# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2018** දෙසැම්බර් **07** වන සිකුරාදා
2018மார்கழி 07 வெள்ளிக் கிழமை
Friday 07th December 2018

බත්තරමුල්ල , ශ්‍රී ජයවර්ධනපුර , ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක **204 (12** වන මහල**)** හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම

பத்தரமுல்ல ,ஸ்ரீ ஜயவர்த்தனபுர ,டென்சில் கொப்பேகடுவ மாவத்தை இலக்கம் 204(12ஆம் மாடி) இல் அமைந்துள்ள மேல் மாகாண மாகாண சபையின் கட்டடத் தொகுதியின் கூட்ட மண்டபத்தில் நடைபெற்ற சபைக் கூட்டம்.

Council meeting was to be held at the Council Hall located in the 12th floor of Western Province Provincial Council at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා.** 09.32 ට **පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.32 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.32 a.m.*

ගරු සභාපතිතුමා **[**සුනිල් විජේරත්න මහතා**]** මූලාසනාරූඪ විය.
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne] in the Chair*

# වාර්ෂික මුදල් ප්‍රකාශය : 2019
## ANNUAL FINANCIAL STATEMENT - 2019
*[අවිච්ඡින්නව - 2018.12.06]*

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා. අද දිනට නියමිත මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් එනම්, ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය ආරම්භ කිරීමට නියමිතයි.

මේ අවස්ථාවේදී පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

# පූර්ණ කාරක සභාව
## COMMITTEE OF THE WHOLE COUNCIL

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 107** | - | **මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 121** | - | **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 122** | - | **සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 123** | - | **ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 124** | - | **නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 125** | - | **කර්මාන්ත දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 103** | - | **සමූපකාර සේවක කොමිෂන් සභාව** |

| | |
|---|---|
| Head No 107 | Ministry of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction,Estate Infrastructure facilities, Industries and Rural Development |
| Head No 121 | Department of Motor Transport |
| Head No 122 | Department of Co-operative Development |
| Head No 123 | Department of Registration of Business Names |
| Head No 124 | Department of Housing Commissioner |
| Head No 125 | Department of Industries |
| Head No 103 | Co-operative Employee's Commission |

***ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන ශීර්ෂවලින් රුපියල් 10/- බැගින් කපා හැරිය යුතු යැයි යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් 2018.12.06 වන දින ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.34 ]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු සභාපතිතුමනි, සියලුදෙනාටම සුභ උදෑසනක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයීය වැය ශීර්ෂය ක්‍රියාත්මක වන මොහොතේ අපට අවස්ථාවක් ලබා දීම පිළිබඳව අපි හදවතින්ම ස්තූතිවන්ත වෙනවා. අපි මේ කාලවකවානුව තුළ දැක්කා, මේ පළාත් සභාවට ඇවිල්ලා අපි මේ අමාත්‍යාංශය තුළින් ක්‍රියාත්මක වන වැඩ සටහන්වලට ගරු අමාත්‍යතුමාගේ නිබඳ සහයෝගය සහ ලේකම්තුමිය ප්‍රධාන ඒ නිලධාරීන්ගේ කැපවීම තුළින් මහත් කාර්යභාරයක් කරන්න අපට ලැබුණු බව. අපි පළාත් සභාව තුළට ඇවිල්ලා ඒ අමාත්‍යාංශය තුළින් ක්‍රියාත්මක වන උපදේශක කාරක සභාවට සියලුදෙනාත් එක්ක වාඩි වෙලා කථා කරන කොට මම දැක්කා හැම දෙයකටම ඇහුම්කන් දීලා, ඒ ඉන්න නිලධාරී මණ්ඩලය, අපි යම් දෙයක් කිව්වොත් ඒ ගැන සොයා බලලා මහා දැවැන්ත කාර්යභාරයක් අපේ මන්ත්‍රීවරුන්ට ලබා දීම තුළින් ජනතාවට වඩාත් සේවාවක් ලැබුණා. ඒ නිසා මම හිතන්නේ මාර්ග සංවර්ධන කටයුතු අමාත්‍යාංශයෙන් අපට ලැබෙන මුදලට වඩා යම්කිසි දෙයක් ලැබිලා අපේ ප්‍රදේශය කාපට් කරලා, එයට සමගාමීව ප්‍රවාහන පද්ධතිය සම්බන්ධව විටින් විට ලැබෙන චෝදනාවලදී, ගරු ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඒවාට ප්‍රතිඵල අපට ලැබුණා. ජනතාව සන්තෝෂයට පත් වන කාර්යයන් බවට පත් වුණා. අද මේ වන විට අලුත්ගම නගරයේ තිබෙන බස් නැවතුම්පොළේ දෙවැනි අදියර ක්‍රියාත්මක කරන්න මධ්‍යම රජයත් එක්ක සම්බන්ධ වෙලා, ගරු අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ ඒවා අලුතෙන් ඉදි කරගෙන යන කාර්යය මේ වන විට ක්‍රියාත්මක වේගෙන යනවා. කළුතර දිස්ත්‍රික්කය හැටියට, අනිකුත් දිස්ත්‍රික්ක දෙකත් සංවර්ධනය වන විට අපේ දිස්ත්‍රික්කය තුළට සංවර්ධන කටයුතු මේ අමාත්‍යාංශය ලබා දීම කෙරෙහි තුළින් අපේ ගරු ඇමතිතුමා ප්‍රධාන ඒ කාර්යය මණ්ඩලයට ස්තූතිය ප්‍රකාශ කරනවා.

ඒ වාගේම තමයි සමූපකාර සංවර්ධනය. සමහර අවස්ථාවලදී අපි දැකලා තිබෙනවා, පරණ සමූපකාර තිබෙනවා ගරු ඇමතිතුමනි. අපි ඒවා උපදේශක කාරක සභාවලදී අයින් කරලා, ඒවායේ Business නැත්නම් මේවා මොනවා හරි ක්‍රමවේදයකට දියුණු කරලා ගමට අවශ්‍ය කරන ශක්තිය, ජනතාවට අවශ්‍ය කරන ශක්තිය සමූපකාරයෙන් ලබා දෙන්න. නමුත් සමූපකාරයේ දැඩි ප්‍රශ්න තිබෙනවා. ඒ සභාපතිවරු, එහි අධ්‍යක්ෂ මණ්ඩලය, නිලධාරීන් තුළින් ක්‍රියාත්මක වන වැඩ සටහන - මම හිතන්නේ තමුන්නාන්සේගේ කාලය තුළ නොවෙයි. ඊට පෙර සිට තිබුණු ප්‍රශ්න පිළිබඳව තමුන්නාන්සේ දැනුවත් කළාට පස්සේ සෑහෙන ප්‍රමාණයක් අවම කරගන්න පුළුවන්කම ලැබුණා. අපි මේ පිළිබඳව දිගින් දිගටම කථා කරද්දී සමහර අවස්ථාවලදී, මම කනගාටු වෙනවා. සමහර නිලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය වඩාත් ශක්තිමත්. හැබැයි මට කොමසාරිස්තුමා ගැන පොඩ්ඩක් කථා කරන්න වෙනවා. කොමසාරිස්තුමාට දැන් අවුරුදු 1 ½ ට පෙර ලියුමක් දුන්නා. ඒ ලියුමෙන් මාව කැඳවලා, ඒ කාර්ය මණ්ඩලය කැඳවන්න කියලා ඉල්ලුවා. නමුත් අද වනතුරුත් කොමසාරිස්තුමාට කැඳවා ගන්න බැරි වුණා. මහා පරිමාණයේ වංචා බේරුවලත් සිදුවන කොට, අපේ සමූපකාරයේ ස්කාගාරයේ වංචා සිදුවන කොට මම හිතන්නේ දිගින් දිගටම මේ ගැන කථා කළත් ඇහුම්කන් නොදී හිමිහිට ලිස්සලා යන ක්‍රමවේදය ඔහු තුළ තිබුණා. අපි කියන්නේ මේවා දිගින් දිගටම කෙරෙන්න නොවෙයි. කාලවකවානු තුළ මේ ඉන්න ඇමතිවරයා සිටියා නම්, ඊට ඉස්සෙල්ලා ඇමතිවරුන්ගේ කාලයේ කළා නම් මේ ඇමතිවරයා ආවාට පස්සේ ඒ ඇමතිතුමාට නිවැරැදි මඟ යන්න ශක්තිය නිලධාරීන් ලබා දෙන්න ඕනෑ. සමහර අවස්ථාවලදී එය මන්දගාමී වුණා. අපි ඒවාට කනගාටුව ප්‍රකාශ කරනවා.

හැබැයි අපේ අනිකුත් වැඩ රාජකාරීවලදී මම දැක්කා කර්මාන්ත වැඩි දියුණු කරගෙන යන්න ඒ අවශ්‍ය කරන ශක්තිය, නිබඳව ඒ අමාත්‍යාංශ තුළින් අපට මහා ශක්තියක් ලැබුණා. ඒ නිසා තමයි අද අපි ගරු ඇමතිතුමා සුහදශීලීව, නිහතමානීව, ඇහුම්කන් දෙමින් මම හිතන්නේ අපේ හැම මන්ත්‍රීවරයෙකුටම ඒ අවශ්‍ය කරන ශක්තිය ලබා දෙනවා. සමහර අවස්ථාවලදී පොඩි පොඩි අඩුපාඩුකම් තිබෙනවා. ඒවා කාටද නැත්තේ? එහෙම තමයි. අමාත්‍යාංශයක් කරන කොට, මමත් කවදා හරි මේකේ ඇමතිවරයෙක් වුණොත් මටත් යම්කිසි දෙයක් තිබෙනවා, ශක්තිය නිර්මාණය කරගන්න. එහෙම තමයි. ඒවා ඇතුළේ පොඩි ගැටලුවක් තිබෙනවා. ඔබතුමා ඇමතිවරයෙක් වුණත් එහෙමයි. ඉල්ලන ඉල්ලන ඔක්කොම දේවල් මන්ත්‍රීවරයාට දෙන්න

බැහැ. ඒක තමයි ඇමතිකමේ තිබෙන බලය. ඒ නිසා අවශ්‍ය කරන විධියට කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා තමයි අපි සහෝදර මන්ත්‍රීවරු එක්ක, මොන ප්‍රශ්න තිබුණත් අපි ආණ්ඩු පක්ෂයක් වශයෙන් අවශ්‍ය කරන ශක්තිය ගරු ප්‍රධාන ඇමතිතුමා ප්‍රධාන මේ සියලු ඇමතිවරුන්ගේ වැය ශීර්ෂයන්ට ශක්තිය දීලා ජයග්‍රහණය කරා අපි ඉදිරියට ගෙනි යනවා.

ඒ නිසා මම හිතනවා, තිරසාර සංවර්ධනයක් කරා යන ගමනේදී බස්නාහිර පළාත තුළ කාර්යක්ෂමව හා ඵලදායිව මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම හා නඩත්තුව, සමූපකාර ව්‍යාපාරය කාර්යක්ෂම සහ ඵලදායි සේවාවක් බවට පත් කිරීම, නිවාස ඉදි කිරීම් හා කුළී නිවැසියන් සුරක්ෂිත තාවය තහවුරු කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම, ග්‍රාමීය සංවර්ධනය ශක්තිමත් කිරීම තුළින් සවිබල ගන්නා වූ ග්‍රාමීය ප්‍රජාවක් බිහි කිරීම, වතු ප්‍රජාවගේ ආර්ථික ශක්තිය දියුණු කරන්න ශක්තිය සමහර තැන්වලට අපට ලැබුණා. අපේ පැතිවල වතු මාර්ග තිබෙනවා. ඒවාට ඕනෑ කරන ශක්තිය අපට ලැබුණා.

ගරු සභාපතිතුමනි, ප්‍රවාහන පද්ධතිය දියුණු කරගෙන යන කොට ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ දී අලුතින් පත් වුණු සභාපතිතුමා ආවාට පස්සෙ අලුත් ගමන් මං තීරු වෙන් කරලා වෙනත් ආකාරයට, පොලිසියත් සමඟ, ඇමතිතුමාත් සමඟ එකතු වෙලා උදෑසන තිබෙන තදබදය අවම කර ගැනීමට අවශ්‍ය කරන ශක්තිය අපට ලැබුණා. ඒ වාගේම තමයි නිවාස කොමසාරිස් කාර්යාලයේ කොමසාරිස්තුමා ප්‍රධාන ඒ ආදරණීය නිලධාරී මණ්ඩලය ඉතාම නිහතමානීව ඒ අවශ්‍ය කරන ශක්තිය, නිවාස කොමසාරිස් කාර්යාලය තුළින් ඒ අපේ ප්‍රදේශයේ ඉන්න ජනතාවට දෙන ශක්තිය ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් අපට ලැබුණා. ඒ ලැබීම තුළින් මම හිතන්නේ ඉදිරියේදී මැතිවරණයක් තිබෙන කොට භයක් සැකක් නැතිව අපට ජනතාව ළඟට යන්න පුළුවන් ශක්තිය මේ අමාත්‍යාංශ සියල්ලෙන්ම අපට ලැබුණා. ඒ නිසා තමයි අපට ඔබතුමාගේ අමාත්‍යාංශයේ මේ වැය ශීර්ෂය තුළින් කථා කරගන්න පුළුවන් ශක්තියක් තිබෙන්නේ.

ඒ නිසාවෙන් ගරු ඇමතිතුමනි, කර්මාන්ත පිළිබඳව කථා කරද්දී කර්මාන්ත ක්‍රමවේදයේ සමහර අලෙවිහල්වල තිබෙන අඩුපාඩු අපි පෙන්නුවා. ලේකම්තුමිය එය නිහතමානීව පිළිගෙන ඉදිරි කාලවකවානුව තුළදී ඒ අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්නය කියලා, අමාත්‍යාංශ තුළින් ක්‍රියා කරලා අලුත්වැඩියා කරලා, නවීන ක්‍රමයට - උදාහරණයක් ගත්තොත් අපි සංචාරක කලාපයක ජීවත් වෙන්නේ. මොරගල්ල, බේරුවල, කළුතර කියන ප්‍රදේශ. එහෙමනම් අපි ඒවායේ තිබෙන අලෙවිහල් වැඩි දියුණු කරලා, ඒවාට සේවකයන් බඳවාගෙන, ඒ අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරලා අලෙවි හලෙන් වැඩි ආර්ථික ශක්තියක් ලබා ගැනීමේ කටයුත්ත මම හිතන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ඉදිරියට කෙරේවි. ඒ සඳහා අපි දිගින් දිගටම ඉල්ලීමක් කළා. කථා කළා. කළුවාමෝදර, බේරුවල, මොරගල්ල කියන සංචාරක කලාපය තුළ දී රෙදිපිළි කර්මාන්තය අලෙවි කරන ඒකේ නම මට මතක් වෙන්නේ නැහැ. ඒ අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. මම හිතන්නේ ලබන අවුරුද්ද වන විට ඒ අවශ්‍ය කරන ශක්තිය ඔබ අමාත්‍යාංශය තුළින් ඊට ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි තමුන්නාන්සේගේ වැඩ පිළිවෙළ තුළදී මම හිතන්නේ අලුත් අලුත් දෑ නිර්මාණය කිරීමට, ඒ වාගේම අර මාර්ග සංවර්ධනය කිරීමේදී ඒ ඉන්න ඉංජිනේරුතුමන්ලා, ඒ වාගේම කාර්මික නිලධාරීන් යම්කිසි දෙයක් කිව්වාම ඇහුම්කන් දීලා, මම හිතන්නේ පුංචි පුංචි ගැටලු තිබෙනවා. නමුත් ඇහුම්කන් දීලා අපේ ප්‍රදේශවල සංවර්ධන කටයුතු ඉතාමත් දැවැන්තව ලබා දීමට කටයුතු කළා. සමහර අවස්ථාවලදී මම දැක්කා. එක්සත් ජාතික පක්ෂයේ අපේ සහෝදර නිශාන්ත ගරු මන්ත්‍රීතුමා මෙතැන නැහැ. පසුගිය දවසක කථාවකදී මෙතැන කිව්වා, බේරුවල ආසනය තුළ රාජිත සේනාරත්න ඇමතිතුමාත් එක්ක Deal කරනවා කිව්වා. මම රාජිත ඇමතිතුමාත් එක්ක Deal කරනවා නොවෙයි. මගේ දේශපාලනයේ පළමුවැනි නායකයා තමයි, අපේ තාත්තාගේ නායකයා තමයි ආර්.ජී.සමරනායක. අර්.ජී. සමරනායක මහත්මයාට අපි වැඩ කළේ. අර රබර් ඇට කරත්තේ තල්ලු කරගෙන ගිහින් තමයි අපි පෝස්ටර් ගැහුවේ. අවුරුදු පහේදී. ඊට පස්සේ එදිරිවීර ප්‍රේමරත්න මහත්මයා තමයි මගේ නායකයා. ඊට පස්සේ රෝහිත අබේගුණවර්ධන මැතිතුමා තමයි මගේ නායකයා. ඊට පස්සේ ආසන සංවිධායක රාජිත සේනාරත්න මැතිතුමා මගේ නායකයා වුණේ. අපි දේශපාලනයේ නායකයින්ට බණින්නේ නැහැ. හෙට අපට මොන නායකයා ආවත් අපට අවශ්‍ය කරන ශක්තිය ලැබෙනවා. අපි ඒ නායකයනන්ට ගරු කරනවා. අපි

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ඔවුන්ට බණින්නේ නැහැ. ඒ නිසා තමයි අපි දැක්ක තැනදී නිහතමානීව කථා කරන්නේ. දැවැන්ත සංවර්ධනයක් බේරුවල කරන්න පුළුවන් වුණේ, මේ පළාත් සභාවට එන්න පුළුවන් වුණේ -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ප්‍රාදේශීය සභාව තුළ සභාපති වෙලා, දෙපාරක් සභාපති හැටියට ඉඳලා අද පළාත් සභාවට එන්න පුළුවන් වුණේ ජනතාවත් එක්ක සිටිය නිසා. ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. අද මේ අමාත්‍යාංශය තුළින් ගරු ඇමතිතුමා ප්‍රධාන, ගරු ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම්තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ලේකම්තුමිය ප්‍රධාන අනිකුත් සමස්ත නිලධාරී මණ්ඩලයටම අපි හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. ලබන්නා වූ නව වසර සුභ නව වසරක් වේවා. ලබන්නා වූ නත්තල සුභ නත්තලක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් ලබන අවුරුදු කාලය තුළ මැතිවරණයක් තියලා, අපි නැවත ජයග්‍රහණය කරලා මේ පළාත් සභාව තුළින් අපේ ආණ්ඩුවක් තුළින් ජනතාවට සේවය කරන්න ශක්තිය, ධෛර්යය ලබා දෙන බවට මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමා නැඟිට්ටේ ඇයි?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් කියන්න. මොකද, කාලය ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා කෙටියෙන්ම කියන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඉතාම කෙටියෙන් තමයි සඳහන් කරන්නේ. මටත් මේක මන්ත්‍රීවරු පෙන්නලා දුන්නාට පස්සේ තමයි මේ අවශ්‍යතාව මතු වන්නේ. 2018.12.04 වැනිදා අපේ සුමිත් ගරු මන්ත්‍රීතුමා මා ගැන කරුණු කිහිපයක් සඳහන් කළා. අභූත චෝදනා ටිකක් එල්ල කළා. ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. හැන්සාඩ්ගත කරන කොට ඒවායේ නිවැරැදි තාවය බලලා, ඒවා සටහන් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමාගේ නම සඳහන් කරලා කිව්වාද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔව්. මගේ නම සඳහන් කරලාම කථා කළා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

හරි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට යම්කිසි හානියක්, ඔබතුමාගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා නම් හඬ පටිය පරීක්ෂා කරලා බලලා මම ඒවා හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කටයුතු කරන්නම්. ඔබතුමාට අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, හානියක් වෙලා තිබෙනවා නම් එහෙම.

සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.45 ]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම 107, 121, 122, 123, 124, 125 හා 103 කියන වැය ශීර්ෂයන් යටතේ වචන

ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම මම පොදුවේ කථා කරන්න පෙර මුදල් ප්‍රකාශයේ තිබෙන මේ අමාත්‍යාංශයට සම්බන්ධ ශීර්ෂයන් පිළිබඳව, විශේෂයෙන්ම 107 වැය ශීර්ෂය පිළිබඳව අදහසක් දක්වන්නම්. මේ ශීර්ෂය සඳහා සමස්ත අයවැයෙන් 2.1% ක් වෙන් වෙලා තිබෙනවා. 107 කියන වැය ශීර්ෂයට. ඒ වාගේම 2017 ත්, 2018 ත්, 2019 ත් අපි සංසන්දනාත්මකව බැලුවොත් අපේ පුනරාවර්තනවල 2017 වර්ෂයේ මිලියන 910 යි. 2018 වර්ෂයේ මිලියන 1036 යි. 2019 වර්ෂය වන විට මිලියන 958 ට අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, පුනරාවර්තන වියදමේ අඩු වීමක් අපට 2019 වර්ෂයේ දකින්නට ලැබෙනවා. ඒ වාගේම මූලධන වියදම්, නැත්නම් ප්‍රාග්ධන වියදම්වල, 2017 මිලියන 561 යි. 2018 මිලියන 671 යි. 2019 වර්ෂය වන විට මිලියන 752 ක් වෙලා තිබෙනවා. අපි එහි වර්ධනයක් දකිනවා. වැඩි වීමක් දකිනවා. ඒ වාගේම තමයි අපි මේ වැය ශීර්ෂය දිහා බලන කොට 2017 සත්‍ය වියදමට වඩා 2019 ඇසේම්න්තුව මිලියන 238 ක වැඩි වීමක් තිබෙනවා. ඒක 16% ක වැඩි වීමක්. ඒ වාගේම 2018 ඇස්තමේන්තුවට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 3 ක වැඩි වීමක් තිබෙනවා. ඒක 0.2% ක වැඩිවීමක් තිබෙනවා. ඒ වාගේම පුනරාවර්තන වියදම් 2017 වර්ෂයේ සත්‍ය වියදමට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 47 ක වැඩි වීමක් තිබෙනවා. ඒක 5% ක වැඩි වීමක්. ඒ වාගේම 2018 ඇස්තමේන්තුවට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 78 ක අඩු වීමක් තිබෙනවා. ඒක 8% කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම්වල 2017 සත්‍ය වියදමට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 191 ක වැඩි වීමක් තිබෙනවා. ඒක 34% ක වැඩි වීමක්. ඒ වාගේම 2017 ඇස්තමේන්තුවට වඩා 2019 ඇස්තමේන්තුව මිලියන 81 ක වැඩි වීමක් තිබෙනවා. ඒක 12% කින් වැඩි වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, අපි බැලුවොත් එහෙම සභා ආදායම. සංවර්ධන කාර්යයන් සඳහා යෙදවුම්, PDG වල මිලියන 357 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන PSDG වල මිලියන 391 ක් වෙන් වෙලා තිබෙනවා. එතකොට අපි මේවා වැය ශීර්ෂයන් එක්ක බලන කොට, බෙදලා තිබෙන අපේ විෂයයන් අනුව, ගරු ඇමතිතුමාට තිබෙන විෂයයන් අනුව බැලුවොත් 2001, 2104, 2502 කියන විෂයයන්වල වැය ශීර්ෂවල මිලියන 12 ක් කුඩා කර්මාන්ත සඳහා PSDG වලින් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ග්‍රාම සංවර්ධනය සඳහා 2509, 2104 කියන වැය ශීර්ෂවලට මිලියන 15 ක් වෙන් වෙලා තිබෙනවා PSDG වල. ඒ වාගේම 2506 යේ වතු යටිතල පහසුකම් සඳහා PSDG වල මිලියන 09 ක් වෙන් වෙලා තිබෙනවා. 2104, 2509 ප්‍රවාහන සඳහා PSDG වල මිලියන 21 ක් වෙන් වෙලා තිබෙනවා. ඒ වාගේම 2104 නිවාස සඳහා PSDG වල මිලියන 07 ක් වෙන් වෙලා තිබෙනවා. 2506 පළාත් මාර්ග සඳහා PSDG වල මිලියන 325 ක් වෙන් වෙලා තිබෙනවා. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, PSDG වල මේ ආකාරයේ මුදල් වෙන් වෙලා තිබුණත්, PDG වල මේ විධියට මුදල් වෙන් වීමක් අපි මුදල් ප්‍රකාශයේ දකින්නේ නැහැ. නමුත් අපි දන්නවා, අපේ ඉන්න නිලධාරීන් අපේ ගරු ඇමතිතුමාත් එක්ක එකතු වෙලා මේ තිබෙන මුදල් ඒ විෂයයන්වලට බෙදා දෙන්න කටයුතු කරනවා. මෙන්න මේ ආකාරයෙන් මම මුදල් ප්‍රකාශය පිළිබඳව දැනුවත් කළේ අපි කථා කරන්න පෙර මේ මුදල් ප්‍රකාශයේ අපේ ශීර්ෂවලට අදාළව තිබෙන ඒ අය සහ වැය පිළිබඳව මතක් කිරීමක් කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි අපේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. සාමාන්‍යාධිකාරිතුමා බණ්ඩාරනායක මැතිතුමාගේ ඉඳලා ඒ සියලුම නිලධාරීන්, අපි දන්නවා. උපදේශක කාරක සභාවලට ආපුවාම මන්ත්‍රීවරුන්ගේ අඩුපාඩුකම්, අවශ්‍යතාවයන් සොයා බලලා සෑහෙන සහයෝගයක් ලබා දීලා විශාල වශයෙන් තිබෙන මාර්ග පද්ධතිය සකස් කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ ඒ අලුත්වැඩියා කිරීම් කටයුතුවල නිරත වෙලා කැපවීමෙන් වැඩ කරනවා. ඒ නිසා ඒ අය සොයා ගන්න ආදායම පඩි ගෙවා ගෙන, අපට බරක් නොවී, අමාත්‍යාංශයට බරක් නොවී, පළාත් සභාවට බරක් නොවී කටයුතු කිරීම පිළිබඳව අපි අගය කරනවා.

ඒ වාගේම තමයි, කර්මාන්ත අධිකාරිය. ඒ අය උත්සාහයක් කරනවා කොහොම හරි කීයක් හරි සොයාගෙන මේ කර්මාන්තකරුවන් සඳහා යමක් කරන්න. ඒ පිළිබඳව අපේ පැසසුමට ලක් වෙනවා. ඒ වාගේම තමයි කර්මාන්ත දෙපාර්තමේන්තුව. විශේෂයෙන්ම බිඳුණු පුටුව. අපේ දරුවන්ගේ පාසල්වල පුටු ඩෙස් ටික සොයලා, ගිහිල්ලා කථා කරලා, මන්ත්‍රීවරුන්ට කියලා විශාල ශක්තියක් අපට ලබා දෙනවා වාගේම දරුවන්ගේ පුටු ටික හදලා පාසල්වලට ලොකු පිටුවහලක් ලබා දෙන්න කටයුතු කරනවා. අපි අගය කළ යුතුයි. පුංචි මුදලක්

[ගරු සහන් ප්‍රදීප් විතාන]

ලැබුණත් ඒකෙන් හොඳ ප්‍රතිඵලයක් මේ පළාත් සභාවට ලබා දෙන්න කටයුතු කරනවා. ඒ සියලු නිලධාරීන්ට අපේ ගෞරවය පුද කරනවා.

ඒ වාගේම තමයි නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව. දුප්පත් මිනිස්සු ටික සොයලා, අපි මුදල් වෙන් කළාම - අපි දන්නවා, ඇත දුෂ්කර ගම්මානවල ගෙවල්වලට ගිහිල්ලා, ඒවා බෙදලා, ඒවා පසුවිපරම් කරලා, ඒවා හරියට වෙනවාද කියලා නැවත නැවත බලලා ඒ හිටපු කොමසාරිස්තුමිය ඇතුළු සියලු දෙනා ඒ කටයුත්ත හරියට කරනවා. ගරු ඇමතිතුමාගේ මඟ පෙන්වීම යටතේ. අපි ඒකට ගෞරව කරනවා. අපි ඒ අත්දැකීම දැකලා තිබෙනවා. අපේ ගෙවල්වලට පවා ඇවිල්ලා ඒ කටයුතු සාර්ථකව කරන්න කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව. ඒ අයගේ ප්‍රාග්ධන වියදම, පුනරාවර්තන වියදම මිලියන 20 යි. හැබැයි ඒ අය මිලියන 61 ක් සොයා දීලා, මිලියන 41 ක අතිරික්තයක් අපේ මුදල් ප්‍රකාශයට එකතු කරලා දීලා තිබෙනවා. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ වාගේම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව. අපි සතුටු වෙනවා. අපේ ගරු අමාත්‍යතුමාගේ නායකත්වයෙන් මුදල් ප්‍රකාශයට මිලියන 4500 ක් එකතු කරලා දෙනවා. ඒ වාගේම ඒ අයට වියදම් කරන්නේ මිලියන 141 ක් විතරයි. ඒ පිළිබඳව අපි සතුටු වෙන්නට ඕනෑ. ඒ වාගේම ප්‍රවාහන අධිකාරියේ හිටපු GM, සාමාන්‍යාධිකාරී පැහැදිලිව අපි කියනවා. හොරෙක් කියලා. පට්ටපල් හොරෙක්. මේ ඉන්න මිනිස්සුන්ගේ සල්ලි අරගෙන පැන්නා. ඒක විනාශ කළා. ඒක නැත්තටම නැති කළා. හැබැයි වර්තමානයේ සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු නිලධාරීන් ඒ අමාරු වළෙන් ගොඩ එන්න විශාල උත්සාහයක්, මහන්සියක් ගන්නවා. අද කොන්දොස්තරලා, ඩ්‍රයිවර්ලා දැක්කත් ඉතාම පිළිවෙළකට අද ඔවුන් බස් රථවල ගමන් කරනවා අපි දකිනවා. ඒක නිසා මේක ගොඩක් පැටළුණු අධිකාරියක්. නමුත් ඒක ක්‍රමක්‍රමයෙන් ලිහාගන්න ඒ සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු නිලධාරී මණ්ඩලය විශාල වෙහෙසක් ගන්නවා. ඒ නිසා අපි ඒ අයටත් අපේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම තමයි විශේෂයෙන්ම ග්‍රාම සංවර්ධන යටතේ ඉන්න නිලධාරීන්. විශේෂයෙන්ම අපි දැක්කා පුහුණුවීම් වැඩ සටහන් තිබුණා. ඒ සමිති ශක්තිමත් කරන්න මුදල් ලබා දෙනවා. මේ විධියට වැඩ සටහන් තියලා ග්‍රාම සංවර්ධනය පැත්තෙන් පළාත් සභාව තුළ විශාල වර්ධනයක් ලබා ගැනීම සඳහා කටයුතු කරනවා අපි දැක්කා.

ඒ නිසා අපි බොහොම සතුටු වෙනවා. එක පැත්තකින් උපදේශක කාරක සභාව හරියටම වෙලාවට තියලා, ගරු මන්ත්‍රීවරුන්ට උදව් කරලා සෑම වැය ශීර්ෂයක් පිළිබඳව මම ඒ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට සෑම නිලධාරියෙක්ම, ආයතන ප්‍රධානියෙක්ම ගෙනැල්ලා ඒ සෑම වැය ශීර්ෂයක්ම අපි පරීක්ෂා කරලා, ප්‍රගතිය බලලා, මාසෙන් මාසේ ගරු ඇමතිතුමාගේ නායකත්වය යටතේ ඒ කටයුතු ටික කරගෙන ගියා. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා. අපේ උපදේශක කාරක සභාව යටතේ ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ 100% ක් අපේ මුදල් වියදම් කරලා අවසන් කරලා තිබෙනවා. PSDG සහ PDG සියලු දේවල් අවසන් කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා.

ඒ වාගේම තමයි පැහැදිලිවම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා. මට කථා කරන්න බැරිව ගියා, අපේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) බන්දුල මහත්මයා. මේ සෑම දවසකම ඇවිල්ලා උදේ සිට සවස් වනතුරු ඉඳලා, එතුමා විශාල ශක්තියක් ලබා දෙනවා. මේ අයවැය ලේඛනය සකස් කිරීමේදී අපි ප්‍රශ්නයක් ඇහුවත් එතුමාට විතරයි හරියට උත්තරයක් දෙන්න පුළුවන් වන්නේ. ඒ නිසා ඔබතුමා අපේ පළාත් සභාවට සම්පතක් හැටියට අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මේ අයවැය හදපු ඒ අධ්‍යක්ෂ කුරේ මහත්මාටත් අපේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය බොහොම නිහතමානීව හැම කෙනෙකුටම ඇහුම්කන් දීලා මේ අමාත්‍යාංශය නිවැරැදි මඟකට ගෙනි යන්න හරි දේ කරන්න කටයුතු කරනවා, සැලසුම් අධ්‍යක්ෂතුමියත් එක්ක එකතු වෙලා. ඒ වාගේම අවසාන වශයෙන් මම මේ කියන්නේ. අපේ ගරු ඇමතිතුමා මේ වෙලාවේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු ඔක්කෝටම බඩ පිරෙන්න, හිත පිරෙන්න මේ වසර තුළ මුදල් ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. අපි ඒ පිළිබඳව සතුටු වෙනවා. බොහොම නිහතමානීව, ඉවසීමක් තිබෙන අමාත්‍යවරයෙක් හැටියට එතුමා නිහඬව දැවැන්ත සේවයක් මේ පළාත් සභාව තුළ මේ අමාත්‍යාංශයට කරනවා. ඒ නිසා අපි විපක්ෂයට පැහැදිලිවම කියනවා. ඔබතුමන්ලා මොනතරම් උත්සාහ කළත්, අපේ මේ වැය ශීර්ෂය පරද්දන්න අපි සියලුදෙනාම,

අපි 56 දෙනාම එකතු වෙලා දැවැන්ත ශක්තියකින් මේ වැය ශීර්ෂය ඓතිහාසික ජයග්‍රහණයක් ලබනවයි කියමින් සියලු දෙනාට ස්තූතිවන්ත වෙමින්, ගරු සභාපතිතුමාටත් ගෞරවය පුද කරමින් මා නිහඬ වෙනවා.

[පූ.භා. 09.55 ]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මාර්ග, ප්‍රවාහන, සමූපකාර, වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධව කථා කරන්න ලැබීම භාග්‍යයක් කොට සලකනවා. ඇත්තටම මම මේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් වශයෙන්, මේ අමාත්‍යාංශය සම්බන්ධව හැම වැය ශීර්ෂයකම කථා කරපු මන්ත්‍රීවරයෙක් වශයෙන් ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ අමාත්‍යවරයෙක් මේ අමාත්‍යාංශයේ සිටීම නිසා එක් අතකින් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන අගය කරනවා. මෙම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට නොවරදවාම යන මන්ත්‍රී කෙනෙක් වශයෙන් ඇත්තටම අපි දකිනවා. මේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා ක්‍රමානුකූලව තියලා, එයට ශක්තියක් වෙන්න කටයුතු කිරීම පිළිබඳව. ඒ ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලය, මෙතුමාට අයත් සියලුම ආයතනවල නිලධාරීන් ගෙනැල්ලා විධිමත් අධීක්ෂණයක් යටතේ කටයුතු කිරීම ගැන මම ස්තූතිවන්ත වෙනවා. මට පෙර කථා කළේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා තමයි. එතුමා අන්තිමට කියපු කථාවට පොඩි උත්තරයක් දෙන්න ඕනැ. ඒකට පොඩි උත්තරයක් දීමෙන් පසුව තමයි අමාත්‍යාංශයට අදාළව මගේ කථාව ආරම්භ කරන්නේ. එතුමා කිව්වා, මේ ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශ වැය ශීර්ෂය ඉහළින්ම ජයග්‍රහණය කරනවා. විපක්ෂය මොන දේවල් කළත් අපි මේ විධියට කරනවා. ඔබතුමන්ලා මතක තියාගන්න. අවුරුදු 3 1/2 ක් අපි එතුමන්ලා සමඟ සිටියා. එතුමාට ඒ ශක්තිය දුන්නා. ඔබතුමන්ලා කකුළෙන් අදින කොට එතුමාට ඒ ශක්තිය දුන්නා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඒ වාසියට නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක අමතක කරන්න එපා. දැන් මෙතැන අපේ පක්ෂයේ අග්‍රාමාත්‍යතුමාට, ඒ දේශපාලන තීන්දුවක් ගැනීම නිසා ඔබතුමන්ලාගේ පක්ෂයේ නායකයින් -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

දැන් දුක ඇති සල්ලි නැති හින්දා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමන්ලාට මේ ප්‍රශ්නය වුණා කියලා හිතන්න. එතකොට ඔබතුමන්ලා ගන්න තීන්දුව මොකක්ද? ඒක පෞද්ගලිකව ගන්න එපා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

විසර්ජනය කොහොම හරි පරද්දන්න කියලා කිව්වා නේද?

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

අපට පාර්ලිමේන්තුව වැඩක් නැහැ. පාර්ලිමේන්තුවේ ඉන්න කට්ටිය අපට මොකුත් කළේ නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අපි කරන්නෙත් දේශපාලනයක්. ඔබතුමන්ලා කරන්නෙත් දේශපාලනයක්. ඔබ දෙගොල්ලෝ එකතු වුණේ කොහොමද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මේ අයට පක්ෂයෙන් කිව්වේ නැහැ. මේ අය අල ඇණුවලට යට වෙලා තිබෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අපට තව මාස හතරයි තිබෙන්නේ. අපිත් දේශපාලනයක් කරන්නේ. ඒ නිසා පුද්ගලික තරහක් ගන්න එපා. උත්තරයට උත්තරයක් දෙන්න ඕනෑ. නැත්නම් ඒක කථාවක් නොවෙයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු ප්‍රධාන ඇමතිතුමාට පක්ෂයෙන් කියලාලු, පක්ෂයෙන් එහෙම කිව්වේ නැහැයි කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

පක්ෂයෙන් නොවෙයි. අර අල ඇණු දෙතුන් දෙනෙකුගේ උවමනාවට. මෙයාට කොන්දක් තියෙනවායැ තීන්දුවක් ගන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අගමැතිතුමා, පක්ෂයේ ලේකම්තුමා සියලුම දෙනා -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

එක්කෙනා දෙන්නා එන්නේ නැති වෙන කොට. අගමැතිතුමාට, පක්ෂයේ ලේකම්තුමාට මේගොල්ලෝ ගිහින් කිව්වේ කිව්වේ මේගොල්ලන්ගේ -

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

අන්න මග හරිනවා. කවුරුවත් නැහැ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අගමැති කෙනෙක් දැන් නැහැ නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

විපක්ෂයේ සංවිධායක වශයෙන් මම වගකීමක් දරනවා. මේක අපේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

හීනෙන්ද රනිල් වික්‍රමසිංහ අගමැති කියන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

පක්ෂයේ මහ ලේකම්තුමා ඇතුළු අය ගත්ත තීන්දුවක්. මේක වගකීමෙන් කියන්නේ. හැන්සාඩ් ගත කරන්න. ඒ තීන්දුවටයි අපි මේ ගරු කරන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

හැන්සාඩ් ගත කරන්න ඕනෑ නැහැ. මේ පක්ෂයෙන් ලකුණු ගන්න හදන්නේ. කවුද එක්සත් ජාතික පක්ෂයේ කොන්ද කෙලින් තියාගෙන ඉන්න මන්ත්‍රීවරු?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, කෙසේ වෙතත් මේ වැය ශීර්ෂය සම්බන්ධව කථා කරනවා නම්, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්ධව අපි පළමුවෙන්ම කථා කරන්න ඕනෑ. පළාත් මාර්ග සම්බන්ධව කථා කරන කොට අමාත්‍යාංශ මුදල් පළාත් මාර්ග නඩත්තු කිරීමට, ඒ වාගේම ප්‍රාග්ධන වියදම් ඇති කිරීමට ප්‍රමාණවත් නැහැයි කියන එක උපදේශක කාරක සභාවලදී දීර්ඝ වශයෙන් අපි, සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා ඇතුළු සියලුමදෙනා කථා කරලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත් පළාත් මාර්ග නඩත්තු කිරීමට පවා ඒ මුදල් මදි බවයි අපි දකින්නේ. ඒ වාගේම කැලණිය, බියගම, මහර වැනි ප්‍රදේශවල අපේ පළාත් මාර්ග ගොඩක් තිබෙනවා. ඒවා පසුගිය රජය විසින් නවීකරණය කළත් අද ඒවා නඩත්තු කිරීමට පවා බැරි වෙලා තිබෙනවා. ඒවා පළාත් මාර්ග. ප්‍රාදේශීය සභාවෙන් කරන්නෙත් නැහැ. පළාත් පාලන ආයතනයෙන් කරන්නෙත් නැහැ. ඒ වාගේම පාලම්. උදාහරණයක් ගත්තොත් කැලණියේ පළාත් මාර්ග ගැන කථා කරනවා නම්, කැලණියේ කොහල්විල පාර හැමදාම ජලයෙන් යට වෙනවා. කැලණි පන්සලට ආසන්නයේම තිබෙන්නේ. ඒ පාරේ දැන් බෝක්කුවක් නවීකරණය කරගෙන යනවා. ඒ කැලණි පන්සලට එන පාර. තව බෝක්කු තුනක් නවීකරණය කරන්න තිබෙනවා. මම ඉල්ලීමක් කරන්නේ. ඔබතුමන්ලා මේ මුදල් ඇති කරගන්න. ලෝක බැංකු ආධාර වෙන්න පුළුවන්. පළාත් නිශ්චිත ආධාර වෙන්න පුළුවන්. ඒවාට ඇතුල් කරන

ක්‍රමවේදයක් - මේ අපේ පාරවල් කියලා නොවෙයි. මේ පළාත් මාර්ග පාරවල්. මේ පළාත් මාර්ග පාරවල් අපේ පළාත් සභාවෙන් කළ යුතුයි. ඒ නිසා ඇතුල් කරන ක්‍රමයක් මේ කථාවෙන් ඇතුල් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ඒ ප්‍රදේශයේම කැලණිය පිලපිටිය ගෝනගම්පල පාර. කැලණිය, වේවැල්දූව, හුණුපිටිය පාර. කැලණිය කොහල්විල පාරට ප්‍රමුඛත්වය ලබා දෙන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු සියලු නිලධාරී මණ්ඩලය කාර්යක්ෂමව ඒ වැඩේ කරනවා. ඒ නිසා ඒ මුදල් ඒ ආකාරයෙන් ලබා දුන්නොත් ඒ ශක්තිය ලැබෙනවා. කෙසේ වෙතත් මේ නවීන ගොඩනැගිල් පවා හදන්න ශක්තිය දුන්නේ, PRD එකයි. එහි පරිපාලන කටයුතු කළේ එතුමන්ලායි. එම නිසා තමයි අපට ලොකු වියදමක් අඩු කරගන්න ලැබුණේ. කෙසේ වෙතත් යම් යම් චෝදනාවලට ලක් වුණත් කිව යුතු දේ කියන්න ඕනෑ. හොඳට කරපු නිසා තමයි, ඒ පරිපාලනය නිසා තමයි අපට මේ ශක්තිය ලැබුණේ.

ගරු සභාපතිතුමනි, ප්‍රවාහනය ගැන කථා කරනවා නම්, කැලණිය රජමහ විහාරස්ථානය අසළ ඇති බස් නැවතුම්පොළ පිළිබඳව අපි හැම වෙලේම උපදේශක කාරක සභාවේදී කථා කරනවා. ඒක නවීකරණය වෙන්නේ නැහැ. ඒ වාගේම විදුලිය ඇණහිටලා. විදුලිය කපලා. ඒ වාගේම රැස්වීම්වලදී අපට කියලා තිබෙනවා මේකේ පැවරීම කාටද අයිති කියන එක නැහැ. එහෙමනම් කවුද හැදුවේ? අපි දන්න විධියට නම් පළාත් සභාවෙන් කියලා තමයි අපි දන්නේ. එහෙමනම් ඒ ආකාරයෙන් නිසි විධියට, හැමදාම අපි උපදේශක කාරක සභාවේ කථා කළත්, ඒ අවස්ථාව නොලැබුණු බව මම ප්‍රකාශ කරනවා. ඒ වාගේම ගරු අමාත්‍යතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ කැලණිය Bus stand එක අසළ, මම දැක්කා මෙතුමා මහරගමද? හෝමගමද ලොකු විදුලි පද්ධතියක් ඒ ස්ථානයේ හදලා තිබෙනවා. කැලණිය රජ මහ විහාරස්ථානයට ශක්තියක් වෙන්න, ඒ වාගේම ආලෝකයක් වෙන්න ඒ Bus stand එක අසළ නව වීදි ලාම්පු පද්ධතියක් ඇති කරලා ඒ අවස්ථාව ලබා දෙන්නය කියලා මේ අයවැය කථාවේදී මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම පොඩි චෝදනාවකුත් කරනවා. මේ අමාත්‍යාංශයේ බස් පර්මිට් දීමේදී යම් යම් චෝදනා ඇති වෙලා තිබෙනවා. යම් යම් පෙත්සම් අපට ඇවිල්ලා තිබෙනවා. අල්ලස් ගන්නවා. ඒ වාගේම දූෂණ ඇති වෙලා තිබෙන බව. එම නිසා ඒවායේ නිවැරැදි භාවය ඇති කරන්න, ඒ ක්‍රමවේදය වෙනස් කරලා - උපදේශක කාරක සභාවට ඒ අලුත් පර්මිට් ඉල්ලනවා නම් අපට දාලා, මන්ත්‍රී කමිටුවට දාලා විනිවිද භාවය ඇති වන ක්‍රමවේදයක් ඇති කරන්න. නැත්නම් ඔබතුමාගේ අධීක්ෂණය යටතේ කරන මෙන් ඉල්ලීමක් කරනවා. මේ නිලධාරීන්ට අත දික් කරනවා නොවෙයි. නිලධාරී වෙන්න පුළුවන්. යම් යම් අය වෙන්න පුළුවන්, මේ දේ කරන්නේ. ලොකුවට මුදල් ගැවසෙනවා කියලා ප්‍රසිද්ධියේ අපි ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ වාගේම කර්මාන්ත අධිකාරිය සම්බන්ධව කථා කරනවා නම්, කර්මාන්ත අධිකාරියේ සභාපති අපේ කැලණිය ආසනයේම අපේම හිටපු මන්ත්‍රී කෙනෙක්. අපි එතුමා ගැන සතුටු වෙනවා. එතුමාට පුළුවන් ආකාරයට කරනවා. ඒ වාගේම බිඳුණු පුටුව වැඩ සටහන ඉතාම සාර්ථකව කරනවා. ඔබතුමාගෙන් ලැබෙන මුදල්වලින් තමයි, කැලණියෙත් ඉස්කෝල එකක් දෙකක් කළේ. හැබැයි සභාපතිතුමාත් ඉන්නේ කැලණියේ. හැබැයි එහෙම මුදලක් තවම කැලණියට දාන්නේ නැහැ. මම ඉල්ලීමක් කරනවා. මට පක්ෂ බේදයක් නැහැ. ඒ අවස්ථාවත් ලබා දෙන්න. අධිකාරියටත් යම් මුදලක් ලැබෙනවා. ඒ ලැබෙන මුදල පඩිවලට දෙනවා කියන එකයි මම දකින්නේ. එහෙමනම් අධිකාරියෙන් මොකක්ද කෙරෙන්නේ? එහෙමනම් කොහොමද මේ අධිකාරිය ගෙනි යන්නේ? ලාභ ලබන්නේ කොහොමද? එහෙමනම් නවීන විධියට මේක හිතන්න අවස්ථාවක් වෙලා තිබෙනවා. අපි බොරුවට නමට අධිකාරියක් කියලා දාගෙන ලොකුවට අධිකාරී දානවා. කර්මාන්ත අධිකාරී කියලා දානවා. ඒවා සුදු අලියන් බවට පත් කරන්න එපාය කියලා තමයි මම ඉල්ලීමක් කරන්නේ.

ඒ වාගේම සමූපකාරය ගැන කථා කරන්න ඕනෑ. සමූපකාර අධ්‍යක්ෂවරයෙක් වශයෙන් මම කටයුතු කරලා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වෙලා, විපක්ෂ නායක වෙලා, උප සභාපති වෙලා අද පළාත් සභාවේ මේ තත්ත්වයට එන්න ලැබුණේ සමූපකාරයෙන් මට අඩිතාලම ලබපු නිසා. එම නිසා සමූපකාර පද්ධතිය විශේෂයෙන්ම අද ග්‍රාමීය බැංකුවලින් නඩත්තු කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒක වෙනස් කරන්න ඕනෑ. ග්‍රාමීය බැංකු නැත්නම් අද පඩි දෙන්න පවා, බැරි වෙලා ති බෙනවා. සමහර සමූපකාරවල

[යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක]

වත්කම්, ඉඩම් ඒ සියලුම දේ අද 99 අවුරුදු බදුවලට දීලා, විකුණන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගැන සොයා බලන්න. මේකෙනුත් ඉතාම දූෂණ ඇති වෙනවා. අපේ තිබෙන ඉඩම්, අපේ මුතුන් මිත්තෝ, නැත්නම් ඒ ආයතනවල දක්ෂ විධියට සභාපතිකම් කරලා අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරු දරලා ඒ ආරක්ෂා කරපු දේවල් අද නඩත්තු කරන්නේ, මේ සම්පත් විකුණලා. පළාත් සභාවේ මේ පරිපාලනයත් හදා ගන්නේ මේවා කරන්නද? මේ කොමසාරිස්ලා ඉන්නේ විකුණනන්ද? කොමසාරිස්තුමෙක් හරි ඒ නිලධාරී මණ්ඩලය හරි ඉන්නේ විකුණන්න දෙන්නද? බදු දෙන්නද? කියන එක මම විවෘතව අහනවා. ඒ නිසා මෙම ක්‍රමවේදය නැති කරලා, මොකක් හරි ක්‍රමවේදයකින් නවීන ක්‍රමයක් ඇති කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. මේ සම්බන්ධව සමූපකාර කොමිෂන් සභාව මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න ඕනෑය කියන එකයි මම ඉල්ලීමක් කරන්නේ.

නිවාස සම්බන්ධව කථා කරනවා නම් අමාත්‍යාංශයේ සියලුම අය ඉතාම කාර්යශූරව වැඩ කරනවා. ඒ දෙන ආධාර මුදල ඒ නිවාස වැඩි දියුණු කිරීමට, අලුත්වැඩියා කිරීමට ප්‍රමාණවත් නොවන බැවින්, ඉදිරියේදී ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් නව නිවාසයක් සෑදීමට සරිලන මුදලක් ලබා දෙන්නය කියලා ඉල්ලීමක් කරමින්, මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 10.06 ]

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ගරු සභාපතිතුමනි බස්නාහිර පළාත් සභාවේ 2019 අයවැය විවාදයේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ යටතේ තිබෙන මාර්ග, ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. ගරු සභාපතිතුමනි, ඊට ඉස්සෙල්ලා මම සියලු දෙනාගෙන්ම අවසර ඉල්ලා සිටිනවා, පොඩි පැහැදිලි කිරීමක් කරන්න. ඒකට ඔබතුමා අවසර දෙයි කියලා මම සිතනවා. මෙය ඉතාම වැදගත්. අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැදගත් දෙයක්. පසුගිය දින අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා, දේශපාලන පිල් මාරුවීම් ගැන කථා කරන කොට දේශපාලන පිල් මාරු ආරම්භ කළේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා කියලා. මේ කථාවෙන් වැරදි පණිවුඩයක් රටට යන්න පුළුවන්. ඒක අපි හරිගස්සන්න ඕනෑ. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා කියන්නේ හිටපු අගමැතිතුමා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘවරයා. මම තුන්වැනි පරම්පරාවේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක්. බණ්ඩාරනායක පවුලත් එක්ක ඉතාම හිතවත් නිසා මම මේ හරි ගැස්සීම කරන්න ඕනෑ. 1950 කාලයේ රට පාලනය කළේ ඩී.ඇස්. සේනානායක අගමැතිතුමා. එතුමා එවකට විපක්ෂයේ සිටි මාක්ස්වාදී පක්ෂය බෙදා වෙන් කොට Divided rule ක්‍රමය යොදා ගනිමින් පාලනයක් ගෙන ගියා. 1951 එම රජයේ, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාත්, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් ඒ ආණ්ඩුවේ අමාත්‍යවරු හැටියට සිටියා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජපානයට ගිහිල්ලා අර විශේෂ කථාව කළේ. ප්‍රසිද්ධ කථාව. ඒ වාගේම ඒ කාලයේ තමයි මේ රටේ සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු බලවේග ආරම්භ වුණේ. ඒ බලවේග යූ.ඇන්.පී. යේ බටහිර ගැති පාලනයට විරුද්ධව ජාතික වශයෙන් නැඟී සිටියා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකමැතිතුමා ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ඉගෙන ගත්ත, ඉංග්‍රීසි කථා කරන කෙනෙක් වුණත්, සාමාන්‍ය ජනතාවගේ සිතුම් පැතුම් තේරුම් ගන්න හැකියාවක් තිබුණා. සිංහල මහ සභාව ජාතික වටිනාකමක් ඇති කරගෙන කටයුතු කළේ අන්න ඒ කාලයේ තමයි.

1951 මාදම්පේ දී පැවතුණු එක්සත් ජාතික පක්ෂ ක්‍රියාකාරී කමිටුවේදී සිංහල මහ සභාව රට වෙනුවෙන් ඉදිරිපත් කරපු සියලු යෝජනා ප්‍රතික්ෂේප කළා. බටහිර රටවල අවශ්‍යතාවය වෙනුවෙන් පෙනී සිටියා. මෙන්න මේ කරුණු උඩ තමයි එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා යූ.ඇන්.පී. අතහැර වෙනත් පක්ෂයක් හැදුවේ. එතුමා පිල් මාරු කළේ නැහැ. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කළා. එතුමා එක්ක ඒ වෙලාවේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පියා ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා එළියට ගියා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා අලුත් පක්ෂයක් බිහි කළා මිස පිල් මාරු කළේ නැහැ. එතුමා සමග සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු බලවේග එකතු වුණා. 1951 සැප්තැම්බර් මස 02 වැනිදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කළා. ඊට පසු දින තමයි මෛත්‍රීපාල සිරිසේන කියන දරුවා බිහි වුණේ, පොළොන්නරුවේ ගොවි පවුලකින්. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ඒ ගැන කථා කරන්න දුන්නාට ස්තූතියි.

ලලිත් වනිගරත්න ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ ඇත්තටම අපි අඩුපාඩු කියන්න යන්න හොඳ නැහැ. හොඳ කියන්න එපැයි. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක කෙලින් ඉන්න ඇමතිවරයෙක් විධියට ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් හැටියට මම එතුමාට සලකනවා. එතුමා හැම විටම සංවිධායකවරු වශයෙන්, අපට ශක්තිය ලබා දුන්නා. අපේ ප්‍රශ්නවලදී - එක්සත් ජාතික පක්ෂය ඉතාමත් තදින් එතුමාවත් යටත් කරගෙන යන්න හදන කාලයේ - මොන යහපාලනයක්ද? පාලනයක් තිබුණේ නැහැ. යහපාලනයේදී තනිකරම ඇත්ත කියන්න ඕනෑ නේ? පළාත් සභාවේ මුදල්, එක්සත් ජාතික පක්ෂයට ඕනෑ විධියට තමයි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් සියලුම මුදල් වෙන් කරගෙන ගියේ. ඒ හැම අවස්ථාවකදීම ගරු ඇමතිතුමා අපේ ගෞරවය ආරක්ෂා කරන්න කටයුතු කළා. අපට කොන්ක්‍රීට් පාරවල්වලට සල්ලි දුන්නා. පාසල්වල ඩෙස් බංකු හදන්න මුදල් ලබා දුන්නා. ඒ ගැන මම ගොඩක් අගය කරනවා. ඒ වාගේම කර්මාන්ත අමාත්‍යාංශයෙන් ස්වයං රැකියාවලට අපට මුදල් ලබා දුන්නා. මම ගරු ඇමතිතුමාගේ අඩුපාඩුවකට කියන්නේ, වැරැද්දකට කියන්නේ, තරහකට කියන්නේ - මම එකම එක ඉල්ලීමයි කළේ. සාමාන්‍යයෙන් මම පුද්ගලික ඉල්ලීම් කරන්නේ නැහැ. මේ බස් ක්‍රමානුකූලව දුවවන්නේ නැහැයි කියලා. මේවා කොටන එක නතර කරන්නය කියලා ඉල්ලීමක් කළා. ඒක තමයි තිබෙන එකම ප්‍රශ්නය. ඒක තමයි එතුමාගෙන් පෞද්ගලිකව ඉල්ලපු එකම ඉල්ලීම. හැමදාම ඉල්ලුවා. ඉල්ලුවා. එතුමා කිව්වා. මේ නිලධාරීන් කරන්නේ නැහැ. බස් කොටනවා, කොටනවා, කොටනවා කියන්නේ. බස් එක තැන මිනිත්තු 25, 30 එක තැන නතර කරගෙන ඉන්නවා. දෙකටන හන්දියේ මගේ ගේ ඉස්සරහා හැමදාම, හැම බස් එකක්කම මිනිත්තු 25 ක්, 30 ක් කට්ට අව්වේ නතර කරගෙන ඉන්නවා. අර මිනිස්සු බලාගෙන මේ මටත් එක්ක බණිනවා. මේ මළ ඉලව් පළාත් සභාවේ මුංගේ බස් ටික හරියට දුවන්නේ නැහැ නේ කියලා මටත් බණිනවා. මම ඔබතුමාගෙන් ඒ ඉල්ලීම ඉල්ලුවේ. මම දන්නවා, ඔබතුමා නිලධාරීන් එව්වා. ඒ නිලධාරීන් එදාට කියලා තමයි එන්නේ. ඔන්න අපි එනවා කියලා. එදාට බස් ටික ෂෝක් එකට දුවනවා. මේ කාර්යය කරන්න. මොකද මිනිස්සුන්ට ඇත්තටම ගමනක් යන්න ගියාම පැය දෙකක් තුනක් යනවා. මිනිත්තු 45 යේ වැඩේට. අර කිව්වා වාගේ මිනිස්සුන්ට සල්ලි දෙනවා. ඔබතුමාගෙන් මම ඉල්ලන්නේ. මේ මාස හතර පහකටවත් අඩුම ගණනේ එක තැනකට Cheker කෙනෙක් දැම්මොත්, එතකොට ඔක්කොම ටික හරියට දුවනවා. එක තැනකට දැම්මොත් ඇති. එක තැනකින් හරියට බස් ටික යවනවා නම් දිගටම වෙලාවට යනවා. අර රුපියල් 50 ක්, 100 ක් දීලා -

අනික් එක ඔබතුමා ගොඩක් මහන්සි වෙලා වැඩ කරන්න උත්සාහ කළත් ඔබතුමා පත් කරගෙන තිබෙන සමහර නිලධාරීන් - ජනාධිපතිතුමාත් ඒ පිළිබඳව ප්‍රශ්න කළා. සමහර නිලධාරීන් ඔබතුමාට අගෞරවයක් වන පරිදි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් අගෞරව වන විධියට වැඩ කරන අය ඉන්නවා. අපි හොඳ නැති අය ගැන කියනවාට වඩා හොඳ අය ගැන කියමු. හොඳ නිලධාරීන් ඉන්නවා, ඔබතුමාත් එක්ක ඉන්න. මම නම් වශයෙන් කියන්න හොඳ නැහැ. ප්‍රවාහන අධිකාරියේ හොඳ නිලධාරීන් ඉන්නවා. ඒ වාගේම බිඳුණු පුටුවෙන් ලොකු සේවාවක් වුණා. මගේ පාසල්ගොඩකට ඒවා හදලා දුන්නා. ඔබතුමාගෙන් මම කවම කවදාවක්වත් පුද්ගලික දෙයක් ඉල්ලා නැහැ. ඉදිරි මාස පහ තුළ ඔබතුමාගෙන් ඉල්ලන්නේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සමූපකාරය ගැන කථා කරන්නේ නැද්ද?

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

සමූපකාර ගැන කථා කරන්න දෙයක් නැහැ. හැබැයි ඒකට දොස් කියන්නත් බැහැ. සමූපකාරයට තරග වදින්න බැහැ. මමත් ව්‍යාපාරිකයෙක්. වෙළෙන්දෙක්. සමූපකාරයට අද තිබෙන වෙළඳ රටාවත් එක්ක තරග කරන්න බැහැ. වැඩ කරන්න ඒ අයට බලතල දෙන්න ඕනෑ. පාඩු විඳගන්න බැහැ. ෂෙඩ්වල ලක්ෂ ගණන් පාඩු කරලා, ඒවායේ වංචා කරන එවුන් දිගටම වැඩ කරනවා. පෙට්‍රල් ෂෙඩ්වල. ඒවාත් නතර කරන්න ඕනෑ. ඒවාත් මිනිස්සු බලාගෙන ඉන්නවා. ඇයි මේ හොරකම් කරන එකා දිගටම වැඩ කරන්නේ කියලා. ඔබතුමා හොඳට මහන්සි වෙලා වැඩ කරන්න උත්සාහ කළාට ඒ නරක නාමය එනවා. නිලධාරීන් කරන වැඩ වලින්. මම නැවත සැරයක් ඉල්ලනවා. ලොකු දෙයක් නොවෙයි. අඩුම ගණනේ දොම්පේ ආසනය තුළවත් දුවන බස් ටික හරියට දුවවන්න.

[ගරු උපාලි ගුණරත්න]

හන්දියක් ගණනේ කොට කොට ඉන්නේ නැතිව. මිනිස්සු හරියට බණිනවා. ඒක තමයි මට තිබෙන ලොකුම ප්‍රශ්නය. මට කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම ස්තූතිවන්ත වෙනවා,. මම ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාව හොඳ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් හැටියට එතුමාව මම අගය කරනවා. එතුමා කෙලින් සිටීම පිළිබඳව අගය කරනවා. එතුමාට ගරු කරනවා. එතුමාට අවශ්‍ය ශක්තිය ඕනෑ වෙලාවක ලබා දෙනවා කියලා මතක් කරමින් මම නවතිනවා.

[පූ.භා. 10.13]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි. මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව දීර්ඝ කාලයක් නියෝජනය කරපු කෙනෙක් හැටියට මේ අමාත්‍යාංශය ගැන කථා කරන අවස්ථාවේ අපේ ගරු ඇමතිතුමා මේ කාර්යභාරය භාරගෙන ඉතාම හොඳ සේවයක් ලබා දෙන්නත්, අපේ ගරු මන්ත්‍රීවරුන් ගැන සොයා බලලා ඒ අයට උපකාර කරන්නත් කටයුතු කරන එක ගැන මගේ ස්තූතිය මම පළමුවෙන්ම පුද කරනවා. මේ වැඩ කටයුතු සාර්ථක කරගන්න ලේකම්තුමිය ඇතුළු ඒ කාර්ය මණ්ඩලයේ සැම දෙනාගෙන්ම ලැබෙන සහයෝගය අපි අගය කොට සලකනවා.

විශේෂයෙන්ම බෙහෙවින්ම අපට බලපාන්නේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය. මේ රටේ තිබෙන A, B පාරවල් ඇරුණාම C, D ගණයට වැටෙන සියලුම පාරවල් නඩත්තු වන්නේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින්. අපේ බල ප්‍රදේශය තුළ කිලෝ මීටර් 1952 ක ප්‍රමාණයක් පළාත් සභාවට නතු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම වෙලා තිබෙන්නේ ඒ කාර්යයන් හරියට නඩත්තු කිරීම, සැකසීම, බොක්කු නඩත්තු කිරීම වැනි දේවල්. ඒ වැඩ පිළිවෙළ තුළදී මෙතෙක් කරපු වැඩ බලපුවාම විශාල ප්‍රමාණයක් අපේ පළාත් සභාව තුළින් සකස් කරලා තිබෙනවා. තව කිලෝ මීටර් 500 ක් පමණ තමයි සකස් කරන්න තිබෙන්නේ. ඉතිරි සියලු දේවල් කාපට් කරලා අංගසම්පූර්ණව හදලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. ඒ වාගේම විශේෂයෙන් අපි විවිධ පාරවල් ලැයිස්තු ගත කරලා තිබෙනවා. 2019 වසරටත් බලාපොරොත්තු වෙනවා, මාර්ග සංවර්ධන අධිකාරියට මිලියන 2700 ක්. නමුත් ඒ මුදල් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමාගේ ඉලක්කයට යන්න බැරි තත්ත්වයක් තමයි ලබන අවුරුද්දේ තිබෙන්නේ. එතුමාට ඒ මුදල් ලැබෙනවා නම්, මීට වඩා විශාල වැඩ කොටසක් කරන්න පුළුවන් කියන එක මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මම අගලවත්ත ආසනය නියෝජනය කරන්නේ. අවිත්තාව - වලල්ලාවිට කොටස පාර හදන්න තිබෙනවා. ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම ගංවතුරට බෙහෙවින් යට වන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ යගිරල ඉහළ කන්ද ප්‍රදේශයත්, යගිරල පන්සල අසළත් අඩි තුනක් හතරක් ප්‍රමාණය ගොඩ කරලා කරන්න පුළුවන් නම් සාමාන්‍ය ගංවතුරකදී ප්‍රවාහනය කරන්න ගමනාගමනය සඳහා, වලල්ලාවිට ප්‍රදේශයේ ඉත්තැපාන දක්වා ගමන් කරන්න, පුළුවන් තත්ත්වයක් ලැබෙනවා. එහෙම වුණොත් ගරු ඇමතිතුමනි, අපේ ප්‍රදේශයේ ජනතාවට විශාල සහයෝගයක් වෙනවා. මොකද විශේෂයෙන්ම අගලවත්ත කොට්ඨාශයේ නිෂ්පාදනාගාරයක් බවට පත් වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම තේ වගාව විශාල වශයෙන් ප්‍රචලිත වෙලා තිබෙනවා. සැම කෙනෙක්ම, සැම ගම්වැසියෙක්ම තේ වගාවේ නියැලෙනවා. ඒ අයගේ තේ ප්‍රවාහනය කිරීමේදී ප්‍රවාහන පහසුකම්, ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කරන්න බෙහෙවින් බලපානවා. ඒ නිසා මාර්ග පද්ධතිය ගැන විශේෂ අවධානය යොමු කරනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පුළුවන් නම් ලබන වර්ෂයට අවිත්තාව - වලල්ලාවිට මාර්ගයේ යගිරල ඉහළ කන්ද ප්‍රදේශයත්, යගිරල පන්සල අසළ ප්‍රදේශයත් අඩි තුනක් හතරක් උස්සලා පාර හදන්න පුළුවන් නම් ඒ ප්‍රදේශයේ ජනතාවට ලැබෙන ලොකු සේවයක් හැටියට මම දකිනවා. විශේෂයෙන්ම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අපි බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. බොහොම කැපවීමෙන් වැඩ කටයුතු කරනවා. මට මතකයි ඊයේ පෙරෙයිදා කුඩලිගම පාලම කැඩිලා ගියා. ඒ මොහොතේම තාවකාලික පිළියම් යොදලා ඒ ස්ථානය සකස් කරගන්න, වාහනයක් යන්න බැරි වුණත් ත්‍රීවිල් එකක් යන්න පුළුවන් තත්ත්වයට ඇති කරලා දුන්නා. ඒ වාගේම මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒවාට කඩිනමින් පාලම් ලබාදෙන්න පුළුවන් නම් ඉතා වැදගත්.

ඒ වාගේම අගලවත්ත ප්‍රදේශයේ හැඩිගල්ල පාලම ඉතා අබලන් තත්ත්වයේ තිබෙනවා. විශාල ජනතාවක් ගමන් කරන ප්‍රදේශයක්. මේ පාලම ලබා දෙන්නය කියලා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. විදේශ ව්‍යාපෘති යටතේ විශාල පාලම් ප්‍රමාණයක් මහ ආණ්ඩුවට ලැබෙනවා. මහ ආණ්ඩුවේ ඇමතිතුමාට විශාල පාලම් ප්‍රමාණයක් ලැබෙනවා. ඔබතුමා ගරු ඇමතිතුමාත් එක්ක කථා කරලා පළාත් සභාවලට - අපට විතරක් නොවෙයි. අනික් ඒවාටත් වැදගත් වෙනවා. ඒ පාලම්වලින් ලැබෙන ප්‍රමාණයක් අපේ පළාත් සභාවලටත් ලබා ගන්න පුළුවන් නම් අපට කඩිනමින්, අපට පාලමක් නැති වුණු වෙලාවක කඩිනමින් ඒක ඇතුළත් කරලා, බොහොම ඉක්මණින් ඒක අපට හදලා නිම කරගන්න පුළුවන්කම ලැබෙනවා. එහෙම නැත්නම් ඔබතුමන්ලා ඉල්ලීම් කරලා, අමාත්‍යාංශ අනුමත කරලා බලලා පාලම ලබා ගන්න කොට මාස ගණනක් යනවා. එහෙම නැත්නම් කෙටි කාලයක් තුළ පාලම් ඉදි කරන්න පුළුවන්. පාලම් එහෙම ඉක්මණින් අපටත් ලබා ගන්න පුළුවන් නම් මීට වැඩිය වේගවත් වැඩ කොටසක් කරන්න පුළුවන් කියන එක මම මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම මම අවධානයට යොමු කරනවා. සමහර කොන්ත්‍රාත්කරුවන් නිසා පළාත් සභාවත් මාර්ග සංවර්ධන අධිකාරියත් අපකීර්තියට පත් වෙනවා. පසුගිය දවස්වල වලල්ලාවිට එහෙම සිද්ධියක් වුණා. කොන්ත්‍රාත්කරුවන් ගැන සොයා බලලා හරියට ලබා දෙන්නේ නැත්නම්, ඒ කොන්ත්‍රාත්කරුවන් කරන ක්‍රියාදාමයන් තුළ අපි අවඥාවට, ජනතා අප්‍රසාදයට ලක් වෙනවා. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. පළාත් සංවර්ධන අධිකාරිය කොන්ත්‍රාත්කරුවන්ට දෙන කොට ඒ ගැන සොයා බලලා කටයුතු කරන්නය කියලා. ඒ වාගේම මම දැක්ක දෙයක් තමයි පසුගිය ගංවතුර වෙලාවේදී මාර්ග සංවර්ධන අධිකාරිය මගින් අපට විශාල ලෙස මුදල් ලැබුණා අවශ්‍ය කටයුතු කරන්න. ඒ අවස්ථාවේ එකම කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත් කිහිපයක් දීම නිසා අපට වැඩ නිම කරගන්න බැරි වුණා. ඒ නිසා අපට ඒ අවස්ථාවේ ලැබුණ මුදලින් උපරිම ප්‍රයෝජන ගන්න බැරි වුණයි කියන එක කනගාටුවෙන් මතක් කරනවා. එවැනි අවස්ථාවල බෙදිලා යන විධියට, කාලයට අනුව කරන්න පුළුවන් ප්‍රමාණයක් ලබා දුන්නා නම් මීට වැඩිය වැඩ කොටසක් අපට කරගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම හදිසි ආපදා අවස්ථාවල මාර්ග සංවර්ධන අධිකාරිය අපට ඉදිරිපත් වෙලා කටයුතු කළා වාගේම මම ගරු ඇමතිතුමාට ස්තූතිවන්ත වෙනවා. අපට හදිසි ආපදා සිදු වුණු වෙලාවේදී ජනතාවට ලබා දෙන්න භාණ්ඩ පවා ගෙනත් දීලා ඒ අවස්ථාවේදී ඔබතුමා අපට සහයෝගය දුන්නා. ජනතාව වෙනුවෙන් සොයා බැලුවා කියලා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. එවැනි කටයුත්තක් කරපු එකම ඇමතිතුමාත් ඔබතුමා විතරක් කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළින් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ස්වයං රැකියා පුහුණු කිහිපයක් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. අද අපට මේ රටේ රැකියා උත්පාදනය වැඩි කරන්න අවශ්‍යයි. විරැකියාව වැඩි වෙලා තිබෙන වේලාවක කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළින්, ඒ ඇති වෙලා තිබෙන දැනුවත් කිරීම තුළින් ස්වං රැකියා කරන පිරිසක් නිර්මාණය කරන්න ලැබීම අපි භාග්‍යයක් කොට සලකනවා. මේක වැඩි දියුණු කරලා විශාල පිරිසක් පුරුදු පුහුණු කරනවා නම්, ඒ තුළින් අපේ රටේ අවශ්‍යතා සපුරන්න, තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නය විසඳන්න ලොකු රුකුලක් වෙනවා කියන එක මම මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම බිඳුණු පුටුව වැඩ සටහන. ඒක ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක්. ගරු අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක එකතු වෙලා මේ පාසල්වල කැඩුණු පුටු ටික හදා ගන්න පුළුවන් නම් විශාල මුදලක් අපට ඉතිරි කරගන්න පුළුවන්කම ලැබෙනවා. ඔබතුමා අපට බිඳුණු පුටුව වැඩ සටහන පාසල්වල ක්‍රියාත්මක කරන්න අවස්ථාව දෙනවා. අපි ඒ අවස්ථාවේදී එම පාසල්වල කැඩුණු පුටු ටික හදලා විශාල ආර්ථික ශක්තියක් ලබා දෙනවා. මුදල් ඉතිරි කිරීමට පුළුවන්කම ලැබෙනවා. ඒක අමාත්‍යාංශයත් එක්ක කථා කරලා සියලුම පුටු ටික හදන්න ඔබතුමාගේ මේ බිඳුණු පුටුව වැඩ සටහන යටතේ අපේ බස්නාහිර පළාතේ කරගෙන ගියොත් මම හිතනවා, අධ්‍යාපන අමාත්‍යාංශයේ විශාල මුදලක් ඉතුරු කරගන්න පුළුවන්කම ලැබෙනවා. ඔබතුමාට රැකියා විශාල ප්‍රමාණයක් ලබා දීමට හැකියාව තිබෙනවා. මේවාට දැව ඕනෑ නම්, අපි දන්නවා පාසල්වල තිබෙන ගස් කොළන් අපි දෙන්නේ දැව සංස්ථාවට. අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දැව කඳන් අපි ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් දැව සංස්ථාවට දෙනවා. ඒ අය විකුණ ගන්නවා. මේ අපේ පුටු ටික හදන්න හරි ක්‍රමවේදයක් හැදුවොත් ඒවාට අවශ්‍ය දැව ලබා ගන්න, අපේ පාසල්වල තිබෙන ගස් ලබා

[ගරු පී.ඩී. අබේරත්න]

ගැනීමට හැකියාව තිබෙනවා. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, අපි ඒ දැව නිකන් ලබා දෙන්නේ. අපට ලාභයක් ලැබෙන්නෙත් නැහැ. අපේ අවුරුදු ගණනක් තිබුණු ගස් කොළන් ලබා දෙන්නේ. දැව සංස්ථාවට නොදී අපට මේක ලබා ගන්න පුළුවන් නම්, දැව සංස්ථාවට දීලා හරි පළාත් සභාවේ කර්මාන්ත දෙපාර්තමේන්තුවට ලබා ගන්න පුළුවන් නම් අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍ය පුටු, ඩෙස්, බංකු, අල්මාරි මේවා ඔක්කොම හදා ගන්න පුළුවන්කම ලැබෙනවා. එහෙම වුණොත් විශාල ආර්ථික ලාභයක් ලබා ගන්න පුළුවවන්කම ලැබෙනවා. අමාත්‍යාංශය තුළින් විශාල රැකියා ප්‍රමාණයක් උත්පාදනය කරගන්න අවස්ථාවක් කරගන්න පුළුවන් කියන එක මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ මේ පොතේ තිබෙන විස්තර බැලුවාම, බිඳුණු පුටුව වැඩ සටහන කියවලා බලන කොට මම දැක්කා, 2015 ත්, 2017 ත් අතර පාසල් 222 ක ඩෙස්, පුටු, බංකු 2628 ක් හැදුවා කියලා තිබෙනවා. මෙය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ගරු ඇමතිතුමනි මේක 2015, 2017 අතර පාසල් 222 ක හැදුවා කියන්නේ, මෙය බෙදලා බැලුවාම එක පාසලකට පුටු 11 යි වැටෙන්නේ. මේ ගාණ වැරැදිද? නැත්නම් මේ ක්‍රියාදමය වැරැදිද? කියන එකයි මම අහන්නේ. ඔබතුමාගේ පොතේ තිබෙන 2015, 2017 බිඳුණුපුටුව වැඩ සටහනෙන් පාසල් 222 කට පුටු හදලා තිබෙන්නේ 2228 යි. එහෙමනම් එක පාසලකට පුටු 11 යි. පුටු 11 ක් හදන්න බිඳුණු පුටුව වැඩ සටහන පාසලකට යනවා නම් ඒක අපරාදයක්. එක්කෝ මේකේ ගණන් වැරැදිද? නැත්නම් ක්‍රියාදාමය වැරැදිද දන්නේ නැහැ. ඒ සඳහා වියදම් කරලා තිබෙන මුදල ලක්ෂ 85 ක්. එතකොට එක පුටුවකට වියදම් වෙලා තිබෙනවා, රුපියල් 3234 ක්. ඒ තරම් මුදලක් වියදම් වෙනවා නම්, මේ ක්‍රමවේදයෙන් වැඩක් වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පුටු සල්ලිවලට ගන්න එක ලාභයි.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

එහෙම වුණොත් පුටු සල්ලිවලට ගන්න එක ලාභයි. මේ ගණන් හරි නම් එක පුටුවකට රුපියල් තුන්දහස් දෙසිය ගණනක් ගිහිල්ලා තිබෙනවා. එහෙමනම් ඒක පාඩුයි. නමුත් 2018 ජූලි 31 වැනිදා වෙන කොට පාසල් 31 ක 4111 ක් පුටු හදලා තිබෙනවා. මම ඒකයි ගණන වැරැදිද කියලා අහන්නේ. 2018 ජූලි 31 වැනිදා වෙන කොට පාසල් 37 ක පුටු 4111 ක් හදන්න පුළුවන් නම් අවුරුදු දෙකකට දෙදහස් ගණනක් හැදුවයි කියන එක අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ. එහෙමනම් මේ තරම් මුදලකුත් යන්න පුළුවන්කමක් නැහැ. ඒ පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒ වාගේම පේෂ කර්මාන්තය, ලුහු ඉංජිනේරු, දැව තාක්ෂණය, මැටි, කොහු, මේ අංශවල වැඩ පුහුණු කරනවා. මම හිතන්නේ මැණික් කපන ඒවා පවා පුහුණු කරන ස්ථාන පවා තිබෙනවා. මේ සම් කර්මාන්තය තුළ සපත්තු නිෂ්පාදනය, කොහු, මැටි කර්මාන්තය මේවායින් අද රැකියා උත්පාදනය ඇති කරන්න පුළුවන්කම තිබෙනවා. මේවා තව තවත් වැඩියෙන් පුහුණු කරලා, ඒ අවස්ථාව ලබා දෙනවා නම් අපේ ජනතාවට හුඟක් රැකියා අවස්ථා ලැබෙනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒ වාගේම ග්‍රාමීය සංවර්ධන සමිති ගැනත් වචනයක් කියන්න ඕනෑ. අද ග්‍රාම සංවර්ධන සමිති ඉතාම ක්‍රියාත්මක සමිති තිබෙනවා. සුළු මුදලක් අරගෙන මහා පරිමාණයේ වැඩ කරන - ගාල්ලේ දැවැන්ත වැඩ පිළිවෙළක් කළා. රුපියල් 20,000 යි ඔබතුමා දෙන්නේ. ලබන අවුරුද්දේ 30,000 ක් දෙන්න බලාපොරොත්තු වෙනවා කියලා තිබෙනවා. ඒ අයට රුපියල් 20,000ක් දුන්නාම ලක්ෂ ගණනක වැඩ කරනවා. ඒ වාගේම තරුණයන් වැඩකට යෙදෙනවා. අද මත්පැන්, කුඩුවලට තරුණයන් ඇබ්බැහි වන යුගයක මේවාගේ දේවල් තුළින් ඒවාට ඇබ්බැහි වීම නවත්වන්න හොඳ උපාය මාර්ගයක් වෙනවා. ඒ නිසා මේ ග්‍රාම සංවර්ධන වැඩ පිළිවෙළේ දී අපි දකිනවා, අද වැඩිහිටියන්ටත් වැඩිය තරුණයන් මේවාට උනන්දු වෙනවා. ඒ නිසා ග්‍රාම සංවර්ධන වැඩවලටත් තරුණයින්ගේ සහභාගීත්වය අරගෙන, ඒ අය තුළින් යම් වැඩ කොටසක් ගන්නවා නම් අපේ ආර්ථිකය ශක්තිමත් වන විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්කම ලබෙනවා. ඒ වාගේම ගමේ සමගිය සමාදානය ඇති වෙනවා. අද අපේ ගම්වල සමගිය

නැති වෙලා, සමාදානය නැති වෙලා අසල්වැසියන් ගැන සොයා බලන්නේ නැහැ. නමුත් මේ වාගේ ශ්‍රම මට්ටමෙන් වැඩ කරන කොට ගමේ අයගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වැඩි දියුණු වෙනවා. අපේ ගම ආරක්ෂා වෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ ඉතාම හොඳ වැඩ පිළිවෙළක්. ග්‍රාම සංවර්ධන සමිතිවලට මීට වඩා වැඩි මුදලක් දීලා ශ්‍රමදාන මට්ටමින් වැඩ කරන වැඩ පිළිවෙළක් හදනවා නම් මේ වාගේ වැඩ කරගන්න පුළුවන්.

ඒ වාගේම නිවාස දෙපාර්තමේන්තුව අපට බෙහෙවින්ම වටිනවා. ලැබෙන මුදල් ප්‍රමාණයෙන් ලොකු වැඩ කොටසක් කරන්න බැහැ. බොහොම සුළු වැඩ කොටසක් කරන්නේ. නමුත් ගරු ඇමතිතුමනි, අපට ලොකු මුදලක් ලැබෙනවා නම්, මහ ආණ්ඩුවෙන් කරනවා වාගේ උදා ගම්මාන හදන්න පුළුවන් වැඩ පිළිවෙළක් මේ පළාත් සභාවට කරන්න බැරිකමක් නැහැ. ලක්ෂ දෙකක්, තුනක් විතර දෙන කොට ලස්සන ගෙයක් නිර්මාණය වෙනවා. ආණ්ඩුවෙන් හදන ගෙවල් අපි දැකලා තිබෙනවා. අපි හදලා තිබෙනවා. ඒ නිසා පළාත් සභාව තුළිනුත් මේ සුළු මුදලක් දිදී යනවාට වැඩිය මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අඩුම වශයෙන් ලබන අවුරුද්දේ අඩුම ගණනේ මේ දිස්ත්‍රික්ක තුනේ ගම්මාන තුනක් හදන්න පුළුවන් -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. සමාවෙන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

කාලය අනුව කථා කරන්න වෙලාවක් නැහැ. ඔබතුමාටත්, ගරු ඇමතිතුමාටත්, ගරු ඇමතිතුමාගේ කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙමින්, ගරු ඇමතිතුමාගේ වැඩ පිළිවෙළ සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 10.26 ]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. අද මේ අයවැය විවාදය ඓතිහාසිකගත වෙනවා. මොකද හේතුව, නව ගොඩනැගිල්ලේ නව ස්ථානයක පවත්වනු ලබන පළමුවැනි අයවැය විවාදය. ඇත්තටම ඒ ගැන අපේ ගරු ප්‍රධාන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම අපේ ප්‍රධාන ලේකම්තුමා, ඒ වාගේම ප්‍රධාන ඉංජිනේරු රණසිංහ මහත්මා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම ඊයේ දවසෙත් අපට මතකයි. අපේ ප්‍රසන්න රණතුංග හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා මෙම ස්ථානයට ඇවිල්ලා, ඊයේ දවසේ පළමුවැනි වතාවට ආවේ. එතුමාත් මෙම ස්ථානය බලලා සතුටු වුණා. මෙයට සහයෝගය දක්වපු සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මම වෙන එක වැය ශීර්ෂ එකකටවත් කථා කළේ නැහැ. අද අපේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ මාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය තිබෙන්නේ. ඇත්තටම මේ අමාත්‍යාංශය තමයි ගරු ප්‍රධාන ඇමතිතුමාට වැඩිය ලොකු අමාත්‍යාංශයක් තිබෙන්නේ කියලා මම දකින්නේ. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ පළාත් සභාවේ තිබෙන ලොකුම අමාත්‍යාංශය හැටියට අපි දකිනවා. මේ කථා කරපු සියලු දෙනා කිව්වා වාගේ එතුමා නිහතමානීව කරන්න පුළුවන් කාර්යය කළා. ඒකට ලොකු ශක්තියක් සහ සහයෝගයක් විශේෂයෙන්ම වර්තමාන ලේකම්තුමිය ලබා දුන්නා. ඒ වාගේම අධ්‍යක්ෂතුමියන්ලා විශාල පිරිසක් ඉන්නවා. සියලුදෙනාම ඒ ශක්තිය දෙනවා වාගේම පෞද්ගලික කාර්ය මණ්ඩලය, පෞද්ගලික ලේකම් නුවන් මහත්මයා, ඒ වාගේම වසන්ත, කිත්සිරි මහත්වරු ලොකු ශක්තියක් දුන්නා. ඒ අය දන්නවා ගරු ඇමතිතුමාගෙන් මොනවා හරි ගිලිහෙනවා නම්, අඩු වෙනවා නම් ඒක නිවැරැදි කරලා මහජන නියෝජිතයින් සමග මන්ත්‍රීවරුන් සමඟ කොයි ආකාරයෙන්ද ගනුදෙනු කරන්නේ කියලා. ඇත්තටම ඒ ගැන සතුටු වෙනවා.

විශේෂයෙන්ම අපට ලොකු ගැටලුවක් තිබෙනවා. පළාත් මාර්ග ගැන කථා කරන කොට 2014 I -road ව්‍යාපෘතිය තුළ අපේ පළාත් සභාවේ විශාල පාරවල් ප්‍රමාණයක් ඒ ව්‍යාපෘතියට ඇතුළත් වුණා. පසුගිය අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලය තුළ දී ආසියානු සංවර්ධන ණය ආධාර ක්‍රමය යටතේ ලැබුණු ඒ ණය ආධාරයක් අපට ගෙවන්න ඕනෑ. නමුත් අද අපේ සමහර පාරවල් බෝඩ් එකට පමණක් සීමා වෙලා තිබෙනවා. මිලියන මෙච්චරයි කියලා තිබෙනවා. හදපු පාරවල් ප්‍රමිතියට නැහැ. කවුරුත් ඒකට වග කියන්නේ නැහැ. අන්තිමට අපට තමයි ඒක භාර අරගෙන වග කියන්න වෙන්නේ. ඒ කරන කාලය තුළ අපේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ ගැන නිරීක්ෂණයක්

[ගරු ලලිත් වර්ණකුමාර]

නැහැ. ඇත්තටම කරපු ටිකේ අසාර්ථක වෙලා තිබෙනවා වාගේම නමට විතරක් මුදල් ප්‍රතිපාදන වෙන් වෙලා අද ඒක බෝඩ් එකට පමණක් සීමා වෙලා තිබෙනවා. මම කියන්නේ මේ මුදල් අපරාදේ. මේ ණය අපි ආපසු ගෙවන්න ඕනෑ. ඒවාට වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ඒ වාගේම අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා මතක් කළා. අපේ බුලත්සිංහල ආසනය දුෂ්කර ආසනයක්. අපේ මුස්ලිම් ගම්මානයක් තිබෙනවා. වේයන්ගල තිබෙන පාලම. හදිසියේ ගිලා බැස්සා. යන්න බැහැ. ඒ වෙලාවේ පුළුවන් ආකාරයට විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික් ප්‍රධාන ඉංජිනේරු තෙන්නකොන් මහත්මයා. ඒ වාගේම අපේ හොරණ ඉංජිනේරුතුමිය මැදිහත් වෙලා ඒ පුළුවන් දේ කළා වාගේම මම ඉල්ලීමක් හැටියට කරන්නේ, මේ එන මුල්ම ප්‍රතිපාදනවලින් මේ පාලමට මුදල් ප්‍රතිපාදන වෙන් කරලා දෙන්නය කියන එකයි. මොකද හේතුව, එතැන මුස්ලිම් ජනතාව විශාල ප්‍රමාණයක් වාගේම අපේ ප්‍රධාන මාර්ග දෙකක් සම්බන්ධ කරන පාරක්. විශාල ජනතාවක් යනවා. ඒ නිසා මේ අවස්ථාවේදී එම ඉල්ලීමත් කරනවා.

ඒ වාගේම තමයි වෙනදාට නම් මේ අමාත්‍යාංශය තුළ අපි දකින්නේ, ගොඩක් වෙලාවට සමූපකාර ප්‍රශ්න තමයි එන්නේ. සමූපකාර ප්‍රශ්න නැතිවා නොවෙයි. ඇත්තටම දැන් නම් ටිකක් අඩුවෙන් එන්නේ. මගේ ආසනයේත් තිබෙනවා සමූපකාර දෙකක්. මම නම් කවදාවක්වත් ඇඟිලි ගහන්නෙත් නැහැ. යන්නෙත් නැහැ. සොයන්නෙත් නැහැ. ඕනෑ විධියට කරගන්න කියලා දාලා තිබෙනවා. ඔහොම ඇඟිලි ගහන කොට තමයි ඇත්තටම ඒවායේ අඩුපාඩු මතු වෙලා ප්‍රශ්න ඇති වෙන්නේ. ඕනෑ විධියට කරගන්න කියලා දාලා තිබෙනවා වාගේම - හැබැයි අද වෙන දෙයක් ගැන මේ සභාව ගොඩක් කථා කළා. ඒ බස් රථ ගැන, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ගැන. මම දන්නේ නැහැ ඇයි කියලා. ඒක අපට සන්තෝෂ වෙන්න පුළුවන් ආකාරයට නැහැයි කියලයි මම දකින්නේ. මොකද සමූපකාරය ගැන කථාව අඩුවෙන්, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ගැන වැඩියෙන් කථා කරන්නේ මොකද කියන එක අපි දන්නේ නැහැ. මොකද, මම මීට පෙරත් මෙම පළාත් සභාව තුළ අයවැය විවාදයේදී අපි කිව්වා අඩුම ගණනේ මේ පස්වරු හයෙන් පස්සෙවත් බස් රථ ටික දුවවන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. මේ සෙනඟ ඉන්න වෙලාවට විතරක් නොවෙයි. සේවාවක් හැටියට ඒ දේ කරන්න කියලා. නමුත් ඇත්තටම ඒවා සිද්ධ වෙන්නේ නැහැ. නමුත් ඒ වැඩ පිළිවෙළ තුළ පළාත් සභාවේ අපට අපකීර්තියක් ඇති වෙනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඒකේ සභාපතිතුමා ඉන්නේ මගේ ආසනයේ. එතුමා ගන්නේ ඇමතිතුමාටත් එහා ගිය ක්‍රියා මාර්ග. ඒ කෙසේ ගත්තත් ඇමතිතුමා ඔළුව පාවිච්චි කරපු නිසා එතුමාට අද හයිය දෙන්න පුළුවන්කම තිබෙනවා. මොකද, පසුගිය අපේ රැස්වීම් අවස්ථාවකදී අපි දැක්කා බස්වලට දාපු නීති රීති එක්ක ඇමතිතුමා ඒක ප්‍රායෝගිකව, ගරු මහ ඇමතිතුමාත් එක්ක හිටපු නිසා අද අපේ ඇමතිතුමාට ඒ ශක්තිය දෙන්න පුළුවන්. සභාපතිතුමා එදා නොසිටියත්. හැබැයි, අද සභාපතිතුමන්ලාට ඔය තනතුරු කරන්න අපි තමයි මෙතැන ශක්තිය දෙන්නේ කියන එක මතක් කරන්න ඕනෑ. ඔය සභාපතිතුමාට ඇත්තටම ඔය තනතුරු දරන්න පුළුවන්කමක් නැහැ. සුදුසු නැහැ. මොකද අපි දන්නවා බුලත්සිංහල ප්‍රාදේශීය සභාව තුළ දී අර අපේ පළාත් සභාවෙන්ම කරපු මාර්ගයක කිසි ප්‍රමිතියක් නැහැයි කියලා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, PRD එකෙන් පරීක්ෂණ කරලා ඒ පාරට ලක්ෂ 70 ක් ආපසු ගෙවන්න කියලා නීතියක් දැම්මා. ලක්ෂ 70 ක් එතුමා ගෙවන්න ඕනෑ. කිසිම නිලධාරීයෙක් සම්බන්ධ කරනොගෙන -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එවැනි තනතුරු දරමින් තමයි ඔය දේ කරන්නේ. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ ගරු ඇමතිතුමාට යටහත්පහත්ව කටයුතු කළොත් ගොඩ යන්න පුළුවන්. මේ ප්‍රශ්නවලින් ගොඩක් නිදහස් වෙන්න පුළුවන් කියන එක මතක් කරමින්, අවස්ථාව දුන්නාට සියලු දෙනාටම මා ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.32 ]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අපේ ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදීත් කිව්වා, අයවැය විවාදයකදී බොහෝ වෙලාවට කථා කරන්නේ සමූපකාරය ගැන. හැබැයි, අද වර්තමානයේ සමූපකාර ව්‍යාපාරය ගැන කවුරුත් මන්ත්‍රීවරුන්ට කථා කරන්න උවමනාවක් වුණේ නැහැ. හේතුව තමයි, බහුතරයකට මේ සමූපකාරය ගැන කථා කරලා එපා වෙලා තිබෙන්නේ. සමූපකාර ව්‍යාපාරය ලංකාවේ බිහි වෙන්නේ මැණික්හින්නෙන්. 1911 දී. ඊට පස්සේ බණ්ඩාරනායක මහත්තයාගේ ආණ්ඩුවක් තුළ සමූපකාර ව්‍යාපාරය මිනිස්සුන්ට සහන දෙන්න, මිනිස්සුන්ගේ ජීවිත නගා සිටුවන්න, මිනිස්සුන් තුළ රටේ මිල පාලනයක් කරන්න බැරි අවස්ථාවකදී මිල පාලනය කරන්න, මේ සමූපකාර ව්‍යාපාරය පෝෂණය වෙනවා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ සමූපකාර ව්‍යාපාරය මිනිස්සු වෙනුවෙන් ශක්තිමත් කර ගෙන ඉස්සරහාට ගෙනියනවා. විවෘත ආර්ථිකය ආවාට පස්සේ සමූපකාරය යම් බිඳ වැටීමකට ලක් වුණාය කියන කාරණය පිළිගන්නවා. හැබැයි, ඒ සමූපකාර ව්‍යාපාරය තුළ පසුගිය 2015 වන තෙක් බස්නාහිර පළාතේ සමූපකාර ව්‍යාපාරය හොඳට තිබුණා. සමාජිකයාගෙන් හැදෙන සමූපකාර ව්‍යාපාරය කාරක සභාවලට පත් වෙලා, මහ සභාවට ඇවිල්ලා, මහා සභාවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් වෙලා, අද ඒ හරහා සභාපතිවරු බවට පත් වුණු, අධ්‍යක්ෂවරු බවට පත් වෙලා තමන්ගේ දේශපාලනය ආරම්භ කරපු මන්ත්‍රීවරු ගණනාවක් මේ බස්නාහිර පළාත් සභාවේත් ඉන්නවා. හැබැයි, ඉතාමත් කනගාටුයි. අද වර්තමාන සමූපකාර කොමසාරිස්තුමාගේ ක්‍රියාකලාපය හින්දා බස්නාහිර පළාතේ සමූපකාර ව්‍යාපාරය බින්දුවට බැහැලා තිබෙන්නේ. සමූපකාරය, අද සාමාජිකයාට වගකියන්නේ නැති වන විධියට සමූපකාරය විනාශ කරලා තිබෙන්නේ. බස්නාහිර පළාතේ කොමසාරිස්තුමාට අමතකයි. එතුමාට තිබෙන්නේ මේක නියාමනය කරන්න මිසක් ඒකට අයිතිවාසිකම් කියන්න නොවෙයි. අද එතුමා මේ බස්නාහිර පළාතේ සියලුම සමූපකාරවල අයිතිකාරයා බවට පත් වෙලා. එතුමාට අවශ්‍ය නිලධාරීන් පත් කර ගෙන, බහුතරයක් සමූපකාරවල එතුමාට ඕනෑ විධියට පාලනයක් කර ගෙන යනවා. සමූපකාර අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉවත් කරන්න අවශ්‍ය නම් - එතුමාට නමාශීලී නැති අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබෙනවා නම්, එතුමා කියන දේට ඇහුම්කන් දෙන්නේ නැත්නම් ඒ නිලධාරීන්ට පරීක්ෂණ එවනවා. පරීක්ෂණ එවලා, ඒ පරීක්ෂණ තුළින් ඒ අයව වැරදිකාරයෝ කරලා එතුමාට අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල පත් කර ගෙන අවුරුදු තුන හතරක් සමූපකාර ව්‍යාපාරය එතුමාගේ නිලධාරීන් හරහා තමයි ක්‍රියාත්මක කරන්නේ. මේක ඉතාමත් ශෝචනීයයි. මේක ඉතාමත් කනගාටුදායකයි. මම හිතනවා, කොමසාරිස්කමේ ඉන්න සුදුසු නැති පුද්ගලයෙක් තමයි අද බස්නාහිර පළාතේ කොමසාරිස් පුටුවේ වාඩිවෙලා ඉන්නේ. මිනිස්සු ගැන හැඟීමක් තිබෙන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාව කියලා කියන්නේ මිනිස්සු බහුතරයක් ජීවත් වන පළාත් සභාවක්. ඒ තුළ සමූපකාර ව්‍යාපාරය තරම් ඉහළට යන්න පුළුවන් තැනක් නැහැ. ගං වතුරක් එන කොට, නාය යන කොට , සුනාමි එන කොට, රටේ ව්‍යසනයක් ඇති වන හැම වෙලාවකදීම සමූපකාර ව්‍යාපාරය හරහා තමයි සහන ටික අපට දෙන්න පුළුවන්කම ලැබුණේ. ඒ නිසා සමූපකාර ව්‍යාපාරය අපට අහකට දාන්න බැහැ. තරඟකාරීත්වයට මුහුණ දෙන්න බැහැයි කියලා අහක දමන්න පුළුවන් ව්‍යාපාරයක් නොවෙයි, සමූපකාර ව්‍යාපාරය කියන්නේ. ඊයේ පෙරේයිදා ලැහැස්ති වෙනවා, මේක ස්වයං පාලනයට දෙන්න. කඩ ටික ස්වයං පාලනයට දෙන්න. කොමසාරිස්තුමා දන්නේ නැහැ, සමූපකාර ව්‍යාපාරයේ අරමුණ මොකක්ද කියලා. සමූපකාර ව්‍යාපාරය තිබෙන්නේ පෞද්ගලික ආයතන එක්ක තරඟ කරන්න නොවෙයි. ගරු සභාපතිතුමනි, සමූපකාර ව්‍යාපාරය තිබෙන්නේ, ගමේ මිනිහාට කරදරයක් වෙන කොට, ගමේ මිල පාලනය කර ගන්න බැරි වෙන කොට රජයක් හැටියට, පළාත් සභාවක් හැටියට ඒ මිල පාලනය කර ගන්න පුළුවන් ආයතනයක් හැටියට ක්‍රියා කරවීමයි.

ඒ නිසා ඉතාමත් කනගාටුවෙන් කොමසාරිස්තුමාගේ මේ ක්‍රියාකලාපය හෙලා දකිනවා වාගේම, මම යෝජනාවක් කරනවා. අද වන කොට සමූපකාරය විනාශ කරලා, කාලා ඉවරයි විතරක් නොවෙයි. හෙට අනිද්දා වන කොට බස්නාහිර පළාත් සභාවම විනාශ වෙනවා, මේ සණස ව්‍යාපාරයත් එක්ක අපි කරන ගනුදෙනුවත් එක්කලා. මේ සණස ව්‍යාපාරය - මම ගිහින් කොමසාරිස්තුමාව හම්බ වෙනවා. හිටපු සභාපතිතුමා වත්තෙමුල්ල සණසේ කෝටි 75 කට ආසන්න මුදලක් හොරකම් කරලා. අද වන කොට විගොඩ සණසේ කෝටි 65 කට ආසන්න ප්‍රමාණයක්. අද පොලීසිවල නඩු තිබෙනවා, මේ සභාපතිවරුන්ට විරුද්ධව. අපි කොමසාරිස් හම්බ වුණාම කියනවා, නියාමන අයිතිය විතරයි. කරුණාකරලා නියාමනය, අයිතිය විතරයි නම්

[ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන]

තිබෙන්නේ ගරු ඇමතිතුමනි, මේ සමූපකාර සණසෙන් ඉවත් වෙන්න. බස්නාහිර පළාත් සභාව ඉවත් වෙන්න. ඇයි මේ කුණු නාමයක් අපි ගා ගන්නේ? මොකටද අපි කුණු නාමයක් ගා ගන්නේ? නියාමනය, අයිතිය විතරයි නම් තිබෙන්නේ මේ සණස ව්‍යාපාරයෙන් අයින් වෙන්න. මිනිස්සු ගිහිල්ලා තැන්පත් කරන්නේ, බස්නාහිර පළාත් සභාව මේකට වගකියනවා කියන විශ්වාසයට. ඒ නිසා ඒ විශ්වාසය කඩන්න එපා. බස්නාහිර පළාතේ ජීවත් වන මිනිස්සුන්ගේ විශ්වාසය කඩන්න එපා. කරුණාකරලා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරන්න. සණසේ අපට මුකුත් කරන්න බැහැයි කියලා ඔබතුමා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරන්න. මේක එසේ මෙසේ කාරණාවක් නොවෙයි.

තව එක කාරණාවක්, එක යෝජනාවක් කරනවා. කරුණාකරලා ප්‍රඥප්තියක් හදලා එක්කෝ සණස අපේ පාලනයට ගන්න. එහෙම නැත්නම් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරලා සණස අයින් කරන්න. සණසෙන් ඉවත් වෙන්න. ඉතාමත් කනගාටුයි මේ අමාත්‍යාංශය ගැන. ඇමතිතුමා බොහොම නිහතමානීයි. ඉතාමත් හොඳයි. හැබැයි, අපට ඕනෑ වැඩ. 2014 න් පස්සේ බස්නාහිර පළාත් සභාවට අයිති එක මාර්ගයක්වත් කාපට් කර ගන්න අපට බැරි වුණා. මීරිගම ඉතිරි වුණේ, එකම එක පාරයි. ඇමතිතුමාට දහස් වාරයක් කිව්වා, ඒ පාර කාපට් කරලා දෙන්නය කියලා. එකම එක ඉල්ලීමයි කළේ. මධ්‍යම රජයෙන් සල්ලි එවනවා. අරෙහෙන් සල්ලි එනවා, මෙහෙන් සල්ලි එනවා කියලා කිව්වාට ඇමතිතුමාටත්, ඒ වාගේම අපි බොහොම හිතවත් බණ්ඩාරනායක මහත්තයා. එතුමාටත් බැරි වුණා ඒ ඉතිරි වුණු එක මාර්ගය අවුරුදු තුනක් තිස්සේ කාපට් කරලා මීරිගම මිනිස්සුන්ට දෙන්න. ඉතාමත් ශෝචනීය තත්ත්වයක්.

ගරු ඇමතිතුමාගේ හොඳක් කියන්නේ නැතිව හොඳ නැහැ. ඒ නිසා මේ කථාව කියලා මගේ කථාව අවසාන කරනවා. එතුමා මහන්සි ගන්නවා. බිඳුනු පුටුවට දැතේ සවිය කියන වැඩ සටහන.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ කාලය අවසන්. ඇමතිතුමාට හානිය වෙන්නේ. එතුමාට වෙලාව නැහැ. ඒ නිසා කථාව අවසන් කරන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මම යෝජනා කරනවා. මේ වැඩ සටහන දිගටම ක්‍රියාත්මක කරන්න. මීට වඩා මුදල් ප්‍රතිපාදන යොදවන්න කියලා යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, කෙනෙක් කථා කළාම ඒක ස්ථිර කරන්න වාගේ සම්ප්‍රදායක් මේ සභාව ඇතුළේ තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

නැහැ. එහෙම නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මොකද, එතුමියගේ කථාව මට ස්ථිර කරන්න ඕනෑ. මොකද, සමූපකාර ගැන කියපු ඒවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔබතුමා හිටපු ඇමතිවරයෙක් හැටියට තේරුම් ගන්න කෝ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

බබා වෙන්න එපා. සභානායක බබා වෙන්න හදනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

කවුද ඒ පොලොස් කොට්ටෝරුවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මීළඟට ගරු ඇමතිතුමාට අවස්ථාව.

[පූ.භා. 10.38 ]

**ගරු ලලිත් වනිගරත්න** (ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Fisheries, Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, 2019 වර්ෂය සඳහා අප අමාත්‍යාංශය වෙනුවෙන් පක්ෂව හා විපක්ෂව කරුණු ඉදිරිපත් කළ මැති ඇමතිවරුන්ට ප්‍රථමයෙන්ම මගේ ස්තුතිය පුද කර සිටිනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද කරුණු ඉතා සැලකිල්ලෙන් යුක්තව සිහි තබා ගනිමින් ඉදිරි වර්ෂය තුළද අමාත්‍යාංශයේ කටයුතු සාර්ථක කිරීමට අවශ්‍ය මග පෙන්වීමට මා බලාපොරොත්තු වන බව ප්‍රකාශ කර සිටිනවා. ගරු සභාපතිතුමනි, 2018 වර්ෂයතුළ ප්‍රමාණවත් උපදේශක කාරක සභා රැස්වීම් ගණනාවක් පැවැත්වීමට අප අමාත්‍යාංශයට හැකි වුණා. ඒවාට සහභාගී වූ මැති ඇමතිවරු විසින් ඉදිරිපත් කළ යෝජනා හා අදහස් අප අමාත්‍යාංශයේ වැඩ කටයුතු නිවැරදිව කර ගෙන යෑමට බොහෝ රුකුලක් වූ බව ඉතා නිහතමානීව මම පිළිගන්නවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න. අනවශ්‍ය ඝෝෂා වැඩියි. නිශ්ශබ්ද වන්න.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ජනතාවගේ ජීවනාලිය බඳු ප්‍රවාහන සේවය නිසි පරිදි ක්‍රියාත්මක කරවීමට විශාල වගකීමක් අප අමාත්‍යාංශය වෙත පැවරී ඇත. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හරහා බස්නාහිර පළාත තුළ ප්‍රවාහන ක්ෂේත්‍රයෙන් දියුණුව සඳහා මෙන්ම මගී පහසුව සඳහා මෙම වසර තුළ ගරු මන්ත්‍රීතුමන්ලාගේ මග පෙන්වීම හා ඉල්ලීම පරිදි ප්‍රමාණවත් නවීන පන්නයේ බස් මගී ආවරණයක් ඉදි කිරීමට ද හැකි වී තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික බස් රථ රියදුරන් හා කොන්දොස්තරවරුන් විසින් ලබා දෙන සේවාව අගය කිරීම සඳහා අප මේ වන විට ඔවුන් හා සාකච්ඡා කර ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම උදෙසා රක්ෂණ ආවරණයක් ආරම්භ කිරීමට වැඩ කටයුතු සකස් කර තිබෙනවා.

ඒ වාගේම මාර්ග බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය පිළිගත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් ලබා දීමට හැකි වුණා. ගරු සභාපතිතුමනි, එමෙන්ම මගී ජනතාවට වඩාත් හොඳ ප්‍රවාහන සේවයක් ලබා දීමේ අරමුණෙන් බස් රථ සේවකයින් වෙනුවෙන් පුහුණු වැඩ සටහන් රාශියක් පසුගිය කාලයේදී පැවැත්වීමට හැකි වුණා. ගරු සභාපතිතුමනි, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බස්නාහිර පළාත තුළ කාපට් අතුරා සකස් කරන ලද මාර්ග පද්ධතිය 75% ක් දක්වා ඉහළ නංවා ගැනීමට 2018 වසර තුළ හැකි වුණා. ඒ වාගේම බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග නඩත්තුව හා සංවර්ධනය ක්‍රමවත්ව පසුගිය වසර තුළ සිදු කිරීමට හැකියාවක් ලැබුණා.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළින් බස්නාහිර පළාතේ කර්මාන්ත නගා සිටුවීමට විවිධ වැඩ සටහන් රාශියක් පවත්වන ලද අතර, විශේෂයෙන්ම එම දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වුණු බිඳුනු පුටුවට දැතේ සවිය වැඩ සටහන බොහෝ දෙනාගේ පැසසුමට හේතු වුණු වැඩ සටහනක් බවට පත් වුණා. මෙකී වැඩ සටහන හරහා 2018 වසර තුළ පමණක් මිලියන 4.5 ක් වැය කර පාසල් 100 කට ආසන්න ප්‍රමාණයක කැඩුණු ඩෙස් පුටු අලුත්වැඩියා සිදු කිරීමට හැකියාව ලැබුණු බව දැන්වීමට කැමැත්තෙමි. ගරු සභාපතිතුමනි, 2018 වර්ෂය තුළදී සමූපකාර සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමට අවශ්‍ය පියවර ගත්තා. මේ අනුව පසුගිය වසර තුනක කාලය තුළ දෙවරක් සමූපකාර සේවකයින්ගේ වැටුප් වැඩි වුණා. මේ තුළින් බස්නාහිර පළාතේ සමූපකාර සේවකයින් 12,000 කට අධික පිරිසකට තම ජීවන තත්ත්වය උසස් කර ගැනීම සඳහා යම් ආර්ථික ප්‍රතිලාභයක් ලබා දීමට අපට හැකි වුණා. තවද, වෙළඳපොල තුළ පවතින තරඟකාරීත්වය හා නවීකරණයට මුහුණ දීමට නොහැකි වීම මගින් සමූපකාර සමිතිවල පාරිභෝගික අංශ කඩා වැටීම වැළැක්වීම සඳහා දිගු කාලීන වැඩ සටහන් ආරම්භ කිරීමට අපේක්ෂා කරනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු ඇමතිතුමා කියන දේවල් ඇහෙන්නේ නැහැ. පෞද්ගලික කතා නවත්වන්න. එක සභාවයි තිබෙන්නේ.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය සමගාමීව බස්නාහිර පළාත් සමුපකාර සාමාජිකයින් හා සේවකයින් සහභාගී කර ගනිමින් ගෙවතු වගා වැඩ සටහන් පසුගිය කාලය තුළ ක්‍රියාත්මක කළ අතර, එය තවදුරටත් පවත්වා ගෙන යැමට මෙම වසර තුළදී අපේක්ෂා කරනවා.

ගරු සභාපතිතුමනි, අප අමාත්‍යාංශයේ ඉතා වැදගත් විෂයක් තමයි ග්‍රාම සංවර්ධන අංශය. එමගින් බස්නාහිර පළාතේ ජන ජීවිතය නගා සිටුවීම සඳහා ප්‍රමාණවත් දායකත්වයක් මෙම වසරේදී ඉටු කිරීමට හැකි වුණා. සමස්ථයක් ලෙස ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය සාමාජීය දියුණුව සඳහා බොහෝ පියවර ගණනාවක් ග්‍රාම සංවර්ධන අංශ තුළින් ඉටු වන බව සතුටින් ප්‍රකාශ කරන්නට කැමැතියි. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කාලය අවසන්. මට කාලය දික් කරන්න බැහැ. කොහොමටවත් කාලය දික් කරන්න බැහැ.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මෙම අයවැය විවාදයේදී මම හිතන්නේ පක්ෂව හා විපක්ෂව මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයක් අදහස් ප්‍රකාශ කළා. මම විශේෂයෙන්ම ඒ පිළිබඳව අපේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරු හා සාකච්ඡා කරමින් -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු ඇමතිතුමා, සමාවෙන්න. මට කාලය දෙන්න බැහැ. කථාව නවත්වන්න. ඡන්දයට යන්න ඕනෑ.

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ඒ සඳහා අපි හැකි ඉක්මණින් විසඳුමක් ලබා දෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන, වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන වැය ශීර්ෂයන් සභා සම්මත කිරීමේ අවස්ථාව. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ශීර්ෂ අංක 107 පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, පක්ෂව 54 යි, විපක්ෂව 33 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 107 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 33 against and 00 decliners.*

***ශීර්ෂ අංක 121 පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, පක්ෂව 54 යි, විපක්ෂව 33 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 121 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 33 against and 00 decliners.*

***ශීර්ෂ අංක 122 පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, පක්ෂව 54 යි, විපක්ෂව 33 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 122 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 33 against and 00 decliners.*

***ශීර්ෂ අංක 123 පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, පක්ෂව 54 යි, විපක්ෂව 33 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 123 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 33 against and 00 decliners.*

***ශීර්ෂ අංක 124 පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, පක්ෂව 54 යි, විපක්ෂව 33 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 124 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 33 against and 00 decliners.*

***ශීර්ෂ අංක 125 පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, පක්ෂව 54 යි, විපක්ෂව 33 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 125 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 33 against and 00 decliners.*

***ශීර්ෂ අංක 103 පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, පක්ෂව 54 යි, විපක්ෂව 33 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 103 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 33 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

මීළඟට සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 වැය ශීර්ෂයන් සම්බන්ධව විවාදය දැන් ආරම්භ වෙනවා. මම විවාදය ආරම්භ කිරීම සඳහා -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම උදේ මේ බ්ලේසර් එක පැළඳගෙන එන කොට ටයි එක ඇඳගෙන ආවේ නැහැ. එතකොට ෆයිරෝස් මන්ත්‍රීතුමා කිව්වා, ටයි එක දා ගෙන තමයි එන්න ඕනෑ කියලා, එතැන ලොකු ආන්දෝලනයක් ඇති වුණා. මම දන්නේ නැහැ. මම ඔබතුමාගෙනුත් ඊට පස්සේ ඇහුවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් හොඳයි. දැන් ලස්සනයි. වාඩිවෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙච්චරකල් දැනගෙන හිටියේ නැද්ද?

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

දැනගෙන හිටියේ නැහැ. නමුත් සභාවේ අනික් අයත් ඉන්නවා.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

දැන් හොඳයි ලු. ලස්සනයි ලු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔය පැත්තේ කට්ටියට අඳින හැටිත් උගන්වන්න ඕනෑ. ඇත්ත කථාව.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

දැන් ටයි නැතිව අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. මොකක්ද මේකේ තේරුම ඒකයි අහන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක ටියුනික් කොලර්.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

දන්නේ නැතිදේ තමයි අහන්නේ. ටියුනික් කොලර් එක පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මට මේකට කාලය දෙන්න බැහැ. සභාවේ Full suit එක කියන්නේ, Tie එක, Shirt එක, Coat එක, ඔය සියල්ලක් ඔබතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉතින් ටයි එක නැති කෙනෙක් ඉන්නවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ටියුනික් කොලර් එක පුළුවන්ද කියන එක අහන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

යුරෝපීය ඇඳුම අංගසම්පූර්ණ වෙන්න ඕනෑ.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

ටයි එක සහ ළමයා කියලා පොතක් තිබෙනවා. ඒක කියවලා එන්න.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

පොත කියවලා තමයි ආවේ. ටියුනික් කොලර් එක පුළුවන්ද? (බාධා කිරීම්)

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

උපදේශක පොතක් තිබෙනවා. ඒක බලන්න.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

නීතිය කොහේද තිබෙන්නේ කියන්න. පොතේ නැහැ.

ගරු මෙරිල් පෙරේරා
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා අහපු ප්‍රශ්නය හරි. මේ සභාවට එනවා නම්, ජාතික ඇඳුම ඇඳගෙන එනවා නම් ජාතික ඇඳුම ඇඳගෙන එන්න ඕනෑ. එහෙම නැතිව Coat එක පළඳිනවා නම් Tie දා එක ගෙන එන්න ඕනෑ. දැන් රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඉන්නේ කෝට් එක දාලා. එහෙම නම් ෂර්ට් එක ඇඳලා ටයි එකක් දාන්න ඕනෑ. ටියුනික් කොලර් එක ඇඳලා කෝට් එක දාන්න බැහැ. රීතිය බලන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

ගරු මන්ත්රීතුමා, මම රීතිය කියන්නම්. *"සභා රැස්වීමට සහභාගී වන ගරු මන්ත්‍රීවරුන් යුරෝපීය ඇඳුම හෝ ටියුනික් කොලරය සහිත අත් දිග කමිසය හා කලිසම හෝ ජාතික ඇඳුම වැනි නිසි ඇඳුමකින් හෝ සැරසී සිටිය යුතුය."*

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේකේ කිසි අනිසි කමක් නැහැ. මේක හරි. ටියුනික් කොලර්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කෝට් එක දාලා ටියුනික් කොලර් අඳින්න බැහැ. එහෙම නම් යුරෝපීය ඇඳුමට ටයි එක දාගෙන එන්න එපැයි. ලේකම්තුමාගෙන් පැහැදිලිව අහන්න. යුරෝපීය ඇඳුම කියන්නේ මොකක්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

එතුමා ඇඳලා තිබෙන්නේ හයිබ්‍රිඩ් ඇඳුමක්. එකක් ගැලෙව්වා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැන් හරි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

මට මීට වඩා කාලය දෙන්න බැහැ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මෙපමණ ප්‍රශ්න තිබෙන මේ රටේ, මේ ඇඳුම පිළිබඳව ෆායිස් මන්ත්‍රීතුමා කථා කිරීම පිළිබඳව කනගාටු වෙනවා.

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 105** | - | **සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 113** | - | **සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 114** | - | **ආයුර්වේද දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 115** | - | **සමාජ සේවා දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 116** | - | **පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව** |
| Head No 105 | - | Ministry of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs |
| Head No 113 | - | Department of Health Services |
| Head No 114 | - | Department of Ayurveda |
| Head No 115 | - | Department of Social Services |
| Head No 116 | - | Department of Probation and Child Care Services |

***[සංකේත කපා හැරීම ]***
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාතයාංශයේ අදාළ ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යටතේ සංකේත වශයෙන් රු. 10/- ක මුදලක් අඩු කළ යුතු යැයි යෝජනා කරනවා.

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question proposed again.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 10.56]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට මුලින්ම අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව විපක්ෂ නායකතුමාට මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කිරීමේදී විශේෂයෙන්ම මේ මොහොතේ රටේ සෞඛ්‍ය ගැන කථා කරන්න කලින් රටේ දේශපාලන සෞඛ්‍ය, ආර්ථික සෞඛ්‍ය, සාමාජීය සෞඛ්‍ය, සංස්කෘතික සෞඛ්‍ය කියන මේ සෑම ක්ෂේත්‍රයකම සෞඛ්‍යයන් අද පිරිහෙමින් තිබෙන්නේ. කඩා වැටෙමින් තිබෙන්නේ. එවැනි තත්ත්වයකයි අපට සෞඛ්‍ය ක්ෂේත්‍රය සහ විෂයානුබද්ධව මේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න සිදු වෙලා තිබෙන්නේ. පළමුවෙන්ම මම කියන්න ඕනෑ. ජාතික ආණ්ඩුවේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය තමයි පල්ලෙහාට කාන්දු වෙලා එන්නේ. ඒ අනුව ඒ සෞඛ්‍ය ප්‍රතිපත්ති, තීන්දු, තීරණ තමයි පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය තුළිනුත් පිළිඹිබු වෙන්නේ. ක්‍රියාත්මක වෙන්නේ. යම් යම් වෙනස්කම් සමහර විට සිදු වෙන්න පුළුවන්. නමුත් ප්‍රධාන වශයෙන්ම ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය විධියට මහා ආණ්ඩුවේ, ජාතික ආණ්ඩුවේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය තමයි ක්‍රියාත්මක කරන්නේ. අපි බෞද්ධයෝ විධියට සෑම විටම දන්න කාරණයක් තමයි, සෞඛ්‍යයේ තිබෙන වැදගත්කම. "ආරෝග්‍යා පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං" කියලා අපේ බුදුහාමුදුරුවෝ කියලා තිබෙනවා. ඒ කියන්නේ, රජෙක් වුණත් වැඩක් නැහැ, ලෙඩෙක් වුණොත්. ඒ නිසා සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීම අපි හැම කෙනෙකුගේම ජීවිතයේ තිබෙන ඉතාම වැදගත් අංගයක්. මේ නිසාම පුරාණයේ පටන් අපේ සාම්ප්‍රදායික, ඒ වාගේම කිසියම් විධියකට අපි විසින්ම සකස් කර ගත්ත ප්‍රතිකාර ක්‍රම අප සතුව තිබෙනවා. වෛද්‍ය ක්‍රම තිබෙනවා. ඒ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයන් ඔස්සේ තමයි අපි කාලාන්තරයක් තිස්සේ අපේ රටේ අපේ නිරෝගීභාවය රැක ගැනීම සඳහා, ඒ වාගේම රෝගවලින් බේරීම සඳහා අපි අනුගමනය කරලා තිබෙන්නේ. ඒ අනුව සිංහල වෙදකම, රාවණා වෙදකම, ඒ වාගේම ආයුර්වේද වෙදකම මේ පෙරදිග ලෝකයේ තිබෙන වෙනත් වෛද්‍ය ක්‍රමයන් ආශ්‍රය කර ගෙන අපේ නිරෝගීභාවය රැක ගන්න, අපේ සෞඛ්‍ය ආරක්ෂා කර ගන්න, ඒ වාගේම අපේ පරමායුෂ උපරිම ලෙස භුක්ති විඳින්න අපි උත්සාහ කරලා තිබෙනවා. නමුත් අපි දන්නවා. යුරෝපයේ ඇති වුණු පුනරුදයත් එක්ක, ඒ වාගේම විද්‍යාත්මක පුනරුදය, තාක්ෂණික පුනරුදය, දැනුමේ ඇති වුණු මේ පුනරුදයත් එක්ක යුරෝපයෙන් බිහි වුණා, අලුත් වෛද්‍ය ක්‍රමයක්. ඒ වෛද්‍ය ක්‍රමය තමයි අපි හඳුන්වන්නේ ඇලපති වෛද්‍ය ක්‍රමය කියලා. යුරෝපයේ තවත් විකල්ප වෛද්‍ය ක්‍රම බිහි වෙලා තිබෙනවා. ඒ වෛද්‍ය ක්‍රම අතර එකක් තමයි හෝමියෝපති වෛද්‍ය ක්‍රමය කියලා කියන්නේ.

නමුත් මේ ඇලපති වෛද්‍ය ක්‍රමය තමයි ලෝකය පුරාම ප්‍රචලිත වෙලා ගියේ. ඒක මේ වෙළඳපොල ක්‍රමයත් එක්ක ඉතාම හොඳට සම්බන්ධ වුණා. අපේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, සිංහල වෛද්‍ය ක්‍රමය, රාවණා වෛද්‍ය ක්‍රමය තුළින් ප්‍රතිකාර කිරීමේදී තිබුණු යම් යම් ප්‍රායෝගික අපහසුතාවයන් ඒවාට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය, ඒ වාගේම ගස්වල කොළ පොතු සහ අනෙකුත් දේවල් එකතු කර ගැනීමත්, ඒවා සකස් කර ගැනීමේත් තිබුණු යම් යම් දුෂ්කරතාවයන් නිසා තමයි අපට සිද්ධ වුණේ, මේ පෙති, කරල් සහ ඉන්ජෙක්ෂන්වලට යන්න. ඒ නිසා වඩා පහසු වෛද්‍ය ක්‍රමයක් විධියට මුළු ලෝකය පුරාම ප්‍රචලිත වෙලා ගියා මේ ඇලපති වෛද්‍ය ක්‍රමය. හැබැයි, යුරෝපයේ බිහි වුණු හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳවත් සාකච්ඡා වෙනවා. නමුත් ඒකට මේ වෙළඳපොල ක්‍රමයත් එක්ක බද්ද වෙලා යන්න, ඉස්සරහාට යන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසා ඒ වෛද්‍ය ක්‍රමය පිළිබඳව එතරම් අපි සාකච්ඡා කරන්නේ නැහැ. ඒ නිසා මුළු ලෝකයේම දැන් ආධිපත්‍ය හොබවලා තිබෙන්නේ, මේ ඇලපති වෛද්‍ය ක්‍රමය.

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

එතකොට මේ ඇලපති වෛද්‍ය ක්‍රමයත් එක්කම අපට පේනවා ඖෂධ සමාගම්, බහු ජාතික සමාගම්, ඒ වාගේම බෙහෙත් හේත් නිෂ්පාදනය කරන කොම්පැනි තමයි අද අපේ ජනතාව සම්පූර්ණ ග්‍රහණයට අරගෙන තිබෙන්නේ. සිරකරුවන් කර ගෙන තිබෙන්නේ. ඒ නිසා මුළු ලෝකයම මේ ඇලපති වෛද්‍ය ක්‍රමයත් එක්ක, බහුජාතික සමාගම් පෙති කරල් නිෂ්පාදනය කරමින් විවිධ ආකාරයේ සෑම ලෙඩකටම, රෝගයකටම, ඒ වාගේම ඔවුන් විසින්ම අලුතෙන් නිර්මාණය කරන යම් යම් ලෙඩ රෝග සඳහා අවශ්‍ය කරන බෙහෙත් හේත් ලෝකය පුරා නිෂ්පාදනය කරමින් තිබෙනවා. ඒ නිසා අද අපට පේනවා, මුළු ලෝකයේම තිබෙන මේ වෛද්‍ය ක්‍රමය අද බහු ජාතික සමාගම්වල ග්‍රහණයට ගොදුරු වෙලා තිබෙන්නේ. දැන් මේකෙන් අපේ රට මුදවා ගැනීම සඳහා විශාල සටනක් කරපු ජාතික වීරවරයෙක් තමයි සේනක බිබිලේ කියලා කියන්නේ. අපට නිදහස් අධ්‍යාපනය යම් සේද, ඒ ආකාරයටම නිදහස් සෞඛ්‍ය සේවය මේ රටට දිනා දීම සඳහා විශාල සටහනක් කරපු බහු ජාතික සමාගම් එක්ක, කොම්පැනි එක්ක සටන් කරපු, හැප්පුණු, ජාතික වීරවරයෙක් තමයි සේනක බිබිලේ කියලා කියන්නේ. එතකොට සේනක බිබිලේ මැතිතුමා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක්, ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් සකස් කරන්න කාලාන්තරයක් තිස්සේ සටන් කළා. ඒ සඳහා තුන් වන ලෝකයේ රටවල්, අප්‍රිකාව, ලතින් ඇමරිකාව, ආසියාවේ මේ සියලු රටවල්වල දුප්පත් රටවල්වල ඒ රාජ්‍ය නායකයින් එක්ක එකතු වෙලා ප්‍රතිපත්තියක් සකස් කරන්න උත්සාහ කළා. නමුත් එතුමාට ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න බැරි වුණා. අවසාන වශයෙන් එතුමාව කුමන්ත්‍රණකාරී විධියට ඝාතනයට ලක් වුණා. එතුමාගේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය අපට ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. දැන් පසුගිය කාලය පුරාම මේ රටේ ක්‍රියාත්මක වුණු ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය ඇතුළේ අපි දැක්කා. කොහොමද මේ රටේ ජනතාවට තමන්ට අවශ්‍ය කරන බෙත් හේත් ටික, ප්‍රතිකාර ටික ලබා ගැනීමට තිබුණු අපහසුතාවය කෙසේද කියලා.

නමුත් අපි කියන්න ඕනෑ. 2015 ජනවාරි 08 වැනිදා අපි කරනු ලැබූ ඒ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයත්, මේ රටේ ඇති කරනු ලැබූ යහපාලන ප්‍රතිපත්තියත් නිසා සෞඛ්‍ය අමාත්‍ය ධූරය සඳහා රාජිත සේනාරත්න මැතිතුමාව පත් කළා. එතුමා මේ විෂයට බද්ධව, ඉතාම පුළුල් දැනුමක් තිබෙන කෙනෙක්. ඒ නිසා එතුමා පත් වුණු වහාම අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල වෙනස්කම් ටිකක් සිදු කළා. මම කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද බෝ නොවන රෝග තමයි වේගයෙන් පැතිරී යමින් තිබෙන්නේ. ඒ බෝ නොවන රෝග අතර ප්‍රධානම එකක් තමයි මේ හෘදය රෝග කියලා කියන්නේ. අපි දන්නවා, හෘදය රෝගයකදී අවසාන වශයෙන් මේකට කරන්න තිබෙන්නේ සැත්කමක්. ඒ කියන්නේ, හෘදය විවෘත කරලා. අපි දන්නවා, හෘදය සැත්කමක් සිදු කරන්න සිද්ධ වෙනවා. අපි දන්නවා හෘදය සැත්කමක් කරන්න යන කොට, ඒකට සාමාන්‍යයෙන් ලක්ෂ පහක්, හයක්, සමහර විට දහය පහළොව යනවා. මේක සාමාන්‍ය කෙනෙකුට තියා වෘත්තියවේදියෙකුටවත් මේ වාගේ වියදමක් අද දවසේ දරා ගන්න අමාරුයි. ඒ නිසා අලුත් ක්‍රමයක් ලෝකය තුළ හඳුන්වා දුන්නා. ඒක තමයි මේ Stent ක්‍රමය. Stent දාන එක. ඒ නිසා Stent දෙක තුනක් ආලා හෘදය විවෘත කරන්නේ නැතිව, සැත්කම් කරන්නේ නැතිව, Stent එක දාලා හෘදය රෝගියා බේරා ගන්න පුළුවන්කමක් තිබුණා. දැන් මේ Stent එකක් අපි වෙළඳපොලේ මිලදී ගන්න තිබෙන්නේ, එහෙම නැත්නම් පෞද්ගලික රෝහලකට ගිහිල්ලා මේ සැත්කම කරන්න ගියොත් මේ සඳහා එක ස්ටෙන්ත් එකක් රු. 150,000 ක් වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය යටතේ රාජිත සේනාරත්න ඇමතිතිතුමා ඒ වෙලාවේ ගත්ත ඒ නිර්භය තීරණය මත සම්පූර්ණයෙන්ම ඒ ස්ටෙන්ත් එක නොමිලයේ ලබා දෙන්න කටයුතු කළා. ස්ටෙන්ත් 4 ක් දාන්න වෙනවාය කියන්නේ 650,000 ක වාගේ මුදලක් යනවා. එහෙම නම් ඒ මුදල සම්පූර්ණයෙන්ම රජය විසින් දරමින් ඒ සැත්කම කරන්න, එහෙම නැත්නම් ඒ ස්ටෙන්ත් එක දාන්න අවශ්‍ය කරන කටයුතු කළා. දැන් මෙවැනි වෙනස්කමක් සිදු කළාම මේකෙන් වඩාත්ම කලබලයට පත් වුණේ, පෞද්ගලික රෝහල්. ඒ වාගේම බහුජාතික සමාගම්. මේවා සපයන විවිධ වෙළඳ සමාගම්, කොම්පැනි තමයි මේකෙන් වැඩියෙන්ම කලබලයට පත් වුණේ. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යවරයාටත්, සෞඛ්‍ය ප්‍රතිපත්තියටත් එරෙහිව විශාල ප්‍රහාරයක් දියත් වෙන්න පටන් ගත්තා. ඒ සඳහා වෘත්තීය සමිතිත් එකතු වුණා. වෛද්‍යවරුත් එකතු වුණා. වෙළෙන්දොත් එකතු වුණා. බහු ජාතික සමාගමුත් එකතු වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මම කියන්න කැමැතියි. අද සාමාන්‍ය මනුස්සයෙක් මේ වාගේ හෘදය රෝගයකට ගොදුරු වුණොත්, අවසානයේ ඔහුට මරණය

තමයි උරුම කර ගන්න පුළුවන් වෙන්නේ. ජනාධිපති අරමුදලින් ලබා ගන්න පුළුවන් වෙන්නේ රු. 150,000 ක් පමණයි. එහෙම නම් ඉතිරි මුදල කොහොමද සොයා ගන්නේ? ඒ නිසා සම්පූර්ණයෙන්ම නොමිලේ මේ Stent එක දැමීම සඳහා අපි අවස්ථාව සලසා දුන්නා. මේක අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිදු වුණු විප්ලවයක්.

ඊළඟට අද මේ රටේ විශාල වැඩිහිටි ජනතාවක් ඉන්නවා. මේ ඇස් පෙනීම පිළිබඳ ප්‍රශ්නය. විශේෂයෙන් අක්ෂි කාච. අපි අක්ෂි කාචයක් පෞද්ගලික රෝහලකින් දාන්න ගියොත් රු. 35,000/- ක මුදලක් යනවා. ඒ නිසා රජයක් විධියට තීරණය කළා, මේ අක්ෂි කාචය නොමිලයේම ලබා දෙන්න. ඒ අනුව අපි වර්ෂයකට දස ලක්ෂයකට ආසන්න ප්‍රමාණයකට මේ අක්ෂි කාච නොමිලයේ ලබා දෙන්න, ඒ අක්ෂි කාච දැමීම නොමිලයේ සිදු කිරීම කර ගෙන යනු ලැබුවා. මේ විධියටයි අපි කටයුතු කර ගෙන ගියේ.

ඊළඟට අපි දින 100 වැඩ පිළිවෙළ ඇතුළේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් ඉදිරිපත් කළා, ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරනවාය කියලා. ඒ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය අපි ඉදිරිපත් කරන්න කටයුතු කළා. ඒ අනුව සේනක බිබිලේ මැතිතුමාගේ ඒ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය, ඒ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය මත පදනම් වෙමින් මේ නූතනත්වයට ගැලපෙන විධියට නවීකරණය කරමින් ඒ ප්‍රතිපත්තිය අපි ගෙනැල්ලා පාර්ලිමේන්තුව ඇතුළේ සම්මත කළා. ඒකට ඖෂධ සමාගම්, බහු ජාතික සමාගම් ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරුවා. ඒ සියල්ලටම මුහුණ දෙමින් අපට පුළුවන්කම ලැබුණා, ජාතික සෞඛ්‍ය ප්‍රතිප්තියක් සම්මත කර ගන්න.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ යහපාලන ආණ්ඩුව බලයට පත් වුණු වහාම පළමුවෙන්ම කරපු දේ තමයි බෙහෙත් වර්ග 48 ක මිල අපි විශාල වශයෙන් පහත හෙලනු ලැබිමයි. ඒ වාගේම තවත් බෙහෙත් වර්ග 24 ක මිල අපි විශාල වශයෙන් පහත හෙලන්න කටයුතු කළා. ඊළඟට මේ රටේ දැවෙන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබුණු, වසංගතයක් බවට පත් වෙලා තිබුණු, ත්‍රස්තවාදයෙන් පස්සේ, ඒ කියන්නේ මේ දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදයෙන් පස්සේ මේ රටේ තිබුණු බරපතළම ත්‍රස්තවාදය තමයි මේ මත් උවදුර කියන ත්‍රස්තවාදය. ඒකෙනුත් ප්‍රධානම එක තමයි මේ දුම්වැටි කියන එක. දුම්වැටි පිටු දැකීම සඳහා දුම්කොළ පනත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, ඒ පනත සම්මත කර ගෙන අපට පුළුවන්කම ලැබුණා, දුම්වැටි දවටනවල 80% ක් රූපමය අවවාද ඇතුළත් කරන්න. එහිදීත් මේ දුම්වැටි සමාගම් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ඔවුන් කිව්වා, මේක පාරිභෝගික අයිතිවාසිකමක්. මේක Consumer rights එකක්. ඒ නිසා දුම් බොන්න මිනිස්සුන්ට අයිතිය තිබෙනවා. ඒ අයිතිය වෙනුවෙන් ඒ කට්ටිය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයේ විශාල වශයෙන් මේ ගැන වාද විවාද කරලා අවසාන වශයෙන් අපට පුළුවන්කම ලැබුණා, මේ පනත සම්මත කර ගන්න විතරක් නොවෙයි, දුම්වැටිවල බදු, දුම්කොළ බද්ධ විශාල වශයෙන් ඉහළ නංවලා, දුම්වැටි පරිභෝජනය සීඝ්‍රව පහත හෙලන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම තමයි මත් පැන්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දැන් දුම් බොන්නේ නැහැ. පෙතියි කුඩුයි බොන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කියන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පෙතියි. කුඩුයි. යහපාලනයේ කුඩු ඇති තරම් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හොඳයි. එතකොට දැන් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කුඩු ගැන කියන්න එපා. ලොක්කා හෙලිකොප්ටරයෙන් ඇවිල්ලා බේරගෙන ගියේ. කුඩුකාරයාව, මීගමුවේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ රටේ තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි මත් පැන්. ඒ නිසා මත්පැන් පාලනය කිරීම සඳහා අවශ්‍ය කරන නීති

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

රීති ගෙන එනු ලැබුවා. ඒ වාගේම විහාරස්ථානවල, පාසල් අවට මීටර් 100 ක්, මීටර් 500 ක් ඒ සීමාව ඇතුළේ දුම්වැටි, ඒ වාගේම මත්පැන් අලෙවි කිරීම නතර කරමින් පාලනය කරන්න, නියාමනය කරන්න අවශ්‍ය කරන කටයුතු කළා. එහිදී අපි ස්තුතිවන්ත වෙනවා. මේ මොහොතේ ජනාධිපතිතුමා මොනවා කරමින් සිටියත්, එතුමා පියවි සිහියෙන් මේවා කරනවාද නැද්ද මම දන්නේ නැහැ. නමුත් එක දෙයක් මම කියන්න ඕනෑ. එතුමා මේ දුම්කොළ සහ ඒ වාගේම මත්පැන් පිළිබඳ ප්‍රශ්නයේදී ඉතාම දැඩි ස්ථාවරයක ඉඳිමින් මේක පාලනය කිරීම සඳහා අවශ්‍ය කරන කටයුතු කළා. ඒ සඳහා සහයෝගය, ආශිර්වාදය ලබා දුන්නා.

ඊළඟට අපි කථා කර ගෙන ගියේ, මේ රටේ තිබෙන මේ බෝ නොවන රෝග පිළිබඳව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෝ නොවන රෝග අතර ප්‍රධාන එකක් තමයි පිළිකා රෝගය කියලා කියන්නේ. අද අපට පේනවා, පිළිකා රෝගීන් මොන තරම් අසරණ තත්ත්වයට පත් වෙනවාද කියලා. පිළිකා රෝගියෙක් සඳහා සාමාන්‍යයෙන් රජයෙන් වෙන් කරන්නේ රුපියල් පහළොස් ලක්ෂයයි. ලක්ෂ 15 යි වෙන් කරන්නේ. ඒ ලක්ෂ 15 සීමාව ඇතුළේ ඒ රෝගියාගේ ජීවිතය බේරා ගන්න බැරි වුණොත්, ඊළඟට කරන්න තිබෙන දේ ඔහුට මරණය තෝරා ගැනීම හැර වෙන විකල්පයක් නැහැ. ඒ නිසා තීරණයක් ගත්තා, රෝගියාගේ ජීවිතය බේරා ගැනීම සඳහා අවශ්‍ය කරන මුදල් සම්පූර්ණයෙන්ම නිදහස් කරන්න. මේ යහපාලන ආණ්ඩුවේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය යටතේ ක්‍රියාත්මක කළා. ඒ විතරක් නොවෙයි. පිළිකා රෝගියෙකුට අවශ්‍ය කරන ප්‍රතිකාරය, ඒ කියන්නේ මේ අවශ්‍ය කරන ඉන්ජෙක්ෂන් එක ලබා ගැනීම සඳහා, එක ඉන්ජෙක්ෂන් එකකට විතරක් රු. 293,000 ක් වෙනවා. එහෙම නම් මුදලින් අරගෙන බලන්න. සති කීයද රෝගියෙකුට ජීවත් වෙන්න පුළුවන්. මොකද, රජයෙන් වෙන් කරන්නේ රුපියල් පහළොස් ලක්ෂය නිසා. නමුත් අපට පුළුවන්කම ලැබුණා, ඒ ඉන්ජෙක්ෂන් එකේ මිල රු. 150,000 දක්වා අඩු කරන්න. මෙන්න මේවාට තමයි මේ වෘත්තීය සමිති, වෛද්‍ය සංගම් පාරට බැහැලා කෑ ගැහුවේ. උද්ඝෝෂණය කළේ, රාජිත සේනාරත්න මැතිතුමාව ගෙදර යවන්න ඕනෑ කියලා. එතුමාගේ යම් යම් දේශපාලන කරුණු සම්බන්ධයෙන් අපි සියලු දෙනාටම ප්‍රශ්න තිබෙන්න පුළුවන්. එතුමා ක්‍රියා කරන ආකාරය, හැසිරෙන ආකාරය, අදහස් ප්‍රකාශ කරන ආකාරය පිළිබඳව. නමුත් එතුමා වෛද්‍යවරයෙක් විධියට, දොස්තර කෙනෙකු විධියට මේ රටේ වෛද්‍ය ක්ෂේත්‍රයේ තිබෙන දොස් තොර කරන්න අවශ්‍ය කරන නිර්භය තීන්දු තීරණ ගත්ත කෙනෙක් කියන එක මේ වෙලාවේදී එතුමාට ගෞරවයක් විධියට මම ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම මේ රටේ ඊළඟට තිබෙන -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

පළාත් සෞඛ්‍ය පිළිබඳ විවාදය යන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔව්. ඒකට අදාළයි. මොකද, අමුතු එකක් නැහැ මේකේ. ඊළඟට මේ රටේ තිබුණු තවත් ප්‍රශ්නයක් තමයි, අද අපේ ප්‍රධානම බෝ නොවන රෝගයක් තමයි දියවැඩියාව. අද අපි සාමාන්‍යයෙන් කියනවා. අර ඒ කාලේ බුදු හාමුදුරුවෝ කිසාගෝතමීට කිව්වා, නොමළ ගෙයකින් අබ ඇටයක් සොයා ගෙන එන්න කියලා. නමුත් කිසාගෝතමීට ඒ කියපු එක අද වලංගු වෙන්නේ අපට. අද නොමළ ගෙයකින් අබ ඇටයක් සොයා ගෙන එන්න නොවෙයි. දියවැඩියා රෝගියෙකු නැති ගෙදරක් පුළුවන් නම් සොයා ගෙන එන්න. මේ සභාවේත් කොතෙකුත් ඇති දියවැඩියා රෝගයට ගොදුරු වුණු අය. ඒ නිසා අපි පැහැදිලිව මේ රටේ මේ සීනි පරිභෝජනය පාලනය කිරීම සඳහා, සීනි පාවිච්චි කිරීම පාලනය සඳහා සීනිවලට බද්දක් දැම්මා. ඒ හරහා අපි කිසියම් ප්‍රමාණයකට මේ සීනි පාවිච්චි කිරීම පාලනය කරන්න උත්සාහ කරමින් ඉන්නවා. අද මේ රටේ ජනගහනයෙන් ලක්ෂ 20 ක් සෘජුව, ඒ කියන්නේ සම්පූර්ණ දියවැඩියාවට ගොදුරු වුණු අය, අර්ධ වශයෙන් ගොදුරු වෙමින් තිබෙන අය ඉන්නවා. මේකට කිට්ටුවෙමින් ඉන්න අයත් ඉන්නවා. ලක්ෂ 20 ක් ඉන්නවා දියවැඩියාවට ගොදුරු වුණු අය. ඒ නිසා සීනි පාලනය කිරීම සඳහා සීනිවලට අපි බද්දක් ගැහුවා. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි දන්නවා. අපේ රටේ විශාල වශයෙන් මාර්ග අනතුරු සිදු වෙනවා. රිය අනතුරු සිදු වෙනවා. වෙනත් ආකාරයේ අවදානම් සහගත තත්ත්වයන්ට මුහුණ දෙනවා. දැන් ඒකට කිසියම් ආකාරයකට එවැනි තත්ත්වයකට මුහුණ දුන්නු අවස්ථාවලදී - වතුරේ ගිලෙනවා. එහෙම නැත්නම් ඉදිකිරීම් කටයුතුවලට ගිහිල්ලා ඒවායේදී යම් යම් අනතුරුවලට ලක් වෙන අය ඉන්නවා. එවැනි අවස්ථාවක ක්ෂණිකව අපට ගිලන් රථයක් ගෙන්වා ගන්න

ගියොත් රු. 25,000 ක්, 30,000 ක්, 50,000 ක් යනවා. කළුතර ඉඳලා කොළඹට ගිලන් රථයක් අපි පෞද්ගලික රෝහලකින් මිලදී ගත්තොත් රු. 30,000 කට ආසන්න මුදලක් යනවා. ඒ සඳහා අපි සුවසැරිය නමින් ගිලන් රථ සේවාවක් රට පුරා ඇති කළා. ඒක අපි මුලින් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කළා. මේක ගේන කොටත් වෘත්තීය සමිති කිව්වා, ඇතැම් අය කිව්වා, මේක පිටිපස්සේ ඉන්දියන් ඔත්තු සේවය ක්‍රියාත්මක වෙනවාය කියලා. වෙන වෙන කුමන්ත්‍රණ මේක පිටිපස්සේ සිදු වෙනවාය කියලා කිව්වා. අද ඒ සුවසැරිය ගිලන් රථ සේවාව හරහා මුළු රටේම ජනතාව ඒ සේවාව ලබා ගනිමින් තිබෙනවා. ඒ නිසා මම මේ කිව්වේ, මේ යහපාලන ආණ්ඩුව යටතේ අපි ලබා ගත්තා වූ ජයග්‍රහණ ටිකක්. ඒ නිසාම WHO එක, ලෝක සෞඛ්‍ය සංවිධානය 70 වසරක් පිරෙන අවස්ථාවේදී ලෝකයේ සෞඛ්‍ය සේවාවන් අතරින් ඉහළින්ම සෞඛ්‍ය සේවාවක් තිබෙන රටක් හැටියට ශ්‍රී ලංකාව හඳුන්වා දුන්නා විතරක් නොවෙයි. අපේ සෞඛ්‍ය ඇමතිතුමාටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයටත් ගෞරවයක් විධියට 'සුවපති' කියන තනතුර පවා පිරිනමන්න කටයුතු කළා.

ඔවුන්ගේ ඊළඟ සමුළුව ඔවුන් ශ්‍රී ලංකාවේ පවත්වන්න කටයුතු කරමින් තිබුණේ. මේ විධියේ විශාල සේවාවක් අපි කරමින් තිබෙනවා. මේ සියල්ල අවසාන වශයෙන් අපේ බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයටත් කාන්දු වෙලා ආවා. ඒ නිසා මම කියන්න ඕනෑ. සෞඛ්‍ය ගැන කථා කරන කොට අපට අද කථා කරන්න වෙලා තිබෙන්නේ, විශාල වශයෙන් මේ බස්නාහිර පළාතේ දියුණු වෙමින් තිබෙන, මේ පළාත තුළ මධ්‍යම පන්තිය වේගයෙන් ප්‍රසාරණය වෙමින් තිබෙනවා. ඒ මධ්‍යම පන්තිය අතර තිබෙන ප්‍රධාන රෝග කිහිපයක් තිබෙනවා. හෘදයාබාධ, පිළිකා, දියවැඩියාව, වකුගඩු රෝග, ඒ වාගේම මානසික ආතතිය. එහෙම නම් මේවාට කිසියම් ආකාරයකට අපි පිළියම් සොයන්න ඕනෑ. ඒ පිළියම් සෙවීමේදී මම කියන්නේ නැහැ, ඇලපති වෛද්‍ය ක්‍රමයෙන් පමණක් මේකට පිළියම් සොයන්න පුළුවන් කියලා. ඒකට රාවණා වෙදකම වෙන්න පුළුවන්. ආයුර්වේද වෙදකම වෙන්න පුළුවන්. සිංහල වෙදකම වෙන්න පුළුවන්. ඒ වාගේම මුස්ලිම් ජනතාව අතරින් ප්‍රචලිත වෙලා ඇවිල්ලා තිබෙන යුනානි වෛද්‍ය ක්‍රමය වෙන්න පුළුවන්. චීන කටු චිකිත්සාව වෙන්න පුළුවන්. යුනානි කටු චිකිත්සාව වෙන්න පුළුවන්. මේ සෑම වෛද්‍ය ක්‍රමයක්ම පාවිච්චි කරලා, අපේ රටේ ජනතාව සුවපත් කරන්න කටයුතු කරන්න ඕනෑ. එකකට පමණක් ප්‍රමුඛත්වය දීලා හරියන්නේ නැහැ.

ඒ වාගේම කියන්න ඕනෑ. විශේෂයෙන්ම මේ නාගරිකව ඉන්න ජනතාව තුළ අද විශාල මානසික අසහනයක්, එහෙම නැත්නම් ආතතියක් වර්ධනය වෙමින් තිබෙනවා. මේ ආනශික ආතතිය ප්‍රධාන වශයෙන් හේතු පාදක වෙනවා, අපි කථා කරන මේ බෝ නොවන රෝග ඇති වෙන්න. එහෙම නම් ඒ අයගේ මානසික සුවය ඇති කිරීම සඳහා අවශ්‍ය යම් යම් පිළියම් අපි සොයන්න ඕනෑ. ඒ සඳහා කිසියම් ආකාරයකට චිකිත්සාවන් වෙන්න පුළුවන්. මානසික චිකිත්සාවන් වෙන්න පුළුවන්. ශාරීරික චිකිත්සාවන් වෙන්න පුළුවන්. වෙනත් ආකාරයේ වෙන්න පුළුවන්. ඒවා නියමිත ක්‍රමවේදයකට නියාමනය කරලා, ප්‍රමිතියක් ඇතිව ඒවා අපේ සමාජය තුළ ඇති කරන්න ඕනෑ. එහෙම නැත්නම් අද විශාල වශයෙන් මේ රට ඇතුළේ ඇති වෙලා තිබෙන මේ මානසික ආතතිය, මේ මානසික අසහනය, කලකිරීම නිසා සිය දිවි නසා ගැනීම් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම අනික් පැත්තෙන් අපේ වැරදි ආහාර පුරුදු නිසා අද අපට පේනවා, අවිධිමත් ආකාරයට ආහාර ගැනීම නිසා අපි විශාල වශයෙන්, ලෙඩ රෝගවලට ගොදුරු වෙමින් තිබෙනවා. මේ සියල්ල පිළිබඳව අපේ අවධානය යොමු කරලා, අපේ සැලසුම් සකස් කරන්න ඕනෑ.

ඒ වාගේම මම කියන්න කැමැතියි. මේ අවස්ථාවේදී මේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී අපට තනියම වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. රටේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය, සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා, මේ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලා, ග්‍රාමීය මට්ටමට, බිම් මට්ටමට ගෙනියලා අපේ ජනතාව සුවපත් කරන්න කටයුතු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් මම කියන්න කැමැතියි. අපි සියලු දෙනා බලාපොරොත්තු වුණා, මේ ප්‍රතිපත්ති ඉස්සරහාට ගෙනියයි කියලා. නමුත් ගෙවුණු දවස් 36 ඇතුළත මේ සියල්ල ආපස්සට හරවමින් තිබෙනවා. සීනි බද්ද ඉවත් කළා. ඒ වාගේම ඉදිරියේදී මම දන්නේ නැහැ, මේ දුම්කොළ සම්බන්ධ අපේ ප්‍රතිපත්තිය, මත්පැන් සම්බන්ධ ප්‍රතිපත්තිය මොන විධියට මාරු වෙයිද? වෙනස් වෙයිද? කියලා. ඒ වාගේම අපි ලබා ගත්ත මේ ජයග්‍රහණ ආපස්සට හැරවීමක් තමයි දැන් සිදු වෙමින් තිබෙන්නේ. ඒ නිසා මේ සියල්ල පිළිබඳව අපි අද ඉතාම වේදනාවෙන්, කනගාටුවෙන් කථා කරන්නේ. මේ ලබා ගත් ජයග්‍රහණ ගැන. අවසාන වශයෙන් මේ සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ මානසික සුවය, ඒ වාගේම ආධ්‍යාත්මික සුවය සඳහා අවශ්‍ය කරන ඒ නිරෝගීභාවය අපි හැම

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

කෙනෙකු තුළම කායික වශයෙන්ම, මානසික වශයෙන්, ආධ්‍යාත්මික වශයෙන් ඒ අවශ්‍ය කරන දීර්ඝායුෂ, ඒ වාගේම අනික් පැත්තෙන් සුවය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මේ සියලු දෙනාගේම තිබෙන තුන් දොස් කිපෙන එක ටිකක් පාලනය කරන්න අපේ සෞඛ්‍ය ඇමතිතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවායි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.18 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යටතේ කථා කරන්න අවස්ථාව සලසා දීම ගැන. විශේෂයෙන්ම මම සතුටු වෙනවා. අපේ කලින් කථා කරපු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ සභාව ආරම්භයේ හිටපු සෞඛ්‍ය ඇමතිවරයෙක්. එතුමා ඉතා පුංචි කාලයක් සෞඛ්‍ය අමාත්‍ය ධුරයේ කටයුතු කළේ දේශපාලන සෞඛ්‍යයේ මතු වුණු ප්‍රශ්නයක් මත එතුමාට සෞඛ්‍ය අමාත්‍යාංශය නැතිව ගියා. ඊට පස්සේ අපේ සුමිත් ලාල් මැන්දිස් මැතිතුමා අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය භාර ගත්තා. මම ඉතාම සතුටු වෙනවා. එතුමා දේශපාලනය සඳහා විශාල කැප කිරීම් කරපු දේශපාලඥයෙක්. තමන්ගේ සහෝදරයෝ මේ දේශපාලන කටයුතු නිසා ජීවිතයෙන් වන්දි ගෙවපු බව අපි දන්නවා. ඒ නිසා එතුමා බොහොම කැපවීමෙන් දීර්ඝ කාලයක් කරපු දේශපාලන ගමන් මග නිසාම එතුමාට ලැබුණු අවස්ථාවක් විධියට තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය ලැබුණේ. මම හිතනවා, එතුමා සෞඛ්‍ය අමාත්‍යාංශය එතුමාට පුළුවන් උපරිමයෙන් මෙහෙයවන්න විශාල කාර්යභාරයක් කරන බව. ඒ ගැන අපි ඉතාම සතුටු වෙනවා සහ එතුමාට ඒ සඳහා අවශ්‍ය සහයෝගය අපි පසුගිය කාලය පුරාම දීලා තිබෙනවා. සෞඛ්‍ය කියලා කියන්නේ රටේ ප්‍රධාන සුභ සාධන විෂයයක්. අපි දන්නවා. මීට කාලයකට ඉහත විශේෂයෙන් 1970 සමඟි පෙරමුණ ආණ්ඩුව තියෙන කාලයේ රටේ සුභ සාධන විෂයයන් රාශියක් තිබුණා. ඒවා සුභ සාධන විෂයයන් විධියටම පවත්වාගෙන යන්න කටයුතු කරනු ලැබුවා. සෞඛ්‍යයත් සුභ සාධන විෂයයක්. අවුරුදු 4000 ක් විතර පැරණි මේ රටේ සෞඛ්‍ය ක්‍රමය වඩා සුභ සාධනවාදීව, විශේෂයෙන් මේ රටේ ජීවත් වන අහිංසක දිළිඳු මිනිස්සුන්ට සෞඛ්‍ය පහසුකම්, රාජ්‍ය සුභ සාධනය යටතේ ලබා ගැනීමේ පහසුකම තිබුණා. නමුත් අපි දන්නවා. වර්තමානයේ සෞඛ්‍ය එවැනි තැනක නැහැ. සෞඛ්‍ය මාෆියාවකට යට වෙලා. මොන ප්‍රතිපත්ති හැදුවා කියලා කිව්වත්, ගෙවුණු ඉතිහාසය පුරාම අපි දන්නවා. මේ රටේ අහිංසක මිනිහාට සෞඛ්‍ය පහසුකම ලබා ගන්න තිබෙන ඉඩකඩ අවහිර වේගෙන යන්නේ. ඒකට රජය විසින්ම පත් කරපු සමහර අයගේ බලපෑමුත් තිබෙනවා. මේ ඖෂධ ප්‍රතිපත්ති නිර්මාණය කරන කොට, වෙනත් ප්‍රතිපත්ති නිර්මාණය කරන කොට තමන්ගේ කොටස කොහේද කියලා සොයලා බලනවා. ඒ නිසා තමයි පසුගිය කාලය පුරා වෛද්‍යවරු මේ ඖෂධ ප්‍රතිපත්තිවලට විරුද්ධව දැවැන්ත අරගලයක්, සටනක් කළේ. ඒ වාගේම අනික් පැත්තට වෛද්‍යවරුත් මේ මාෆියාවේ ගොදුරු බවට, කොටස්කාරයෝ බවට පත් වෙලා සිටිනවා. ඒ නිසාම බොහෝ සෞඛ්‍ය පහසුකම් ලබා දීමට තිබෙන ඉඩකඩ අහුරා දමමින් තිබෙනවාය කියන කාරණය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2017 වර්ෂයේ සෞඛ්‍ය සඳහා පළාත් සභාවේ වෙන් වුණේ මිලියන 997.06 ක්. මෙකේ අපේ පොතේ කියන විධියට 2017 සියලු ව්‍යාපෘතීන් මගින් වෙන් වුණු මුදල්වලින් 96.15% ක භෞතික ප්‍රගතියක් සහ 90.75% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඒ වැඩ සටහන් අවසන් කළා කියලා තමයි මේ පොතේ කියන්නේ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභා ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණයක් සෞඛ්‍ය සඳහා වෙන් වුණේ 2018 අවුරුද්දේ. එය මුදල්වලින් කියනවා නම්, රුපියල් මිලියන 1745.365 ක්. දැවැන්ත මුදලක්. ඉතිහාසයේ සෞඛ්‍ය සඳහා වෙන් වුණු වැඩිම මුදල වෙන් වුණේ, මේ 2018 අවුරුද්දේ. ඒක පළාත් සංවර්ධන ප්‍රදානවලින් රුපියල් මිලියන 350 ක්. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධානවලින් රුපියල් මිලියන 325 ක්. පළාත් සංවර්ධන ප්‍රදාන පරිපූරක විසින්, පරිපූරක ඇස්තමේන්තු දෙකක් හරහා රුපියල් මිලියන 719.325 ක්. දෙවන සෞඛ්‍ය ක්ෂේත්‍ර සංවර්ධන වැඩ සටහන යටතේ 324 ක් සහ නම්‍යශීලී අරමුදලින් මිලියන 26.240 ක්. මිලියන 1745.365 ක මුදලක් සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබුණා. දැවැන්ත මුදලක්. මේ සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබුණු මුදල ගරු අමාත්‍යතුමා ප්‍රතිපත්ති සම්පාදකයා විධියට මේක බොහොම සාධාරණ විධියට පළාතේ විවිධ සෞඛ්‍ය සේවාවන් අවශ්‍ය කරන තැන්වලට වෙන් කරලා දෙන්න කටයුතු කරනු ලැබුවා. හැබැයි, මට තේරෙන්නේ නැහැ. සෞඛ්‍ය ඇමතිතුමාට තිබෙන උවමනාව සෞඛ්‍ය

අමාත්‍යාංශය ඇතුළේ ඉන්න නිලධාරීන්ට තිබෙනවාද කියලා. ඔවුන්ට ඒ හැඟීම තිබෙනවාද කියලා. සෞඛ්‍ය ඇමතිතුමා යන වේගයට මේ නිලධාරීන්ට යන්න පුළුවන්ද කියන කාරණය ප්‍රශ්නයක් විධියට තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. මේ විවාදය අවසන් කරන වෙලාවේ කථා කරන වෙලාවේ කරුණාකරලා මේ සභාවට කියන්න කියලා, මේ වෙන් වුණු රුපියල් මිලියන 1745.365 න් කොයි තරම් භෞතික ප්‍රගතියක් ද ලබලා තිබෙන්නේ? කොයි තරම් මූල්‍ය ප්‍රගතියක් ද ලබලා තිබෙන්නේ කියලා. ඒක වැදගත් වෙනවා, ඊළඟ අවුරුද්දේ මුදල් වෙන් කිරීමේ කටයුතුවලට යන කොට, අපට. ඒ නිසා කරුණාකරලා ඒක දැනුම් දෙන්නය කියන කාරණය කියනවා. මට නම් තේරෙන විධියට, මම දන්න විධියට, මට දැණුනු විධියට මේ මුදල් අති විශාල ප්‍රමාණයක් තවමත් පාවිච්චි කරලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට උදාහරණ මට කියන්න වෙන්නේ මගේ ආසනය පදනම් කර ගෙන. අවිස්සාවේල්ල ආසනයේ ප්‍රධාන රෝහල් කිහිපයක් ම තිබෙනවා. එහි ප්‍රධාන රෝහල තමයි, අවිස්සාවේල්ල මූලික රෝහල. අවිස්සාවේල්ල මූලික රෝහල කියලා කියන්නේ, ලංකාවේ රෝහල් අතර 16 වැනි ස්ථානයට වැටෙන රෝහල. මේක දැවැන්ත රෝහලක්. දිස්ත්‍රික්ක ගණනාවකට, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණනාවකට, දැවැන්ත සේවාවක් සපයන ආයතනයක්.

අද අවිස්සාවේල්ල රෝහල ආසන්නයේ දැවැන්ත කර්මාන්තපුරයක් තිබෙනවා. මේ කර්මාන්තපුරය ඇතුළේ 23,000 ක් සේවකයෝ වැඩ කරනවා. පසුගිය සතියට එහා සතියේ අපි කරපු සමීක්ෂණයට අනුව. මේ 23,000 ඇවිල්ලා පදිංචි වෙලා ඉන්නවා. දවස ගණනේ කාර්යාලවලට එනවා. දවස ගණනේ ගමන් කරනවා. ඔවුන්ගේ සෞඛ්‍ය අවශ්‍යතාවලින් බහුතරයක් ප්‍රමාණයක් විසඳගන්නේ අවිස්සාවේල්ල රෝහල මුල් කර ගෙන. මේ රෝහලට වාර්ෂිකව ලක්ෂ පහකට අධික රෝගීන් සංඛ්‍යාවක් ප්‍රතිකාර සඳහා යොමු වෙනවා. දැවැන්ත රෝහලක්. නමුත් මේ රෝහලේ සංවර්ධනය වෙනුවෙන් කරන්න තිබෙන මූලික කටයුතුවලට ගරු අමාත්‍යතුමා මුදල් වෙන් කරලා දුන්නා. දැවැන්ත මුදලක් වෙන් කරලා දුන්නා. මේකේ තිබෙනවා, වාට්ටු අංක 02 ට යාබදව නව ගොඩනැගිල්ලක් ඉදි කරන්න. මේකට පරිත්‍යාගශීලී මහත්මයෙක් රුපියල් මිලියන 10 ක්, තමන්ගේ පුද්ගලික සල්ලි දුන්නා. එය රුපියල් මිලියන 15 දක්වා වැඩි කරන්නත් කැමැතියි කියලා එතුමා කිව්වා. අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාල සංකීර්ණය වියදම් කරලා හදන්න රුපියල් මිලියන 6 ක් වෙන් වුණා. ප්‍රධාන ඖෂධ ගබඩාව පුළුල් කරන්න රුපියල් මිලියන 5.2 ක් වෙන් වුණා. පල්දෝරු පද්ධතිය සඳහා විධියට රුපියල් මිලියන 60 ක් වෙන් වුණා. සායන සංකීර්ණයක් ඉදි කිරීම සඳහා මුදල් ඉල්លුවා. ඒ මුදල හම්බ වුණේ නැහැ. දැන් මේ මුදල්වලින් අඩුම තරමින් 10% ක් මේ වන කොට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වියදම් කරලා තිබෙනවාද කියලා අපි අහනවා. මේක කරලා නැහැ. මේක ඇමතිතුමාගේ වරද නොවෙයි. ඇමතිතුමා මුදල් වෙන් කරලා දුන්නා. නමුත් අමාත්‍යාංශය මේ සඳහා පසු විපරම් කරමින් කටයුතු කළේ නැහැ.

විශේෂයෙන්ම මම තහවුරු කරලා කියන්න ඕනැ. කොළඹ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සැලසුම් අංශය. මම දන්නේ නැහැ. ඒක විසුරුවලා දානවා නම් වඩා හොඳයි කියලා මම ඇමතිතුමාට යෝජනා කරනවා. කිසිම කටයුත්තකට තමන්ගේ සක්‍රිය දායකත්වය දෙන්නේ නැහැ. මේවා ගැන සොයන්නේ නැහැ. මම අහනවා, මේ ව්‍යාපෘති සම්බන්ධයෙන් එකම එක ක්ෂේත්‍ර සාකච්ඡාවක්වත්, තියලා තිබෙනවාද කියලා. මේ පසුගිය මාසේ අග සතියේ තමයි පළමුවැනි ක්ෂේත්‍ර සාකච්ඡාව අපි තිබ්බේ. බලහත්කාරයෙන් ගිහිල්ලා අමාත්‍යාංශය යොමු කරවා ගෙන. එදා වන කොට තහවුරු වුණා මේ එකක්වත් වැඩ කෙරිලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පරිත්‍යාගශීලී මහත්මයා තමන්ගේ වාට්ටු සංකීර්ණය ඉදි කරන්න කියන කාරණාවට 2017.04.26 වැනිදා ප්‍රාදේශීය ඉංජිනේරුවරයා වෙතින් ඉල්ලීමක් කරලා තිබෙනවා මේකට ඇස්තමේන්තු හදලා දෙන්නය කියලා. 2018.04.18 වැනිදා ප්‍රාදේශීය ඉංජිනේරු විසින් වාස්තු විද්‍යාත්මක සැලසුම්පත් අනුමැතිය සඳහා වෛද්‍ය අධිකාරී වෙතත්, එතැනින් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙතත් ගිහිල්ලා තිබෙනවා. එතැනින් පස්සේ මොකුත්ම වෙලා නැහැ. අවසාන සාකච්ඡාවටත්, අපි ඒ මහත්මයාව ගෙන්නුවා. එතුමා ඉතාම කලකිරීමෙන් කිව්වා. මම මිලියන 10 ක් වෙන් කරලා එදා කරන්න හදපු වැඩේ අද කරන්න මිලියන 15 ක් යනවා. මම ලැහැස්තියි මිලියන 15 දෙන්නත්. කරුණාකරලා මේක පටන් ගන්නය කියලා. මම දන්නේ නැහැ කවදා පටන් ගනියිද කියලා. මේවා තිබෙන්නේ ඉතාම අවාසනාවන්ත තත්ත්වයක.

[ගරු මහේෂ් අල්මේදා ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධිකරණ වෛද්‍ය නිලධාරී සංකීර්ණය. මේක හදන්න 2017.06.09 හා 2018.01.30 දිනයන්හි ඇස්තමේන්තු සකස් කරලා දෙන්න කියලා ප්‍රාදේශීය ඉංජිනේරුට කියලා තිබෙනවා. නමුත් ඒ ඇස්තමේන්තු තවමත් ඇවිල්ලා නැහැයි කියන කාරණාව තමයි අපට පැහැදිලි වෙලා තිබෙන්නේ. 2018.06.20 දින සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මිලියන 25 ක් දුන්නා මේකට. ඒ මිලියන 25 න් එක සතයක්වත් අද වන කොට වියදම් කරලා නැහැ. සතයක්වත් වියදම් කරලා නැහැ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හදන්න සැලසුම මේ වන කොට ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ තිබෙනවාය කියලා තමයි ආරංචිය. කොළඹ කාර්යාලයේ. හැබැයි, එතැනින් එහාට ගිහිල්ලා නැහැ. මේ මුදල එහෙම්පිටින්ම lapse වෙලා යනවා. මේ මුදල එහෙම්පිටින්ම 2018 වර්ෂයේ අහකට යනවා. දැන් ප්‍රධාන ඖෂධ ගබඩාව පුළුල් කරන්න වෙන් කරපු සල්ලි. මේ මුදල වියදම් කරලා, ඉවර කරලා නැහැ. 2018.04.17 වැනිදා වෛද්‍ය සැපයීම් අංශය මගින් රුපියල් මිලියන 6.25 ක මුදලක් වෙන් කරලා දෙනවා. 2018.04.23 වැනිදා මේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සකස් කර දෙන ලෙස ඉල්ලනවා. නමුත් තවමත් ඇස්තමේන්තුව ගියා කියන ආරංචියක් නැහැ. ඇස්තමේන්තුව ගියා කියන ආරංචියක් නැහැ. මේ හැම එකම පල්ලෙහාට පල්ලෙහාට යනවා. පල්දෝරු පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා 2018 සංවර්ධන යෝජනා යටතේ රුපියල් මිලියන 60 ක් වෙන් වෙනවා. 2018.02.07 වැනිදා පල්දෝරු පද්ධතිය වැඩි දියුණු කිරීමට අදාළ අවශ්‍යතා ප්‍රාදේශීය ඉංජිනේරු වෙත යොමු කරනවා. 2017.06.22 අමාත්‍යාංශය විසින් අදාළ තොරතුරු විමසා තිබෙනවා. ඒ අනුව ජුනි මස 25 වැනිදා එම තොරතුරු අමාත්‍යාංශයට දීලා තිබෙනවා. 2018.10.22 දින අමාත්‍යාංශය විසින් අපජලය සම්බන්ධ වාර්තාවක් ජල සම්පාදන මණ්ඩලයෙන් ගන්න යවලා තිබෙනවා. තවමත් ජල සම්පාදන මණ්ඩලයේ ඒ වාර්තා ආවාද කියලත් පැහැදිලි වාර්තා වීමක් සනිටුහන් වෙන්නේ නැහැ.

ඒ නිසා මේ මිලියන 6 ත් වියදම් නොවී ඉතිරි වෙලා තිබෙන්නේ. දැන් අපි අවසාන වශයෙන් කරපු සාකච්ඡාවට අනුව, එදා අමාත්‍යාංශ ලේකම්තුමා මේ සාකච්ඡාවට සම්බන්ධ වුණා. අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා මේ වියදම් වුණේ නැති සල්ලි ආපහු අරගෙන නැවත මිලියන 30 ක වෙනත් ව්‍යාපෘති අනුමත කරලා තිබෙනවා. රෝහලේ තිබෙන හදිසි අවශ්‍යතා වෙනුවෙන්. දැන් මේ හදිසි අවශ්‍යතා වෙනුවෙන් වෙන් කරපු සල්ලි කඩිනමින් ක්‍රියාත්මක කරන්න අමාත්‍යාංශය මීට වඩා කාර්යක්ෂම වෙන්න ඕනෑ කියන කාරණාව තමයි අපි මතක් කරන්නේ. දැන් අපි ඒකයි කියන්නේ. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වාට සෞඛ්‍ය ප්‍රතිපත්ති හදනවාය කියලා, සෞඛ්‍ය ක්‍රියාවලියේ ඉන්න රාජ්‍ය නිලධාරීන්ට - විශේෂයෙන්ම වෛද්‍යවරු තමයි මේ තනතුරුවල ගොඩාක් ඒවායේ ඉන්නේ. ඒ වෛද්‍යවරුන්ට උවමනාවක් තිබෙන්න ඕනෑ මේවා කරලා දෙන්න. වෛද්‍ය මාෆියාවක් තිබෙනවාය කියලා අපි කියන්නේ ඒකයි. බොහෝ වෛද්‍යවරු හිතනවා නම්, පෞද්ගලික අංශයට තමන්ගේ අවශ්‍යතා සඳහා මේ රටේ මිනිස්සු එන්න ඕනෑ කියලා. එහෙම හිතන අයට උවමනාවක් නැතිව ඇති, රාජ්‍ය සේවයේ, එහෙම නැත්නම් රජයේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සංවර්ධනය කරලා අහිංසක මිනිස්සුන්ට සහනයක් දෙන්න.

මම ගරු ඇමතිතුමාට මතක් කරනවා. අවිස්සාවේල්ල රෝහලේ සායනික ගොඩනැගිල්ලක බරපතළ අවශ්‍යතාවයක් තිබෙනවා. ඒ සායනික ගොඩනැගිල්ලේ සමහර වෛද්‍යවරු වැඩ කරන්නේ ඉතාම අපහසුවෙන්. අවිස්සාවේල්ල රෝහලේ සායන 22 ක් විතර තිබෙනවා. මේ සඳහා රෝගීන් වාර්ෂිකව ලක්ෂ පහක් විතර එනවා. හැබැයි, මේ අයට තිබෙන පහසුකම් ඉතාම අල්පයි. ඖෂධ ගබඩාවල, ඖෂධ තියාගෙන ඉන්නේ. සමහර ඒවා දැඩි රශ්මිය මත තියාගෙන ඉන්නේ. ඒවා දිය වෙනවාය කියලා ඖෂධවේදීන් කියනවා. ඒ නිසා බරපතළ ප්‍රශ්න මතු වෙමින් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම අවසාන වශයෙන් මේක ඉවර කරන්න ඉස්සෙල්ලා කියන්න ඕනෑ. මම උපදේශක කාරක සභාවට යෝජනාවක් එවලා තිබෙනවා. අවිස්සාවේල්ල නගර සභා සීමාව සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක් හදලා දෙන්නය කියලා. අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාශය තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දෙකක් තිබෙනවා. ඒකෙන් වර්ග කිලෝ මීටර් 143 ක් පමණ වන භූමි ප්‍රදේශයක 120,000 ක් පමණ වන ජනගහනයක් හංවැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අයත් වෙනවා. එසේම සීතාවකපුර නගර සභා සීමාවේ ජනගහනය 33,500 ක් විතර වෙනවා. සීතාවක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ 25,000 ක් විතර වැඩ

කරනවා. ඒ ආසන්න සේවකයින්ටත්, වැඩි වන ජනගහනයට සෞඛ්‍ය සේවා පහසුකම් සලසන්නත් මේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඇති කරන්න කියන කාරණාව මතක් කරනවා. විශේෂයෙන්ම මේ සඳහා යෝජනාවක් සීතාවක පුර නගර සභාවේ සම්මත වෙලා තිබෙනවා. මේකට ඉඩමක් තිබෙනවා. ඒ නිසා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. 2019 වර්ෂයට මුදල් වෙන් කරද්දී, සීතාවක නගර සභා සීමාවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක් හදන්නත් මුදල් වෙන් කරන්නය කියන ඉල්ලීම මේ වෙලාවේ කරනවා. කාරණා ගණනාවක් තිබෙනවා. වෙලාව මදි නිසා කියන්න විධියක් නැහැ. කොහොම වුණත් අපි සතුටු වෙනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමා ලොකු උත්සාහයක් ගන්නවා. ඒ උත්සාහයට සමගාමීව මේ නිලධාරීන් විශේෂයෙන් වෛද්‍ය පරිපාලන සේවයෙන් ඉදිරියට ඇවිල්ලා නිලධාරීන් තමන්ගේ වගකීම් නිවැරදිව ඉෂ්ට කළොත් මේ සෞඛ්‍ය අමාත්‍යාංශය ඉෂ්ට කරන්න බලාපොරොත්තු වන අපේක්ෂාවන් සියල්ල ජය ගන්න පුළුවන් වෙනවා. ඒවා ජය ගත්තොත් තමයි නිරෝගී සෞඛ්‍ය සම්පන්න පරපුරක් හදා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. නිරෝගීකම තරම් උතුම් ලාභයක් නැහැයි කියලා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා. ඒ අදහසේ ඉඳගෙන වැඩ කරන්නය කියලා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ට ආයාචනය කරමින්, සෞඛ්‍ය ඇමතිතුමාට සුභ පතමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.32 ]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා, සමාජ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන ඉතාමත් සතුටු වෙනවා. මොකද, ඉතාම සංවේදී අමාත්‍යාංශයක්. රටට වැදගත් වටිනා සේවයක් කරන්න පුළුවන් අමාත්‍යාංශයක්. විශේෂයෙන් ඇමැතිතුමා ගැන කථා කළොත් එතුමා ඉතාම නිහතමානී, යමක් කරන්න හැම තිස්සේම උත්සාහ කරන, තමන්ගේ උපරිම සේවයක් කරන්න උත්සාහ කරන ඇමැතිවරයෙක් විධියට අපි දකිනවා. ඉතින් වැඩ පිළිවෙළ ගැනත් සතුටු වෙනවා. එතුමා ඇවිල්ලා දැන් අවුරුදු තුනක වාගේ කාලයක් වෙනවා. ඒ කාලය තුළ එතුමා කරන්න පුළුවන් සේවය කරලා තිබෙනවා. අපි සමහර අඩුපාඩුකම් දැකලා තමයි ඔබතුමා වෙත කථා කරන්නේ. අපේ අන්තිම වැය ශීර්ෂය. ඉදිරියට එන අයට හරි සමහර අඩුපාඩුකම් තිබෙනවා නම් ඒවා සාදා ගැනීම සඳහා. ලංකාවේ කථාවක් තිබෙනවා ඌරන්ට මොන සෞඛ්‍යයද කියලා. ඒ වාගේ තමයි සමහර අවස්ථාවලදී අපේ රටේ මිනිස්සුන්ට සෞඛ්‍ය සේවය එදාට වැඩිය අද හොඳයි. ගොඩක් දේවල් සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි අපට සොයා ගන්න බැරි වුණු, අපි නොකරන විශාල ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන් ගත්තොත් සෞඛ්‍ය සේවයේ බෙහෙත් හේත් ටික අපට දැන් ටිකක් හරි ලැබෙනවා. එදාට වැඩිය අද අපට සමහර පරීක්ෂණ කර ගැනීමේ හැකියාව ලැබිලා තිබෙනවා. අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ සිගරට්වලට රූප දාලා තිබෙනවා. ඒ වාගේ යම් යම් දේවල් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. හැබැයි ප්‍රධාන වශයෙන් බෝ නොවන රෝගවලට හේතු සොයාගෙන, සමාජගත කරලා, මිනිස්සු දැනුවත් කරලා, වැඩ සටහන් කරලා, වැඩමුළු පවත්වනවා. හැබැයි ඉතාමත් අඩුයි. මිනිස්සුන් දැනුවත් නැහැ. විශේෂයෙන්ම ආහාර රටාව ගැන. අද ආහාර රටාවේ අපි කන්නේම වස විෂ Chemical. ඉතින් වැඩිපුර හෘද රෝග, වකුගඩු රෝග, පිළිකා වැනි රෝග හැදෙන්න ප්‍රධානම හේතුවක්, වන්නේ 80% ක් බලපාන්නේ අපි ගන්න ආහාර. දැන් මේ පිටරටින් ලංකාවට ගෙන එනවා. ලංකාවේ වගා කරන හැම එකකටම කෙමිකල් භාවිතා කරනවා. දැන් මේ දවස්වල හැම තැනම මාදම් තිබෙනවා. මාදම් ගෙන එන්නේ ඉන්දියාවෙන්. ඒ ගේන මාදම්වලට කොපමණ Chemicals ගහනවාද තියාගන්න. ඒ වාගේ විවිධ පළතුරු වර්ග ගේනවා. ඒ ගේන ඒවාට කල් තබා ගන්න විශාල බෙහෙත් ගහනවා. මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පරීක්ෂණ කරනවාද? හොයනවාද? බලනවාද අපි දන්නේ නැහැ. මිනිස්සු හැබැයි අනුභව කරනවා. දැනුත් කිරීමේ වැඩ සටහන් ඉතාමත් අඩුයි. ඉතින් ඒ නිසා මේ වාගේ මිනිස්සු දැනුවත් කිරීමේ වැඩ සටහන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කරන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම ආයුර්වේදය ගත්තොත් එහෙම අපට ඉතාම පැරණි, දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබෙනවා. ආයුර්වේදය තිබෙනවා. ඒවා අපේ රටේ එදා සිට - දැන් අපි බටහිර වෛද්‍ය ක්‍රමය ගත්තොත් රෝග හොඳ කරන්නේ නැහැ. රෝග මැඩ පැවැත්වීම විතරයි කරන්නේ. සදාකල් බෙහෙතේ බොන්න ඕනෑ. දියවැඩියාවට බෙහෙත් බොනවා නම් සදාකල් බෙහෙත් බොන්න ඕනෑ. හැබැයි ආයුර්වේද

[ගරු නිරෝෂා අතුකෝරල ]

සහ දේශීය වෛද්‍ය ක්‍රමය ඇතුළේ දියවැඩියාව කියන රෝගය සදාකල් සුව කරන්න පුළුවන් රෝගයක් බවට පත් කරනවා. මෙන්න මේ ක්‍රමවේදවලට අපි ආයුර්වේදය පැත්තට වැඩියෙන් නැඹුරු වෙන්න ඕනෑ. හැබැයි අවාසනාව කියන්නේ, ලංකාවට ආයුර්වේද බෙහෙත් වර්ග සියල්ල වෙනිවැල්ලගැට, කොත්තමල්ලි හැම දෙයක්ම ගේන්නේ ඉන්දියාවෙන්. හැබැයි ලංකාවේ අපි කාන්තාවන්ට ස්වයං රැකියා කරන්න කියනවා. මේ වාගේ දේවල් ප්‍රවර්ධනය කරලා, කාන්තාවන්ට ගෙවල්වල වගා කරලා හරි මේවා ගන්න ක්‍රමවේද ලංකාව තුළ තවමත් නැහැ. හැබැයි වගා කරන්න පුළුවන් විශාල බිම් ප්‍රමාණයක් තිබෙනවා. මෙන්න මේවාට ක්‍රමවේදයක් නැහැ. මෙන්න මේවාට ක්‍රමවේදයක් හදන්න පුළුවන් නම් අපට ඉන්දියාවෙන් ගේන බෙහෙත් වර්ග අඩු කරන්න පුළුවන්. ඒ වාගේ තත්ත්වයක් තිබෙනවා.

ඒ වාගේම රෝහල්වල ඇමැතිතුමා ඇත්තටම විශාල Building හදලා තිබෙනවා. විශේෂයෙන් ගත්තොත් දොම්පේ එහෙම ගත්තොත් සියල්ල සම්පූර්ණ ගොඩනැගිල්ලක් තිබෙනවා. හෘද රෝගීන් සම්බන්ධව. හැබැයි සේවකයෝ නැහැ. අපට තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි මේ සේවක හිඟය. ඉතින් ඇමැතිතුමනි, මම දන්නේ නැහැ, ඔබතුමාට ඒක කරන්න හැකියාව තිබෙනවාද කියලා. මේ අඩුපාඩු තිබෙන තැන් බලලා හදලා ඒ තිබෙන තැන්වල ආයතන හදන්න. ඒ ආයතන විවෘත කිරීමට සඳහා සේවක පුරප්පාඩු තිබෙනවා. ඒ සේවක පුරප්පාඩු පිළිබඳව පුළුවන් නම් ඉල්ලීම් කරන්න කියලා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ කාන්තා අංශය ගැන. මේ අමාත්‍යාංශයෙන් අඩුම සැලකිල්ලක් දක්වන්නේ කාන්තාවන්ට. මොකද, ලංකාවේ 52% ක් කාන්තාවෝ ඉන්නවා. මේ ආයතනය ගත්තාම මේකේ මන්ත්‍රීතුමියන්ලා නැති වුණාට වැඩිපුරම ඉන්නේ කාන්තාවෝ. හැබැයි කාන්තාවන් වෙනුවෙන් ඉතාම සුළු මුදලක් තමයි වෙන් කරලා තිබෙන්නේ. මේ පොත ගත්තොත් පොත විශාලයි. කාන්තාවන් වෙනුවෙන් පිටු දෙකයි වෙන් කරලා තිබෙන්නේ. ඒකත් ඕකිඩ් බෙදලා තිබෙනවා. ඒ වාගේ ගෙවතු වැඩ කිහිපයක් කරලා තිබෙනවා. හැබැයි ඇමැතිතුමනි, කාන්තාවන් වෙනුවෙන් මීට වැඩිය ඔබතුමාගේ අවධානය යොමු කළ යුතුමයි. මීට වැඩිය ප්‍රතිපාදන වෙන් කළ යුතුමයි. මෙනවා හරි දීම තුළම කාන්තාව නඟා සිටුවන්න අමාරුයි. මොකද, අම්මා කියන කොනා තමයි රටේ ඉන්න සම්පත. අම්මාව දැනුමෙන්, ආකල්පවලින්, කුසලතාවලින් වර්ධනය කරන්න පුළුවන් නම්, ගෙදර තිබෙන ලොකු ප්‍රශ්නයක් විසඳෙනවා. ඉතින් මේක අපි කරන්නේ නැතුව, මිනිස්සු රටවට්ටන්න බඩු බෙදලා, මොනවා හරි කරලා ඒකෙන් අම්මලාව හදන්න බැහැ. අම්මලාගේ දැනුම එදා පන්සල් වටා එක් වෙලා වැඩිහිටි අධ්‍යාපන කියලා දුන්නා. අර ඕපාදූප හරි කථා කරලා යම් අධ්‍යාපනයක් එදා ලැබුවා. දැන් අපේ අම්මලාට ලබන්න තිබෙන අධ්‍යාපනය තිබෙන්නේ ටෙලිෆෝන් ඒකේ. Facebook එකේ. Facebook Account එකක් ඇරියොත් මේ අම්මලා විනාශ වෙන එක තමයි කියන්න වෙන්නේ. අද දවසකට දික්කසාදම 300 ක් වෙනවා. කසාද බැඳලා අවුරුදු තුනක් ඇතුළත දික්කසාද වන ප්‍රමාණය වැඩියි. ඒ නිසා කාන්තාවන්ව දැනුවත් කිරීම, වැඩමුළු පැවැත්වීම, අම්මා කෙනෙකුගේ වටිනාකම සමාජය තුළ මතු කරන්න ඕනෑ. (බාධා කිරීමක්)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාන්තාව ශක්තිමත් කරනවා කියලා කියන්නේ අපි මොනවා මොනවා හරි දීලා විතරක් නොවෙයි. කාන්තාවන්ගේ දැනුම, බුද්ධිය විශේෂයෙන්ම රැකියා අවස්ථාවලට යන අපේ කාන්තාවන්ට තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි කාන්තාවන්ගේ දරුවන්ව අපි කොහේද තියලා යන්නේ කියන එක. අද රටේ වන අපයෝජන ගොඩක්වලට බලපාන්නේ, අම්මා තාත්තා ගෙදර නැති වුණාමයි. රස්සාවට ගියාමයි. එතකොට මේ රස්සාවට යන කාන්තාවන්ගේ දරුවන්ට රැකවරණ මධ්‍යස්ථාන, ඇති කරන්න ඕනෑ. ඒ වාගේ අපේ කාන්තාවෝ ශක්තිමත් කරන විශේෂ වැඩ සටහන් කරන්න ඕනෑ. මොකද, මේ ලෝකයේ ඉන්න සම්පත, වස්තුව තමයි අම්මා කියන කෙනා. මේ අම්මාව රැක ගන්න මීට වැඩිය වැඩ සටහන් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. ඇත්තටම ලෝක කාන්තා දිනයේදී වුණත් - කාන්තාවට තැන දෙන්න ඇමැතිතුමනි. කවදාවත් වරදින්නේ නැහැ. අම්මාට සලකන කෙනා තමයි ගැහැණියට සලකන්නේ. තමන්ගේ බිරිඳට සලකන්නේ. ඒ නිසා ඔබතුමා කාන්තාවට විශේෂ අවධානය යොමු කරන්න. මොකද, අද දවසින් දවස අපේ කාන්තාවෝ පිරිහෙන විදිය දැක්කාම ඉතාමත් කනගාටුයි. දැනුම, ආකල්ප, කුසලතා ඉතාමත්ම අඩුයි. මොකද, දැන් ඉන්න අයට නම් ටිකක් හරි සලකනවා. අපි වාගේ මධ්‍යම වයසේ ඉන්න කාන්තාවෝ හරියට දුක් විඳලා තමයි

විවාහයක් කර ගන්නේ. ඒ අයට දැනුම නැහැ. මෝඩකම් නිසා ගොඩක් දේවල් කරනවා. ඒ නිසා දැනුම වර්ධනය කරන වැඩ සටහන් කරන්න කියලා ඔබතුමාගෙන් මා කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ වාගේම මත්පැන්. අද අපේ කාන්තාවෝ ගොඩක් දුක් විඳින්නේ මත්පැන් සම්බන්ධව. ඒකට මොනවා හරි පියවරක් ගන්න. ඒක අපි ඔබතුමාට කියලා වැඩක් නැහැ. ගියපාර බියර්වලින් අඩු කරපු එක මේ පාර ඩබල් ට්‍රිබල් කරලාවත් දෙන්න. එතකොට මත්පැන් බීම අඩු කරන්න. ප්‍රශ්න වෙන්නේ, කාන්තාවෝ වැඩියෙන්ම පීඩනයට ලක් වෙන්නේ මත්පැන් බීපු මිනිස්සු නිසා. ආර්ථිකය විනාශ වෙන්නේ මත්පැන් බීපු මිනිස්සු නිසා. සෞඛ්‍ය, අද ගොඩක් මිනිස්සුන්ට ලෙඩ රෝග හැදෙන්නේ ඔය ජරා අරක්කු වර්ග බීම නිසා. ඉතින් පොලීසියත් එක්ක එකතු වෙලා ඒවාට අනිවාර්යෙන්ම මොනවා හරි ක්‍රියා මාර්ග, වැඩ සටහන් ගන්න ඕනෑ ඇමැතිතුමනි. රටක් විධියට දරුවෝ කාන්තාවෝ රැක ගන්න ඕනෑ නිසා. (බාධා කිරීමක්)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම පරිවාස හා ළමා රක්ෂක සේවා ගැන කථා කරන්න ඕනෑ. මොකද, මමත් ළමා නිවාසයක් කරන කාන්තාවක්. මගේ නිවාසයේත් ගැහැණු දරුවෝ 22 ක් හැදෙනවා. ඔබතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ අපේ බස්නාහිර පළාතේ ඒඩ්ස් හැදුණු දරුවන් සිටිනවා. මේ දරුවෝ නිවාසගත කරන්න බැහැ. හැම නිවාසයකටම දෙන්න බැහැ. විශේෂයෙන්ම ඒවා තිබෙනවා. ලංකාවේ කිසිම ආයතනයක් නැහැ ඒඩ්ස් හැදුණු දරුවන්ව තියාගන්න. මේ දරුවෝ වෙනුවෙන් විශේෂ ආයතනයක් හදන්න. මේ දරුවෝ කිසිම කෙනෙකුට වරදක් කරන්නේ නැති අහිංසක දරුවෝ. කාගේ හරි වරදකට ඒඩ්ස් රෝගය වැළඳුණාම කිසි කෙනෙක් භාර ගන්නේ නැහැ. ඉතින් මේ දරුවන්ට ඉන්න පුළුවන් ආයතනයක් හදන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම අධි මානසික දරුවෝ ඉන්නවා. ඒ දරුවෝ නිවාසගත කළාම ඒගොල්ලන් එක දෙයක් හයියෙන් කරන අය. අධි මානසිකත්ව දරුවෝ. ලෝකයේ ඉතා ප්‍රසිද්ධ, නම ගිය දාර්ශනිකයෝ, විද්‍යාඥයෝ බිහි වෙලා තිබෙනවා අධි මානසිකත්ව දරුවෝ විධියට. මේ අයට රෝහල් කිට්ටුව මොනවා හරි ආයතනයක් හදන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, එහෙම කිසිම ආයතනයක් ලංකාව තුළ නැහැ, ගරු ඇමැතිතුමනි. ඒ දරුවෝ රටට සම්පතක් කර ගන්න පුළුවන්. වෛද්‍යවරයෙක් ඉන්න තැනක ඒ වාගේ ආයතනයක් හැදුවාම. ඒ දරුවෝ හඳුනා ගන්න පුළුවන් ඒ වාගේම කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නීතියේ රැකවරණය ලබන දරුවන් සිටිනවා. ඒ රැකවරණය දෙන ආයතන මාකොළ, රන්මුතුගල වාගේ තැන් හතරක තිබෙනවා. අපේ එහෙම දරුවන්ගේ රැකවරණය සඳහා. විවිධ නඩුවලට සම්බන්ධ, පාතාලයට සම්බන්ධ වුණු විවිධ ප්‍රශ්නවලට මැදි වුණු දරුවන්ගේ රැකවරණ මධ්‍යස්ථාන හතරක් පළාත් සභාවට අයිතිව, අපට තිබෙනවා. මේ ආයතන හතරට සාමාන්‍යයෙන් කම්කරුවන් සහ මුරකරුවන් පමණයි සිටින්නේ. හැබැයි මේ වාගේ තැන්වලට ප්‍රහාරයක් හරි මොකක් හරි දෙයක් එල්ල කිරීමට පෙර, මේ දරුවන් රැගෙන යෑමට පෙර මේවාට පොලිස් රැකවරණය ලබා දෙන්න. ඒක අනිවාර්යෙන් කරන්න. කවදා හරි දවසක අපට පසුතැවිලිවීමට පෙර. මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරලා මේ තැන්වලට පොලිස් රැකවරණය අනිවාර්යයෙන්ම ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් මා කාරුණිකව ඉල්ලා සිටිනවා. දරුවෝ, කාන්තාවෝ ගැන සෞඛ්‍ය අමාත්‍යාංශය ඔබතුමාට අයිති එකක්. ඒ ගැන මීට වැඩිය ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා කාන්තාවක් විධියට, මවක් විධියට කාරුණිකව ඉල්ලා සිටිනවා.

[පූ.භා. 11.42 ]

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කිරීම සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධව. විශේෂයෙන්ම උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට අපේ ගරු ඇමැතිතුමා සංවේදීව ගොඩක් වෙලාවට මන්ත්‍රීවරුන්ගේ අදහස් යෝජනාවලට කන් දීලා, අපි ගොඩක් වෙලාවට ඇමැතිතුමාගෙන් යම් යම් ඉල්ලීම් කළාම එතුමා හැකි සෑම අවස්ථාවකදීම අපට අවශ්‍ය ඒ සහයෝගය, ශක්තිය ලබා දෙනවා. මම එතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ආසනයේ මීගමුව මැතිවරණ බල ප්‍රදේශයේ, මීගමුව මූලික රෝහල පිළිබඳව තමයි විශේෂයෙන්ම අවධානය යොමු කරන්න වෙලා තිබෙන්නේ. මොකද, මීගමුව රෝහල කියන්නේ, එක පැත්තකින් නිදහස් වෙළඳ කලාපය තිබෙනවා. අනෙක්

[ගරු එස්. සකාවුල්ලා ]

පැත්තෙන් ජාත්‍යන්තර ගුවන් තොටුපළ තිබෙනවා. අනෙක් පැත්තෙන් මීගමුව කියන්නේ සංචාරක පුරවරයක්. ඒ නිසා මීගමුව රෝහල දිහා බලලා තමයි මම හිතන විධියට ගුවන් තොටු පළෙන් විදේශිකයෙක් ලංකාවට ආවාම, යම්කිසි රෝගී තත්ත්වයක් ඇති වුණාම ඇතුළත් කරන්න තිබෙන්නේ රජයේ රෝහලට. ඒ ආසන්නම තිබෙන රෝහල තමයි මීගමුව රෝහල. ඒ වාගේම සංචාරකයෙක් මීගමුවට ආවාම හෝටලයකදී යම්කිසි අකරතැබ්බයක් වුණාම සෞඛ්‍ය සේවාව සඳහා විශේෂයෙන්ම රජයේ රෝහලක් හැටියට ඇතුල් වෙන්නේ මීගමුව රෝහලට. ඒ නිසා මීගමුව රෝහල තමයි ලංකාවේ සෞඛ්‍ය තත්ත්වය රටට ගෙන යන ස්ථානයක් බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මම තමුන්නාන්සේ හරහා සෞඛ්‍ය ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා, අද මීගමුව රෝහල එදාට වඩා යම්කිසි උසස් මට්ටමක පැවතුණත් අනෙකුත් රටවල්වලට සාපේක්ෂව සතුටු වෙන්න පුළුවන් හැකියාවක් නැහැ. මම විශේෂයෙන්ම මතක් කරනවා. තමුන්නාන්සේට මතක ඇති ගිය අවුරුද්දේ අපි මීගමුව රෝහලේ මහල් හතකින් සමන්විත අවුරුදු ගණනකට කලින් කොරියානු රජය මැදිහත් කරගෙන, අපේ හිටපු අමාත්‍ය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා ඒ කාලේ මේකට විශාල උත්සාහයක් දැරුවා, මේ රෝහලේ තිබෙන අඩුපාඩු සම්පූර්ණ කරන්න. තමුන්නාන්සේගේ කාලයේ, පසුගිය අවුරුද්දේ මේ සඳහා විශාලා මුදලක් වැය කරලා මේ තට්ටු හතේ ගොඩනැගිල්ල ඉක්මණින් අලුත්වැඩියා කරලා, අලුත් ක්‍රමයට හදන්න යෝජනා ගෙනැල්ලා, ඒ වැඩ කටයුත්ත පටන් ගත්තා. මම හිතන විධියට බස්නාහිර පළාත් සභාවේ සල්ලි නැති වුණත්, රේඛීය අමාත්‍යාංශය හරහා ඒ මුදල් ලබා දුන්නත්, උපදේශක කාරක සභාවේදී අපි සෞඛ්‍ය ඇමැතිතුමාගෙන් ඇහුවා මේ රෝහලේ කටයුතු කවදාද ඉවර වෙන්නේ කියලා.

ඇත්තටම අපි කනගාටු වෙනවා අපේ සෞඛ්‍ය ඇමැතිතුමා, මේකේ ඉන්න අධ්‍යක්ෂවරු ඒ කවුරුත් දන්නේ නැහැ මේකේ මොකක්ද වෙන්නේ කියලා. අපි ඇහුවා මේකට සල්ලි කොපමණද යොදවලා තිබෙන්නේ කියලා. තට්ටු කීයක් මේ වනකොට ඉවර කරලා තිබෙනවාද? කොපමණ කාලයකින් ඉතුරු ටික නිම කරනවාද කියලා ඇහුවාම ඒකට උත්තරයක් දෙන්න අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ට සහ අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාට හැකියාවක් තිබුණේ නැහැ. ඒකෙන් අපට දැනෙන්නේ යම්කිසි බලවේගයක් විසින් මේක පසුගිය කාලය තුළ මේ රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා මීගමුව මහ රෝහලට කොරියාවෙන් දීපු ගොඩනැගිල්ලේ වැඩ කටයුතු කරන්න මැදිහත් වෙලා තිබෙනවා. අපේ අමාත්‍යාංශයට කිසිම තොරතුරක් ලබා දෙන්නේ නැහැ. ඒක කනගාටුවට කාරණාවක්. අපි මීගමුවේ ජීවත් වන ජනතාව හැටියට මිනිස්සු අපෙන් ඇවිල්ලා අහනවා. අවුරුදු ගණනක් තිස්සේ මේක හදනවා. මේක කවදාද ඉවර වෙන්නේ? මේ ගොඩනැගිලි කීයක් ඉවර වෙලාද? අවසාන වශයෙන් ඇමැතිතුමා ඒකේ කොන්ත්‍රාත්කරුවන්ව උපදේශක කාරක සභාවට ගෙන්නුවා. ගෙන්නලා එතුමන්ලාගෙන් පොරොන්දුවක් ගත්තා. තට්ටු තුනක් හෝ හතරක් මාස දෙකකින් ඉවර කරලා දෙනවා කිව්වා. නමුත් ඊට පස්සේ ඒකට කිසිම ප්‍රතිචාරයක් දැක් වූයේ නැහැ. මම බලාපොරොත්තු වෙනවා මේ ගොඩනැගිල්ල පිළිබඳව එතුමා යම්කිසි තොරතුරක් දන්නවා නම් ඇමැතිතුමාගේ පිළිතුරු කථාවේදී කියයි. අනාගතයේදී මේක සම්පූර්ණ කරලා දෙන දවස එතුමාට කියන්න පුළුවන් හැකියාව තිබෙනවා නම්, ඒක එතුමාගේ පිළිතුරු කථාවේදී අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහජන නියෝජිතයෝ හැටියට අපි නිතරම ගිහිල්ලා ආරෝග්‍යශාලාවලට ඇතුළත් වෙලා වැඩ කටයුතු කරන්න බැරි නිසා අපට දීලා තිබෙනවා යම්කිසි කෝටා එකක් රෝහල් කමිටුවේ සාමාජිකයෙක්ව පත් කරන්න. ඒ අනුව අපි ඡන්ද කාලයේදී අපේ පෝලිම් බූත් එකට ගිහිල්ලා අපේ පාක්ෂිකයාව ඉන්දවනවා වාගේ නොවෙයි. අපි පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු, බොහෝ අවස්ථාවලදී උගතුන්, බුද්ධිමතුන්, විද්වතුන් ඒ වාගේම යම්කිසි සමාජ සත්කාරවලට කැප කිරීම් කරන්න පුළුවන් අයව තමයි රෝහල් කමිටුවට නම් කරලා යවන්නේ. මීගමුව රෝහලට, මම කනගාටු වෙනවා, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ මීගමුව රෝහලේ අධ්‍යක්ෂවරු හත් දෙනෙක් මාරු වෙලා තිබෙනවා. ඒ නිසා වර්තමාන අධ්‍යක්ෂවරයාට මම ඒ චෝදනාව කරන්නේ නැහැ. එතුමා ඇවිල්ල ටික කාලයක් වෙන්න ඇති. ඒ පසුගිය අවුරුදු දෙකක කාලය තුළ රෝහල් කමිටුව කැඳවලා තිබෙන්නේ දෙවතාවයි. සාමාන්‍යයෙන් මරණාධාර සමිතියක, ත්‍රිවිල් සමිතියක, එම නැත්නම් සුභසාධක සමිතියක, ඕනෑම තැනක සාමාජිකයෙක් ගිහිල්ලා අවශ්‍ය නිවේදන නිකුත් කරලා කමිටුවට සහභාගී වුණේ නැත්නම්, තුන් පාරක් ගියේ

නැත්නම් අවලංගු කරනවා. ඒ වාගේම රෝහල් කමිටුවටත් තුන් පාරක් ගියේ නැත්නම්, සහභාගී වුණේ නැත්නම් ඒ සාමාජිකත්වය අත්හිටුවනවා. නමුත් මේ ක්‍රමය තුළ අධ්‍යක්ෂවරයා හෝ නිසි බලධරයා මේ සාමාජිකයන් කැඳවූයේ නැත්නම්, ඒ අයට මොකක්ද වෙන්නේ කියලා කොහේවත් සඳහන් වෙලා නැහැ. ඒක කනගාටුදායක කරුණක්. අපි වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් කවුරු හරි ගිහිල්ලා රෝහලේ අවශ්‍යතාවය එහෙම නැත්නම් අඩුපාඩු සොයලා බලලා අපට ඇවිල්ලා කිව්වාම මේ සභාවේ කථා කරන්න පුළුවන්. උපදේශක කාරක සභාවල කථා කරන්න පුළුවන්. අමාත්‍යවරයා එක්ක කථා කරලා, පුද්ගලිකව අපට මැදිහත් වෙලා ඒ රෝහලට අවශ්‍ය වැඩ කටයුතුවලට මැදිහත් වෙන්න පුළුවන්. නමුත් ඒ ක්‍රමවේදය අක්‍රිය වෙලා තිබෙනවා. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යවරයාගේ අවධානයට යොමු කරනවා. අනාගතයේදී මේ ක්‍රමවේදයට යම්කිසි සුදුසු ක්‍රමයක් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා. ඒ වාගේම මීගමුව රෝහලේ විශේෂිත වූ ප්‍රශ්නයක් තිබෙනවා. සායනික ගොඩනැගිල්ල සම්බන්ධව. මම හිතනවා වෛද්‍යවරු පරීක්ෂා කෙරුවාට පස්සේ ගොඩක් වෙලාවට සායනය සඳහා ඉදිරිපත් වෙලා - රෝගී තත්ත්වයට පත් වෙන්නේ වයෝවෘද්ධ අය. ඇවිදින්න බැරි අය. විශ්‍රාම ගිය අය. අපේ අම්මා තාත්තා වාගේ අය ගියාම රෝහලෙන් බෙහෙත් ගන්න පල්ලෙහා මහලෙන් තුණ්ඩුව අරගන්නවා. දොස්තර පරීක්ෂා කළට පස්සේ ඒ බෙහෙත් ටික ලබා ගන්න උඩ තට්ටුවට නඟින්න ඕනෑ. ඉතින් ඒ නිසා විශාල විවේචනයක් තිබෙනවා. රෝගී තත්ත්වයේ පසුවන ඒ වයෝවෘද්ධ අයට උඩ තට්ටුවලට ගිහිල්ලා ඒ අවශ්‍ය බෙහෙත් ලබා ගැනීමේදී ගොඩක් වෙලාවට, අපහසුතාවලට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරලා ඒ අයට පහසු වන ආකාරයකින්, ඒ අයට සුදුසු වන ආකාරයකින් ඒ කටයුත්ත කරලා දෙන්න කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා සෞඛ්‍ය ඇමැතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි.

ඒ වාගේම විශේෂයෙන්ම පසුගිය කාලය තුළ අපට සුභසාධන කටයුතු සඳහා ගරු සෞඛ්‍ය ඇමැතිතුමා අපට ලබා දුන්නා අඩු ආදායම්ලාභීන් සඳහා ඇස් කණ්ණාඩි ඒ වාගේ දේවල්. අපි ඉල්ලීම් කළාම ඒ අවශ්‍යතාවය එතුමා ලබා දීම සම්බන්ධයෙන් මම එතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අනාගතයේදී මීගමුව රෝහල සුවිශේෂී රෝහල් හැටියට, මට මතකයි රෝහල් මෘත ශරීරාගාර ඒකකය අක්‍රිය වෙලා තිබුණා. ඒ සඳහා මුදල් යොදවලා තිබෙනවා. ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. ඒක සම්මත කරලා තට්ටු හතේ ගොඩනැගිලි වාගේම රෝහලේ අනෙකුත් අත්‍යවශ්‍ය කටයුතුවලට ඔබතුමාගේ කාරුණික මැදිහත්වීම අපේක්ෂා කරමින්, ඔබතුමා මේ කටයුත්ත සඳහා ඉදිරිපත් වෙද්දී නිලධාරීන් සියලු දෙනාගේම සහයෝගය අහිංසක දෙමව්පියෝ, දරුවෝ වැනි සියලුම මහජනතාව වෙනුවෙන් බලාපොරොත්තු වෙමින් අවස්ථාව ලබා දීම සම්බන්ධව ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 11.52 ]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා කාලය ලබා දීම පිළිබඳව. ඇත්ත වශයෙන්ම අපේ සෞඛ්‍ය ඇමැතිතුමාගේ මේ වැය ශීර්ෂය පිළිබඳව පසුගිය වසර හතරේදීම මම අයවැය විවාදයේදී කථා කළා. සමහර කාරණා පිළිබඳව විවේචනාත්මකව කථා කළා. කරුණු පෙන්වලා දුන්නා. නව යෝජනා ඉදිරිපත් කළා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දැක්කේ නැහැ ඒ හා සම්බන්ධ කිසිදු යෝජනාවක්. මම හිතන්නේ මා විපක්ෂයේ මන්ත්‍රීවරයක් නිසා ඒවා අවධානයට ලක් වෙන්නේ නැති වෙන්න පුළුවන්. නමුත් මේ වනතෙක් අපේ මන්ත්‍රීවරු කථා කරපු බොහොමයක් කාරණාවලදී අපි මීට කලින් කථා කරපු, යෝජනා කරපු කාරණා තවමත් අඩාංගු වී තිබීමෙන් පෙනී යන්නේ අපේ ගරු ඇමැතිතුමාගේ අවධානය ඒ කරුණු කෙරෙහි යොමු වෙලා නැහැයි කියලයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා, සෞභාග්‍ය කියන එකේ කොටසක් සෞඛ්‍ය කියන්නේ. අපි දන්නවා ප්‍රීතිමත් ජාතියක්, සතුටින් ඉන්න ජාතියක් බවට පත් වෙන්න නම්, අනිවාර්යෙන්ම ඒ ජාතිය සෞඛ්‍ය සම්පන්න වෙන්න ඕනෑ. අපේ කියමනක් තිබෙනවා රජෙක් වුණත් වැඩක් නැහැ, ලෙඩෙක් වුණොත් කියලා. ඒක නිසා සෞඛ්‍ය අපේ ජීවිතයේ අතිශයින්ම වැදගත් කොටසක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සෞඛ්‍ය ඇමැතිතුමාගේ සෞඛ්‍ය කියන විෂයය ඇතුළේ මහ දැවැන්ත වැඩ කොටසක් තිබෙනවා. විශේෂයෙන්ම පළාත් සෞඛ්‍ය ඉහළ නැංවීමෙහිලා එතුමාට දැවැන්ත වගකීමක් තිබෙනවා. ඉතින් ඒ වගකීම ඉෂ්ට

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

කරන්න අපි කොතැනද ඉන්නේ කියන එක පිළිබඳව, අපි යළි හැරිලා බැලුවොත් හොඳයි කියලා හිතනවා.

මම කැමැතියි එක තැනකින් පටන් ගන්න. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන යම් කාරණා කිහිපයක් කිව්වා. විශේෂයෙන්ම අපි අද කාලයේ අවධානය යොමු කරන්නේ, බටහිර වෛද්‍ය ක්‍රමය ගැන විතරයි. අපි ඒකට කියනවා, එතුමාත් කිව්වා ඇලෝපති වෛද්‍ය ක්‍රමය. Allopathic Medicine කියලා කියනවා. නමුත් අද ලෝකය දියුණු වෙලා. අද ලෝකයේ Allopathy වෛද්‍ය ක්‍රමය, බටහිර වෛද්‍ය ක්‍රමය ගැන පමණක් අවධානය යොමු කරන්නේ නැහැ. ඒ වෙනුවට ඔවුන් අද වචනයක් පාවිච්චි කරනවා. Alternative Medicine.එහෙම නැත්නම් Integrative Medicine. තවත් විධියකට Complimented Medicine කියලා කියනවා. ඒ කියන්නේ, මේකට අපට කියන්න පුළුවන් විකල්ප වෛද්‍ය ක්‍රම. එහෙම නැත්නම් ඇලෝපති වෛද්‍ය ක්‍රමය වෙනුවට, සංකලන වෛද්‍ය විද්‍යාව කියලා කියන්නත් පුළුවන්. අනෙකුත් ලෝකයේ පිළිගත්තු ප්‍රතිකාර ක්‍රම. විශේෂයෙන්ම අපේ රටේ ඇලෝපති වෛද්‍ය ක්‍රමය හැරෙන්න, හෝමියෝපති - ජර්මනියේ හානමන් කියන වෛද්‍යවරයා සොයා ගත්තු වෛද්‍ය ක්‍රමයක් තිබෙනවා. අපේ ජනප්‍රිය වචනයක් තිබෙනවා විෂෙන් විෂ නැසෙයි කියලා. ඒ වෛද්‍ය ක්‍රමයේදී අපි සාමාන්‍ය ජීවිතයේදී විෂ වර්ග කියලා හඳුනාගන්න දේවල් පවා, උදාහරණයක් විධියට රසදිය වාගේ දේවල්. රත්තරන් වාගේ දේවල්. වෛද්‍ය ක්‍රමයේ අංශු මාත්‍ර වශයෙන් පාවිච්චි කරන අවස්ථා තිබෙනවා. ඒවා ඉතාම දියුණුයි. අපි අහලා තිබෙනවා, එංගලන්තයේ මහ රැජිණ පවා හෝමියෝපති ප්‍රතිකාරයි ලබා ගන්නේ කියලා. ඒ වාගේම අපේ අවුරුදු දස දහස් ගණනක් පරණ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තිබෙනවා. ඊළඟට යුනානි වෛද්‍ය ක්‍රමය තිබෙනවා. ඊළඟට චීන වෛද්‍ය ක්‍රමය. විශේෂයෙන් අපි පාවිච්චි කරනවා, කටු චිකිත්සාව. අපි අකුපංච කියලා කියනවා. මෙවැනි වෛද්‍ය ක්‍රම ගණනාවක් අද ලෝකයේ පාවිච්චි වෙනවා. දැන් මම වාර්තාවක් බැලුවා ඇමරිකා එක්සත් ජනපදයේ වැඩිහිටියන්ගෙන් 40% ක් කියනවා ඒගොල්ලෝ ප්‍රතිකාර සඳහා පාවිච්චි කරන්නේ බටහිර වෛද්‍ය ක්‍රමය නොවෙයි, Alternative Medicine. එහෙම නැත්නම් විකල්ප වෛද්‍ය ක්‍රමයයි කියන එක. සංකලන වෛද්‍ය විද්‍යාව කියන එක අද ලෝකයේ දියුණු වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා. ඔබතුමාත් විවිධ රටවල ඇවිදින කෙනෙක්. ඇයි මේ අපට මෙහෙම වෙලා තියෙන්නේ? ඇයි අපි මේ වාගේ තැනකට තල්ලු වෙලා තිබෙන්නේ? මේකට හේතුව තමයි අපේ මන්ත්‍රීතුමාත් කිව්වා අපි බහුජාතික සමාගම්වල ඖෂධ මාෆියාවට යට වෙලා. බහුජාතික සමාගම්වල ඒ සල්ලිවලට යට වෙලා, අපව ආක්‍රමණය කරලා ඉවරයි. ඒ නිසා අපි විකල්ප වෛද්‍ය ක්‍රම ගැන හිතන්නේ නැහැ. හිතන්න එපා ඇලෝපති වෛද්‍ය ක්‍රමයයි, බටහිර වෛද්‍ය ක්‍රමයයි තමයි රෝගීන් ප්‍රතිකාර කරන්න තිබෙන එකම ක්‍රමය කියලා. ඒ වෛද්‍ය ක්‍රමයෙන් සුව කරන්න බැරි බොහෝ රෝග මේ අනෙකුත් වෛද්‍ය ක්‍රමවලින්, ප්‍රතිකාර ක්‍රමවලින් සුව කරන්න පුළුවන් බව අපි දන්නවා.

හැබැයි ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයුර්වේද බෙහෙත් ශාලාවල ප්‍රමාණවත් බෙහෙත් නැහැ. සමහර අම්මලා උදේ ඉඳලා පෝලිමේ ඉන්නවා, බෙහෙත් ගන්න. බෙහෙත් ගන්න ආවාම වෛද්‍යවරයා කියනවා අම්මේ අහවල් කෂාය නැහැ. එතකොට අහනවා මහත්තයෝ කෙහෙන්ද අපට මේක ගන්න පුළුවන් කියලා. ඔබතුමා දන්නවාද සමහර වෛද්‍යවරු මේ ආයුර්වේද බෙහෙත් වර්ග එන රෝගීන්ගෙන් එකතු කරනවා කියලා. ආයුර්වේදයෙන් බෙහෙත් ගන්න එන රෝගීන්ගෙන් ආයුර්වේද රෝහල්වල බෙහෙත් එකතු කරනවා. සමහර වෛද්‍යවරු පොඩි සංගම් හදාගෙන ඉන්නවා. මේ වැඩිකොහේවත් නොවෙයි. මෙතුමාගේ දිස්ත්‍රික්කයේ සිද්ධියක් ගැන මම මේ කියන්නේ. කියනවා අම්මේ ඊළඟ දවසේ එනකොට පුළුවන් නම් අහවල් කෂාය වැඩිපුර තියෙනවා නම් ගෙනැල්ලා තියන්න. අනෙක් රෝගීන්ටත් බෙදලා දෙන්න කියලා. ඒ නිසා අපි මීට වඩා මේ ගැන සැලකිල්ල දක්වන්න ඕනෑ ගරු ඇමැතිතුමනි. ඔබතුමාට මුදල් මදි වෙන්න පුළුවන්. හැබැයි, මේ මුදල් ටික කළමනාකරණය කරන වැඩේදී ප්‍රමුඛතා ලේඛනගත කරන්න ඕනෑ. අඩුම තරමින් අපි කරන යෝජනාවක්. ඒ නිසා විකල්ප ප්‍රතිකාර ක්‍රමවලට මීට වඩා නැඹුරු වෙන්න අපේ සෞඛ්‍ය ඇමැතිතුමා, රාජිත ඇමැතිතුමා විශාල සේවයක් කළා. මොකද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේක කියන්න ලැජ්ජ වෙන්නේ නැහැ. මම රජයේ රෝහල්වලින් බෙහෙත් ගන්න කෙනෙක්. මගේ දරුවාට මීට මාසයකට කලින් දවස් අටක් රජයේ රෝහලේ නවත්වලා බෙහෙත් කළා. රජයේ රෝහලේ නවත්වලා, සමහර වෙලාවට දරුවා ළඟ හිටියේ මම. මොකද, මෙතැන පෞද්ගලික රෝහලේ වාගේ පහසුකම්

නැහැ. රට දෙමව්පියන්ට දරුවා ළඟ ඉන්න බැහැ. එහෙම පහසුකම් නැහැ. නමුත් අපි කොහොම හරි ඒක කළමනාකරණය කර ගත්තා. හැබැයි, මට ස්ථිර වශයෙන්ම බය නැතුව විශ්වාසයක් තිබෙනවා මගේ දරුවා රජයේ රෝහලෙන් බලා ගන්නවා කියලා. හැබැයි මම එතැන ඉන්න කොට දැක්කා රජයේ රෝහල්වල තිබෙන අඩුපාඩු. මගේ දරුවාට ඉංජෙක්ෂන් එක ගහන්න, ඒ ඉංජෙක්ෂන් ගහන කාමරයට ගෙන ගියාම මට හෙදිය කිව්වා, මේ ෆෑන් එක වැඩ කරන්නේ නැහැ. මේක ඇතුළේ හරි රස්නෙයි. කරන්න දෙයක් නැහැයි කියලා. එතකොට මොකක්ද කරන්නේ? මෙන්න මේ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒවායේ පහසුකම් අඩුයි. හැබැයි වෛද්‍යවරු අතිශයින්ම කැප වෙනවා. අපට චෝදනාවක් තිබෙනවා. මේ පළාතේ වෛද්‍යවරුන්ට වැටුපට අමතරව අතිරේක වැයක් ගෙවනවා කියලා. වැටුප 40,000 ක් නම්, 50,000 ක් නම් ඒ අයගේ අනෙක් දීමනා රුපියල් 120,000 ක් ගෙවනවා. අපට ඒ ගැන විවේචනයක් තිබෙනවා. හැබැයි ඒ විවේචනය වාගේම ඔවුන් කරන සේවය මහ විශාලයි. එහෙම වෛද්‍යවරු ඉන්නවා. ඒ වාගේම මේ මාෆියාවට යට වුණු වෛද්‍යවරු ඉන්නවා. හැබැයි, රෝහල්වල අපි දකිනවා. අසීමිත භෞතික සම්පත් අඩුවක් තිබෙනවා ගරු ඇමැතිතුමනි. මම දන්නේ නැහැ කොහොමද මේක කළමනාකරණය කරන්නේ කියලා. අපි චෝදනා කරලා වැඩකුත් නැහැ. අපි වෙන වෙන දේවල්වලට අනවශ්‍ය වැය ගොඩක් වැය කරනවා. හැබැයි, අපි වැය කරන්න ඕනෑ තැනට වැය කරන්නේ නැහැ. මේ නිදහස් සෞඛ්‍යයට, අපි විශාල මුදලක් වැය කරනවා.

ඉතින් රජයේ රෝහල්වලින් බෙහෙත් ගන්න කෙනෙක් හැටියට මම මේකත් කියන්න ඕනෑ. අපට රක්ෂණයක් තිබෙනවා. ගිය අවුරුද්දේ මට බෙහෙත් සඳහා රුපියල් 11,000 ක් වැය වුණා. හැබැයි, ඒ රුපියල් 11,000 මේ රක්ෂණයෙන් ගන්න අසීමිත දුකක් වින්දා. අපේ ලේකම්තුමා දන්නවා. ගෙවන්න බැහැයි කිව්වා. අන්තිමට මම පෙන්නලා දුන්නා, ඒගොල්ලෝ කරපු වැරැද්ද. ඊට පස්සේ ඒ මුදල ගෙව්වා. ඊට පස්සේ තවත් රුපියල් 5000 ක බෙහෙත් අරගෙන තිබෙනවා. මේ අවුරුදු පහටම රුපියල් 16,000 යි Insurance වලින් අරගෙන තිබෙන්නේ. ඒත් මේ අවසාන අවුරුදු දෙකේදී. මේ අවුරුද්දේදී රුපියල් 5000 ක බෙහෙත් ගත්තා, පෞද්ගලික රෝහලකින් කරපු පරීක්ෂණයකට. ඒ රුපියල් 5000 ට මට Insurance එකෙන් එව්වේ, Return වෙන චෙක් එකක්. බැංකුවට චෙක් එක දැම්මාම Return වුණා. ඊට පස්සේ ඒ Return චෙක් එක ආයිත් දීලා එක නිවැරදි වෙලා එන්න මාස දෙකක් විතර ගියා. මේ සැරේත් මට වෛද්‍ය වාර්තා ටිකක් ගන්න ඕනෑ වුණා. මම ආණ්ඩුවේ ඉස්පිරිතාලයට ගියා. ගිහිල්ලා වෛද්‍යවරයාට කිව්වාම මට මේ වාර්තා ටික ඕනෑ කියලා, කිසිම කරදරයක් නැහැ, රෝහලෙන් වෛද්‍ය ජවර්තා ටික ගත්තා. මම කියන්නේ සෞඛ්‍ය අංශයෙන් අපට විශාල සේවයක් සිද්ධ වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු ඇමැතිතුමනි, කායික මෙන්ම මානසික ව්‍යාධීන්ගේ සංඛ්‍යාව විශාල වශයෙන් ඉහළ යනවා. විශේෂයෙන් පාසල් ආශ්‍රිත දරුවන්ගේ ප්‍රශ්න විශාලයි. කායික රෝග වැඩි වෙන්න හේතුවත් මානසික ව්‍යාධීන්. මනෝ කායික ආබාධ විශාල වශයෙන් එනවා. ඒ නිසා මනෝ කායිකව ඇති වන ආබාධවලට මනසටයි බෙහෙත් කරන්න ඕනෑ. ඒ නිසා මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම සඳහා වන වැඩ සටහන් පළාත තුළ ක්‍රියාත්මක කළ යුතු යැයි මා විශ්වාස කරනවා. ඔබතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ඩෙංගු. ගිය අවුරුද්දේ අපි ලොකු වැඩ පිළිවෙළක් ඩෙංගු නැගගෙන ආපු වෙලාවේ ක්‍රියාත්මක කළා. හැබැයි ඒක එතැනම ඉවර වුණා. හැබැයි දැන් අපට පේනවා, මට මතකයි හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා ගිය සැරේ ඔබතුමාට යෝජනාවක් කළා අපි ක්ෂණික විහිදුම් බලකායක් වාගේ එකක් පටන් ගනිමු. ඩෙංගු කෙහෙන් මතු වෙනවාද දන්නේ නැහැ කියලා. මෙවැනි තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා අපි ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න ඕනෑ. වැඩ සටහන් සකස් කරන්න ඕනෑ. ඒ ප්‍රතිපත්ති තීරණය මත ඩෙංගු සඳහා, මෙවැනි රෝග සඳහා හදිසියේදී අවශ්‍ය වුණොත් අපි කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මේ සඳහා අපට අදහසක්වත් නැහැයි කියන එකයි. අපි බඳවා ගැනීම් කළා. ඒ බඳවා ගැනීම් පිළිබඳව වෙනම ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමන්ලා මුලින්ම කම්කරුවන් සඳහා 228 ක් බඳවා ගත්තා. ඒකෙන් පිරිසක් ස්ථිර කළා. මම මේ සභාවේදී ඔබතුමාගෙන් ප්‍රශ්න ඇහුවා. නමුත් පිරිසකට සුදුසුකම් නැහැයි කියලා දැන් ඒ පිරිසත් අයින් කරලා තිබෙනවා. ඊට පස්සේ මම ලේකම්තුමාගෙන් ඇහුවා, මේ අයින් කරපු පිරිසට මොකද වෙන්නේ කියලා. ඒ අයට සුදුසුකම් නැහැලු. සුදුසුකම් නැත්නම් අඩුම ගණනේ

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

ඒ අයව ස්ථිර කරන්න පුළුවන් සුදුසුකම්වලින් බඳවා ගත්තේ නැත්තේ ඇයි? හැබැයි දැන් ඒ පිරිස එළියට දාන්න බැහැ ඇමැතිතුමනි. ඒක මානුෂික නැහැ. ඊළඟට අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මතු කළා මට මතකයි. මේ අය බඳවා ගන්න කොට වයස 45 ක් නැහැ. හැබැයි දැන් ඒගොල්ලන්ට 45 පැනලා. 45 පැන්නා නම් ඒ අයට මොකක්ද වෙන්නේ? ඒගොල්ලන්ට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ ඇමැතිතුමනි. ඒ වෙලාවේ ඔබතුමන්ලාට සල්ලි තිබුණේ නැහැ. ඔබතුමන්ලා කලින් අයවැයෙන් මුදල් වෙන් කරගෙන තිබුණේ නැහැ. හැබැයි පස්සේ මොකද වුණේ? අධිවැයක් දරන්න සිද්ධ වුණා. වෙන වෙන ඒවායෙන් සල්ලි අරගෙන. ඊට පස්සේ මේකට අනුමැතිය ඉල්ලනවා. ඒ නිසා ඇමැතිතුමනි, මේවාට සැලසුමක් තියෙන්න ඕනෑ. මේවා ඔක්කෝම පැත්තකින් තියමු. ඒ 228. ඊට පස්සේ මේ මෑතකදී හදිසියේ කම්කරුවෝ 135 ක් එනවා, ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයට බඳවා ගත්තා කියලා. කාර්යාලයට ආවාම තමයි පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ දන්නේ. 135 ක් බඳවාගෙන කියලා. කොහෙන්ද ආවේ දන්නේ නැහැ. ඔබතුමාගේ ලේකම්තුමාගෙන් ඇහුවාම කියනවා. අපි වෙබ් එකේ දැම්මාලු. ඒ ක්‍රමය වැරැදියි. අපි ප්‍රශ්න කළා කොයි පත්තරේද මේක දැම්මේ කියලා. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දේශපාලනය කළ යුතුයි. බඳවා ගැනීම්, අපි එපා කියන්නේ නැහැ. මට නැති වුණාට කමක් නැහැ. හැබැයි විධිමත් ක්‍රමවේදයකට බඳවා ගන්න. විධිමත් ක්‍රමවේදයකට මුදල් වෙන් කර ගන්න. Budget එකෙන්, අයවැයෙන් අවශ්‍ය විධියට මුදල් වෙන් කරගෙන -

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

විනිවිදභාවයක් නැහැ ඒවායේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

විනිවිදභාවය තියෙන්න ඕනෑ. අනෙක් එක තමයි තනතුරු හඳුනා ගන්න. තනතුරු හඳුනාගෙන, ඒ ටික කරන්න. පස්සේ අධිවැයක් වුණා. කෙටි මාර්ග හොයාගෙන යන්න එපා කියන එක මම ඔබතුමාට යෝජනා කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක ඇතුළේ තව චෝදනාවක් තිබෙනවා. සමහරු කියනවා. අපට දුරකථන ඇමතුම් වලිනුත් කියලා තිබෙනවා, සල්ලිවලට මේ රස්සාවල් වික්කා කියලා. ඒක නිසා ගරු ඇමැතිතුමනි, මම කිසිසේත් විශ්වාස කරන්නේ නැහැ ඔබතුමා මේ පිළිබඳව දන්නවයි කියලා. හැබැයි මේ වාගේ දේවල් වුණා වෙන්න පුළුවන්. මම ඔබතුමාට චෝදනා කරනවා නොවෙයි. ඒ නිසා මේ ගැන සොයා බලන්න. ඔබතුමාට හොඳ නැහැ, එහෙම චෝදනාවක් එල්ල වුණොත්. (බාධා කිරීමක්)

ඒ වාගේම පළාතේ රෝහල් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සඳහා විදුලි ජනක මිලදී ගැනීමට මිලියන 36 ක් වෙන් කළා. ඇමැතිතුමා වෙන් කළා නේ? මේ පිළිබඳව චෝදනාවක් තිබෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත් වෙන නිසා මම මුකුත් කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැබැයි මේක නතර කරන්න කියලා ඔබතුමා නියෝගයක් දීලා තියෙද්දී ඊට සති ගණනකට පස්සේ ලේකම්තුමා ඇවිල්ලා රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී කියනවා, මේක නතර වුණේ නැහැයි කියලා. ඇහුවා, ඇයි නතර වුණේ නැත්තේ? ලේකම්තුමා නියෝගයක් දීලා තිබෙනවා නේ කියලා. එතකොට එතුමා නිරුත්තරයි. එතකොට ඉඳන් කිව්වා. නැහැ, මට නියෝගයක් ලැබුණේ නැහැයි කියලා. එතකොට මේගොල්ලෝ මේක අනුමත කිරීමේ නිවේදනය යවලා තිබුණා. ඒකෙන් මොකක්ද වුණේ? එතකොට අපේ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා කිව්වා නේ ඕනෑ නම් දැන් නතර කරන්න පුළුවන් කියලා. ටෙන්ඩර් එක අනුමත කරලා නිවේදනය යැව්වාට පස්සේ කොහොමද දැන් නතර කරන්නේ? ඊට පස්සේ ඒක යන්න වෙනවා සමතයකට. ඕනෑ නම් නඩු දාන්න පුළුවන්. හරියට අර පුටු ටිකට වුණා වාගේ. කවුරුත් දන්නේ නැති වුණාට මේ පුටු ටික සම්බන්ධයෙන් නෛතික ක්‍රියා මාර්ගයක් සිද්ධ වෙමින් පවතිනවා. නඩු දාන්න පුළුවන්. නඩු දාන්න අවශ්‍ය ලියුම එවලා තිබෙනවා මෙට්‍රෝපොලිටන් ආයතනයෙන්. මේවා ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. මේ මිලියන 36 ට මේකම වෙන්න පුළුවන්. ඒකෙන් පේනවා මෙතැන දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා කියලා. ඒ නිසා මේක ඔබතුමාගේ අත යටින් රිංගලා ගියා. කවුද වැරැදි කියලා මම මෙතැන කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ ටෙන්ඩර් එක සම්බන්ධයෙන් මෙතැන බරපතළ වරැද්දක් තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මේ පිළිබඳව සොයා බලන්න කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ළමාරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ තිබෙන මධ්‍යස්ථාන සම්බන්ධව ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ දරුවන්ගේ ජීවිත දු:ඛිතයි. ඒ පිළිබඳව සොයා බලන්න. මට මතකයි අපේ සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමිය ගිය අවුරුද්දේ මතු කළා විවිධ පාඨමාලා කාන්තාවන් වෙනුවෙන් කරනවා. නමුත් කාන්තාවන්ට ඒ වෙනුවෙන් සහායක් නැහැයි කියලා. මොකද, මම ඒ වාගේ වැඩ සටහන් කරනවා, ඔබතුමන්ලාගේ සහයෝගය නැතුව. කාන්තාවන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා. නමුත් එවැනි වැඩ සටහන් පිළිබඳව අවධානය යොමු වෙලා තිබෙනවාද මන්ත්‍රීතුමිය. එහෙම වෙලා තිබෙනවා නම් හොඳයි. මේ සඳහා අවධානය යොමු කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මෙතුමාට එකක් කියන්න ඕනෑ. සම්බාහන ආයතන සම්බන්ධයෙන්. ආයුර්වේදවල ලයිසන් එක යොදාගෙන, වෛද්‍යවරු යොදාගෙන මේක තනිකරම ගණිකා මඩම් පවත්වාගෙන යෑමේ ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙනවා. කරුණාකරලා මේවා අධීක්ෂණය කරලා, මේවා නියාමනය කරලා විධිමත් වැඩ පිළිවෙළක් මේකටත් සකස් කරන්න කියලා ඔබතුමාගෙන් අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා. කාලය ලබා දීම සම්බන්ධයෙන් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

[අ.භා. 12.08 ]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක, කාන්තා කටයුතු අමාත්‍යාංශයේ විවාදයට එක්වීමට ලැබීම ගැන මම මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි මේ අමාත්‍යාංශය දිහා බැලුවාම මම දකින්නේ, අධ්‍යාපනය හා සමානවම අපේ පළාත් සභාව තුළ කෙරෙන විෂයය කටයුතු තුළ ඉතාමත්ම වැදගත් අමාත්‍යාංශයක් තමයි මේ අමාත්‍යාංශය. මොකද, අනෙකුත් අමාත්‍යාංශවල වෙන දේවල් සහ කටයුතු නැවත නිවැරැදි කිරීමේ හැකියාවක් තිබෙනවා. මේ සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරද්දී, ඒ සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ කෙරෙන කටයුතුවල අවසාන ප්‍රතිඵලය බොහෝ වෙලාවට අපට නිවැරැදි කිරීමේ හැකියාවක් නැහැ. ඒ නිසා ඒ ප්‍රධානත්වය ඉලක්ක කරගෙන, අපි ඒ හා සම්බන්ධ කටයුතු, සංවර්ධන කටයුතු සහ ඒ ඉලක්ක තමයි අපි මේ අමාත්‍යාංශය තුළින් බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තාම බස්නාහිර පළාත තුළ මහ රෝහල්, මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්, ප්‍රාථමික රෝහල් සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන වාගේ රෝහල් ගණනාවකින් සම්බන්ධ වෙලා තමයි අපේ මේ සේවාව දිගටම ක්‍රියාත්මක කරමින් යන්නේ. ඒ තුළ තිබෙන සම්පත් දිහා බැලුවාම මේ විවාදය මුළුල්ලේම කථා වෙන්නේ ඒ රෝහල්වල තිබෙන සම්පත්වල ප්‍රමාදය.

ඒ වාගේම ඒ සම්පත් අඩුපාඩුව. හැබැයි අපි සෞඛ්‍ය ක්ෂේත්‍රය දිහා බැලුවාම මෙතැන විවිධ සෞඛ්‍ය ව්‍යාපෘති ගැන කථා කළා. පෞද්ගලික අංශය හා බලද්දී අපේ රෝහල්වලින් කොපමණ සේවාවක් වෙනවාද කියන එක අද අපට අමතක කරන්න බැහැ. මේ සෞඛ්‍ය ගැන කථා කරන කොට අද අපට විශාල පහසුවක් වෙලා තිබෙනවා. පෞද්ගලික රෝහල් සහ පෞද්ගලික ආයතනවලින් කෙරෙන සේවාව නිසා අද අපෙන් විය යුතු යුතුකම්වලින් භාගයකට වැඩි ප්‍රමාණයක් ඒ හරහා ජනතාව කරගන්න පුරුදු වෙලා තිබෙනවා. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා පසුගිය තිබුණු රජයේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය ගැන. අපි ඒ සෞඛ්‍ය ප්‍රතිපත්තියේ බොහෝ දේවල් දකිනවා. හොඳ දේවල් තියෙන්න පුළුවන්. නමුත් එතුමා කරගෙන ගිය කථාව තුළ එතුමා දිගින් දිගටම කිව්වේ මේ ප්‍රතිපත්තිය නිසා සෞඛ්‍යයේ ලොකු වෙනසක් ඇති වුණාය කියලා. එතුමා හෘද රෝග ගැන දිගින් දිගටම සාකච්ඡාවක් කළා. එතුමා හෘද රෝග සඳහා නොමිලේ ලබා දෙන Stent ගැන කථා කළා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික්කය ගත්තොත් මම දන්න හැටියට කොළඹ මහ රෝහලේ පමණයි හෘද රෝගයක් හැදුණොත් Stent ඇතුළත් කරන්න හෝ එහෙම නැත්නම් ශල්‍යකර්මයක් කරන්න පුළුවන් තැනක් විධියට තියෙන්නේ. ඒකෙත් දවසකට රෝගීන් බොහොම සුළු ප්‍රමාණයක් වෙන්න පුළුවන්. නමුත් කොළඹ දිස්ත්‍රික්කයේ ඉන්න ජනතාව, බස්නාහිර පළාතේ ඉන්න ජනතාවත් එක්ක බැලුවාම ඒක ඉතාමත් අල්ප මාත්‍ර ප්‍රමාණයක්. රෝගීන්ගෙන් විශාල ප්‍රමාණයක් මිය යනවා. මම ජීවත් වන හෝමාගම මැතිවරණ කොට්ඨාශය දිහා බැලුවාම හෝමාගම මූලික රෝහල ගොඩනැගිලි විශාල ප්‍රමාණයකින් අංග

[ගරු ජනක වැලිවත්ත]

සම්පූර්ණ වුණු රෝහලක්. මේ රෝහලේ රෝගීන් ලක්ෂ ගණනක් වර්ෂයකට බෙහෙත් ගන්නවා. අවිස්සාවේල්ල මූලික රෝහලත්, කළුබෝවිල රෝහලත් අතර තිබෙන ප්‍රධාන රෝහලක් වශයෙන් තමයි මේ රෝහල තිබෙන්නේ. නමුත් හදිසියේ හෘද රෝගයක් හැදුණු කෙනෙක් මේ රෝහලේ පහසුකම් තිබෙනවා කියලා මේ රෝහලට ගියොත් ECG පමණයි බලන්න පුළුවන්. එතැනින් එහාට ඒ රෝගය පිළිබඳව පරීක්ෂා කරන්න කිසි හැකියාවක් නැහැ. එහෙම රෝගයක් හැදුණොත් ඒ රෝගියා එක්කෝ කළුබෝවිල රෝහලට අරගෙන යන්න ඕනෑ. එහෙම නැත්නම් කොළඹ මහ රෝහලට. ඒ අතරතුර මිය යන රෝගීන් ප්‍රමාණය ඔබතුමා ගණනය කරලා බැලුවොත්, හෝමාගම රෝහල තුළ මාසයකට විශාල රෝගීන් ප්‍රමාණයක් මිය යනවා. මේ අඩුපාඩුව නිසා. ඒ නිසා පසුගිය ආණ්ඩුවේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය ගැන කොපමණ කථා කළාට, ඒ දේවල් නොමිලේ ලබා දෙන්න කටයුතු කළත්, මේ ග්‍රාමීය මට්ටමට එනකොට ලැබෙන සම්පත් ප්‍රමාණය අඩුයි.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. හෝමාගම මූලික රෝහල කේන්ද්‍රගත කරලා හෘද රෝග ඒකකයක් ඇති කරන්න. ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන්න. යම් මුදල් ප්‍රමාණයක් යන්නේ. එවැනි ඒකකයක් ඇති කරලා ඒ පහසුකම ලබා දෙන්න. ඒක හෝමාගමට විතරක් සීමා කරන්න එපා. හෝමාගමින් එහාට ගිහිල්ලා ඔබතුමන්ලාගේ කළුතර දිස්ත්‍රික්කයේ තැන් තැන්වල තෝරාගත් රෝහල් කිහිපයකට මේ අවස්ථාව ලබා දෙන්න. අනෙක් පැත්තෙන් ගියාම ගම්පහ දිස්ත්‍රික්කයේ තෝරාගත් ස්ථානවලට ලබා දෙන්න. මොකද, අපි දකිනවා සමාජය තුළ ජීවත් වෙද්දී, හෘද රෝගය හැදෙන රෝගීන්ට අවශ්‍ය කරන වේලාවට ඒ අවශ්‍ය කරන පරීක්ෂණ සහ බෙහෙත් වර්ග කර ගැනීමට නොහැකි වුණොත් එහෙම ඒ රෝගීන් මිය යන එක නවත්වන්න කාටවත් පුළුවන්කමක් නැහැ. අද සමහර වෙලාවට නොයෙක් දේවල්වලට මුදල් වියදම් කරන්න කථා කරනවා. නමුත් ඒකේදී වැඩි ප්‍රතිඵලයක් තිබෙන දේ හොයලා, ඒ සඳහා අපි මුදල් වියදම් කරන එක තමයි ගරු නියෝජ්‍යසභාපතිතුමනි, මම දකින්නේ ඉතාමත්ම වැදගත් කටයුත්ත කියලා. ඒ වාගේම අපි දකිනවා මේ සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා, ඒ වාගේම ගරු ඇමතිතුමා, ඒ නිලධාරී මණ්ඩලය මුදල් වියදම් කරලා ඉතා විශාල සේවාවක් කරන්න, මේ තුළ කටයුතු කරන්න ලොකු මහන්සියක් ගන්නවා. අපිත් දකිනවා. අපි කරන ව්‍යාපෘතිවලට මුදල් ලැබුණාම, අපි ප්‍රමාද වනකොට දුරකථනයෙන් නිතර නිතර කථා කර කර මේ අමාත්‍යාංශයේ ඉන්න නිලධාරීන් අපට කියනවා. මේ කටයුත්ත කරන්න. මුදල් ටික අපතේ යවන්න එපා. මේ මුදල් ටිකෙන් ඒ කටයුතු කරවන්න කියලා. නමුත් සමහර අවස්ථාවල ඒවා අපතේ යෑමක් වෙනවා ඇති. මම දකින විධියට මේ නිලධාරීන් කරන්න පුළුවන් හැකි උපරිම මහන්සියෙන්, මේ මුදල්වලින් උපරිම ප්‍රයෝජන ගන්න කටයුතු කරනවා. ඒ නිසා අවශ්‍ය කරන තැනට හරියාකාරව යොමු කරන්න කියන එක ඉල්ලා සිටිනවා.

මට සීමිත කාල සීමාවක් තිබෙන නිසා ගරු ඇමැතිතුමනි, මේ අමාත්‍යාංශයේ කාන්තා කටයුතු, සමාජ සේවා දෙපාර්තමේන්තුව, පරිවාස දෙපාර්තමේන්තුව ඒ වාගේම අනෙකුත් අමාත්‍යාංශවල විශාල සේවාවක් ජනතාවට කරන්න පුළුවන්කම තිබෙන අමාත්‍යාංශයක්. විශේෂයෙන් අපි මෙතැන කථා වුණා වාගේ, කාන්තා කටයුතු දෙපාර්තමේන්තුව හරහා - අද අපි ගමකට ගියාම තමන්ගේ කාලය හරියාකාරව ප්‍රයෝජනයට ගන්නේ නැතුව, නිකම්ම කාලය අතහරින කාන්තාවන් විශාල ප්‍රමාණයක් ගම්වල ඉන්නවා. හැබැයි මේ කාන්තාවන් කැමැතියි තමන්ගේ කාලය හරි දේකට යොමු කරලා, ස්වයං රැකියාවකට හෝ එහෙම නැත්නම් යම් පුහුණුවකට යොමු කරලා, ඒ තුළින් කටයුතු කරන්න. මොකද, මම දන්නවා. ඔබතුමාගේ අමාත්‍යාංශය හා සම්බන්ධ වෙලත්, ඒ වාගේ බස්නාහිර පළාත් සභාවේ නොවිධිමත් අධ්‍යාපන ඒකකය හරහාත් අපේ ප්‍රතිපාදන යොදවල අපි විවිධාකාර වැඩ සටහන් ප්‍රමාණයක් අපේ ආසන තුළ ක්‍රියාත්මක කරනවා. මේ සඳහා කාන්තාවන්ගේ විශාල උනන්දුවක් තිබෙනවා. ඒ කාලය කැප කරලා, ඒ පුහුණු නිලධාරීන් හා එක්ව ඉතාමත්ම හොඳට තමන්ගේ හැකියාවන් වර්ධනය කරනගෙන හොඳ නිෂ්පාදන කරන්න පුළුවන්කම ලැබෙනවා. නමුත් මම දකින හැටියට අනෙක් මන්ත්‍රීවරු කිව්වා වාගේ මේ සඳහා ලැබෙන මුදල් ප්‍රමාණය මදී. ගරු ඇමැතිතුමනි, මේ වෙන් කරන මුදල් ප්‍රමාණය දෙගුණ, තෙගුණ කරලා මේ මුදල් ප්‍රමාණය වැඩි කරන්න. ඒ සඳහා නිලධාරීන් තව තවත් යොමු කරලා, ඒ කාන්තාවන් ඒ සඳහා යොමු කිරීම තුළින් පුහුණුව ලබා ගන්නවා වාගේම ව්‍යවසායකයින් බවට පත් වෙන්න අවශ්‍ය කරන උපදෙස්, දැනුම සහ අවශ්‍ය කරන කටයුතු ලබා දෙන්න කියන එක ඉල්ලා සිටිනවා.

මොකද, ඒ තුළින් අපි දකිනවා අද තිබෙන සමාජය තුළ ගෙදරක උපයන්නේ ස්වාමි පුරුෂයා පමණක් නම්, ඒ උපයන මුදල තමන්ගේ දවසේ එදිනෙදා වියදම්වලට මදි. ඒ නිසා ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගෙදර කාන්තාව කුමක් හෝ ස්වයං රැකියාවකට යොමු කරන එක ඉතාමත් වැදගත්. එහෙම නොවුණොත් තමයි අපේ කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අර සම්බාහන ආයතනවලට කාන්තාවන් යොමු වීමට සිදු වෙලා තිබෙන්නේ. අද මෙතුමා කථා කළා වාගේ මහරගම ආසනය තුළ සම්බාහන ආයතන 400 ක් විතර තියෙනවාලු. ඉතින් එවැනි තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ කිසිම පුහුණුවක් නැතිව කරන්න පුළුවන් එකම දේ ඒ දේ. ඒ නිසා ඒ තත්ත්වයට කාන්තාවන් යොමු කරන්නේ නැතුව, කාන්තාවන්ට අවශ්‍ය කරන පුහුණුව ලබා දීම සඳහා - අපි මේක එක විෂයයක් කියලා පමණක් තීරණය කරන්නේ නැතුව, තිබෙන සල්ලි ටික ඔක්කෝම සෞඛ්‍ය අමාත්‍යාංශයට යොමු කරන්නේ නැතුව, ගොඩනැගිලිවලට යට කරන්නේ නැතුව ඒ මුදලින් විශාල ප්‍රමාණයක් පුහුණුව සඳහා යොමු කරන්න කියන එක ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් සභාව තුළ විශාල සේවාවක් කරගෙන යනවා. ඒකට හැකියාවක් නැති, ආර්ථික ශක්තියක් නැති, ඉතා අසරණ තත්ත්වයට, දුබල තත්ත්වයට පත් වුණු තැනැත්තන් වෙනුවෙන් උදව් උපකාර කරන්න තිබෙන අමාත්‍යාංශය ගරු ඇමැතිතුමනි. ඒ තුළ අපි නොයෙක් වෙලාවට ගමට ගියාම දකිනවා අද ආදායම් නැති විශාල පිරිසක් ඉන්නවා අසරණ තත්ත්වයට පත් වෙලා. රෝද පුටුවක් ගන්න විධියක් නැහැ. එහෙම නැත්නම් ඇස් කණ්ණාඩි යුගයක් ගන්න විධියක් නැහැ. එහෙම නැත්නම් තමන්ට හෝ දරුවෙකුට හෝ මොකක් හරි ශල්‍යකර්මයක් කරන්න හෝ යමක් කිරීම සඳහා අමතර මුදලක් ලබා ගැනීමට හැකියාවක් නැහැ. එතකොට ඒ මිනිස්සු ඉතා අසරණ තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා ගරු ඇමැතිතුමනි, වර්ෂය තුළ වෙන් කරන මුදල් ප්‍රමාණය මීට වඩා වැඩි කරන්න. ඒ තුළින් අපට පුළුවන්කම ලැබෙනවා ඒ ප්‍රදේශවල ඉන්න, ඉතා අසරණ තත්ත්වයට පත් වූ ජනතාවට අවශ්‍ය පහසුකම ලබා දෙන්න. ඒ පහසුකම ලබා දීම තුළ මම හිතන්නේ එය අපි කරන ලොකු සේවාවක් බවට පත් වෙනවා. රක්ෂණයක් තිබෙන අයට, රැකියාවක් තිබෙන අයට වෙනත් වෙනත් ක්‍රම යොදාගෙන තමන්ගේ ඒ අවශ්‍යතාවයන් ඉටු කර ගන්න පුළුවන්කම තිබෙනවා. නමුත් පිහිට වෙන්න ක්‍රමයක් නැතිව ඉන්න අසරණ ජනතාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා වේවා, එහෙම නැත්නම් ග්‍රාම නිලධාරී කාර්යාල හරහා වේවා අපේ පළාත් සභාව තුළින් ලබා දිය හැකි විශාල මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න සමාජ සේවා දෙපාර්තමේන්තුවට අපේ ශක්තිය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමා හරහා යෝජනා කරන්නේ, අපේ ප්‍රදේශය තුළ තිබෙන තවත් විශාල ගැටළුවක් තමයි මානසික ආතතිය සහ මානසික ගැටළු නිසා ජනතාව එදිනෙදා මුහුණ දෙන ගැටළු. මේවා සඳහා කවුසිලින් සේවාවක් ඇති කරන්න. මේවා සඳහා ප්‍රචාණතාවයක් ඇති කරන්න. අපේ මේ අමාත්‍යාංශවලින් අවශ්‍ය කටයුතු කරලා, ඒ සඳහා නිලධාරීන් යොදවලා මිනිස්සුන්ගේ එදිනෙදා ඇති වන ගැටළු සහ පවුල්වල ඇති වන ප්‍රශ්න පිළිබඳව විසඳුමක් ලබා දෙන්න පුළුවන් තත්ත්වයකට මේ අමාත්‍යාංශය තුළින් අපට කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මේ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් යොදවලා ඒ අවශ්‍ය සේවාව කරලා දෙන්න කියන එක තමයි මම ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය හරහා ඉල්ලා සිටින්නේ. ඔබතුමා පසුගිය වසර කිහිපය තුළ මේ අමාත්‍යාංශය හොඳ තැනකට ගෙන එන්න විශාල කටයුත්තක කළා. ඒ වාගේම අඩුපාඩු විශාල ප්‍රමාණයක් තිබෙන්න පුළුවන්. ඒ අඩුපාඩු හැකි පමණින් නිවැරදි කරමින් කටයුතු කරගෙන ආවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේ මේ පළාත් සභාව මාස හතරක වාගේ කාලයක් තිබෙන්නේ. මේ මාස හතරක කාලය තුළ ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ලැබෙන උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය ලබාගෙන, ඉදිරි දින කිහිපය සැලසුම් සකස් කරලා වර්ෂය ආරම්භ කරන ජනවාරි පළමුවැනිදා මේ කටයුත්ත සඳහා ඒ මුදල් ටික යොදවලා හැකි ඉක්මණින් ඒ කටයුත්ත කරන්න කියන එකත්, ඔබතුමාගේ අයවැය යෝජනාවට ඇතුළත් කරන්න කියන එකත් ඉල්ලා සිටිනවා. හෝමාගම මූලික රෝහලේ හෘද රෝග ඒකකය සඳහා අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන මේ වර්ෂය ආරම්භයේම යොමු කරලා ඒ කටයුත්තත් අනෙක් රෝහල් හා එකතුව කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 12.18 ]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම පළාත් සභාවේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක් වන සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව 2019 වර්ෂයේ මුදල් ප්‍රකාශනයට වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය යටතට ගැනෙන විෂයයන් ගැන කථා කරන කොට ගරු ඇමැතිතුමා බොහොම නිශ්ශබ්ද ඒ වාගේම මානසික ආතතියෙන් තොර අමාත්‍යවරයෙක් බව මම මේ වෙලාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, එතුමා තමයි මේ සභාව ඇතුළේ එතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගෙන් අතවරයට ලක් වුණු එකම ඇමැතිවරයා. නමුත් මම එදා එතුමාගේ හැසිරීම දැක්කා. මානසික සෞඛ්‍ය ඉතාමත් හොඳ තත්ත්වයකින් වර්ධනය කරගෙන සිටීම නිසා තමයි එවැනි හැසිරීමකින් එතුමාට මේ සභාවේ කටයුතු කරන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මැන්දිස්ලා ඒ වගේ නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔව්. විවිධ යෝජනාවල් කරන්න තිබෙන අතරතුරේ මම එතුමාට දෝෂාරෝපණයකුත් කරමින් තමයි මම මගේ කථාව ආරම්භ කරන්නේ. මේ යන්නේ මේ පළාත් සභාවේ අවසාන කාලය. තව මාස තුන හතරකට වැඩිය කාලයක් තිබෙන්නේ. 2019 වර්ෂයේ මේ පළාත් සභාවේ අපට මන්ත්‍රීවරු හැටියට කටයුතු කරන්න, ඔබතුමාට ඇමැතිවරයා හැටියට බොහෝ කාලයක් කටයුතු කරන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. හැබැයි මේ ගත වුණු සෑම මුදල් ප්‍රකාශනයකින්ම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරද්දී ඔබතුමාගෙන් ඉල්ලීම් කරපු ඒවායෙන් බොහෝමයක් බොහොම ඉබි ගමනින් තමයි දශම ගණනින් තමයි ඒවා පිළිබඳව වර්ධනයක් අපේ කොට්ඨාශවලට විශේෂයෙන්ම වත්තල සහ රාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශවලට ලැබුණේ. ගිය අවුරුද්දේත් ඔබතුමාගෙන් ඉල්ලුවා වත්තල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහා විධිමත් ගොඩනැගිල්ලක් ලබා දෙන්නය කියලා. ඔබතුමා මාව විවිධ තැන්වලට යොමු කරලා, ඒ සඳහා අවශ්‍ය කරන ඇස්තමේන්තු ලබා ගත්තා. නමුත් අපට 2018 අවසන් වනකනුත් බැරිව ගියා අඩුම තරමින් ඒ ගොඩනැගිල්ල ඉදි කරන්න උවමනා කරන කටයුතු ටික සම්පාදනය කර ගන්න. ඒ ගැන මම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. මම විශ්වාස කරනවා. ඔබතුමා අතිවිශාල ජනතාවක් ඉන්න, බොහොම සීමිත ඉඩකඩක ජීවත් වන ප්‍රදේශයක් වන වත්තල හැඳල ප්‍රදේශයේ මේ කටයුත්ත සඳහා ලබන අවුරුද්දේ ප්‍රමුඛතාවය ලබා දෙයි කියලා. මම ඔබතුමාට නිතර කරදර කරන්න එන්නේ නැහැ. හිතෙන දේවල් ඉල්ලන්නේ නැහැ. ඔබතුමාගෙන් යම්කිසි දෙයක් දුරකථනයෙන් ඉල්ලුවොත් පුළුවන් වෙලාවට ඒ දේ ඉෂ්ට කරලා දීලා තිබෙනවා. මම නැහැයි කියන්නේ නැහැ. ඒ බොහොම සුළු දේවල්. ඇස් කණ්ණාඩි ටිකක්. ඒ වාගේ දේවල්. නමුත් අපි පළාතට උවමනා කරන පහසුකම් සහිත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක් ඉල්ලන්නේ. ඔබතුමා ගිහිල්ලා එතැන බැලුවා. ඒකයි මට තිබෙන කනගාටුව. මීට අවුරුද්දකට විතර ඉස්සෙල්ලා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමයි, ඔබතුමයි, මමයි ගිහිල්ලා බලලා තමයි තීරණය කළේ. නමුත් ඒවායේ ප්‍රතිඵලයක් අපට ලැබුණේ නැහැ. ඒ ගැන මම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වාගේම අපේ මැතිවරණ කොට්ඨාශයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිබෙනවා උස්වැටකෙයියාව ග්‍රාමීය රෝහල. ඒ රෝහලේ වෛද්‍යවරයා ආවොත් බෙහෙත් කලවම් කරන්න කෙනෙක් නැහැ. බෙහෙත් කලවම් කරන කෙනෙක් ආවොත් මුරකාරයෙක් නැහැ. මේක නිකන් අත හැරලා දාපු කාර් එකක් වාගේ. මේ ප්‍රදේශය ඇවිල්ලා දුප්පත් ධීවර ජනතාව නියෝජනය කරන ප්‍රදේශයක්. හතර වටේම රෝහල් තිබෙනවා. එතැනින් රාගමට එන්න පුළුවන්. කොළඹට යන්න පුළුවන්. එච්චර ලොකු අමාරුවක් නැහැ. නමුත් මෙතැනට එන්නේ, ඇත්ත වශයෙන්ම කියනවා නම්, බස් ගාස්තුව සොයා ගන්න බැරි, අහිංසක ධීවර ජනතාව. ඒක නිසා ඒ මිනිස්සු ගැන තමයි අපි කටයුතු කරන්න ඕනෑ. ඇති හැකි අය ගැන නොවෙයි. නැති බැරි මිනිස්සු ගැන. ඒ නිසා මේ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම කල්පනා කරනවා. මේකට අවශ්‍ය කරන පහසුකම් ටික, මානව සම්පත සහ භෞතික සම්පත් ටික ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තමයි අපි දැක්කා පසුගිය වසර කිහිපය තුළ අපේ රටේ විශාල ව්‍යසනයක් ලෙස ඩෙංගු රෝගය බරපතළ ලෙස පැතිර ගියා. එතැනදී ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා විශේෂයෙන්ම අපේ කොට්ඨාශවල

මේ ඩෙංගු වසංගතය මර්දනය කරන්න අවශ්‍ය කරන වැඩ සටහන් ක්‍රියාත්මක වුණා. විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, අපේ ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂතුමාටත්, ඒ වාගේම අපේ වත්තල සහ රාගම ඉන්න MOH මහත්වරුන්ටත්. ඒ කාර්ය මණ්ඩලයටත්. ඉතා විධිමත් විධියට කාල වේලාව බලන්නේ නැතුව නිවාඩු දවස්ද මොනවාද කියලා බලන්නේ නැතුව අපට උවමනා කරන දැනුවත් කිරීම්, රැස්වීම් පවත්වලා මිනිස්සු දැනුවත් කරලා විවිධ ප්‍රජාවන් හරහා, විවිධ සමිති සමාගම් හරහා බොහොම පහසුවෙන් මේ ව්‍යසනය අඩු කර ගන්නට, එහෙම නැත්නම් මර්දනය කර ගන්නට, පාලනය කර ගන්නට උවමනා කරන කටයුතුවල යෙදුණා. ඒ සඳහා ඔබතුමා ඇත්ත වශයෙන්ම උවමාන කරන උපදෙස් දීලා තිබුණා. මම කියන්නේ මේකයි. නැවත ඩෙංගු රෝගය වැළඳිලා කවුරු හරි රෝගියෙක් මැරුණොත් එහෙම ඔන්න එක පාරටම ආයෙත් කුලප්පු වෙලා යනවා. එහෙම නොවෙයි. දැන් මාස තුන හතරක් තිස්සේ එක දිගට වහිනවා. මේ වැස්සත් එක්ක තමයි සියලු බෝවන රෝග ඇති වෙන්නේ. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය කරන පියවරවල් ගන්න උවමනා කරන විධිමත් පහසුකම් ටික ලබා දෙන්න. ඒ ආයතනවලට. ඒ ඉන්න නිලධාරී මහත්වරුන්ට. ඇමැතිතුමාගෙන් ඒ පිළිබඳව ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම පවුල් සෞඛ්‍ය අංශය පිළිබඳව ගත්තොත් එහෙම, මේ මාතෘකාව පිළිබඳව බොහෝ අවස්ථාවලදී මමම මේ සභාවේ කථා කරලා තිබෙනවා. පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ හිඟය පිළිබඳව. ඒක ඔබතුමාට තනියම ගන්න පුළුවන් තීරණයක් නොවෙයි. ඒක මධ්‍යම රජයත් එක්ක සාකච්ඡා කරලා පුහුණු කරන අයව බඳවා ගැනීම. නමුත් මේ වනකොට අපේ පළාත්වල දැඩි හිඟයක් පවතිනවා. පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට ආවරණය කරන්න තිබෙන ගෙවල් ප්‍රමාණය, සමහර වෙලාවට ඔවුන්ට ආවරණය කරන්න සිදුව තිබෙන ගෙවල් ප්‍රමාණය දෙගුණ තෙගුණ වෙලා තිබෙනවා. 1000 කට නම් යන්න තිබෙන්නේ, 3000 කට විතර ගිහිල්ලා ඒ සේවය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගර්භනී මව්වරුන්ගේ සහ කුඩා දරුවන්ගේ කටයුතු පිළිබඳව ඉතාමත්ම සාර්ථක වැඩ සටහනක් අපේ ප්‍රදේශවල විතරක් නොවෙයි, බස්නාහිර පළාතේත්, ලංකාවේම දියත් වෙනවා. ඒ පිළිබඳව මම හිතන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ පවා පැසසුමට ලක් වෙලා තිබෙන කාරණාවක්. ඒක නිසා මම කියන්නේ මේකට උවමනා කරන පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ ප්‍රමාණය මොන ක්‍රමයකින් හරි වැඩි කරලා දෙන්න. ගිය අවුරුද්දේ ඇහුවාම කිව්වා මේ අවුරුද්දේ මෙපමණ හම්බ වෙනවා, ඒක ස්ථානගත කරන්නම් කියලා. ඉතින් බොහෝ වෙලාවට තමුන්නාන්සේ නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ නිසා කළුතර දිස්ත්‍රික්කයට ඒ අයගේ අවස්ථාව ලැබෙනවා ඇති. නමුත් බස්නාහිර පළාතේ දුෂ්කර ගම්මාන තිබෙනවා. අඩු පහසුකම් සහිත ජනතාව ඉන්නවා. විශේෂයෙන්ම අපි නියෝජනය කරන ප්‍රදේශවල අඩු පහසුකම් තිබෙන, අවම පහසුකම් තිබෙන ධීවර ජනතාව ඉන්නවා. ඒ අයට මේ සේවාව ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම තමයි මේ සායන පවත්වන කොට දැන් අපි පුරුදු වෙලා තිබෙන්නේ, ගර්භනී මව්වරුන්ට කිරි වීදුරුවක් දෙන්න. ඒකත් සමහර වෙලාවට ස්වෙච්ඡා සංවිධාන එක්ක එකතු වෙලා කරන්න පුළුවන්. එහෙම නැත්නම් කුඩා දරුවන්ට ත්‍රිපෝෂ එක දෙනවා. ඒක විධිමත් විධියට දෙනවා.

නමුත් මම ඔබතුමාට යෝජනා කරනවා මේ ගොඩනැගිලි හදන්න, එහෙම නැත්නම් විවිධ වැඩ සටහන් සඳහා සමහර අවස්ථාවලදී අනවශ්‍ය වියදම් කරපු වෙලාවේ විශේෂයෙන්ම විදේශ සංචාර සඳහා එහෙමත් නැත්නම් මන්ත්‍රීවරුන්ට, නිලධාරීන්ට යොදවන මුදල්වලින් පුළුවන් නම් මේ ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ මල්ලක් ලබා දෙන්න. මේක විශාල ලෙස වටිනවා. අද තිබෙන තත්ත්වය දිහා බැලුවාම අපි දන්නවා 2015 වර්තමාන යහපාලන ආණ්ඩුව එනකොට ඩොලරයට තිබුණේ රුපියල් 160 යි. අද රුපියල් 185 ක් වෙලා තිබෙනවා. ඒ පෝෂණ මල්ල විධිමත් විධියට ලැබෙන්නේ නැහැ. ඒකයි මම කියන්නේ. ඒ නිසා මේක මීට වඩා විධිමත් කරලා - හොඳට මතක තියා ගන්න මේ ත්‍රිපෝෂ එක අඩු පහසුකම් තිබෙන, අඩු ආදායම්ලාභී අය විතරක් නොවෙයි. යම්කිසි වත්කමක් තිබෙන අය පවා ගන්නවා. මොකද, ඒ පිළිබඳව විශ්වාසයක් තිබෙන නිසා. ඒක නිසා මම ඉල්ලීමක් කරනවා මේ පෝෂණ මල්ල මීට වඩා විධිමත් ආකාරයට පෝෂණ මට්ටම වැඩි දියුණු වුණු පෝෂණ මල්ලක් ඔබතුමා හරහා ලබා දෙන්න කියලා.

ඒ වාගේම අද බොහොම ජනප්‍රිය වැඩ සටහනක් තමයි වැඩිහිටි සමිති.සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාශයකම වැඩිහිටි සමිති තිබෙනවා. හොඳට හොයලා බලන්න ප්‍රාදේශීය සභාවෙන් හරි නගර සභාවෙන් හරි ගමේ කොන්ත්‍රාත් එක කරන කොට වැඩිහිටි සමිති හරහා තමයි කොන්ත්‍රාත් එක

[ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා]

කරන්නේ. අපි කැමැත්තෙන්ම කිව්වා ඒක හොඳයි. කීයක් හරි මුදලක් ඒ වැඩිහිටි සමිතියට ලැබෙනවා කියලා. අද වනකොට අපේ පළාත්වල වැඩිහිටි සමිති කියන්නේ බොහොම ස්වෙච්ඡාවෙන්, බොහොම ආඩම්බරයෙන් ක්‍රියාත්මක වන සමිති. විවිධ ආගමික වැඩ සටහන් කරන්න. විවිධ විනෝද ගමන් යන්න. සිංහල අවුරුද්දට, වෙසක් එකට, නත්තලට බොහොම විධිමත් විධියට මේ සමිති ක්‍රියාත්මක වෙනවා. හැබැයි, ඒ සමිති ක්‍රියාත්මක වෙන්නේ අර ගමේ කොන්ත්‍රාත් එක කරලා, ප්‍රාදේශීය සභාව හරහා එහෙම නැත්නම් කොන්ත්‍රාත් එක ගන්න පුද්ගලයා ඒ සමිතියට ගියාම හම්බ වන සොච්චම් මුදලෙන් තමයි. මේක මීට වඩා ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා වැඩිහිටි සමිති ශක්තිමත් කරන්න. මම කියන්නේ, හැම තැනම ගමන් බිමන් එක්ක යන්න කියලා නොවෙයි. රෝගී තත්ත්වයේ ඉන්න අය වැඩිපුර ඉන්නේ. මේ වැඩිහිටි සමිතිවල 90% ක් 95% ක් ඉන්නේ එදිනෙදා බෙහෙත් ගන්න අය. මේ අයට විධිමත් වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්. එක එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබෙන එක එක වැඩිහිට සමිතිවලට, අවශ්‍ය කරන නිලධාරීන් ඉන්නවා. ඒ සඳහා උවමනා කරන පහසුකම්, මෙවැනි සොච්චම් මුදලකින් නොවෙයි. ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා ඒවා විධිමත් විධියට හැමෝටම සාධාරණව බෙදන්න. කළුතරට බෙදනවා වාගේම ගම්පහටත්, කළුතරටත් ඒ මුදල් සාධාරණව බෙදලා දෙන්න කියන කාරුණික ඉල්ලීම ඔබතුමාගේ මාර්ගයෙන් කරනවා.

දැන් මම කියන්න හිටපු මාතෘකාවක් අවසානයේදී සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වත්තල කියලා කියන්නේ බොහොම ජනාකීර්ණ නාගරික, අර්ධ නාගරීකරණ බල ප්‍රදේශයක්. කොළඹ මීගමුව ප්‍රධාන පාර තිබෙන්නේ. ඔය මීගමුව පාරේ පැලියගොඩ ඉඳලා මගේ මැතිවරණ කොට්ඨාශය අපි කියමු කෝ ජා-ඇළ මායිමට කියලා. වැලිසරට කියලා. සම්බාහන ආයතන කීයක් තියෙනවාද කියලා ගණන් කරලා කියන්න පුළුවන්. මේක හරි ව්‍යසනයක්. මේ ඔක්කෝම තිබෙන්නේ ආයුර්වේද සම්බාහන ආයතන කියලා තමයි තිබෙන්නේ. දැන් මීට මාස තුන හතරකට ඉස්සෙල්ලා පැලියගොඩ පොලීසිය, කොළඹ උතුර භාර නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ අණ දීමකට අනුව මේ සියලුම සම්බාහන ආයතන වැටලුවා. මේක බොහොම වගකීමෙන් මම කියන්නේ. ආයතන දෙකයි නිසි පරිදි උවමනා කරන කටයුතු සම්පාදනය කරලා ඒ කටයුත්තේ නිරත වෙන්න පුළුවන් විධියට බලපත්‍රය ලබාගෙන තිබුණේ. අනෙක් ඔක්කෝම තිබුණේ හොරට. මේ එකක්වත් ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන නොවෙයි. මේවා ඔක්කෝම ගණිකා මඩම්. හොඳට මතක තියාගන්න. ඒක නිසා මේ පිළිබඳව යම්කිසි පාලනයක් තිබෙන්න ඕනෑ. මේ පාලනය ඇති කිරීමේ එක තැනක ඔබතුමා ඉන්නවා. මේ අමාත්‍යාංශය හරහා තමයි යම්කිසි නිර්දේශයක් ලබා දෙන්නේ. ඒ නිසා කරුණාකරලා මේ ව්‍යසනයෙන්, එදා මම කැලණිය නියෝජ්‍ය පොලිස්පතිතුමාත් එක්ක කථා කරන කොට කිව්වා ඔබතුමා වත්තල ගැන කථා කරනවා. නුවර පාර ගැන කථා කරන්නේ නැහැ. කැලණිය පන්සල තිබෙන පාර ගැන කථා කරන්න. බුදුරජාණන් වහන්සේගේ පා පහස ලබපු කැලණිය ගැන කථා කරන්න. එහෙම තමයි කිව්වේ. මේ නුවර පාර දිගේ කොපමණ සම්බාහන ආයතන තියෙනවාද? මේ එකක්වත් ආයුර්වේද සම්බාහන ආයතන නොවන බව ඔබතුමාට වගකීමෙන් කියන්න ඕනෑ. මම ඒ කථාව ඔබතුමාට මේ වෙලාවේ කියන්නේ ඔබතුමාගේ දැන ගැනීම පිණිස. මේවාට ඍජුවම ඔබතුමා වග කියන්න ඕනෑ නැහැ. නිලධාරී මහත්වරු මේ ගැන බලන්න ඕනෑ. මොකද, නිලධාරීන්ව යට කරගෙන තමයි මේ කටයුතු කරන්නේ.

මට ලැබී තිබෙන කාලය අවසන් වන නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. අපේ කඳාන ආයුර්වේද රෝහල තිබෙනවා. මට ඊයේ පෙරේදා පුද්ගලයෙක් කථා කරලා කිව්වා මේ ඉන්න රෝගීන් හදිසියේ අයින් කරනවා. මේකේ ටයිල් අල්ලන්න යනවා කියලා. මට මේක ගිහිල්ලා බලන්නවත් හම්බ වුණේ නැහැ. ඇත්තටම මට පයින් යන දුර. එහෙම ටයිල් අල්ලන එක හොඳයි. නමුත් ඉන්න රෝගීන් අයින් කරලා මොකක්ද කරන්නේ කියලා ඔබතුමා සොයා බලන්න. ඔබතුමාගේ ඉල්ලීමකට අනුව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත්, මමත් බලන්න ගියා. ඔබතුමා ඒ අනුව මුදල් වෙන් කළාද කියලා දන්නේ නැහැ. ඔබතුමාට මම යෝජනාවක් කරන්න කැමැතියි. මම බොහොම සද්භාවයෙන් කරන යෝජනාවක්. කාන්තා අංශයත් ඔබතුමාට තිබෙන නිසා. විශේෂයෙන්ම මේ ආයුර්වේද බෙහෙත් හදන්න ඕනෑ කරන බෙහෙත් පැළ. මේවා අපේ රටේ නිෂ්පාදනය වෙනවා බොහොම අඩුයි. අපේ පළාත්වල නම් බොහොම අඩුයි. අපට කර ගන්නම

බැහැ. නමුත් ගම්පහ දිස්ත්‍රික්කයේ මේවා කරන්න පුළුවන්. මේ තිබෙන කාන්තා සමිති ටික ප්‍රයෝජනයට අරගෙන එක ග්‍රාම සේවක කොට්ඨාශයක එක බිම් කොටසක් අරගෙන මේ උවමනා කරන බෙහෙත් පැළෑටි ටික විතරක් අරගෙන දෙන්න. අඩුම ගණනේ මේක අමතර ආදායමක් ලබා ගන්න පුළුවන් වන කාර්යයක් වෙනවා. ඒ වාගේම අපට උවමනා කරන බෙහෙත් ටික ලබා ගන්න පුළුවන් වෙනවා. එහෙම නම් අවසාන වශයෙන් මම ඔබතුමා කියන්න කැමැතියි, මම බොහොම වගකීමෙන් මේ කථාව කියන්න ඕනෑ. මීට අවුරුදු දෙකයි මාස තුනකට කලින් මගේ භාර්යාව නැති වුණා. ඒ නැති වුණේ පිළිකා රෝගයෙන්. මම දැනගෙන හරියටම දවස් 25 යි. මම මෙච්චර මේ රටේ ලෝකයේ කථා කරනවා. විවිධ වැඩ සටහන්වලට සම්න්ධ වෙනවා. මිනිස්සුත් එක්ක කථා කරනවා. නමුත් මටවත් දැනීමක් තිබුණේ නැහැ මගේ බිරිඳට මේ වාගේ අසනීපයක් තියෙනවා කියලා. දොස්තරලා කිව්වා බේර ගන්න බැහැ කියලා. එතකොට ඒක දැනගෙන හරියටම දවස් 25 න් නැති වුණා. දැන් අපි හිතනවා අපි යමක් කමක් දන්න මිනිස්සු කියලා. හැබැයි මේ රටේ බහුතරය, අපේ පළාතේ, ගම්වල ඉන්න මිනිස්සු ඇත්ත වශයෙන්ම සමහර වෙලාවට මේ ලෝකේ දෙයක් දන්නේ නැහැ. ඒ නිසා මේ රෝග පෙර හඳුනා ගැනීමට අවශ්‍ය කරන පහසුකම් හදා දෙන්න ඕනෑ කියන කාරණාව මට දැන් සෑහෙන කාලයක සිට තිබෙනවා. ඒක වකුගඩු වෙන්න පුළුවන්. හෘද රෝග වෙන්න පුළුවන්. එහෙම නැත්නම් පිළිකා වෙන්න පුළුවන්. මේවා පිළිබඳව

දැන් කොළඹට යන්න කිව්වාම මිනිස්සු යන්නේ නැහැ. මොකද, මේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය, ජීවත් වෙන්න තිබෙන අරගලය නිසා ඇත්ත වශයෙන්ම ඒක අමාරු කාරණාවක්. මම ඔබතුමාට යෝජනා කරනවා. ඒක නිසා නියමන ව්‍යාපෘතියක් හරියට හරි - මම ඉන්න පළාතේ උතුරු කොළඹ මහ රෝහල තිබෙනවා. වැලිසර තිබෙනවා. කඳාන තිබෙනවා. ලාදුරු රෝහල තිබෙනවා. රෝහල් සංකීර්ණයක් තිබෙනවා. උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය තිබෙනවා. පුනරුත්ථාපන රෝහල තිබෙනවා. ලෙඩ්ඩු පිටින් එන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඒ ලෙඩ්ඩු වැඩියි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

විශේෂයෙන් ඔය අවිස්සාවේල්ල පැත්තේ ලෙඩ්ඩු තමයි වැඩි හරියක් එහේ ඉන්නේ. මොකද, වත්තල ඉන්න අය ඔය දේවල්වලට එන්නේ නැහැ. ඒ නිසා මේ රෝහල් හරහා හරි, ග්‍රාමීය මට්ටමෙන් මේ රෝග පෙර හඳුනා ගැනීමට අවශ්‍ය කරන වැඩ සටහනක් ඔබතුමා නිර්මාණය කරලා දෙන්න. අපි ඒක අතට අරන් දුවන්නම්. මට ඒක දැන් අත්‍යවශයෙන්ම කරන්න පුළුවන්කම තිබෙනවා. බොරු දේවල්වලට වියදම් කරන සල්ලි. මගේ බිරිඳගේ නමින් හරි මේ මිනිස්සුන්ට මේ සේවාව කළාය කියලා. විශේෂයෙන් වකුගඩු රෝගය, පිළිකාව සහ හෘදය රෝග. අද උදේ අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අද නොමිලයේ අපේ ලේ පරික්ෂා කරනවා. ප්‍රෙෂර් එක බලනවා. ECG බලනවා. මම ඊයේ රෑ අටට කාලා ඉවර වෙලා, බොහොම වගකීමෙන් ඇවිල්ලා මේ ලේ බැලුවා. දැන් බලපුවාම මගේ සීනි ප්‍රමාණය 217 යි. මමත් හිතුවේ නැහැ එපමණ තිබෙනවා කියලා. ඊට පස්සේ ගිහිල්ලා ECG එක බැලුවා. මට බොහොම පැහැදිලි කරලා කිව්වා. පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මේක එපමණ ලොකු දෙයක් නොවෙයි. මේකට දැන්මම ගිහිල්ලා ප්‍රතිකාරයක් අරගන්න කියලා. මේ ECG එකේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවාය කියලා ඉවර වෙලා. ඇත්ත. මට ඕක දැන් මාස හය හතකට ඉස්සෙල්ලාත් කිව්වා. ඊට පස්සේ මම බෙහෙත් ගත්තා. මම හිතුවා ඉවර වුණාය කියලා. නැහැ. ගරු මන්ත්‍රීවරුන්ට මේ ලබා දීපු අවස්ථාව පිළිබඳවත් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් නැවත වතාවක් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ රෝග පෙර හඳුනා ගැනීමට අපට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දෙන්නය කියලා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.33 ]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

Bis Milla Hir Rahman Nir Raheem ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ස්තුතිය පළ කරනවා. අද දින ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන හුඟාක් අදහස් පළ කළා. ඒ වාගේම මම නියෝජනය කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කය. මගේ උපන් ගම මීගමුව. අපේ මීගමුව රෝහල සම්බන්ධව තව මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කථා කළා. මීගමුව රෝහල

[ගරු එම්. ෂාහි රහීම්]

කියන්නේ, අද ලොකු වටිනාකමක් ඇති රෝහලක්. ඒ රෝහල එයාර්පෝට් එකේ ඉඳලා, ඉතා ටික දුරකින් තිබෙන්නේ. ඒ වාගේම tourism ප්‍රදේශයක්. ඒ වාගේම අනෙකුත් පුත්තලම සිට කොළඹ දක්වා තිබෙන එකම රෝහල තමයි මීගමුව රෝහල. ඒකේදී අපි දැක්කා. තට්ටු සහිත ගොඩනැගිල්ලක් හදලා, ඒක විවෘත කරලා අවුරුදු කිහිපයක් යන කොට, ඒවාවලින් වතුර leak වෙන්න පටන් ගත්තා. අපි කිහිප වතාවක් ඒ සම්බන්ධව කථා කළත්, ඒකට කිසිම විසඳුමක් ලැබුණේ නැහැ. අපට සුළු මුදලකින් හදා ගන්න පුළුවන්කමක් තිබුණත් අද කෝටි ගණනක මුදල් වෙන් කරන්න සිදු වෙලා තිබෙනවා. නමුත් ඒ කෝටි ගණනක මුදල් වෙන් කළත් නිසි ලෙස ඒ වැඩ පිළිවෙළ සිදු කළේ නැහැ. නමුත් ගිය වතාවේ ඒ ප්‍රශ්නය මතු වුණාම, ගරු සෞඛ්‍ය ඇමතිතුමාට දුරකථනයෙන් කථා කළාම, එතුමා වහාම පිටත් වෙලා ඇවිල්ලා, ඒ ප්‍රදේශයේ ඉන්න මන්ත්‍රීවරුත් එක්ක සම්බන්ධ වෙලා ඒ ගොඩනැගිල්ල පරීක්ෂා කළා. ඒ වාගේම කථා කළා. එතුමාගෙන් අපි ඉල්ලීමක් කළා. ඒ අනුව එතුමාට කරන්න පුළුවන් දේවල් කළා. නමුත් ඒ ගොඩනැගිල්ලට කෝටි ගණන් ආපු සල්ලි ටික. නමුත් මේ මුදල ගියේ පළාත් සභා හරහා නොවෙයි. මධ්‍යම රජයේ අමාත්‍යාංශයෙන් කෙළින්ම මුදල ආවා. අපට කිසිම සම්බන්ධයක් නැතිව අපේ නිලධාරීන්ටවත්, අමාත්‍යතුමාටවත් කිසි දෙයක් නොදන්නා විධියට තමයි ඒ මුදල භාවිතා වෙලා තිබෙන්නේ.

නමුත් අපි හිතනවා, වැරදි මාර්ගයකින් ඒ මුදල අහිමි වෙලා තිබෙනවා. නමුත් ඒකේදී ඩෙංගු ප්‍රශ්නය ඇති කාලවල මීගමුව රෝහල සෑහෙන ප්‍රශ්නයකට මුහුණ දෙන්න වුණා. නමුත් ඒ ප්‍රශ්නය දැන් නිවැරදි කර ගෙන, අද රෝහල නිසි ලෙස කටයුතු කරනවා. මේ ඩෙංගු රෝගය ගැනත් අපේ හුඟාක් දෙනෙක් කථා කරනවා. ඒකට මුදල් වෙන් කරනවා. නමුත් ඒ ගැන නිතරම අපි හිතන්න ඕනෑ. මේ ඩෙංගු කොහේ ඉඳලා ද එන්නේ. සමහර විට කියනවා ජරා වතුර තිබියොත් එනවා කියනවා. තව කාලයක කියනවා හොඳ වතුර තිබුණාම ඩෙංගු මදුරුවා බෝ වෙනවාය කියලා. නමුත් ඒ ගැන පරීක්ෂණයක් කරලා බැලුවාද නැද්ද කියන එක ගැන අපට සැකයක් තිබෙනවා. ඒක මම හිතනවා, පිටින් ගෙනැල්ලා තැන් තැන්වල මේ ඩෙංගු මදුරුවන්ව දාලා යනවා කියන එක තමයි මගේ සැකය වී තිබෙන්නේ. නැත්නම් මේක හැදෙනවා නම් මම අභියෝග කරනවා. පුළුවන් නම් අපි පිරිසිදු වතුරවලත් මාස ගණනක්, අවුරුදු ගණනක් තියලා බලමු. ඩෙංගු හැදෙනවාද කියලා. කෝ ඩෙංගු. ඩෙංගු නැහැ. උන් මම හිතන්නේ කාලයෙන් කාලයට තැන් තැන්වල, ඒ කියන්නේ මුළු ලංකාවටම නැහැ. සාමාන්‍යයෙන් ජනගහනය වැඩි තැන්වල ඩෙංගු මදුරුවාව දානවා. මේක මොනවා හරි ව්‍යාපාරයක් විසින් හෝ මොනවා හරි ආදායමක් සඳහා හෝ එයාලාගේ කටයුත්ත කරනවාය කියන එක මම කියනවා.

ඒ නිසා මේකේදී ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ සේවාව - මම දන්නවා. ඔබතුමා මේ පළාත් සභාවේ දීර්ඝ කාලයක සිට මන්ත්‍රීවරයෙකු වශයෙන් ඉඳලා, එදා ඉඳලාම අපි හොඳ යාළු මිත්‍රකමින් හඳුනා ගත්ත ඇමතිතුමා. ඒ වාගේම ඇමතිකම ගත්ත දා ඉඳලා - මම දවසක් කථා කළා. ඇමතිතුමා මේ වාගේ මාතෘ සායන ප්‍රශ්නයක් තිබෙනවා. යමු කිව්වාම ඒ වෙලාවේම ඇමතිතුමා ඒ ප්‍රදේශයට ඇවිල්ලා ඒ මාතෘ සායනය බලලා, ෂාහි රහීම්, උඹ ගනින්. ඇස්තමේන්තුවක් ලබා දෙන්න. මම හැකි ඉක්මණින් මේක හදලා දෙන්නම්. නමුත් ඇස්තමේන්තුව ගන්න කිහිප දෙනෙකුට කථා කළත් කිසි තනකින් ඇස්තමේන්තු කර ගන්න බැරිව ගියා. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. රෝහල්වලට කොපමණ බඩු අරන් දුන්නත් කෝටි ප්‍රකෝටි ගණනක මුදල් අර ගෙන දුන්නත්, ඒවා ලැයිස්තු ගත කරන්නේ නැහැ. බඩු මුට්ටු කඩන්න මාෆියාවක් ඉන්නවා. ඒ කියන්නේ වටිනා දේවල්, x-ray මැෂින්, තව මොන මැෂින් තිබුණත් ඒකට පිටින් ඉන්න පෞද්ගලික රෝහල්වල ඉන්න අයට රු. 5000 ක් හරි 10,000 ක් හරි දීලා ඕක කඩපන් කියලා, ඒක කැඩුවොත් තමයි පෞද්ගලික ආයතනවලට ලාභ ලබන්නේ. මේ ගැන හොඳ අවධානයෙන් ඉන්න ඕනෑ. මේ මැෂින් ආරක්ෂා කරන්නේ කොහොමද කියලා. කොපමණ බඩු දුන්නත්, ලැයිස්තුගත කරලා තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. ඒ වාගේ මාෆියාකරුවන්. ඇතුළේ ඉන්න සමහර සේවකයෝ අතරින් ඉන්නවා. මාෆියා ගේම් එක ගහනවා. අසරණ ලෙඩ්ඩු රෝහලට එනවා. රෝහලට ඇවිල්ලා බෙහෙත් ගන්න එන කොට බෙහෙත් ගත්තාට පස්සේ උන්ගේ පාට් එක දානවා සමහර ලෙඩ්ඩුන්ට. සමහරුන්ට වාඩි වෙන්න පුටුවකුත් දෙන්නේ නැහැයි ලු. ලෙඩාව බලාගන්න ආවොත් සමහරු ඒකෙන් පළිය හරි මොනවා හරි ගණන් බලාපොරොත්තු වෙනවා. මොනවා හරි කියනවා. මෙන්න මෙහෙම අඩුපාඩුවක් තිබෙනවා. අරන් දෙන්න. මෙතැන TV එකක් නැහැ. ෆෑන් එක කැඩිලා තිබෙනවා. මෙතැනට ෆෑන්

එකක් දාලා දෙන්න. එක්කෝ සල්ලි ටිකක් තිබෙනවා වාගේ පෙනුනොත් එහෙම ෆ්‍රිජ් එකක් අරගෙන දෙන්න. මේ බඩු ගේනවා. ගෙනියනවා. මම දන්නේ නැහැ බඩු ටික කොහේ යනවාද කියලා. නමුත් මේ පිළිබඳ අවධානය යොමු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ගරු ඇමතිතුමාට ඒ ගැන අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

අනික් එක තමයි, භාෂාව. ගම්පහ දිස්ත්‍රික්කයේ, බස්නාහිර පළාතේ දෙමළ භාෂාව කථා කරන්න පුළුවන් ජනතාව 60% ක් ඉන්නවා. නමුත් ගරු ඇමතිතුමා, ඔබතුමා අවධානය යොමු කරන්න ඕනෑ. කොළඹටත් දෙමළ භාෂාව කථා කරන්න පුළුවන් සේවකයන් 30% ක් වත් අඩුම තරමින් රෝහල්වල සේවය කරන්න ඕනෑ. ඒ වාගේම තමයි කළුතරටත් දෙමළ භාෂාව කථා කරන්න පුළුවන් සේවකයෝ 15% ක් හරි බඳවා ගන්න ඕනෑ. ගම්පහටත් 15% ක් හරි අඩුම තරමින් දෙමළ භාෂාව ලියන්න, කියවන්න පුළුවන් කට්ටියව බඳවා ගන්න ඕනෑ. එතකොට ඒ ජනතාව එතැනට ආවාම සේවය සපයන්න පහසුයි. දෙමළ ජනතාවට සමහර විට සිංහල කථා කරන්න බැහැ. ඒ නිසා එයාලා අසරණ වෙනවා. එයාලා ගැන උදව්වක් කරන්නත් එයාලාට අවශ්‍ය දේ කියන්න බැරිව පෙළඹෙන අවස්ථාත් තිබුණා. නමුත් ඒකට ඔබතුමා අවධානය යොමු කර ගෙන, ඒකේදී අවශ්‍ය කටයුතු කරලා දුන්නොත් මම හිතනවා, වඩාත් ගුණාත්මක සේවාවක් ලබා දෙනවාය කියලා.

ඒ වාගේම කාන්තා කටයුතු අමාත්‍යාංශයත් ගරු ඇමතිතුමා යටතේ තිබෙනවා. ඇත්ත වශයෙන් කාන්තා කටයුතු වෙනුවෙන් හුඟාක් දේවල් අපි ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ලබා ගෙන අපේ කාන්තාවන්ට ඒ කියන්නේ, ඒ ප්‍රදේශවල ඉන්න කාන්තාවන්ට පුහුණු පාඨමාලා කිහිපයක් අපි කරගෙන යනවා. නමුත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න නිලධාරීන් ඇත්ත වශයෙන්ම හරි උනන්දුයි. එයාලාගේ අපට අවශ්‍ය දේ ඉල්ලන කොට හැකි ඉක්මණින් ලබා දීලා එයාලාව පුහුණු කරලා එයාලා ඒවාවලින් පුහුණු වෙලා තමන්ගේ ස්වයං රැකියාව තමන්ට පුළුවන්, ඒ කියන්නේ සමහර විසි කරන ඇඳුම් පැලඳුම් අර ගෙන ඒවායින් උපයා ගන්න. කීයක් හරි සොයා ගන්න පුළුවන්ද? බෑග් එකක් මහන්න. ඒ වාගේම සපත්තුවක් හදා ගන්න. ඒ වාගේම රූපලාවන්‍ය කළොත්, මනමාලියන්ව අන්දන්න ගියොත් දවසට 5000 ක් 10,000 ක් සොයා ගන්න පුළුවන්. ඒ වාගේ දේවල් හුඟාක් කාන්තා කටයුතුවලින් ඉටු කරන්න පුළුවන්. ඒ වාගේම ඒ කාන්තාවන්ට අපි දෙන එකෙන් එයාලා හුඟාක් ප්‍රයෝජනත් ගන්නවා. එයාලාගේ වියදම අඩු කර ගන්නවා. ලාභ ලබා ගන්නවා. නමුත් මේක තවත් වර්ධනය කරන්න ඕනෑ. අනික් එක තමයි දැනුවත් කිරීම. සමහර ළමයින් කසාදයක් බැන්දොත් ස්වාමි පුරුෂයාත් එක්ක ජීවිතය කොහොමද ගෙනියන්නේ කියන එක දැන් හුඟාක් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, දැන් ස්වාමි පුරුෂයාගේ පැත්ත බැලුවොත් කාන්තාවක් රැකියාවට යන කොට ස්වාමි පුරුෂයාටත් දැන් ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් මේ පිළිබඳ පැහැදිලි කිරීමක්, එයාලාව දැනුවත් කිරීමක් අවශ්‍යයි. සැකයෙන් තොරව මේ ජීවිතය කොහොමද ගැට ගහගෙන ස්වාමි පුරුෂයාවයි, දරුවන්වයි රැක බලාගෙන මේ පවුල නඩත්තු කර ගෙන ගෙන යෑමට අවශ්‍ය දැනුම ලබා දෙන්න ඕනෑ. ඒ වාගේ තමයි දෙමව්පියන් නැති ළමයි. සමහර ළමයින්ව අපි කථා කරලා අහලා තිබෙනවා. සමහරු ළමයින්ව විසි කරලා දානවා. සමහර මිනිස්සු ළමයින්ව පාර තොටේ දාලා යනවා. ටොයිලට් වළවල්වල දාලා යනවා. ඒ වාගේ ළමයින් කිහිප දෙනෙක්, තාත්තා කවුද කියලා දන්නේ නැති, ළමයාට තාත්තාගේ නම දාන්න බැරි ප්‍රශ්න තිබෙනවා.

ඉතින් මේවා පිළිබඳ නිසි ලෙස අවධානයෙන් ඉන්න ඕනෑ. අපි මහජන නියෝජිතයින් හැටියට හුඟාක් දෙනෙක් හිතන්නේ මන්ත්‍රීවරයෙකු වුණාම අපි සුදු කිට් එක ගහලා පිරිසිඳුව, පුටුවේ වාඩි වෙලා වැඩ කරන්න බැහැ. අපි මහජන සේවකයෝ. මහජනතාවට සේවය කරන්න ආපු මන්ත්‍රීවරු. අපිත් පල්ලෙහාට බැහැලාම මේ කටයුත්ත නිසි ලෙස කරන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. නැත්නම් අපි මෙහේදී කථා කරනවා. හැම දෙයක්ම නිලධාරීන්ට පටවලා, මේක කටින් කිව්වාට කරන්න බැහැ. අපි පුළුවන් තරම් ගැඹුරට ගිහිල්ලා ඒ ගැන අවධානය යොමු කරලා අපේ සේවාවට එයාලාවත් ශක්තිමත් කර ගෙන අපේ වැඩ කටයුත්ත කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ඉදිරියට මම ගරු ඇමතිතුමාට සුභ පතනවා. ලබන වර්ෂයේත් හොඳ කටයුතු කරන්න ඔබතුමාට අපේ දායකත්වය ලබා දෙනවාය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.45 ]

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2019 වර්ෂයට අදාළව සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයට අදාළ අයවැය විවාදයට සම්බන්ධ වෙමින් එම අමාත්‍යාංශයට අදාළව කථා කරන්න ලැබීම පිළිබඳව මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේත්, ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවත් නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව කැඳවීමේදී ඇත්තටම තිබෙන්නේ කනගාටුවක්. මොකද, කෘෂිකර්ම අමාත්‍යාංශයට සාපේක්ෂව ගත්තොත් එහෙම සෞඛ්‍ය උපදේශක කාරක සභාව අඩුවෙන් තමයි කැඳවූයේ කියන හැඟීමක් මට තිබෙන්නේ. මොකද, මම නිරන්තරයෙන් ඒ සඳහා සම්බන්ධ වීම නිසාම. ඒ වාගේම තමයි, එම උපදේශක කාරක සභාවේ අපි ගෙනෙන යෝජනා, අදහස් ක්‍රියාත්මක කිරීමේදී තිබුණු මන්දගාමී ස්වභාවය. විශේෂයෙන්ම කියන්න ඕනෑ. මට මතකයි, මීට ඉහතදී තිබුණු උපදේශක කාරක සභාවේදී මම විශේෂයෙන්ම සෞඛ්‍ය ඇමතිතුමාට මතක් කළා, බස්නාහිර පළාතේ විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ විශාල අඩු ආදායම්ලාභී පිරිසක් ඉන්නවා. ඒ අඩු ආදායම්ලාභී පිරිස්වල තිබෙන ප්‍රශ්නයක් තමයි සනීපාරක්ෂක පහසුකම්, විශේෂයෙන්ම වැසිකිළි නොමැතිකම. මෙවැනි දේවල් ලබා දෙන්න කියලා විශාල පිරිසක් අපෙන් ඉල්ලීම් කරනවා. ඔවුන්ට වැසිකිළියක් හදා ගන්න ආධාර ලබා දෙන්න කියලා. විශේෂයෙන්ම එතුමාට යෝජනා කරපු අවස්ථාවේ එතුමා කිව්වේ, මේ වසරේ මුදල් නැහැ. උත්සාහ දරමු කියලා.

ඒ වාගේම තමයි එම අවස්ථාවේදී මම ආයිත් යෝජනා කළා. ඔබතුමා විසින් පසුගිය වසරේ සනීපාරක්ෂක කටයුතු නිම කර ගැනීම සඳහා විශාල ප්‍රමාණයක් ආධාර ලබා දීලා තිබෙනවා. එහිදී ඒ ලබා දුන්න අය පිළිබඳව, මේ අය ලබා දුන්න ආධාර අරගෙන ඒ වැසිකිළි හදලා ද? එහෙම නැත්නම් තවමත් හදන්නේ නැතිව තිබෙන ප්‍රමාණයක් තිබෙනවාද? ඒ පිළිබඳව අපට වාර්තාවක් දෙන්න. උපදේශක කාරක සභාවේදී යම් සොයා බැලීමක් කරන්න නැවත එම ආධාර ලබා දීමේදී ඒක කොහොමද විධිමත්ව දෙන්නේ කියලා. මොකද, අපි යන සමහර අවස්ථාවලදී අපට දැක ගන්න ලැබෙනවා, එවැනි ආධාර අර ගෙන සමහර ප්‍රතිලාභියෝ විකුණා ගන්නා ආකාරය. නැත්නම් අවුරුදු ගණන් ගෙවල්වල සිමෙන්ති ගල් වෙලා තිබෙන ආකාරය. එම ආධාර ලබා දීලා නිසි අධීක්ෂණයක් සහිතව යන්න පුළුවන් නම් ඒකේ ප්‍රතිඵලය අපට ගන්න පුළුවන්. එහෙම නැති වුණොත් වසර කිහිපයකින් නැවතත් එම ප්‍රතිලාභීන් ආධාර ඉල්ලන එක තමයි කරන්නේ. ඉතින් එවැනි යෝජනා කළත් අපි දැක්කේ නැහැ එතුමාගේ උපදේශක කාරක සභාව තුළ එවැනි යෝජනා ගෙනාවාට ඒවා ක්‍රියාත්මක වන ආකාරය. එවැනි වාර්තා අපට ලැබෙන ආකාරය. ඒ වාගේම තමයි විශේෂයෙන්ම මේ ග්‍රාමීය රෝහල් පද්ධතිය පිළිබඳව අපි නිරන්තරයෙන්ම කථා කරනවා. එතුමාත් සමඟ නිරන්තරයෙන්ම මම ප්‍රකාශ කරනවා මේ ග්‍රාමීය රෝහල් පද්ධතියේ තිබෙන - අපට ඇත්තටම තිබෙන සම්පතක්. ග්‍රාමීය රෝහල් පද්ධතිය දියුණු කළොත් ඇත්තටම අපට නගරයේ රෝහල්වල, මූලික රෝහල්වල තිබෙන තදබදය අඩු කර ගන්න පුළුවන් කියලා විශ්වාසයක් තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා. නාගරික රෝහලකට ගියාට පස්සේ, පානදුර රෝහලට ගියාට පස්සේ රෝගීන්ගේ තිබෙන තදබදය කොතරම්ද කියලා. නාගරික රෝහල් ගත්තොත් එහෙම සමහර දවසට ඇඳන් යට රෝගීන් ඉන්නවා. ඇඳන් නැතිව.

ඒ වාගේම තමයි පානදුර රෝහලට ගියාට පස්සේ විශේෂයෙන්ම බංකු උඩ රෝගීන් ඉන්නවා. ඉතින් මෙවැනි තත්ත්වයකට පත් වෙන්නේ ඇත්තටම ගත්තොත් ග්‍රාමීය රෝහල්වල තිබෙන අඩුපාඩුකම් මත තමයි හැම රෝගියෙකුම මේ නගරයේ තිබෙන මූලික රෝහල් කරා ඇදී යන්නේ. ගමේ ජනතාවට විශ්වාසයක් නැහැ, ග්‍රාමීය රෝහලේ අපට බෙහෙත් ටික නිසියාකාරව ලැබෙයි කියලා. අපේ රෝගයට නිසියාකාරව ප්‍රතිකාර ලැබෙයි කියලා එහෙම විශ්වාසය නැහැ. සමහර රෝගීන් කියනවා, ඔය රෝහලට ගියොත් එහෙම පෙට්ටියේ තමයි එන්න වෙන්නේ කියලා කියන අවස්ථා අපි අහලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ ග්‍රාමීය රෝහල් පද්ධතිය වැඩි දියුණු කරලා, නිසියාකාරව ක්‍රියාත්මක වන ආකාරයේ වෛද්‍ය සේවයක් ලබා දෙන්න පුළුවන් නම් ඉතා වටිනවා. විශේෂයෙන්ම සතියකට දවසක් මේ ග්‍රාමීය රෝහල්වලට එන්න කියලා විශේෂඥ වෛද්‍ය සේවයක් අපට පුළුවන් නම් ඉතා වටිනවා. අපට පුළුවන් විශේෂඥ වෛද්‍ය සේවයක් ක්‍රියාත්මක කර ගන්න. ඒ ග්‍රාමීය මට්ටමේ ඉන්න ජනතාවට හොඳ සේවාවක් ලබා දෙන්න. ඒ වාගේම තමයි, සමහර

රෝහල්වල. විශේෂයෙන්ම එතුමාගෙන් ප්‍රශ්න කිහිපයකුත් මේ සභාවේදී යොමු කළා. අපට මතකයි. ගල්පාත රෝහලේ මතු වුණු තත්ත්වයක් තුළ. මට මතකයි, ගල්පාත රෝහලේ සනීපාරක්ෂක කම්කරුවෙකු හැසිරෙන ආකාරය දිගින් දිගටම, එන රෝගීන්ට පීඩනයක් ගෙන දෙන සිද්ධියක් බවට පත් වුණා. විශේෂයෙන්ම ගල්පාත රෝහලේ එම තත්ත්වය පිළිබඳව ගල්පාත විහාර ස්ථානයේ ස්වාමීන් වහන්සේ ලිඛිතව ඉදිරිපත් කළා, මෙම කම්කරුවා පිළිබඳව. මේ කම්කරුවාගේ හැසිරීම් රටාව තමා අත්වින්දා කියලා. එම සිද්ධියත් එක්ක ගත්තොත් එහෙම මම ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා, පරීක්ෂණයක් කරලා ඇත්තටම එම කම්කරුවා මෙතැනින් ස්ථානමාරුවක් කරන්නය කියලා. නමුත් ඒ පරීක්ෂණය සිදු කළත් එතැනින් එහාට ඒ ස්ථාන මාරුවක් සිදු කිරීම සඳහා කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණේ නැහැ. තවමත් ඔහු එහි සේවය කරනවා. අර විධියටම එන රෝගීන්ට හිරිහැර පීඩා දෙන විධියට තමයි ඔහු ක්‍රියා කරන්නේ. එවැනි තත්ත්වයන් තුළ තමයි අපේ ග්‍රාමීය රෝහල් පද්ධතියේ එන රෝගීන්ට, බෙහෙත් ටික ගන්න එන රෝගීන්ට, නේවාසික ප්‍රතිකාර ගන්න එන රෝගීන්ට එවැනි තත්ත්වයක් මතු වුණාම තමයි ගමේ රෝහල පිළිබඳව විශ්වාසය නැති වෙලා යන්නේ. වැඩක් නැහැයි කියලා හිතෙන්නේ.

ඉතින් එවැනි තත්ත්වයක් තුළ අපේ ග්‍රාමීය රෝහල් තුළ තිබෙන තත්ත්වය පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. ඒ වාගේම තමයි මේ රෝහල්වලට අපි බෙහෙත් ගන්න ගියාට පස්සේ තිබෙන සමහර තත්ත්වයන්. විශේෂයෙන්ම බෙහෙත් ගන්න ගියාට පස්සේ අපි දන්නවා. දෙතුන් සියයක් ඇවිල්ලා ඉන්නවා රෝගීන් උදේට බෙහෙත් ගන්න. එම රෝගීන් වෛද්‍යවරු සමහර වෙලාවට - හැම වෛද්‍යවරයාම නොවෙයි. හොඳ වෛද්‍යවරු ඉන්නවා. රෝගීන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා බෙහෙත් දෙන වෛද්‍යවරු ඉන්නවා. ඒ වාගේම සමහර වෙලාවට අපි දන්නවා. රෝගියාගේ මුහුණ බලන්නේ නැහැ. තමන්ගේ ලෙඩේ හරියට කියන්න අවස්ථාවක් දෙන්නේ නැහැ. එවැනි අවස්ථා අපි දැකලා තිබෙනවා. ඉතින් එවැනි තත්ත්වයන් තුළ රෝගියෙක් බෙහෙත් ගන්න වෛද්‍යවරයා ළඟට ආවාම, එවැනි තත්ත්වයක් මතු වුණාට පස්සේ රෝගියා අසරණභාවයට පත් වෙනවා. රෝගියා බෙහෙත් ගන්න කොටම හිතන්නේ වැඩක් නැහැ. මම බෙහෙත් ගත්තාට මේ ලෙඩේ සුව වෙන්නේ නැහැයි කියලා. එවැනි සිතුවිලි පහළ වෙන අවස්ථා අපි විශේෂයෙන්ම දැකලා තිබෙනවා. විශේෂයෙන්ම අපි ගමේ පාසලට වුණු දේම අපේ ගමේ රෝහලට වෙන්න ඉඩ තියන්න එපා. අපි දන්නවා. අද මේ වන කොට ගමේ පාසල හැර දාලා නගරයේ පාසලට විශාල වශයෙන් ළමුන් ඇදී යන්නේ මොකටද?

ඒ වාගේම තත්ත්වයක් තමයි ග්‍රාමීය රෝහල පිළිබඳවත් තිබෙන තත්ත්වය. ඒ නිසා ගරු ඇමතිතුමනි, අපි කියන්නේ විශේෂයෙන්ම ගොඩනැගිලි විතරක් නොවෙයි. ගොඩනැගිලි හදනවා වාගේම අනෙකුත් සේවාවන් පැත්ත වැඩි දියුණු කරලා, ඒ විශ්වාසය හදන්න පුළුවන්. ගමේ ජනතාවට විශ්වාසය හදන්න පුළුවන් නම් අපට නගරයේ රෝහල්වල තිබෙන තදබදය අඩු කරලා, හොඳ සේවාවක් ලබා දෙන තත්ත්වයට ග්‍රාමීය රෝහල පත් කරන්න පුළුවන්. ඒ වාගේම තමයි පසුගිය කාලයේ ඔබතුමාගෙන් මම බස්නාහිර පළාතේ රෝහල්වල තිබෙන යන්ත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු කළා. ඒකේදී විශේෂයෙන්ම බස්නාහිර පළාතේ රෝහල්වල තිබෙන x-ray යන්ත්‍ර, ECG යන්ත්‍ර Endoscopy යන්ත්‍ර පිළිබඳව විශේෂයෙන්ම අවධානයක් යොමු කළා. මට මතකයි, බස්නාහිර පළාතේ x ray යන්ත්‍ර 22 ක් තිබෙනවා. ඒ 22 න් 4 ක් වැඩ කරන්නේ නැති තත්ත්වයේ තිබෙනවාය කියලා ඔබතුමාගෙන් මම අහපු ප්‍රශ්නවලට උත්තර තිබුණා. ECG යන්ත්‍ර 132 යි. ඉන් 17 ක් වැඩ කරන්නේ නැහැයි කියනවා. ඒ වාගේම Endoscopy යන්ත්‍ර 7 න් 2 ක් වැඩ කරන්නේ නැහැයි කියලා. මේ තත්ත්වය විශේෂයෙන් මම කනගාටු වෙන්නේ ඔබතුමා නියෝජනය කරන මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කය. ඒකේදී ඔබතුමාගේ උත්තරේ තිබුණේ, කළුතර දිස්ත්‍රික්කයේ x ray යන්ත්‍ර 10 ක් තිබෙනවාය කියලා. x ray යන්ත්‍ර 3 ක් වැඩ කරන්නේ නැහැයි කියලා තමයි ඔබතුමා මට දීපු පිළිතුරේ තිබුණේ. විශේෂයෙන්ම අවධානය යොමු කරන්නේ ECG යන්ත්‍ර 59 යි තිබෙන්නේ. 12 ක් වැඩ කරන්නේ නැහැයි කියලා. ඒ වාගේම scan යන්ත්‍ර 12 ක් තිබෙනවා. ඉන් එකක් වැඩකරන්නේ නැහැ. Endoscopy යන්ත්‍ර හතරයි කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන්නේ. ඉන් එකක් වැඩ කරන්නේ නැහැ. විශේෂයෙන්ම ඔබතුමා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ, මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම මේ x-ray යන්ත්‍ර 10 න් 3 ක් වැඩ කරන්නේ නැත්නම් ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න. ECG යන්ත්‍ර 59 න් 12 ක් වැඩ කරන්නේ නැත්නම් ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

[ගරු නන්දන පත්මකුමාර]

ඒ වාගේම තමයි, රෝග නිවාරණ කටයුතු ගත්තොත් එහෙම මම හිතන්නේ අපි රෝගීන්ට ප්‍රතිකාර කරනවා වාගේ තමයි ලොකුම කාර්යභාරය රෝග නිවාරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම. ඒක ග්‍රාමීය මට්ටමට ගිහිල්ලා ගමේ තිබෙන ග්‍රාමීය රෝහලෙන් ඔබ්බට ගිහිල්ලා, ගමට ගිහිල්ලා, ගමේ ප්‍රජා ශාලාවට ගිහිල්ලා අපට එවැනි ප්‍රතිකාර සේවයක්, එවැනි උපදේශන සේවයක් අපට ලබා දෙන්න පුළුවන් නම්, ඒ තමයි මම හිතන්නේ වැදගත් වෙන්නේ. අපි දන්නවා. පසුගිය කාලයේ අපේ වාර්තාවල වැටුණා අපේ රටේ ජීවත් වන ජනගහනයෙන් 29% ක් තමන්ට තිබෙන රෝගය පිළිබඳව තමන් දන්නේ නැහැ. 29% ක් තමන්ට තිබෙන රෝගය දන්නේ නැති ජනතාවක් තමයි අපේ රටේ ජීවත් වෙන්නේ. එවැනි තත්ත්වයක් තුළ අපට පුළුවන් නම් ගමට ගිහිල්ලා ගමේ ජීවත් වන ග්‍රාමීය ජනතාවගේ, තමන් ප්‍රතිකාර ගන්න අවස්ථාවේ, තමන්ට තිබෙන රෝගය පිළිබඳව දැන ගන්න අවස්ථාවක් හදන්න පුළුවන් නම්, එය තමයි මම හිතන්නේ වැදගත් වෙන්නේ. අපි දන්නවා. බොහෝ විට ගමේ ජනතාව තමන්ට මොන රෝගය තිබුණත්, මොන කැක්කුම තිබුණත් බොහෝ විට වෛද්‍ය ප්‍රතිකාර ගන්නවා වෙනුවට, වෙන වෙන පෙති තමයි බොහෝ විට ගන්නේ. අපි දන්නවා. අපේ ඔලු හදලා තිබෙන්නේ, අපේ මානසික මට්ටම හදලා තිබෙන්නේ. පසුගිය කාලයේ TV එකේ ඇවිල්ලා, මොන අමාරුව තිබුණත් අපට මෙන්න මේ පෙත්ත බොන්න කියලා තමයි අපට රෝසි සේනානායක කියලා තිබෙන්නේ. ඒ නිසා එවැනි තත්ත්වයක් තුළ අපේ මානසික තත්ත්වයත් ගමේ ජනතාවගේ මානසිකත්වයත් හැදිලා තිබෙන්නේ මොන අමාරුව හැදුනත් මේ පෙත්ත ගත්තාට පස්සේ අපට මේ සහනය ලැබෙනවා. හොඳ වෙනවා කියලයි. ඉතින් දන්නේම නැහැ. තමන්ට තිබෙන ලෙඩේ පිළිබඳව ලොකු අවබෝධයක් නැහැ. පෙති ගහලා, ගහලා අන්තිමේ අවසානයේ ඔවුන්ට ජීවිත අනතුර, ජීවිතය නැති වීම තමයි විශේෂයෙන්ම අපි බොහෝ විට දකින්නේ.

විශේෂයෙන්ම ගත්තොත් එහෙම ග්‍රාමීය මට්ටමේ මහජන නියෝජිතයන් හැටියට අපි බොහෝ විට සම්බන්ධ වන මළ ගෙවල්වල, විශේෂයෙන්ම මේ පිළිකාවෙන් මිය යන රෝගීන්. මළ ගෙවල් 10 ක් යන කොට, විශේෂයෙන්ම ඒ මළ ගෙවල් එකයි දෙකයි තමයි. සාමාන්‍ය ස්වභාවික මරණ තිබෙන්නේ, අපි යන මළ ගෙවල්වල. නැත්නම් හෘදයාබාධ, පිළිකා, වකුගඩු වැනි මෙවැනි රෝගී තත්ත්වයන් මත ජීවිත විනාශ වන තත්ත්වය ඉතා ඉහළ මට්ටමක පවතින්නේ. ඒ නිසා විශේෂයෙන්ම එම අවධානය ගත්තොත් එහෙම, අපේ ප්‍රදේශවල ගත්තොත් එහෙම අවුරුදු 40 – 45 මට්ටමට පත් වෙන කොට විශේෂයෙන්ම හෘදයාබාධ රෝගී තත්ත්වයක් විශාල වශයෙන් තිබෙනවා. ඒ සඳහා ඔවුන් කල් ඇතිව ඒ රෝගය හඳුනාගෙන ප්‍රතිකාර ගන්න ක්‍රමවේදයක් හදනවා නම්, ඒ ජීවිත බේරා ගන්න පුළුවන්. විශේෂයෙන්ම පිරිමින්ට අවුරුදු 40 ක් 45 ක් වෙන කොට එවැනි තත්ත්වයක්, හෘදයාබාධ තත්ත්වයක් අපට දකින්න තිබෙනවා. මේ තත්ත්වය නිසියාකාරව හඳුනාගෙන ගමේ තිබෙන ප්‍රජා ශාලාවකට ගිහිල්ලා, එවැනි සේවාවක් තුළින් තමන්ට ඇති රෝගය තමන්ට දැන ගන්න සලස්වන්න පුළුවන් නම්, අපට පුළුවන් ග්‍රාමීය මට්ටමේ සෞඛ්‍ය තත්ත්වය හොඳ තත්ත්වයකට නගා සිටුවන්න.

ඒ වාගේම තමයි. විශේෂයෙන්ම දේශීය වෛද්‍ය සේවය ගත්තොත් එහෙම, ආයුර්වේද පැත්ත ගත්තොත් එහෙම විශේෂයෙන්ම ඔබතුමාට මතක් කරන්න ඕනෑ. අපේ ග්‍රාමීය මට්ටමේ ජනතාවට මේ ආයුර්වේදය ගැන කිව්වාට පස්සේ, දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳව අපි කථා කළාට පස්සේ බොහෝ වැඩිහිටියන්ගේ ඔලුවේ තිබෙන්නේ මේ තෙල් බෙහෙත් ටික විතරයි. හැබැයි, දේශීය වෛද්‍ය ක්‍රමය ඇතුළේ තෙල් බෙහෙත් ටික විතරක් නොවෙයි. අපි දන්නවා. ඊට එහා ගිය විශේෂ දේවල් ටිකක් අපේ රටේ ජනතාව වෙනුවෙන් මේ ආයුර්වේදය පාවිච්චි කරලා, දේශීය වෛද්‍ය ක්‍රමය පාවිච්චි කරලා ජනතාවට සිදු කරන්න පුළුවන්. අලුත් අලුත් වැඩ සටහන් - අපි දන්නවා. දැන් ඒ කොමසාරිස්තුමිය අලුත් අලුත් වැඩ සටහන් ඔබතුමාගේ උපදෙස් යටතේ වෙන්න ඇති. සමහර වැඩ සටහන් ක්‍රියාත්මක වෙනවා දැකලා තිබෙනවා. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. එවැනි වැඩ සටහන් අපි දැක්කා. මේ වසරේ 500 කට 600 කට වාගේ ප්‍රමාණයක් සඳහා තමයි දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ග්‍රාමීය මට්ටමේ එවැනි වැඩ සටහන් ආලා තිබෙන්නේ. එතකොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 ක් විතර තිබෙනවා. බස්නාහිර පළාත තුළ මේක මීට වඩා වැඩි කරන්න පුළුවන් නම්. එහෙම බැලුවොත් එහෙම එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට වැඩ සටහන් දහයකට, දොළහකට වැඩිය වෙන්නේ නැහැ. පුළුවන් නම්, තවත් මේ මුදල් ප්‍රමාණය වැඩි කරලා, මෙවැනි වැඩ සටහන්

ප්‍රමාණය වැඩි කරන්න පුළුවන් නම්, ගමට යන්න පුළුවන් නම් - අපි ගත්තොත් එහෙම, උදාහරණයකට ගත්තොත් එහෙම ඔබතුමාත් මමත් ජීවත් වන කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විශාල ග්‍රාම සේවා කොට්ඨාශ ප්‍රමාණයක් තිබෙනවා. මේකේ ගමක් ගමක් ගණනේ ගිහිල්ලා මෙවැනි වැඩ සටහන් කරලා ජනතාව දැනුවත් කරන්න පුළුවන් නම්, අපට පුළුවන් මේක මීට වැඩිය දේශීය වෛද්‍ය ක්‍රමය යටතේ දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කරන ගමන් ගමේ ඉන්න ජනතාවට ලොකු වැඩ සටහනක් කරන්න පුළුවන්.

ඒ වාගේම මම මීට පෙරත් මොල්ලිගොඩ ආයුර්වේද රෝහල පිළිබඳව කථා කරලා ඇති. මේකේ ගැටළුවක් තිබෙනවා. ඇත්තටම ගරු ඇමතිතුමනි, මේකේ ගත්තොත් එහෙම නිරන්තරයෙන්ම ඉඩම් පවරා ගෙන - අර ගලිවල තිබෙන ප්‍රශ්නය. ඉතා ඉක්මණින් ඒකට ප්‍රතිකර්මයක් කරන්න පුළුවන් නම් හොඳයි. මම හිතන්නේ, විදේශිකයන් විශාල පිරිසක් මෙම රෝහලට එනවා. මෙවැනි දුගඳ හමන තත්ත්වයක් තිබෙනවා නම්, අපට ඒක නිසියාකාරව ක්‍රියාත්මක කරන්න අමාරුයි. ඒ නිසා ඉක්මණින් ඒ පවරා ගැනීම් කරලා ඒකට ඕනෑ කරන වැඩ පිළිවෙළ හදා ගන්න පුළුවන් නම් මම හිතන්නේ, අපට පුළුවන් ඒ තුළින් මීට වඩා හොඳ සේවයක් ඒ ප්‍රදේශයට විතරක් නොවයි. ජාත්‍යන්තර මට්ටමට ගෙනියන්න පුළුවන් තැනක් හැටියට, මේ මොල්ලිගොඩ ආයුර්වේදය පත් කර ගන්න පුළුවන් කියලා.

ඒ වාගේම තමයි, විශේෂයෙන්ම කාන්තා කටයුතු, සමාජ සේවා අමාත්‍යාංශය පිළිබඳව කථා කරන කොට විශාල වශයෙන් කාන්තාවන් අපි දන්නවා. අපේ බස්නාහිර පළාතේ ජීවත් වන ජනගහනය ගත්තාට පස්සේ 51% ක් කාන්තාවෝ. ඒ වාගේම අපි ගම් මට්ටමට ගියාට පස්සේ බොහෝ කාන්තාවෝ ඉල්ලන දේ තමයි මන්ත්‍රීතුමා අපට ගෙදර ඉඳන් කරන්න ස්වයං රැකියාවක් සොයලා දෙන්න. ගෙදර ඉඳන් කරන්න දෙයක් සොයලා දෙන්න. අපට පොඩි ආදායමක් ලැබෙන දෙයක් සොයලා දෙන්නය කියලා අපි ඉල්ලා සිටිනවා. අද තිබෙන ආර්ථික රටාවත් එක්ක, මේ යන ආර්ථිකයත් එක්ක තමන්ගේ ස්වාමි පුරුෂයා ගෙනැත් දෙන වැටුපෙන් විතරක් ජීවත් වෙන්න බැහැ. ඒ නිසා දරුවන්ගේ අවශ්‍යතාවයන්, පවුලේ අවශ්‍යතාවයන් පිරිමහ ගන්න ගියාම විශාල මුදලක් වැය වෙනවා. ඒ නිසා එවැනි වැඩ පිළිවෙළක් කාන්තාවන්ට කර ගන්න පුළුවන් නම්, මම හිතන්නේ අපට පුළුවන් ග්‍රාමීය මට්ටමේ ආර්ථිකය නඟා සිටුවන්න.

විශේෂයෙන්ම කළුතර ඉඳලා මේ පළාත් සභාවට එන කොට පාර දිගටම අපි දන්නවා කැඳ විකුණන ස්ථාන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ගණන් කළොත් තිහ හතළිහකට වැඩිය තිබෙනවා. අපට පුළුවන් නම් එම කාන්තාවන්ව විධිමත් විධියට මෙම ක්‍රියාවේ නියැලෙන්න අවශ්‍ය මාර්ගෝපදේශය ලබා දෙන්න පුළුවන් නම් - දැන් මේ සමාජය ගත්තත් කොළ කැඳ වීදුරුවක් බොන්න සෑම දෙනාගේම ඉල්ලුමක් තිබෙනවා. එක්තරා අවස්ථාවක මට අහන්න ලැබුණා. ඒ කොළ කැඳ විකුණන තැනක තමන්ට කොළ කැඳ සෑදීම සඳහා කොළ ටික නිසියාකාරව සොයා ගන්න බැරි වුණාට පස්සේ කොළ කැඳ හදන්න කෙසෙල් කොළ පාවිච්චි කරනවා කියලා. ඉතින් මෙවැනි මානසික මට්ටම් නැති කරලා, මේක පෝෂ්‍යදායී ලෙස, ගුණාත්මක ලෙස මේ කොළ කැඳ ටික ජනතාව බොන විධියට හදා ගන්න පුළුවන් නම් හොඳයි. ප්‍රජා සෞඛ්‍ය නිලධාරීවරයෙකු ඉන්නවා. ඒක අධීක්ෂණය කරන්න පුළුවන් නම්, විධිමත්ව කරන්න පුළුවන් නම් විශාල සේවයක් අපට ඒ හරහා කරන්න පුළුවන්.

ඒ වාගේම තමයි මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය අනිල් සමරනායක මැතිතුමා ජනතාවත් සම්බන්ධ කර ගෙන, විශේෂ වැඩ සටහන් ටිකක් ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම ගම් මට්ටමට ගිහිල්ලා ඒ සායන පවත්වමින් අපේ ඉල්ලීම මත ඒ කරන සායන පිළිබඳව විශේෂ ස්තුතියක් එතුමාට පුද කරනවා. බස්නාහිර පළාතේ ජීවත් වන ජනතාවගේ එවැනි සායනවලට උදව් කරමින්, ඒ කරන වැඩ පිළිවෙළවලට දෙන සහායට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම තමයි පළාත් පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමිය දරුවන් වෙනුවෙන් ගන්න ඒ වෑයම. අපි දකිනවා, විශාල වෑයමක්, මහන්සියක් ගන්නවා. ඒ පිළිබඳවත් අපි විශේෂ ස්තුතිය පළ කරන්න ඕනෑ. මොකද, දරුවෝ තමයි සම්පත. හොඳම දේ දරුවන්ට දෙන්න තමයි අපි මේ සමාජයේ කථා කරන්නේ. ඒ නිසා විශේෂයෙන්ම එතුමියටත් මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙමින් මම මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව දිවා ආහාරය සඳහා ප.ව. 2.00 දක්වා අත්සිටුවනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් ඇ.භා. 02.09 ට යළිත් රැස් විය.***

*Accordingly the Whole Council Suspended and. it resumed at 02.09 p.m.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

මීළඟට සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමියට අවස්ථාව ලබා දෙනවා.

[ඇ.භා. 02.09 ]

**ගරු සන්ධ්‍යා සිරිවර්ධන**
Hon. Sandya Siriwardana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක කටයුතු අපේ සුමිත් ලාල් මැන්දිස් මැතිතුමාගේ උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරියක් වශයෙන් කථා කරන්න අවස්ථාවක් සලසා දීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. ඇත්තෙන්ම අධ්‍යාපනය හැරුණු විට වැඩිම ප්‍රතිපාදන මුදලක් අපට ලැබෙන්නේ, මේ සෞඛ්‍ය අමාත්‍යාංශයට. මම හිතනවා, ඒක එහෙම වෙන්නේ ඉතාම භාරදූර කටයුත්තක් තමයි මෙම අමාත්‍යාංශය හරහා කෙරෙන්නේ. පළාතේ ජනතාව නීරෝගිමත් ජනතාවක් කිරීමට අමාත්‍යාංශයේ ඒකායන බලාපොරොත්තුව වෙනවා. ඒ සඳහා අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමතිතුමා විශේෂ කාර්යභාරයක් අපට ඉටු කරනවා. ඇත්තෙන්ම එතුමා ඉතාමත් හොඳ පරිනත දේශපාලඥයෙක්. මන්ත්‍රී ධූරය දරලා වසර 20 කට වැඩිය අත්දැකීම් ලබා ඉන්න මෙතුමා ඉතාමත් සුහදශීලීව, කාගේවත් හිතක් රිද්දන්නේ නැතිව, අපි දුරකථනයට අමතන ඕනෑම අවස්ථාවක ඇමතිතුමාම උත්තර දීලා, අපට සහනයක් සලසා දෙන ගරු අමාත්‍යවරයෙක්. මම ඒක ඉතා අගය කොට සලකනවා. ඒ වාගේම මෙහිදී තවත් ස්තූතිවන්ත වෙන්න ඕනෑ. එතුමාගේ හොඳ කාර්ය මණ්ඩලයක් ඉන්නවා. ඒ කාර්ය මණ්ඩලයේ එතුමාගේ ලේකම්තුමා, ඒ වාගේම පෞද්ගලික ලේකම් අපේ ගයාන් මහත්තයා, ඒ වාගේම අපට විශාල කාර්යභාරයක් කරලා දෙන පරිපාලනයේ දක්ෂ නිහතමානී කෙනෙක් තමයි සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය අනිල් මහත්මයා. ඒ වාගේම ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ වෛද්‍ය නලින් මහත්මයා. ඒත් එක්කම අපේ ආයුර්වේද කොමසාරිස්තුමිය. ඒ වාගේම සැලසුම් අංශයේ මාධව, නිල්මිණි, අනෝමා යන මහත්ම මහත්මීන් මෙතුමාට විශාල සහයෝගයක් ලබා දෙනවා. මම හිතන්නේ, ඒ තුළින් තමයි අපේ පළාතට හොඳ වෛද්‍ය සේවයක් ලැබෙන්නේ. අපට අමාත්‍යවරයාට කථා කරන්න බොහෝ වෙලාවට අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද මේ නිලධාරීන් හරහා හොඳ සේවාවක් දුරකථන මාර්ගයෙන්ම අපට ලබා දෙනවා. ඒ වාගේම අපේ සමාජ සේවා සහ පරිවාස කොමසාරිස්තුමියන්ලා ඇතුළු කාර්ය මණ්ඩලය කරන්නා වූ සුවිශේෂී සේවාව මම අගය කරනවා. ඒ වාගේම උපදේශක කාරක සභාව පවත්වලා, අපේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම්වලට කන් දීලා, ඒ හරහා අපේ ගරු අමාත්‍යතුමා මෙම පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය කර ගෙන යන්න සුවිශේෂ වූ කාර්යභාරයක් කරනවා. පසුගිය කාලයේ තිබුණු ඩෙංගු වසංගතය ගත්තාම 2016 ට සාපේක්ෂව 2017 ඒ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාව මගින් පසුගිය අයවැයෙන් මුදල් වෙන් කරලා 2018 අගෝස්තු මාසය වන විට 71,000 ක් හිටපු ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 14,000 දක්වා අඩු කර ගැනීමට අපට හැකි වුණා. මම හිතනවා, විශේෂයෙන් අපේ අමාත්‍යතුමා ඒකට අපේ එක කොට්ඨාශයට එක් අයෙකු බැගින් පළාත් සභා මන්ත්‍රීවරුන්ව පත් කරලා, සභාපතීත්වය දීලා, අපේ MOH වෛද්‍යවරුන්, PHI මහත්වරුන්, රජයේ නිලධාරීන්, පාසල් ආදිය එකතු කර ගෙන මෙයට සහභාගී වුණා. මේ මගින් අපට විශාල ජයග්‍රහණයක් ලබා ගන්න හැකි වුණා. නමුත් මෙය දිගටම කර ගෙන යන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, වර්ෂා කාලය නැවත එන විට මෙම වසංගතය නැවත ඇති වීමට ඇති ඉඩකඩ වැඩි නිසා.

ඒ වාගේම බෝ නොවන රෝග ගැන කථා කළාම අද MOH කාර්යාල මගින් හොඳ වැඩ සටහන්, දැනුවත් කිරීමේ වැඩ සටහන් අපට ක්‍රියාත්මක වෙනවා. ඒ අතරින් අපේ වෛද්‍ය සමන් ජයකොඩි මහත්මා යටතේ පුහුණු කළ ඇවිදීමේ ව්‍යායාම වැඩ සටහන් මාලාව අපේ සෞඛ්‍ය කොට්ඨාශ 50 න් 35 ක පමණ දැනට හොඳින් ක්‍රියාත්මක වෙනවා. වෛද්‍යවරුන් වෙත මේ බෝ නොවන රෝගවලට බෙහෙත් ගැනීමට යෑමේ ප්‍රවණතාවය දැන් අඩු වෙලා තිබෙනවාය කියලා අපේ අත්තනගල්ල කොට්ඨාශයෙන් වාර්තා වෙනවා. මෙය ක්‍රියාත්මක කරන්නේ ගමේ පවුල් සෞඛ්‍ය සේවිකාතුමිය. ගරු අමාත්‍යතුමනි, මෙය අනිකුත් දිස්ත්‍රික්වලත් ක්‍රියාත්මක

කළ හැකි හොඳ වැඩ සටහනක්. බෝ නොවන රෝගවලින් වැළකී සිටීම සඳහා මිලක් වැය වන දෙයක් නොවෙයි. මම මේක කළේ MOH කාර්යාලවලට අපේ පවුල් සෞඛ්‍ය සේවිකාවන් ගෙන්වලා, ඔවුන්ව පුරුදු පුහුණු කරලා ගමට යවමින් එක. අපේ MOH වෛද්‍ය ජීවන් මහත්තයා එය හොඳින් පවත්වාගෙන යනවා.

ඒ වාගේම අද මෙතැනදී හුඟාක් මන්ත්‍රීවරු කථා වුණා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදීත් මම අහගෙන හිටියා. ජීවත් වීමේදී ඇති වන තරඟකාරීත්වය නිසා මානසික සමතුලිත භාවය තුරන් වෙලා තිබෙනවා. වෛද්‍යවරු ප්‍රකාශ කරනවා, දැනට බෝ නොවන රෝගවලින් 50% ක් පමණ මානසික කරුණු නිසා ඇති වී තිබෙන බව. දෙමව්පියන් දෙදෙනාම රැකියාවල නියුතු නිසා දරුවන් ගැන සොයා බලන්න, ඔවුන්ට ආදරය කරන්න වෙලාවක් නැහැ. ඒ නිසා දරුවෝ අද සමාජ මාධ්‍ය ජාල එක්ක අතරමං වෙලා. ඉතින් මම හිතනවා, අර මාතර දරුවාගේ පිහි ඇනුමේ සිද්ධියත්, මේ ඛේදනීය තත්ත්වයත් මෙවැනිහ දෙයක් වෙන්න පුළුවන් කියලා. ඉතින් මේ වාගේ සිද්ධීන්වලට මානසික ආතතිය බලපානවා. අපේ රෝහල්වල මානසික විශේෂඥ වෛද්‍යවරු ඉන්නවා. නමුත් ඔවුන්ට අවශ්‍ය මූලික පහසුකම් ඉතාමත් අඩුයි. අපේ වතුපිටිවල රෝහලට අලුතෙන් පත් වෙලා ඉන්න වෛද්‍ය අධිකාරී ජයන්ත මහත්මයා මා එක්ක පැවසුවේ හොඳ විශේෂඥ වෛද්‍යවරු අපට ඉන්නවා. ඒ අවශ්‍ය කටයුතු කර ගැනීම සඳහා අපට වාට්ටුවක් ලබා දෙන්න කියලා. මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, 2019 වර්ෂයේදී ඒ කාර්යභාරය අපට ඉටු කර දෙන්නය කියලා. ඉතින් ඒක මම හිතනවා, සෑම රෝහලකම මේ මානසික උපදේශන ආදිය පැවැත්වීම පුළුල් කරන්නය කියලා. මොකද, මෙය ඉතාමත්ම කාලීන අවශ්‍යතාවයක්.

ඒ වාගේම අපේ ආයුර්වේදය ගැනත් කථා කරද්දී අපට ඉන්නවා හොඳ පරිපාලනයේ දක්ෂ, ක්‍රියාකාරී, ක්‍රියාශීලී හොඳ කොමසාරිස්තුමියක්. එතුමියගේ සංකල්පයක් මත අද අපේ නිට්ටඹුව ආයුර්වේදයට ඉතාමත් කඩිනම්, හොඳ වෛද්‍ය සේවයක් රෝගීන් වෙත ලබා දෙනවා. අපේ ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය යටතේ. එක දිනකට වෛද්‍යවරු තුන් දෙනෙක් බැගින් දින පහම අඛණ්ඩව ඔවුන් උදේ සිට සවස් වන තුරු වැඩ කරනවා. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෝගීන්ගේ තෙල් ගාන්නේ, පත්තු බඳින්නේ ඔක්කොම වෛද්‍යතුමන්ලාමයි. සේවක සේවිකාවන් යොදා ගන්නේ නැතිව වෛද්‍යවරුන් අතින් තමයි මේ දේවල් සිද්ධ වෙන්නේ. අපේ නිට්ටඹුව ආයුර්වේදය අද ජනතාවගේ ඉතාමත්ම ප්‍රශංසාවට ලක් වෙලා තිබෙනවා. මොකද, බෙහෙත් ගන්න එන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා, කාර්යක්ෂම සේවාවක් ඒ ස්ථානයේ වෙන නිසා.

ඒත් එක්කම අපේ ගරු අමාත්‍යතුමාට මම විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. උපදේශක කාරක සභාවේදී මා කළ ඉල්ලීමකට අනුව කොමසාරිස්තුමියගේ මග පෙන්වීම අනුව අපට මිලියන 11.5 ක ආයුර්වේද ගොඩනැගිල්ලක් ලබා දීම සම්බන්ධව. දැන් එහි වැඩ කටයුතු අවසන් වෙමින් පවතිනවා. ජනවාරි මාසයේදී පමණ එය විවෘත කළ පසු රෝගීන්ට පංචකර්ම ක්‍රියාවලියේ සිට සියලුම සත්කාරයන් පුළුල්ව ලබා ගැනීමට හැකි වෙනවා. ඒ වාගේම දේශීය ආහාර ප්‍රචලිත කිරීම ඉතා හොඳ වැඩ සටහනක්. මම යෝජනා කරනවා. රජයේ කාර්යාලවලට, පාසල්වලට, අනෙකුත් ආයතනවලට දේශීය කෑඳ වර්ග, පාන වර්ග, තේ වෙනුවට අපේ දේශීය පාන වර්ග අඩු මිලකට සපයලා ජනතාවට ඒ දේවල් පුරුදු පුහුණු කරන්නය කියලා. මම හිතනවා, හරිම කැමැත්තෙන් ඔවුන් ඒ දේවල් වැළඳ ගනීවි කියලා. මට මතකයි. මේ ළඟදී ගිය අවමංගල උත්සවයකදී නෙස් කැෆේ සහ බෙලි මල් තිබුණා. බොහෝ දෙනෙක් පරිභෝජනයට ගත්තේ බෙලි මල්. නෙස් කැෆේ ඉල්ලුවේ නැහැ. ඉතින් ඒ වාගේ තත්ත්ව යටතේ අපට මේ දෙයට ජනතාව හුරු කරන්න හරිම ලේසියි.

ඒ වාගේම ගරු අමාත්‍යතුමා බටහිර වෛද්‍ය ප්‍රතිකාර හා ආයුර්වේද ප්‍රතිකාර එකම රෝහලකින් බදුරලිය රෝහලේ පටන් අරගෙන තිබුණා කියලා කිව්වා. ගරු අමාත්‍යතුමනි, මටත් ඉල්ලීමක් තිබෙනවා. මා ජීවත් වන අත්තනගල්ල ප්‍රදේශයේ ඉතාමත්ම ග්‍රාමීය ප්‍රදේශයක් වන අලවල ප්‍රදේශයේ මධ්‍යම බෙහෙත් ශාලාවක් තිබෙනවා. ඒකේ මෙවැනි ආයුර්වේද ප්‍රතිකාර දීම පටන් ගන්නය කියලා මම ඉල්ලා සිටිනවා. කොමසාරිස්තුමිය ඇතුළු වෛද්‍යවරුන් දන්නවා. ඒ ප්‍රදේශයේ තිබුණු වෛද්‍ය සායනවලට විශාල ජනතාවක් පැමිණෙනවා. හුඟාක්ම ගම්බද ප්‍රදේශයක් නිසා මම හිතනවා, ඒක ඉතාමත්ම ප්‍රයෝජනවත් වේවි කියලා.

[ගරු සන්ධ්‍යා සිරිවර්ධන]

ඒ වාගේම කාන්තා කටයුතු ගැන කථා කරන කොට අපේ රටේ ජනගහනයෙන් 51% ක් කාන්තාවෝ. අපේ පළාත් සභාව තුළ දැක්ම වන්නේ අපේ ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වූ කාන්තාවන් බිහි කිරීම. තේමාව. ඒ නිසා හැමදාමත් සිදු කරන්නා වූ කාන්තාවන් සඳහා පවත්වන ස්වයං රැකියා පුහුණු පන්ති මං ඉතාමත්ම අගය කරනවා. මම දන්නවා. වසර ගණනාවක් අත්දැකීම් තුළින් මේ පන්තිවලට සහභාගී වූ පිරිසෙන් කිහිප දෙනෙක් අද ස්වයං රැකියා ආරම්භ කරලා හොඳ ආදායම් තත්ත්වයක් ලබනවා. ඔවුන් ඒ ආදායම් මාර්ගයෙන් ජීවනෝපාය කර ගෙන ජීවත් වන අය ඉන්නවා. සමහරු උපදේශිකාවන්ගේ තත්ත්වයට පවා පත් වෙලා තිබෙනවා. නමුත් වැඩි දෙනෙකු ඒ දැනුම ලබා ගත්තත් වෙළඳපොලක් සොයා ගැනීමට නොහැකිව අතරමං වෙලා ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ස්වයං රැකියා කරන්නේ කාන්තාවෝ නිසා, ඔවුන්ට වෙළඳ පොලක් සොයා ගෙන තනිවම යන්න ටිකක් අමාරුයි. ඒ නිසා පළාත් සභාවේ සහයෝගය මම හැමදාම ඉල්ලුවා. ගිය වසරේ අයවැයේදීත් මම මේ සම්බන්ධව කථා කළා. නමුත් 2019 ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිවලවත් මම දැක්කේ නැහැ ඒ සඳහා සහයෝගයක්. මොකද, විශේෂයෙන්ම කියන්න ඕනෑ. පසුගිය කාල වකවානුවල පුෂ්පා රාජපක්ෂ මැතිනිය ඉන්න කොට ලිය අභිමන් කියලා කාන්තාවන්ගේ නිෂ්පාදන සුපිරි වෙළඳසැල්වලට පවා දැම්මා. ඒක ඉතාමත් හොඳට ව්‍යාපාරික වශයෙන් කරගෙන ගියා. නමුත් එහෙම තිබෙනවා නම්, ඇයි අපට පළාත් සභාවක් හැටියට මේ දේවල් කරන්න අපහසු, මොකද, අපට මේකට මැදිහත් වෙලා, අපේම තිබෙනවා රජයේ සතොස ආයතන.

ඒ වාගේම සමුපකාර ආයතන තිබෙනවා. වගකිවයුතු නිලධාරීන් හරහා අපේ කාන්තාවන්ට ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමට වෙළඳපොලක් ලබා දෙන්නය කියලා ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් මම නැවත වරක් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එවිට අපේ කාන්තාවන් සවිබල ගැන්විලා අපේ ඉලක්කය කරා යෑමට හැකි වෙනවා. මම මේ පිළිබඳව අපේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සමඟත් කථා කළා. එතුමා එකඟ වුණා. ඒ වාගේම ප්‍රාදේශීය සභාව හරහා භූමියක් සොයා ගෙන මේ දේ කරන්නට පුළුවන්. එක ස්ථානයක වෙළඳපලක් පවත්වලා අපි විශේෂයෙන්ම කාන්තාවන්ගේ නිමි ඇඳුම්, ඒ වාගේම කාන්තා නිෂ්පාදන පමණක් ඒ ස්ථානයේ වෙළඳාම් කරන්නට අවස්ථාවක් ලබා දීලා, අපි කඩ කාමර, පොඩි stalls දාලා ඒ මාර්ගයෙන් අපේ කාන්තාවන්ට වෙළඳපොලක් හදලා දෙමුයි කියන එක යෝජනා කරනවා. ඉතින් මේ සඳහා පළාත් සභාව හරහා යම්කිසි මුදලක් වෙන් කරලා, එය ක්‍රියාත්මක කරන්න වෙනවා. ඒ නිසා මම ඉල්ලනවා. අපේ කවුරු හරි නිලධාරියෙකු ඒ වෙනුවෙන් යොදවලා 2019 වසරේදීවත් මේ ක්‍රමය ක්‍රියාත්මක කරවන්න. මොකද, අපි ජාත්‍යන්තර කාන්තා දිනය කියලා හැම අවුරුද්දේම සමරනවා. ඒකට විශාල මුදලක් වෙන් කරලත් තිබෙනවා, මම දැක්කා. ඉතින් එක දවසකින් ඒක ඉවර වෙලා යනවා. ඒක නරක දෙයක් නොවෙයි. ඒ නිසා සුළු වශයෙන් හරි ඒ උත්සව පවත්වලා, ඒ මුදල්වත් අපට ලබා දීලා මේ කටයුත්ත අපේ අත්තනගල්ල කොට්ඨාශයෙන්, ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන්න කියලා මම නැවත වරක් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගිය වසරේදී මම ඔබතුමාගෙන් කළ ඉල්ලීමකට අනුව මෙතැන මම හිතන්නේ මීට පෙරත් කථා කරපු මන්ත්‍රීවරුන් කථා කළා. වැසිකිළි, සනීපාරක්ෂක කටයුතු පිළිබඳව. නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාත් කථා කළා. මොකද, අපේ ගම්මානයක්ම තිබුණා. කැන්දලන්ද කියන ගම්මානය. ඒකේ වැසිකිළි නැති පවුල් 35 ක් හිටියා. මමවත් විශ්වාස කරන්නේ නැහැ. මම හිතන්නේ, ඔබතුමන්ලාවත් ඒ පිළිබඳව විශ්වාස කරන එකක් නැහැ. නමුත් මෙතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන් ඒ ගමට ගියා. ගිහින් අපි ආර්ථික සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී හරහා අපි ඒ දේවල් කරලා අද වන කොට කියන්න සතුටුයි. ඔබතුමන්ලා ලබා දුන් ආධාර සහ මගේ ප්‍රතිපාදනවලිනුත් දාලා වැසිකිළි නැති පවුල් 30 කට අද මේ වන කොට ඒ කටයුතු සපයලා තිබෙනවා. අර මන්ත්‍රීතුමා ඇහුවා, ඒවා හරියට කෙරෙනවාද කියලා. මොකද, ඒක අධීක්ෂණය කරන්න පුළුවන්. මොකද, මුලින්ම බඩු ටිකක් ඉස්සෙල්ලා, වළවල් කපලා ඉවර වුණාට පස්සේ, ඒ ග්‍රාම නිලධාරීතුමන්ලා හරහා එය අධීක්ෂණය කරලා බඩු ටික ටික දුන්නාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ඒ වැසිකිළි ඔක්කොම ටික එක පාරම ඉවර කරන්න පුළුවන්. මම හිතනවා, ඔබතුමාගේ නිලධාරීන් පුදුම වුණා. ඒ වැසිකිළි දැක්කාම. ඒවා වැසිකිළි නොවෙයි. ඇත්තටම වළවල් වටේ වට තිර ඇදලා ගෙවල් දෙක තුනකට වාගේ එක වැසිකිළියක් තමයි තිබුණේ. ඒත් මම සමහර අයගෙන් ඇහුවා. කොහොමද ඕගොල්ලෝ කාන්තාවෝ විධියට

මේවා පාවිච්චි කරන්නේ කියලා. බැහැනේ කිව්වාම, සමහර අය කිව්වේ. ඇත්තටම කනගාටුයි. තමන් වැඩ කරන වැඩපළට ගිහිල්ලා උදේටු ඒ කර්තව්‍ය කර ගන්නේ. අපට ඒක හරිම බේදනීය අවස්ථාවක්. මොකද, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම අත්තනගල්ල වාගේ තැනක මේ වාගේ කටයුත්තක් සිද්ධ වෙනවා කියලා ඇහුවාම, ඇත්තෙන්ම හරිම කනගාටුයි. නමුත් ඔබතුමා අපට ඒකට පිහිට වුණා. ඒ වාගේ මම හිතනවා, දැන් මගේ ආසනයේ විතරක් නොවෙයි. ගම්පහ දිස්ත්‍රික්කයේ මේ වාගේ හුඟාක් ආසනවල මේ තත්ත්වය ඇතියි කියලා මා හිතනවා. ගම්බද ආසනවල තිබෙනවා. ඉතින් මේකට ප්‍රතිකර්මයක් විධියට මම හිතනවා, ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා මුදලක් යොදවලා මොකක් හරි පිටරට විශේෂ ආධාර මුදලක් හරි ලබා දෙන්න. මොකද, ශරීර කෘත්‍ය කියන්නේ හිර කර ගෙන, තද කර ගෙන ඉන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ නිසා 2019 වර්ෂයේදී මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම 2019 වසරේදී අපට නිරෝගී ජනතාවක් වාගේම ආර්ථික වශයෙන් සවිබල ගැන්වූ කාන්තාවන් පිරිසක් බිහි කිරීමට හැකි වසරක් වීමට ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා සියලු කටයුතු සම්පාදනය කර ගැනීමට උදව් දෙන අපේ කාර්ය මණ්ඩලය ඇතුළු සියලු දෙනාටම සුභ පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.24 ]

**ගරු අසෝක සපුමල් රන්වල**

Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධව අදහස් ප්‍රකාශ කරද්දී මම වඩාත්ම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නේ, සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාට පස්සේ අපේ රටේ ජනතාවගේ සෞඛ්‍ය ඇත්තටම ලෝකයේ තිබෙන දත්තයන් එක්ක ගලපාගෙන වඩාත්ම පොහොසත් - ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රකාශ කරන ආකාරයට වඩාත්ම පොහොසත් පළාත් සභාව විධියට අපි ඒ ඉලක්කවලට කිට්ටු කරලා තිබෙනවාද නැද්ද කියලා සොයා බලන්න ඕනෑ. ඒකේදී එක පැත්තකින්, අපට රෝගවලට ප්‍රතිකාර කිරීම සම්බන්ධව අපේ රටේ ජනතාවට විශාල පොර බැදීමක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. තමන්ට වැළඳුනු රෝගය නිසියාකාරයෙන් ප්‍රතිකාර කර ගෙන වඩාත් නිරෝගීව ජීවත් වෙන්න තිබෙන අයිතිය තහවුරු කර ගන්න. ඒ සම්බන්ධව මම හුඟාක් කථා කරන්න සූදානම් වෙන්නේ නැහැ. මොකද, බොහෝ මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධව අදහස් ප්‍රකාශ කළා. ඒ සම්බන්ධව බස්නාහිර පළාතේ ජනතාවට අත් විඳින්න වෙලා තිබෙන ඉතාමත් ශෝචනීය තත්ත්වය, රෝහලට ගියාට පස්සේ තමන්ගේ අතේ තිබෙන සල්ලි ප්‍රමාණය අනුව රෝගයට ප්‍රතිකාර කරන්න සිද්ධ වුණාට පස්සේ තමන්ගේ ඉඩකඩම් පවා උකස් තියන්න සිද්ධ වෙලා තිබෙන ශෝචනීය තත්ත්වයක් අත්පත් වෙලා තිබෙනවා. පෞද්ගලික රෝහල් මගින් - රජයේ රෝහල්වල ඒ පහසුකම් නොමැති වීම නිසා පෞද්ගලික රෝහල්වලට යන්න සිද්ධ වුණාට පස්සේ තමන්ගේ රෝගය මුල් කර ගෙන ඒ රෝගයට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වාණිජ ව්‍යාපාර රාශියක් ගොඩ නැගිලා තිබෙනවා. ලෝකයේ අද එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළි අරගෙන තිබෙනවා. රෝගියා කියලා කියන්නේ, කාගේවත් වාණිජ භාණ්ඩයක් නොවෙයි කියලා.

හැබැයි, අද වන කොට මේ රෝගියා මත යැපෙන මහා දැවැන්ත වාණිජ ජාලයක් නිර්මාණය වෙලා තිබෙනවා. මල් ශාලාවේ හිමිකරුවාගේ ඉඳන්ම ඊට එහාට ගියාට පස්සේ ෆාමසිය, ඊට පස්සේ රෝග පරීක්ෂා කරන ආයතන, ඊට පස්සේ ඒ සම්බන්ධ වූ ආහාර, මේ සෑම ස්ථානයකදීම රෝගියාගෙන් ජීවත් වන විශාල ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබෙනවා. අපේ රටේ සංස්කෘතිය අනුව, අපේ පැරැන්නන්ගේ තිබෙන අත්දැකීම් අනුව, සමාජයම එකතු වෙලා රෝගියාව සුරක්ෂිත කරන සමාජයක් අපට තිබුණේ. අද ලෝකයේ රටවල්වලට මග පෙන්වන ප්‍රධාන නිර්ණායකයක් බවට පත් වෙලා තිබෙනවා. රෝගියා සුරක්ෂිත කරන්න සමාජ බලවේගයන් පෙළ ගැහිලා ඉන්නවා. අපට තිබුණු දේ නැති කර ගෙන රෝගියා වෙළඳ භාණ්ඩයක් බවට පත් වෙලා තිබෙනවා. අනිකාට ප්‍රාග්ධනය යොදවලා, අනිකා ජීවත් වන, අනිකාව සූරා කන ප්‍රධාන මාධ්‍යයක් බවට රෝගියා පත් වෙලා තිබෙනවා. ශ්‍රමය නොවෙයි. ඉස්සර අපි කිව්වේ ශ්‍රමය සූරාගෙන කනවාය කියලා. දැන් ඒක අපේ රටේ ගත්තාට පස්සේ රෝගියාව සූරා කන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ විධියටම අපේ රටේ ජනතාවගේ සාතිශය බහුතරයක් රෝගීන් බවට පත් කරන ක්‍රමවේදය අනුගමනය කරලා තිබෙනවා. ඒ නිසා තව පැත්තකින් මේ ශෝචනීය ඉරණමට විසඳුමක් විධියට අපේ රටේ ජනතාවට රක්ෂණාවරණ ලබා දෙන ක්‍රමයට පත්

[ගරු අසෝක සපුමල් රන්වල]

වෙලා තිබෙනවා. මේ සියල්ලම ගත්තාට පස්සේ අපට ඉතාමත් පෙනෙන කාරණයක් තමයි, අපේ රටේ රෝගියා මත ජීවත් වෙන්න, රෝගියා මත ව්‍යාපාර සැලසුම් කරන, මහා ජන උවමනාවක් ගොඩ නැගිලා තිබෙනවා.

මේ සම්බන්ධව කථා කරද්දී අපි ප්‍රතිකාර සම්බන්ධව පමණක් කථා කරලා ප්‍රමාණවත් වෙන්නේ නැහැ. තව ඒකටම අදාළ ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා. ඒකේ පළමුවැනි ස්ථානය ගන්නවා පෝෂණය සහ ආහාර සම්බන්ධව. ඒ සම්බන්ධව රටේ ජාතික මට්ටමේ වැඩ පිළිවෙළ ගණනාවක් දියත් වෙලා තිබෙනවා. පෝෂණය සහ පෝෂණයට අදාළව. ඒ වාගේම ආහාරවලට අදාළව. ආහාර ප්‍රවර්ධන වැඩ සටහන දින කිහිපයකින් කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ ඒ සම්බන්ධව ප්‍රදර්ශනයක් ආරම්භ වෙනවා. දින හයක. එතකොට මේ පෝෂණය සම්බන්ධ උවමනාවක් රජයට ඇති වෙලා තිබෙනවා නම්, බස්නාහිර පළාත් සභාවට කොතරම් ප්‍රමාණයක් සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා එහෙම උවමනාවක් ඇති වෙලා තිබෙනවාද නැද්ද කියලා අපි කථා කර ගන්න ඕනෑකම තිබෙනවා. එතකොට පෝෂණය ඇරුණු කොට තවත් ක්ෂේත්‍රයක් තමයි, සෞඛ්‍ය වටා පිටාවක් නිර්මාණය කර ගැනීම. Community Medicine විධියට, එහෙම නැත්නම් පාරිසරික වෛද්‍ය විද්‍යාව අනුව එහෙම අවශ්‍යතාවයක් අපේ රටේ ජනතාවට තිබෙනවා. මේ සියලු ක්ෂේත්‍ර ගත්තාට පස්සේ ඒකාබද්ධව වැඩ කරන්නේ නැතිව ප්‍රතිකාර පැත්තට පමණක් යොමු වුණොත් අපේ රටේ ජනතාව විශාල වශයෙන් රෝගී වෙනවා. රෝගී වුණාට පස්සේ ප්‍රතිකාර කරනවා. ඒ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝගී ජනතාවගේ අසීමිත මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න සිද්ධ වෙනවා.

ඒ නිසා මේ සෞඛ්‍ය අංශය ගත්තාට පස්සේ පෝෂණය සහ ආහාර සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කළ යුතුයි කියලා මම ඔබතුමාට යෝජනා කරනවා. ඒකේ යම් විධියකට තනි තනි වෛද්‍යවරුන් තමන්ගේ රෝහල තුළ එහෙම ගන්න උත්සාහයන් ගණනාවක් අපි දකිනවා. විශේෂයෙන්ම දොම්පේ රෝහල තුළ කලින් හිටපු DMO මහත්තයා. ඒ මහත්මයා බරපතළ උත්සාහයක් ගත්තා, තමන්ගේ රෝහල් වටා පිටාව තුළ එහෙම තත්ත්වයක් නිර්මාණය කරලා, වඩාත්ම පෝෂණ ගුණයක් සහිත ආහාර සහ පානීය දේවල් ලබා දෙන්න. හැබැයි, ඒක සමස්ත බස්නාහිර පළාත තුළ ඉස්සරහාට ගෙනියන වැඩ පිළිවෙළක් බවට පත් කර ගන්න අපි අසමත් වෙලා තිබෙනවා. මේ පෝෂණය සහ ආහාර සම්බන්ධව කථා කරද්දී ඒකත් ප්‍රධාන කොටස් කිහිපයකට අපට කඩා ගන්න පුළුවන්. පළමුවැනි කාරණය තමයි පෝෂණ ගුණය සහිත සමබර ආහාර වේලක් ලබා ගැනීමේ හැකියාව. ඒක අපේ රටේ සමස්ථයක් විධියට සපුරා ගෙන නැහැ. ඒක සෘජුවම බැඳෙනවා. සෞඛ්‍යයට වඩා එහා ගිය මේ රටේ ආර්ථික ප්‍රශ්නයක් බවට පත් වෙනවා. මහා භාණ්ඩාගාරයේ එහෙම තත්ත්වයක ද තිබෙන්නේ. අපේ පළාත් සභාව එහෙම තත්ත්වයක ද තිබෙන්නේ. ජනතාවගේ පර්ස් එකේ තිබෙන සල්ලි ප්‍රමාණය එහෙම පෝෂණ ගුණයක් සහිත ආහාරයක් බවට පරිවර්ථනය කර ගැනීම සඳහා සූදානම් වෙලා තිබෙනවාද? මේක අපි ඉස්සරහා තිබෙන අභියෝගයක්. ඒක ඔබතුමාට පමණක් විසඳන්න බැහැ. මේ රටේ ආර්ථිකයත් සමඟ ගැටුණු ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

ඒකේ දෙවැනි කොටස ගත්තාට පස්සේ අපට තිබෙනවා, අපි එහෙම අමාරුවෙන් හරි ගන්නා ආහාරය, මුදල් දීලා වෙළඳපොලෙන් ගන්න ආහාරය ඇත්තටම අපේ පෝෂණ ගුණයට, අපේ පෝෂණයට ඉවහල් වෙනවාද? අපිව රෝගී කරනවාද? මේකට නම් වගකියන්න පුළුවන්. ක්‍රමවත් වැඩ සටහනක් හැදුනොත් අපි කඩෙන්, වෙළඳපොලෙන් ගන්නා ආහාරය ඇත්තටම අපේ පෝෂණයට උදව් කරන දෙයක්ද? අපව රෝගී කරන ආහාරයක්ද? ඒකට කෙටි වචනයක් තිබෙනවා. අපි ගන්නා ආහාරය වස නැතිව ලබා ගැනීමේ තහවුරු කරන්න කවුද වගකියන්නේ? ඒක පෞද්ගලිකව මිනිහෙකුට තිබෙන අයිතිවාසිකමක්. මේ අයිතිවාසිකම සුරක්ෂිත කරන්න සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අරගෙන තිබෙන ක්‍රමවේදයන් මොනවාද? ඒ වාගේම තව පැත්තකින් තිබෙනවා. ඒ ගන්නා ආහාර වේල, තමන්ගේ ගන්නා ආහාර වේල නිසි පරිදි සකස් කර ගැනීම හෝ ඒ පෝෂණය සම්බන්ධව මැදිහත් වීමට අදාළව ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක්. එතකොට මෙන්න මේ ක්ෂේත්‍රයන් තුන පෝෂණ සම්බන්ධව කථා කරන කොට ඒ පෝෂණය ගැන හුඟාක් වෙලාවට කථා කරන්නේ අපි ගන්නා ආහාරය සම්බන්ධව. අපි ගන්නා පානීය ජලය සම්බන්ධව කථා කරන ප්‍රමාණය ගොඩාක් අඩු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ ජනතාවට බොහෝ දේවල් අහිමි වෙද්දිත්, 1980 දශකය වෙනකල්ම පානීය ජලය සුරක්ෂිත වෙලා තිබුණා. ඕනෑම තැනකින් දිය

දෝතක් අරගෙන බොන්න පුළුවන්කම ලැබුණා. එහෙම බිව්වා බියගම ආසනයේ ඉන්න අපි. කැලණි ගඟේ දෝතක් අරගෙන අපි බිව්වා. හැබැයි, මේ පානීය ජලය ඉතාමත් පෝෂණ ගුණය සහිතව ඒකේ තිබෙන විටමින් ප්‍රමාණය සහිතව, ඛණිජ ලවණ ප්‍රමාණය සහිතව අපට පානය කරන්න පුළුවන්කම ලැබෙනවා නම් අපේ ඇඟේ තිබෙන බොහෝ ලෙඩ රෝගවලට උත්තරයක් ලැබෙනවා වාගේම අපේ අභ්‍යන්තර ඉන්ද්‍රියයන්වලට ඒක ප්‍රාණයක් සපයනවා. ජවයක් සපයනවා. ඒක මත රෝග සුව කර ගැනීමේ මහා දැවැන්ත හැකියාවක් පවතිනවා.

ක්‍රමානුකූලව, මම කලින් කියපු ආකාරයටම අද ජලය කියන්නේ වාණිජ භාණ්ඩයක් බවට පත් වෙනවා. 1980 දී වතුර බෝතල් කරලා විකුණුවොත් කවුද ගන්නේ කියලා ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ තත්ත්වයට මම පෞද්ගලිකව මුහුණ දුන්නා. මට විශේෂ අවස්ථාවක් ලැබුණා, 1982 දී ලෝක බැංකුවේ ණය යෝජනා ක්‍රමයක් යටතේ යම් වාණිජ ව්‍යාපාරයක් ආරම්භ කරන්න, ඒගොල්ලන්ගේ අධීක්ෂණය යටතේ. එහෙම අවස්ථාව දුන්නේ, ඊට කලින් දුන්න ව්‍යාපෘතිවලට, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපෘතිවලට දුන්න මුදල් වැරදි විධියට භාවිතා කරලා නැවත බණ්ඩාර කියලා EDB එකේ මහත්තයෙක් තමයි ඒකට මැදිහත් වුණේ. මාව තෝරා ගත්තා ඒ සම්බන්ධ ව්‍යාපෘතියකට පුහුණු කරන්න. ඒ ව්‍යාපෘතියේදී මම තෝරා ගත්තේ ඔහුගේ ඉල්ලීම මත. ඔහු මට කිව්වා, අනාගතයේදී ඔබේ රටේ වඩාත්ම වටිනා භාණ්ඩය බවට ජලය පත් වෙනවා. ඒ නිසා ඔබ තෝරා ගන්න පානීය ජලය ව්‍යාපෘතියක්. ඒකට project report එක හදන්න කොළඹ හිල්ටන් හෝටලයට අපව ගෙන්වලා, අපට වෙනම පුහුණුවක් දීලා ඒ පානීය ජලය සම්බන්ධව ඇසුරුම. කොහොමද මූඩිය ගහන්නේ. මේ ඔක්කොම අපට කියලා දීලා අපව විසුරුවා හැරියා. ඔවුන් වාහනයක් දුන්නා. රට පුරා ගිහිල්ලා පානීය ජලය තිබෙන ස්ථාන හඳුනාගන්න කියලා. එහෙම ගියාට පස්සේ අපි මේ ව්‍යාපෘතිය එකින් එක හදලා, දුන්නාට පස්සේ, ඒ වෙලාවේ අඩුම තරමින් මිලි ලීටර් 500 බෝතලයක් රුපියල් 18.50 ක් වෙනවා. අපි මේක ගෙනැල්ලා ඒගොල්ලන්ගේ සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරලා, අපට විකුණන්න සිද්ධ වෙන්නේ රුපියල් 18 ට. කොහොමද මේ ව්‍යාපෘතිය කරන්නේ? ඒ වෙලාවේ coca cola බෝතලයක් රුපියල් 7.50 යි. coca cola බෝතලයක් රුපියල් 7.50 වෙද්දී, අපේ පානීය ජල බෝතලය ව්‍යාපෘතිය විධියට රුපියල් 18 ක් වෙනවා. මෙන්න මේ ප්‍රශ්නයේදී අපි දැඩි ලෙස අවධානය යොමු කළාට පස්සේ, මම පෞද්ගලිකව මට දුන්න ව්‍යාපෘතිය මම අතහැරියා. මේක කරන්න බැරි වැඩක් විධියට. ඒ ව්‍යාපෘතිය අරගෙන, මට කථා කරලා, මගෙන්ම ඉල්ලා ගෙන අද වන කොට ප්‍රධාන පෙළේ ජල ව්‍යාපෘතියක් ආරම්භ කරන, ප්‍රධාන පෙළේ trade mark එකක් බවට පත් වෙලා තිබෙනවා. මගේ මිතුරෙකුට මම දුන්නා ඒක කරන්න කියලා රනාල පැත්තේ. අද ඉතාමත් සාර්ථක ජල ව්‍යාපෘතිය බවට පත් වෙලා තිබෙනවා. මම මේක කිව්වේ උදාහරණයක් විධියට. එදා ජලය විකුණනවාය කිව්වොත් විශ්වාස කරන්න බැරි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබුණා. දැන් අපට තිබෙනවා, ඔය බෝතලය ඇතුළේ වතුර බීලා අපේ ඇඟ ඇතුළේ තිබෙන රෝග සුව කර ගන්න, අපි නිරෝගී වෙන්න ඉවහල් වෙනවාද? මම ඒ සම්බන්ධව පොඩි වෙලාවක් අරගෙන ඔබට පැහැදිලි කරන්නම්. මේ සම්බන්ධව දැනුවත් වීම ඉතාම වැදගත් විධියට සලකනවා, සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට.

මිනිහෙකුට පානීය ජලය පානය කරන්න තිබෙන හොඳම අවස්ථාව තමයි ගංගාවකින්, එහෙම නැත්නම් ඇළ දොළකින්, එහෙම නැත්නම් පුංචි වතුර පාරකින් වතුර ගලාගෙන යන කොට ඒ කිරි මුල් එක්ක, කොළත් එක්ක වැටුනු වතුර ඉතාමත් අධික ලෙස පෝෂණ ගුණය සහිතයි. විටමින් සහ ඛනිජ ලවණ. ඒකේ දෝතක් අරගෙන බොන එක තමයි හොඳම දේ. ඒක මිනිසා විසින් අපිරිසිඳු කරලා නම්, ඊළඟ පියවරට අපට යන්න සිද්ධ වෙනවා. අපි වතුර ටිකක් අරගෙන ඒකට මුලක්, එහෙම නැත්නම් කොළයක් දාලා බොන එක. ඒකට දවස් ගණනාවක් යනවා ඒ කොළයේ සහ මුලේ තිබෙන පෝෂණ ගුණය උරා ගන්න. ඒක බැරි නිසා ඊළඟ පියවර තමයි වතුර රත් කරලා, රත් කරපු එකට කොලයක් දාලා බොන එක. දෙවැනි අවස්ථාව. ඒකත් නරක නැහැ. මොකද, කොලේ තිබෙන අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ ටික ක්‍රමානුකූලව වතුරට විසරනය වෙනවා. ඒ වතුර පානය කිරීම ප්‍රමාණවත් වෙනවා. අපි තේ පානය කරනවා. ඒ වාගේම මුරුංගා මල් එහෙම දාලා වතුර බොනවා. ඒකත් හොඳයි. දෙවැනි එක තමයි, මේ කඩිනම් ජීවන රටාව තුළ වතුරවලට කොළ දදා ඉන්න බැහැ. ඊළඟ පියවර විධියට අපි කරනවා. වතුර රත් කරමින් කොළ දාලා ඉවර වෙලා කැකෑරෙන විධියට කොළේ තිබෙන ගුණේ එකතු කර ගැනීම බෙලි මල්, එහෙම නැත්නම් අපි පානය කරන ජාති. එපමණම නරක නැහැ. ඊළඟට තුන් වැනි පියවර තමයි, අර වතුර, හිඳෙන්න ඇරලා එහෙම

[ගරු අසෝක සපුමල් රන්වල]

නැත්නම් කොළ වර්ග, මුල් වර්ග හිඳෙන්න ඇරලා බොන එක. ඒක අනිවාර්යයෙන්ම ඒ මුල්වල, කොලවල තිබෙන පෝෂණ ගුණය, අපට අනවශ්‍ය දේවල් පවා අධික ලෙස පොටෑසියම් වර්ග, ඒ වාගේම කැල්සියම් වර්ග ජලයට මිශ්‍ර වෙනවා. එය පානය කිරීම අපේ වකුගඩුවලට හා අනෙක් ඉන්ද්‍රියයන්වලට අහිතකරයි. එහෙම දෙයක් පානය කරනවා නම්, අනිවාර්යයෙන්ම වෛද්‍යවරයෙකුගේ උපදෙස් නැතිව පානය කළොත් අපව රෝගී වෙනවා. ඒ නිසා ක්‍රමානුකූලව අපට හොඳ පානීය ජලය පානය කිරීමේ අයිතිය අහිමි වෙලා. අද අපට සිද්ධ වෙලා තිබෙනවා, මොනවා හරි දෙයක් පෝෂ්‍ය පදාර්ථයක් විධියට ගන්නවා නම්, ඒක රත් කරලා, කැකෑරලා ඒ විධියට ගන්න. දැන් කොළ කැඳ බොහෝ ලෙස ප්‍රචලිත වෙලා තිබෙනවා. ඒක හොඳ දෙයක්. හැබැයි, එතැනදී ඒ කොළ කැඳ පානය කරන අය වකුගඩු රෝගයකින් පෙළෙනවා නම්, මුත්‍රා රෝගයකින් පෙළෙනවා නම් බරපතළ අවධානමකට මුහුණ දෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා නිරෝගී ජනතාවකට වඩාත් හොඳ කොළ කැඳ ව්‍යාපාරය, ගුණාත්මකව ලබා දෙන්නේ කොහේද කියලා නන්දන පත්ම කුමාර ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා. මේ කොළ කැඳ ජාවාරමක් බවට පත් වෙන්න ඉඩ නොදී මේ රටේ ජනතාව සුවපත් කරන දෙයක් බවට පත් කර ගන්න. ව්‍යාජ දේවල්, මේක උකු කරන්න පිටි වර්ග, එහෙම නැත්නම් බඩ ඉරිඟු පිටි මිශ්‍ර කිරීමෙන් වැළකිලා හොඳම ආකාරයේ කොළ කැඳ වීදුරුවක් ලබා දෙන්න. යම් ප්‍රමිතියක් ඒ සම්බන්ධව නිර්මාණය කරන්න.

දැන් පොඩි කථාවක් යනවා මේකට කෙසෙල් කොළ දානවා කියලා. ඇයි අපේ ජනතාව මෙවැනි පානීය දෙයක් ඉල්ලද්දී උකුවට ඉල්ලන්නේ. ආර්ථික ප්‍රශ්න හින්දා, එයා රවට්ටයිද කියන දේ තහවුරු කර ගන්න තමයි උකුවට ඉල්ලන්නේ. මේක වැරදි දුර්මතයක්. මේ දුර්මතය අපි දැනුවත් කළ යුතුයි. උකු වූ පමණින් ඒක ඇඟට හොඳ වෙන්නේ නැහැ. කොළ කැඳ වීදුරුවක් බොනවා නම්, අනිවාර්යයෙන්ම වතුර වීදුරුවක් ඊට සමානව පානය කළ යුතුයි. එහෙම නැත්නම් අපේ වකුගඩුවලට බලපානවා. ඒ නිසා මේක දැඩි අවධානයට යොමු කළ යුතුයි. කොළ කැඳ වීදුරුවක් ඔබ පාලනය කරනවා නම්, ඊට සමාන වතුර වීදුරවකුත් පානය කළ යුතුයි. මේක පැරැන්නන් කියන දෙයක් තමයි, ඔබ ගෙදරකට කවුරු හරි ආවාම ඔබට කැඳ වීදුරුවක් දෙනවා නම්, වතුර වීදුරුවක් නොදුන්නොත් ඔහු ඔබේ සතුරෙක් කියලා හිතන්නය කියලා. ඒ නිසා අපි මේවා ප්‍රචලිත කළ යුතුයි.

පෝෂණය සම්බන්ධව වැදගත්ම ක්‍රමවේදයක් නම්, පානය කරන පානීය ජලය සුරක්ෂිත කර ගන්න. ගම්පහ දිස්ත්‍රික්කය, කළුතර දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය අධික ජන ඝනත්ව සහිත ප්‍රදේශ විධියට ස්වභාවික පානීය ජලය අපවිත්‍ර වෙලා. ඒ වාගේම අනුරාධපුර, කුරුණෑගල ඒ වාගේ belt එක ඇතුළේ වෙනත් ක්‍රමවේද ගණනාවක් නිසා පානීය ජලය අපවිත්‍ර වෙලා තිබෙනවා. ඒ නිසා පානීය ජලය අපට අහිමි වෙලා තිබෙනවා. අපි ගන්නා ආහාර වස විෂ සහිතව ගන්න බල කරලා තිබෙනවා.මේ තත්ත්වයත් තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය බස්නාහිර පළාත තුළ මේක නිවැරැදි කර ගන්න අරගෙන තිබෙන ක්‍රමවේදයන් මොනවාද? ඒ සම්බන්ධව සාකච්ඡාවක් නිර්මාණය කර ගන්නේ කොහොමද? වැසිකිළි පද්ධති ආශ්‍රිතව නිර්මාණය වෙලා තිබෙන තත්ත්වයන් පානීය ජලයට කොතරම් ප්‍රමාණයක් වෙලා බලපාලා තිබෙනවාද කියලා අපි අධ්‍යනය කරන්න ඕනෑ. ඊට වඩා දහස් ගුණයක් අධ්‍යයනය කරන්න ඕනෑ. මහා පරිමාණයේ කර්මාන්තශාලා මහා පරිමාණයෙන් අපේ පානීය ජලය දූෂණය කරනවාට විරුද්ධව කටයුතු කළ යුතුයි.

ජපානයේ විශේෂ දෙයක් තිබෙනවා. පොළව යට තිබෙන වතුර ජනතාවගේ පානය සඳහාම වෙන් කරලා තිබෙනවා. පොළවට කිසිම අපද්‍රව්‍යයක් දාන්න බැහැ. පොළවට දාන අපද්‍රව්‍ය තිබෙනවා නම්, ඒක වෙනම භාජනවලට දාන්න ඕනෑ. පොළවට දාන්න බැහැ. ඒක නිසා තමන්ගේ රටේ, තමන්ගේ භූමියේ තිබෙන ජලය සුරක්ෂිත කර ගන්නත්, දාන අපද්‍රව්‍ය ටික වෙන් කර ගන්නත් ක්‍රම අනුගමනය කරලා තිබෙනවා. ඒක නිසා මේ කාර්යභාරය පරිසර අමාත්‍යාංශයටවත්, කෘෂිකර්ම අමාත්‍යාංශයටවත් භාර කරන්න එපා. බස්නාහිර පළාත් සභාව අධීක්ෂණය කරන්න. නියාමනය කරන්න. ඒ සම්බන්ධව නීති සම්පාදනය කරන්න. සෞඛ්‍ය අමාත්‍යාංශය මූලිකත්වය ගත යුතුයි. මොකද පෝෂණයට සහ ආහාරවලට සෘජුවම වග කිවයුතුයි. කෘෂිකර්ම අමාත්‍යාංශය තමන්ගේ අස්වැන්න වැඩි කරගන්න මැදිහත් වේවි. හැබැයි සෞඛ්‍ය අමාත්‍යාංශය එය නියාමනය නොකළොත් පෝෂණ එහෙම නැත්නම් ජලය, ආහාර ලබා දෙන්න අපි අසමත් වෙනවා. ඒක නිසා සෞඛ්‍යය අමාත්‍යාංශය ඔබගේ නිලධාරී මහත්වරුන්,

ඒ වාගේම වෛද්‍ය නිලධාරී මහත්වරුන්, ඒ වාගේම දේශීය සෞඛ්‍යය අමාත්‍යාංශය මගින් මෙන්න මේ කාරණය නියාමනය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒක වාර්ෂිකව කැඳවලා හරි යන්නේ නැහැ. මාසයක් ගණනේ වෙනම, මේ වෙනුවෙන්ම මැදිහත් වී පානීය ජලය නිවැරැදි ආකාරයට ලබා දෙන්න කටයුතු කරන්න. ඒ වාගේම පැහැදිලිව කියන්න ඕනෑ. බෝතල් කරපු වතුර බීලා කවදාවක්වත් නිරෝගී ජනතාවක් නිර්මාණය වෙන්නේ නැහැ. එහෙම නම් බොන්න ඕනෑ, Natural Mineral Water. ලංකාවේ එකම Brand එකයි තිබෙන්නේ. Natural Mineral Water. නුවර පැත්තේ එකම එකයි තිබෙන්නේ. ඒකත් අභාවයට ගිහිල්ලා. කවුරුවත් පානය කරන්නේ නැහැ. ලෝකයේ 3440 යි තිබෙන්නේ, Natural Spring Water. ඒකෙන් ලංකාවේ දැනට අටක් හඳුනාගෙන තිබෙනවා. ඒ අටම අක්‍රියයි. ඒ නිසා Natural Mineral Water මේ මානවයාට අත්‍යවශ්‍යයි. එහෙම නොවුණොත් වකුගඩුවලට වැළඳෙන රෝගවලින් අපි පීඩාවට පත් වෙනවා. මට ලැබී තිබෙන කාලය සීමිත නිසා මම නවතිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.40 ]

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සුමිත් ලාල් මැන්දිස් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන්න ලැබෙන මේ අවස්ථාවේ මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාගේ කථාව ඉතාම විශිෂ්ට ගණයේ කථාවක්. එතුමා හැමදාමත් හොඳ දේවල් කථා කරනවා. එතුමා නියෝජනය කරන්නේ ජනතා විමුක්ති පෙරමුණ. ජනතා විමුක්ති පෙරමුණ රට වටේ නොයෙක් දේවල් කථා කරගෙන ගියත් මේ වාගේ සාරගර්භ කථා කරන අය අපේ පළාත් සභාවේ ඉන්නවා කියන එකත් මම ඇගයීමක් හැටියට ප්‍රකාශ කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මේ ගරු ඇමතිතුමාට පුණ්‍යවන්ත ඇමතිතුමා කියන්නේ. පිං ඇමතිතුමා. ඒකෙන් අදහස් කරන්න එපා පිං ඇමතිතුමා කියන්නේ, පිං කර ගන්නා ඇමති කෙනෙක් කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

ඇයි ඒ?

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පිං ඇමතිතුමා කියන්නේ, එතුමා ඉතාමත් ගොඩක් පිං රැස් කරගෙන ඉන්න ඇමතිවරයෙක් කියන එක මෙතැන ප්‍රකාශ කරන්න ඕනෑ. ඉන්න කෝ හිනා වෙන්නේ නැතිව. මම දැන් මෙතැන ඉඳගෙන කල්පනා කළේ, මේ ඇමතිතුමා පන්සල්වලට ආධාර නොකළාට, පල්ලි හැදුවේ නැති වුණාට, මුස්ලිම් පල්ලි හැදුවේ නැති වුණාට විශාල පිං කන්දරාවක් රැස් කරගෙන ඉන්නවා. මම අපේ සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමියගේ කථාව අහගෙන සිටියා. එතුමිය ඉතාමත්ම - ප්‍රශස්ත ගීතිකා ගැයීම නොවෙයි. ඇත්ත ඇති සැටියෙන්ම එතුමිය කථා කළා. මගේ පෞද්ගලික අඩුපාඩුවක් තිබෙනවා. සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමිය, පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමාගේ ඉඳලා සියලුම වෛද්‍යවරුන්ගේ නම් කිව්වා. ඒක එතුමන්ලාට කරන ගෞරවයක්. නමුත් මට ඒක කියා ගන්න විධියක් නැහැ. මොකද මට ඒ පිළිබඳව එච්චර අවබෝධයක් නැහැ. ඇත්ත කථාව. බිම් ගත ශ්‍රේණියේ සේවකයාගේ පටන් ඉහළට එන හැම සේවකයෙකුගේම සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් විෂයය පථයේ හැම කෙනෙක්ම කැප වෙලා වැඩ කළා. ඒ නිසා තමයි මම කිව්වේ, එතුමා පුණ්‍යවන්ත ඇමතිතුමා කියලා. මේ අය සමච්චලයට භාජනය කරන්නේ. මොකද, ඒ අය කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු. (බාධා කිරීමක්)

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මොකක්ද? මොකක්ද?

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

හිටපු සෞඛ්‍ය ඇමතිතුමාටත් කේන්ති යනවා නේ? පොඩ්ඩක් ඉන්න කෝ. පොඩ්ඩක් අහගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මම මේ කථාවට ආවේ හරිම සැහැල්ලුවෙන්. මම හරි සැහැල්ලුවෙන් කියන්නේ. ගරු ඇමතිතුමාගේ ආයුර්වේද වෛද්‍ය සායනය තිබෙනවා. සෞඛ්‍යය වෛද්‍ය සායනය. ඒකට ගිහිල්ලා අපේ ගරු මන්ත්‍රීවරු ඔක්කොම Head Massage කරගෙන ආවේ. මොළයත් එක්ක Massage කරගෙන ආවේ. ඒ නිසා හරි සැහැල්ලුවෙන් ඉන්නේ. මෙතැනදී මට යෝජනාවක් කරන්න හිතුනා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් හැම එක්කෙනාම ගැඹුරෙන් සෞඛ්‍ය විෂයය පිළිබඳව කථා

[ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා]

කළේ. දැන් අසෝක සපුමල් ගරු මන්ත්‍රීතුමාත් ඉතාමත්ම විශ්ලේෂණාත්මකව සාරගර්භ කථාවක් කථා කළේ. මම එතැනට යන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රී සරත් පතිරණ මැතිතුමා, අපි ඔක්කොම එතැනට ගිහිල්ලා සම්බාහන - වචනය හරිද? හිස සම්බාහනය කර ගත්තා. හිස සම්බාහනය කර ගත්තා. පුදුම සැහැල්ලුවක් තිබෙන්නේ. ඒ සම්බාහනය කරපු ඒ දරුවෝ - මම දරුවෝ කියලා කියන්නේ, ඒ තරුණ දරු දැරියෝ. අපව සම්බාහනය කළේ පිරිමි දරුවෝ. මම ඔවුන් එක්ක කථා කළා. මට ඔවුන් කෙරෙහි විශාල අනුකම්පාවක්, ඒ වාගේම ආදරයක් ඇති වුණා. මොකද ඒ අය කරන මහන්සිය. හැබැයි ඒ අයත් කථා කළාට පස්සේ මම ඇහුවා, පුතා දැන් අපි වෙනින් තැනකට ගිහිල්ලා මේක කළා නම් සන්තෝෂමක් දෙනවා. ඒක සාමාන්‍යයෙන් සම්ප්‍රදායක් බවට පත් වෙලා තිබෙනවා. ඒක කරන්න විධියක් නැහැ. කොහොමද ඔබලාගේ පඩිනඩි කියලා ඇහුවාම, ඔවුන් ඉතාමත්ම නිහතමානීව හිනා වෙලා කිව්වා, මෙන්න මෙහෙමයි තත්ත්වය. ඒත් සර් අපට ප්‍රශ්නයක් නැහැයි කියලා කිව්වා. ගරු සෞඛ්‍යය ඇමතිතුමනි, ඔවුන් කරන එම ක්‍රියාදාමය අතිවිශිෂ්ටයි. හැබැයි මේවා ගොනු වෙලා එන්නේ නැහැ. සභා දෙකක් තියන්න බැහැ. මේ අහගන්න. නැත්නම් නිකා ඉන්න. ඡන්ද ගන්න නම් මිනිස්සු ළඟට ගිහිල්ලා වඳිනවා. වැදගත් දෙයක් අහන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සෞඛ්‍ය ගරු ඇමතිතුමාට යෝජනාවක් කරනවා. සම්බාහනයේ යෙදෙන දරුවන්ට - මම නම් ටික ලියා ගත්තා. ගෞවරයක් හැටියට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

ගරු සභානායකතුමාට බාධා කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ -** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

කාලය ඕනෑ. සුජීත ගිහාන්, මනෝජ් ලියනගේ. කේ.ජේ. සුසිල් කුමාර, එච්.ඒ.ඩී. ප්‍රියන්ත, කේ.ඩී.යූ.කේ. සිල්වා, කේ.සී. පෙරේරා, පී.ඒ.ඩී.ඒ. චන්ද්‍රකාන්ති, ආර්.ඒ. රංග ප්‍රියදර්ශනී, ජී. සුජීතා මනෝරි. මම මේ නම් ටික කිව්වේ, හැන්සාඩ්ගත වෙන්න. ඒ අයට කරන ගෞරවයක් හැටියට. මොකද අපි ඔක්කොම මේ සභා ගර්භවල ලොකු ලොක්කෝ ගැන නේ කථා කරන්නේ. ඒ නිසා මම යෝජනාවක් කරනවා. මම ඔවුන්ගෙන් ඇහුවා, ඔවුන්ට වෙනත් දීමනා දෙනවාද කියලා. කිසිම දීමනාවක් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මගින් මේ උත්තරීතර පළාත් සභාවේ මම යෝජනාවක් කරනවා, අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාට. එතුමාට මොනවා හරි කිව්වොත් කරනවාම තමයි. වචන දෙකක් නැහැ. මේ සම්බාහනයේදී රුපියල් 750, 850, 1000 වාගේ මුදල් අය කරනවා. ඒකෙන් ඔවුන්ට දිරි දීමනාවක් ගෙවිය යුතුයි කියලා. එක්කෝ කැලි ගණනට වෙන්න පුළුවන්. තේරුණාද? කැලි ගණනට කියන්නේ සම්බාහනය කරන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

සභානායකතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාට කැලිමයි මතක් වෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ -** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

සෞඛ්‍ය ඇමතිතුමා එකඟද?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

එකඟයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ -** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

බලන්න. අනික් ඇමතිවරුන්ට මෙහෙම කිව්වාම කෙරෙනවාද? අනික් ඇමතිවරු සලකලා බලන්නම් කියනවා. හිටු කියලා ඒ වෙලාවේම. බොහොම ස්තුතියි. ඊළඟට ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මම කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම කඩුවෙල ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මේක හැන්සාඩ්ගත වෙන්නයි කියන්නේ. කඩුවෙල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා. මම කඩුවෙල මැතිවරණ කොට්ඨාශයේ කඩුවෙල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා. මම ඇමතිකන් කරලා තිබෙනවා. තව තනතුරු ගොඩක් දරලා තිබෙනවා. හැබැයි මට මේ හිටපු

සෞඛ්‍ය ඇමතිතුමාත් උදව් කළාද කියන එක මට හරියට කියන්න බැහැ. මෙතුමා නම් අපට ගොඩක් කරලා තිබෙනවා. විශේෂයෙන් තලංගම රෝහල, අතුරුගිරිය රෝහල, නවගමුව රෝහල කියන ඒවා පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න. ගරු ඇමතිතුමාගේ විශේෂ ව්‍යාපෘතියක් තිබෙනවා. ලේ කාන්දු -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

dialysis

**ගරු හෙක්ටර් බෙත්මගේ -** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

dialysis ඒකේ සිංහල වචනය මොකක්ද? ලේ කාන්දු කිරීමේ - ඒ වචනය හදලා දා ගන්න. මේවා තිබෙන්නේ එක්තරා සීමිත රෝහල් කීපයකට විතරයි. කඩුවෙල මැතිවරණ කොට්ඨාශය කියන්නේ විශාල ජන ගණත්වයක් තිබෙන ප්‍රදේශයක්. ඒකේ තිබෙන්නේ රෝහල් තුනයි. අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා දන්නවා. තලංගම රෝහල, නවගමුව රෝහල, අතුරුගිරිය රෝහල. මේ රෝහල් තුනටත් ලබන අවුරුද්දේ මේවා ලබා දෙනවා නම් විශේෂයි. මොකද එහෙම නැත්නම් කොළඹට යන්න වෙනවා. මට දැනගන්න ලැබුණා. අපේ ගරු අමාත්‍යතුමා කිව්වේ, ලබන අවුරුද්ද වන විට ඩොලර් මිලියන 14 ක් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබෙන්න තියෙනවා. හරි නේද? ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබෙන්න තිබෙනවා. අවුරුදු පහක වැඩ පිළිවෙළකට. ඒ කියන්නේ ඇමරිකාව, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය වගේ නූතන යුගයේ තිබෙන සෞඛ්‍ය ක්‍රමවේදයන් ලංකාවේ අපේ අයටත් ලබා දෙන්න. ඒ නිසා එම ක්‍රමවේදයන් එන කොට මේ වාගේ දේවල් තිබෙන්න ඕනෑය කියන කාරණාව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම ගරු සෞඛ්‍ය අමාත්‍යතුමනි, තමුන්නාන්සේගේ ශක්තියත් එකක්. ඒක මම කියන්න ඕනෑ. නමුත් තමුනාන්සේගේ කාර්යමණ්ඩලයේ ශක්තියත් කියන්න ඕනෑ. තමුන්නාන්සේට හොඳ පෞද්ගලික ලේකම්වරයෙක් ඉන්නවා. වචනයේ පරිසමාප්තයෙන්ම පෞද්ගලික ලේකම්වරයෙක්, විජිත මහත්මයා. ඒ වාගේම තමුන්නාන්සේට හොඳ මහජන සම්බන්ධතා නිලධාරියෙක් ඉන්නවා. ගයාන් මහත්මයා. තමුන්නාන්සේ පුටුවේ නොසිටියත් අපි ගියාම සොයා බලලා, මොකද, සාක්ෂි තිබෙනවා. මම සමහර වෙලාවට ගිහිල්ලා, ගයාන් පුතා මේ වැඩේ කරන්න කිව්වාම ළඟට ඇවිල්ලා කරලා දෙනවා. මොකද මම එහෙම කියන්නේ, ඇතැම් අමාත්‍යාංශවල එහෙම නැහැ. ලියුම් 10 ක් දුන්නත් එහෙකටවත් උත්තර නැහැ. ඒ නිසා තමුන්නාන්සේගේ ප්‍රඥාව, ඥානය පහළ වෙලා තිබෙනවා. හොඳ පෞද්ගලික ලේකම්වරයෙක් සහ මහජන සම්බන්ධතා නිලධාරියෙක් ඇති කරගන්න. ඒ නිසා මගේ පෞද්ගලික ස්තුතිය මේ වැදගත් සභාවේදී ප්‍රකාශ කරන්නේ අනික් අයටත් ආදර්ශයක් වන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ -** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ඇති. ඇති. විනාඩි අරික්කාලක් තිබුණත් ඇති. අවසාන වශයෙන් කියන්නේ, බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු අනිකුත් අමාත්‍යවරුන් අතර අපේ සෞඛ්‍ය ගරු අමාත්‍යතුමා වචනයේ පරිසමාප්තයෙන්ම හොඳ චේතනාවෙන් තම යුතුකම් ඉෂ්ට සිද්ධ කරන අමාත්‍යවරයෙක් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Deputy Chairman

බොහොමත්ම ස්තුතියි. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙස ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 15 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.51 ]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තූතියි. වෛද්‍යවරුන්, සෞඛ්‍ය ක්ෂේත්‍රය ඇතුළු විෂයයන් සමඟ දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, සමාජ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු. මේ සියලුම කාරණා ගැන කථා කරන්න වෙලා මදි. නමුත් අපි කෙටියෙන් කථා කළොත් හැම වේලාවේම විපක්ෂයෙන් විවේචන තමයි මන්ත්‍රීතුමන්ලා අපේක්ෂා කරන්නේ. මේ ඇමතිතුමා බෙහොම නිහතමානී, වයස ටිකක් ගියත් උවමනාවෙන් වැඩ කරන ඇමතිතුමෙක් හැටියට -

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වයස ටිකක් ගියාට කියන්නේ. තිස් අටක පෙණුමක් තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතුමා හැකි සෑම කෙනෙක් එක්කම සුහදව කටයුතු කරන ඇමතිවරයෙක්. ඒ වාගේම එතුමන්ලා සියලුදෙනාම මේ වන විට - දැන් මහින්ද රාජපක්ෂ මැතිතුමා දිනවන්න. ඒ වාගේම ජනාධිපතිතුමා ඉදිරි ඡන්දයට දිනවන්න මහන්සි වෙලා වැඩ කරනවා. ඒකට මහජන සම්බන්ධතාවය ඉතාම වැදගත් වෙනවා. මේ කටයුතු කිරීමට. එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ත් පෙරමුණ ඇතුළු අනිකුත් පක්ෂ විවිධ විවේචන ඉදිරිපත් කළත් මට හිතෙනවා, මේ අයවැය අවසාන කථාවේදී, ඇත්ත වශයෙන්ම මේ ආණ්ඩු පක්ෂ කණ්ඩායම කරපු හොඳ වැඩ ගැනත් ටිකක් වැඩිපුර කියන්න ඕනෑ. අපි උදාහරණයක් හැටියට ගත්තොත් මේ ආණ්ඩු පක්ෂය අනුගමනය කරන ක්‍රියාමාර්ග අනුව මේ දේශපාලන ක්ෂේත්‍රයේ අපේ මන්ත්‍රීවරු104 දෙනෙක් ඉන්නවා. මේ මහින්ද මහත්තයාව අනුගමනය කළොත් මේ 104 දෙනාටම සමහරවිට තමුන්ගේ දරුවෙක් ඉන්නවා නම් ඒ දරුවාට හොඳ අධ්‍යාපනයක් දීලා, හොඳ රස්සාවකට දාන්න අමාරු නැහැ. හේතුව තමයි, වෙනම කාමරයක විභාග ලියන්න පුළුවන්. කොච්චර විදේශවලින් හොරට සහතිකයක් ගහන් ආවත් ලකුණු 99 ක් ගන්න පුළුවන්. ඒ නිසා මේ සභාවල එතුමාට බණින එක වැරැදියි. ඒ වාගේම මම කියන්න ඕනෑ. මේ රටේ සෞඛ්‍ය දියුණු කරන්න විතරක් නොවෙයි. අනික් හැමදේම දියුණු කරනවා නම්, රැකි රක්ෂා පැත්ත හරි දියුණු වෙන්න ඕනෑ, සෞඛ්‍යය දියුණු වෙන්න. බැරි වෙලාවක්වත් රස්සාවකන් නැත්නම් කුඩු වික්කත් එතුමා හෙලිකොප්ටරෙන් ගිහිල්ලා බේරාගන්නවා නම්, එතුමාට බණින එක වැරැදියි. ඒ වාගේම මේ කෑ ගහන මන්ත්‍රීතුමන්ලාට ඡන්දය නැත්නම් ආණ්ඩුවේ සල්ලි ටිකක් අරන් සිල් රෙදි ටිකක් බෙදලා හරි ඡන්ද ගන්න ක්‍රම හදලා දීලා තිබෙනවා. එතුමාට බණින එක වැරැදියි. ඒ වාගේම තමුන්නාන්සේලාගේ කොපමණ නඩුහබ තිබුණත් ආණ්ඩු බලය අරගෙන එතුමා කොහොමහරි නඩුකාරයින්ට කෝල් දීලා හරි වැඩෙත් කරයි. ඒකට බණින එක වැරැදියි නේ? එහෙම බැලුවාම මෙතුමන්ලාගේ උත්සාහයට අපිට දොස් කියන්න බැහැ. ඒ වාගේම එපමණ මහන්සි වෙලා වැඩ කරලා බැරි වෙලාවක්වත් පැරදුණොත් ලැයිස්තුවෙන් හරි අරගෙන, ඇමතිකමක් පවා ගන්න පුළුවන්. එහෙම වාතාවරණයක් හදපු නායකයෝ ඇත්ත වශයෙන්ම මෙතුමන්ලාට අපි ආයෙමත් දොස් කියන්න හොඳ නැහැ. අවසාන කථාවේදී මම හිතනවා තමුන්නාන්සේලාට එවැනි දේවල්වලට දොස් කීම වැරැදියි.

හැබැයි මම සෞඛ්‍යය ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. අද සමස්ත ලංකාවේම මිනිසුන්ගේ මානසික සෞඛ්‍යය ඉස්සෙල්ලාම හදන්න ඕනෑ. ඒ කියන්නේ විඥානය, ඒ වාගේම මේ අයගේ මානසික තත්ත්වය. අද ඇත්ත වශයෙන්ම කේජු කෑල්ල හොරා කාලා හරි ගෙනාවාම මේක බෙදා ගන්න පොරකන මානසිකත්වය මේ ලංකාවේ හැදිලා තිබෙන්නේ. එහෙමනම් මම කියනවා ගරු සෞඛ්‍යය ඇමතිතුමනි, අපි ගණන් හිලව් හැදුවාට, මෙච්චර මුදල් වෙන් කරන්න කිව්වාට, මේවා මේ විධියට වෙන්නේ කිව්වාට, අද ඉස්සෙල්ලාම මානසික සෞඛ්‍යයටයි බෙහෙත් දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ආගමික නායකයන් උගන්වනවා, මිනිසුන්ගේ වකුගඩුව හඳුනගන්න පුළුවන්, අක්මාව මෙතැන තියෙනවා කියලා හඳුන ගන්න පුළුවන්. හැබැයි හිත, විඥානය ක්‍රියා කරන ආකාරය, ඒ සියල්ල පාලනය වන්නේ භාවනාවෙන් සහ හික්මීමක් ඇතිව. ඒ අය ගොඩනඟා ගන්නා වැදගත් ධර්මතාවය අනුව තමයි මේ විඥානය හැඩ ගැහෙන්නේ. අද බහුතරයක් දේශපාලන නායකයන් කථා කරන දිහා බැලුවාම අද පට්ට යන්න බණිනවා. මාව මරන්න ගියා. වළලන්න ගියා. විධායකය යටට අරින්න ගියා. පහුවෙනිදාට කියනවා, මාව නොවෙයි. ඒ කවුරු හරි

රෙකෝඩ් කරලා දාන්න ඇති. මම කිව්වේ නැහැයි කියනවා. මෙවැනි කථා තමයි අහන්න අද ජනතාවට සිද්ධ වෙලා තිබෙන්නේ. අද පුංචි ළමයා පවා මේවා අහලා ඒ විධියට හැඩ ගැහිලා තිබෙනවා. ඒ නිසා අපි මේ වැරැද්ද, දේශපාලන නායකයින්ගේ මේ මානසික සෞඛ්‍යය පැත්ත හැදුවේ නැත්නම්, මොන සෞඛ්‍යය හැදුවත් වැඩක් වෙන්නේ නැහැ. ඒ නිසා යම්කිසි පුද්ගලයෙක් නිතරම වැරැද්ද හරි හරි කියලා හිතන්න පුරුදු වුණොත්, ඒ හෘද සාක්ෂිය සාවද්‍ය හෘද සාක්ෂියක් බවට පත් වෙනවා. එතකොට ඒ ශරීරයම හොරකමට, ඒවා අනුගමනය කරන්න සහ ඒවා වර්ණනා කරන්න පෙළඹෙනවා. ඒ නිසා අපට අද විශේෂ වෙහෙසක් ගන්න වෙලා තිබෙනවා. මේ සියල්ල, ඒ විකෘතිකරණය ප්‍රකෘතිකරණයට ගන්න විශාල වෙහෙසක් දරන්න වෙලා තිබෙනවා. ඒ නිසා මේ සියලුම බස්නාහිර පළාත් මන්ත්‍රීතුමන්ලාගේ, ඒ වාගේම නිලධාරී මහත්ම මහත්මීන්ගේ, ඒ වාගේම ජනතාවගෙන් මේ අවසාන අයවැය කථාවේදී මම ඉල්ලා සිටිනවා. අපි මේ විකෘතිකරණයෙන් ප්‍රකෘතිකරණය කරා ගමන් කරන්න ඕනෑ. මෙයා අපේ හිතවතෙක්ද? ඥාතියෙක්ද? යාළුවෙක්ද? කියන එක අදාළ නැහැ. ඒ නිසා මේ දේ අපි සිදු නොකළොත්, අපි මේ ඉපදෙන්න ඉන්න දරුවාට පවා කරන විශාල අසාධාරණයක් වෙනවා. මම ඒක තමයි කිව්වේ, පෙළ පොතේ හොරා කාගෙන ආපු කේජු කැල්ල ගන්න නරියා කියනවා, ඔබේ කටහඬ මිහිරියි කියලා. එව්වා තමයි අපට පෙළ පොත්වල ඉගැන්නුවේ. ඒවා තමයි පාර්ලිමේන්තුවේ අපි ප්‍රතිඵල හැටියට මේ දකින්නේ. ඒ නිසා අපි උගන්වන්න ගන්න ඕනෑ. සෞඛ්‍ය පැත්තෙන් පුහුණු කරන්න ඕනෑ. තවත් කෙනෙක්ගේ සෞඛ්‍යයට බලපාන දේවල්, අහිතකරන දේවල් අපි නොකරන්න.

අද බලන්න අපට දෙන අඹ ගෙඩිය, අපට දෙන පැපොල් ගෙඩිය, අපට දෙන එළවළු ටික, මාළු ටික හැම එකේම මොනවද තිබෙන්නේ? මොකක් හරි විෂක්. අපි ඉස්සර දැනගෙන හිටියේ නැහැ, හැම පලතුරු ගෙඩියටම ඉන්ජෙක්ෂන් ගහනවා කියලා. මේ සියල්ල පුරුදු වෙලා තිබෙන්නේ අර මම කියපු යහපත් විඥානය මනුස්සයා තුළ වර්ධනය වුණේ නැති නිසා. අද අපි ජපානය ගැන කථා කළොත් ඒ මිනිස්සුන්ට භයක් නැතිව වැඩක් භාර දෙන්න පුළුවන්. 100% ක් ඒක කරනවා. අවංකව කරනවා. අපි අපේ අය පහතට දානවා නොවෙයි. ඊට වැඩිය දක්ෂ මිනිස්සුන් ඉන්නවා. සමබරව කාලගුණය එක්ක, දේශගුණය එක්ක හොඳ පරිසරයක ගැටිලා හැදුණු හොඳ මනසක් තිබෙන මිනිස්සු ලංකාවේ ඉන්නවා. ප්‍රධාන වරද වෙලා තිබෙන්නේ මේ රට මෙහෙයවන්න ඉන්න පරිපාලනය කරන්න ඉන්න අපි සියලුදෙනා හරි ගමන් මාර්ගය ගන්නේ නැති නිසයි මේ ප්‍රශ්න රාශියක් මතු වෙලා තිබෙන්නේ. අද වෙළෙන්දා පුරු වෙලා තිබෙන්නේ. වස විෂ විකුණලා හරි සල්ලිකාරයෙක් වුණොත් ඒ අයට සමාජයේ පිළිගැනීමක් තිබෙනවා. ඊට පස්සේ වස වික්කාද? කුඩු වික්කාද? කියලා අහන්නේ නැහැ. හාමුදුරුවෝ ගෙනැල්ලා පිරිත් නූල බඳිනවා. මේ සහ්‍යත්වයෙන්, මේ සදාචාරයෙන් මේ සෞඛ්‍යය හදා ගන්නේ නැතිව වෙන සෞඛ්‍යයක් හදලා හරි යන්නේ නැහැ. මේකට පෙති ගෙනැල්ලා හරි යන්නේ නැහැ. මේකට සැත්කම් කරලා හරි යන්නේ නැහැ. මේ සෞඛ්‍යය හැදුවොත් තමයි රට හැදෙන්නේ. ඒ නිසා මම විශේෂ කොටම අවධානය යොමු කරනවා. මේ සියලු කාරණාවලදී අපි එතැන ඉන්න ඕනෑ.

ඒ වාගේම අපේ දේශීය වෛද්‍ය ක්‍රමය ගැන ගරු මන්ත්‍රීවරු කථා කළා. මම අහගෙන සිටියා. පරිවාස හා ළමාරක්ෂක ගැන අපි වචනයක් කථා කළොත්, අද විශාල වශයෙන් මේ දරුවන් තැන් තැන්වල දමා යාම, ඒ වාගේම ඉපදුණු ගමන් දරුවා දමා යාම පවා තවම නැවතිලා නැහැ. ඒක එහෙම්ම සිද්ධ වෙනවා. එතකොට මේ පරිවාස ආයතනවල රුපියල් විස්සක වාගේ මුදලක් තමයි දරුවෙකුට වෙන් වෙන්නේ. මේක ඉතාමත් මදී. රුපියල් විස්සකින් කොහොමද කෑම ගන්නේ. අපි ඉස්සර දැක්කා. අර අරලියගහ මන්දිරයේ ආහාර වේලට 5000 ක් විතර සෙනඟ ගේනවා. ඉස්සර අපි කිව්වේ දාන දෙනවා කියලා. හැබැයි දැන් අරලිගයගහ මන්දිරයේ කට්ටිය හිටියට එහෙම හම්බ වෙන්නේ නැහැ. රුපියල් 150/- ක බත් එකක් ගෙනැල්ලා ඒගොල්ලෝ කනවා. එහෙම 5000 කෑම හම්බ වෙන්නේ නැහැ. මම කියන්න හැදුවේ, එවැනි නාස්තිකාර වියදම් කරන්නේ නැතුව මේ පුංචි දරුවන්ට අඩුම ගණනේ රුපියල් 200/- ක්වත් දෙන්න පුළුවන් නම් හොඳයි. ඒ අය සමාජයේ පුරවැසි කොට්ඨාශයක්. කාගේ හරි වරදකින් අසරණ වෙලා තිබෙන්නේ. රුපියල් 20/- කින් නඩත්තු වෙන්න බැහැ. අන්තිමට සිද්ධ වෙන්නේ, ඉතාම දෘඛිත විධියට ඔවුන්ව හදාවඩා ගන්න සිද්ධ වන එකයි. එතැනින් ඒ ළමයින් හැදෙන්නේම යම්කිසි හීනමානයකුත් එක්ක. අනික් සමාජය කෙරෙහි වෛරයකුත් එක්ක. මේ ගැනත් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා, ඒ දීමනාවල්

[ගරු රෝස් ප්‍රනාන්දු ]

පොඩ්ඩක් වැඩි කරන්නය කියලා. මේ හැමෝම කථා කරපු විෂයයන් ගැන මම කථා කරන්නේ නැහැ. මම වෙනස් දෙයක් කථා කරන්නේ. මේ අඩුපාඩුව හඳාගන්න.

ඒ වාගේම කාන්තා කටයුතු පැත්තෙන් බැලුවොත් අපි වාගේ කාන්තාවෝ නම් කලඑළියට ඇවිල්ලා, අපට සමාජයේ අසාධාරණකම් වෙන්න දෙන්නේ නැතිව කටයුතු කරන්න. ඒවාට මුහුණ දෙන්න අපට හයියක් තිබෙනවා. නමුත් 75% ක් කාන්තාවෝ අදත් සමාජයේ අසාධාරණවලට ලක් වෙනවා. සමහරවිට ගෙදර වෙන්න පුළුවන්. සමාජයෙන් වෙන්න පුළුවන්. රැකියා ස්ථානයෙන් වෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හමුදාවේ සේවයට ගිය කාන්තා පිරිසක් මට හමු වුණා. ඒ අය කියනවා. සමහරවිට ප්‍රධානීන් එක්ක - ඉල්ලා අස්වෙන්න ලියුම දුන්නත් එකපාර අස් කරන්නේ නැහැ. ඒ අයට දඬුවම් කරනවා යන්නේ නැතිව සිටියොත්. මොනවා හරි බලපෑමක් නිසා සේවයට වාර්තා කෙරුවේ නැත්නම් ගෙනිහිල්ලා දඬුවම් කරනවා. ඒ දඬුවම් කරද්දිත් අර නිලධාරීන්මයි ඒ අයව පාලනය කරන්නේ. මෙවැනි දේවල් අපි දැක්කේ නැතුවට ඇතුළත තිබෙනවා. මේ කාන්තා ප්‍රශ්න අපි හඳුනාගෙන, මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග අපි ගන්නට අවශ්‍යයි. මම නම් එවැනි දේවල් දැන ගත්තාම ඒ අංශවලට, ඒ ප්‍රධානීන්ට දැනුවත් කිරීමක් කරනවා. මෙවැනි දේවල් අපේ ඇහැට ගැටෙන්නේ නැහැ. පේන්නේ නැහැ. ඒ අය නිල ඇඳුම ඇඳගෙන, නිල ඇඳුමේ ගරුත්වය තියාගෙන, ඒ නිලධාරීන්ට යන්න විධියකුත් නැහැ. එහි තිබෙන නීති රෙගුලාසි අනුව ඔවුන් එයට ගරු කරනවා. පොලීසිවල තත්ත්වයත් ඒකයි. පොලීසිවල කාන්තාවන්ට ඉතා විශාල වශයෙන් රාත්‍රියේ සේවය කරන්න සිද්ධ වෙනවා. කරදරවලට පත් වෙනවා. මේ සම්බන්ධයෙනුත් පළාත් සභාව වශයෙන් අඩුම වශයෙන් අධීක්ෂණයක් කරන්න ඕනෑ. මේ කාන්තාවන් වැඩ කරන වෙලාවන් මොනවාද? ඔවුන්ට ගැටලු තිබෙනවාද? මම හිතන්නේ විවිධ ක්ෂේත්‍රවල විශ්‍රාමික අය හරි දාලා, යම්කිසි කමිටුවක් පත් කරලා ඒ අයගේ දුක්ගැනවිලි අහන්න ඕනෑ. එතකොට තමයි සමාජයේ හැම පැත්තක්ම නිරාවරණය වෙලා මේවාට උත්තර ලැබෙන්නේ. උත්තරයක් ලැබෙන කොට තමයි මේ දේශපාලනඥයා කරන ක්‍රියා සමාජයේ ඇගයීමකට ලක් වෙන්නේ. එලෙස 75% ක විතර කාන්තාවන් දුක් විඳිනවා නම්, ඒ අය ගැන සොයා බැලුවොත්, ඒ අයගේ ඇගයීමට ඔබතුමා ලක් වෙනවා. එකින් එක එකින් එක ගිහිල්ලා මන්ත්‍රීවරයෙක්ට කරන්න බැහැ. ඒ සැලසුම ඔබතුමා අතරින් තමයි යන්න ඕනෑ. මේ බලය තිබෙන අමාත්‍යවරු.

ඒ වාගේම අපේ සභා කටයුතු පැත්ත කථා කළොත්, සභා කටයුතු අමාත්‍යාංශයට අයිති කොටසක් හැටියට සභාවේ කටයුතු තිබෙනවා. නව ගොඩනැගිල්ල නිර්මාණය කරලා, සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට ඒ සඳහා ඇපකැප වුණු අයට සභාවක් හැටියට අපේ ස්තූතිය ප්‍රකාශ කරන්න ඕනෑ, මේ අයවැය විවාදය අවසන් වෙන වෙලාවේදී. ඒ වාගේම මේ සෑම මන්ත්‍රීවරයෙක්ම ඉන්න ස්ථානයකටම විදුලි ආලෝකයක් අවශ්‍යයි. මේ පොත් අපි කියවන්න උත්සාහ කරනවා. සමහර වේලාවට චූටි අකුරු පෙනෙනවා මදී. ඒ නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ නිලධාරීන් හරහා සෑම මන්ත්‍රීවරයෙකුටම - බලන්න, මේ පොත්පත් කියවන්න ලයිට් එක අවශ්‍යයි. එහෙම නැත්නම් විදුලි ආලෝකය තිබෙන්න ඕනෑ. පාර්ලිමේන්තුවෙත් සෑම ආසනයකටම තිබෙනවා. එය අවශ්‍යයි. ඒ වාගේම අපගේ පුස්තකාලය. මම ගිහිල්ලා බැලුවා. මේ වන කොට තව පොත් එහෙම ඇතුළත් වෙලා නැහැ. තවම කෙරීගෙන යනවා. මන්ත්‍රීවරු දැනුමෙන් සම්පූර්ණ කරන ඒ වැඩ කටයුත්ත වෙන්න ඕනෑ. අද අපි මොන දේ කථා කළත් එදා අපි දැකපු ඇන්.එම්. පෙරේරලා එදා අයවැය විවාදවලදී කරන ලද ඒ තර්ක විතර්ක කියවන්න මේ පුස්තකාලවල තිබෙන්න ඕනෑ. අද අපට ගිහින් සොයා බලලා ගන්නවත් ඒ පහසුකම් මෙහේ නැහැ. එවැනි දේ තිබුණොත් තමයි හරයාත්මක කථාවක් අයවැය විවාදයකදී අහන්න ලැබෙන්නේ. එවැනි දේ තිබුණොත් තමයි අලුත් පරම්පරාව තව ඉස්සරහාට අනුගමනය කරලා හොඳ රටක් බිහි කරන්න අපට හැකියාව ලැබෙන්නේ. ඒ නිසා ගරු ඇමතිතුමා, සභා කටයුතු සම්බන්ධ ඇමතිතුමා හැටියට ඔබතුමාගේ අවධානය මම යොමු කරනවා. ඒ සෑම වැදගත් ලියවිල්ලක් - දැන් මේ ළඟදී ප්‍රකාශයට පත් වුණු නඩු තීන්දු පවා. දේශපාලනයේදී තීන්දුවක් තීරණයක් ගන්න මේවා ඉතාමත්ම වැදගත්. ව්‍යවස්ථාව ගැන දන්නේ නැති මන්ත්‍රීවරු පසුගිය කාලයේ පාර්ලිමේන්තුවට පත් වුණා. ව්‍යවස්ථාව මොකක්ද කියලා ඇහුවාම, මම නම් ඒක හරියට දන්නේ නැහැයි කියලා කිව්වා. ව්‍යවස්ථාව. එහෙම අය සිටියා. අපි අද කනගාටු වෙනවා. ඒ තත්ත්වයට දේශපාලනය පත් වුණා. කාගේ වරදින් හෝ පත් වුණා. ජනතාව මේ ගැන දැනගෙන සිටියේ නැහැ. මේ අය යවන්න

ඕනෑද? මේ අය ගෙදර තියන්න ඕනෑද? කියලා දැනගෙන සිටියේ නැහැ. ඒක අපෙත් වරදක්. ඒක අපි සියලුදෙනාම භාර ගන්න ඕනෑ වරදක්. ඒකට නියම සුදුස්සා, උනන්දුවක් තිබෙන, හැකියාවක් තිබෙන, විඥානයක් තිබෙන පුද්ගලයන් දේශපාලනයේ කරීකාවන්වල ඉදිරියට නොයැවීම අපේ වරදක්. ඒක අපි හැමෝම භාර ගන්නට ඕනෑ.

ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බස්නාහිර පළාතේ ආර්ථිකය ගොඩනැංවීමේ කටයුතු අපේ ගරු මහ ඇමතිතුමා කොයිතාක් දුරට උත්සාහවන්ත වුණත් මම හිතන්නේ තව විශාල ගමනක් යන්න තිබෙනවා. මේක ලෙහෙසි ගමනක් නොවෙයි. සමස්ත ජනතාව බලාගෙන ඉන්නේ බස්නාහිර පළාත් සභාව දිහා. අපි දිහා බලලා තමයි අනිකුත් පළාත් සභාවන් මේ ගැන තීන්දු තීරණ ගන්නේ. අපිව අනුගමනය කරන්නේ. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැන් ඉදිරියේදීත් තමුන්නාන්සේලා මොනම දේශපාලන පක්ෂයකට අයත් වුණත්, අපි හරි මේ ආරම්භය ගන්න ඕනෑ. දේශපාලනය ගමන් කළ යුත්තේ කොහාටද? අපේ ලංකාවේ දේශපාලනය වෙනස්කම් විය යුත්තේ කොතැනද? ඒ තැනට අපි යන්න ඕනෑ. මේ මිරිස් කුඩු යුග අපි අවසන් කරන්න ඕනෑ. පොත්පත්වලින් ගහන යුගය අවසන් කරන්න ඕනෑ. කථානායකගේ පුටුව උස්සන යුගය අවසන් කරන්න ඕනෑ. ඒ නිසා මම සියලුදෙනාටම යෝජනා කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ කාලය අවසානයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොහොම ස්තුතියි. මේ මිරිස්කුඩු යුගය නිසා අපි තමුන්නාන්සේලාට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරනවා. නමුත් මේ යුගය අවසන් කරන්න අපි සියලුදෙනාම එක්වෙමුයි කියන යෝජනාව කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 03.06 ]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අතිශයින්ම සන්තෝෂ වෙනවා. බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍යය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, සමාජ සුභසාධන, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම පිළිබඳවත්, ඒ වාගේම මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳවත් මූලාසනයටත් මගේ ගෞරවය පුද කරන්න කැමැතියි. 2019 වර්ෂය සඳහා මේ අයවැය ප්‍රකාශය අනුව රුපියල් මිලියන 17306 ක මුදලක් මූලික වශයෙන් වෙන් කොට තිබෙනවා. මම හිතන්නේ අනාගතයේ මගක් දුර යන කොට ලැබෙන්නේ බාහිර ප්‍රතිපාදනවලට අමතරව, ගිය වර්ෂයේ රුපියල් මිලියන 12710 ක් පමණයි ලැබිලා තිබෙන්නේ. 36% ක මූල්‍ය වර්ධනයක් මේ අමාත්‍යාංශය වෙත ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මුදල් ප්‍රකාශය අනුව පෙන්නුම් කර තිබෙනවා. එසේ වුණත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශ්වාස කරන්නේ නැහැ, මේ මුදල් ප්‍රමාණයත් මේ අමාත්‍යාංශයේ මෙහෙවර ඉෂ්ට කිරීම සඳහා ප්‍රමාණවත් කියන කාරණය. මම දන්නවා, මෙය මොනතරම් සංකීර්ණ වැඩ කොටසක් ඉෂ්ට කරන්න තිබෙන අමාත්‍යාංශයක්ද කියන කාරණාව පිළිබඳව. මට ලැබිලා තිබෙන වෙලාව අනුව වැය ශීර්ෂ කිහිපයක් ඔස්සේ කථා කරන්න අපේක්ෂා කරන්නේ නැහැ.

විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඉතාමත් සාමකාමීව, ලෙංගතුව මන්ත්‍රීවරුත් එක්ක වැඩ කටයුතු මෙහෙයවන්න වෙර දරන බව ගරු මන්ත්‍රීවරු කරන ප්‍රකාශවලින් ඉතාමත්ම පැහැදිලි වුණා. මම ඔබතුමාට පැහැදිලි කරන්න අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම මොල්ලිගොඩ ආයුර්වේදය පිළිබඳව. මේ පිළිබඳව විශේෂයෙන්ම කතා කරන්නේ ඔබතුමාට මහහැරුණු වැඩ කිහිපයක් තිබෙනවා, මෙහිදී සිහිපත් කරලා දෙන්න. ගරු අමාත්‍යතුමනි, මොල්ලිගොඩ ආයුර්වේදයේ පංචකර්ම ඒකකය අපි විවෘත කරනු ලැබුවේ 2013.12.27 වැනිදා. මේ සඳහා රුපියල් මිලියන 80 ක මුදලක් අපි වැය කළා, අංගසම්පූර්ණව මේ කටයුත්ත සකස් කරලා අවසන් කරන්න. ගරු ඇමතිතුමනි, මේක නැවත භාවිතයකට ගන්න අපට යම් කලක් ගත වුණා 2016.07.08 වැනිදා තමයි අපි මේ ගොඩනැගිල්ල යම් ප්‍රමාණයකට භාවිතයට ගන්නේ. පුරා වසර වසර තුනක් ගත වුණාට පස්සේ. ඒ ගොඩනැගිල්ලේ දැනට තාවකාලිව බාහිර රෝගී ප්‍රතිකාර පමණක් කරනවා. නේවාසික ප්‍රතිකාර කිරීමේ කටයුතු අද වනතුරු ආරම්භ වෙලා නැහැ. අංගසම්පූර්ණව සකස් කරන

[ ගරු ජගත් අංගගේ ]

ලද නේවාසිකව ප්‍රතිකාර කිරීම සඳහා කාමර හයක් මේ ගොඩනැගිල්ල ඇතුළේ සකස් කරලා තිබෙනවා. විශාල ඉල්ලුමක් තිබෙනවා. විශේෂයෙන්ම අපි මේක අරමුණු කරගෙන සකස් කළේ, මේ ප්‍රදේශය සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ ප්‍රදේශයක්. සංචාරකයින්ට මේ ආයුර්වේද මධ්‍යස්ථානය තුළ පංචකර්ම ප්‍රතිකාර ලැබීමට පහසුකම් සියල්ල සකස් කරලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අවාසනාවකට 2013 ඉඳලා අපි අද ගත කරන්නේ 2018 වර්ෂයේ අවසාන මාසය. වසර පහක් ගත වෙද්දිත්, මේ කාමර පහ ප්‍රයෝජනයට ගන්න - මේක ගරු ඇමතිතුමාගේ අඩුපාඩුවක් හැටියට මම සලකන්නේ නැහැ. මේ පිළිබඳ ප්‍රශ්නය ගරු ආණ්ඩුකාරතුමාට කිහිප වතාවක්ම යොමු කරලා තිබෙනවා. තව වනතුරු ඊට පිළිතුරු නිවැරැදිව ලැබිලා නැහැයි කියලා තමයි මගේ අදහස වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත් මේ විෂයයභාර නිලධාරීන් මේ වැඩ කටයුතු අවසන් කරන්න ගරු ඇමතිතුමාට සහයෝගය දක්වන්න ඕනෑ. නැතුව මේ ආයෝජනය කළ මුදලට, මට පුදුමයි තවම විගණන අංශයෙන් විගණන විමසුමක් නොලැබීම පිළිබඳව. බස්නාහිර පළාත් විගණන අංශය අවධියෙන් සිටිනවා නම්, මේ ආයෝජනය කරපු මුදලට සාපේක්ෂව මේ ව්‍යාපෘති වාර්තාව මේ විගණන අංශය හරියට පරිශීලනය කරලා තිබෙනවා නම්, මේ ව්‍යාපෘතියෙන් පෙරළා පළාත් සභාවට ලැබිය යුතු ආදායම කොතෙක්දුරට නැතිවෙලාද කියන එක පිළිබඳව හරියට තක්සේරුවක් කිරීම අවශ්‍යයි. එවැනි කටයුත්තක් පසුගිය කාලවකවානුව තුළ - පුරා වසරක් පහක් තිස්සේ බස්නාහිර පළාතේ විගණන අංශය මොන ආකාරයෙන් හැසිරුණාද? ක්‍රියා කළාද? කියන එක පිළිබඳව මට දැවැන්ත ගැටලුවක් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය අතිශයින්ම පළාත් සභාවක් හැටියට දැවැන්ත ඛේදවාචකයක්. ගරු ඇමතිතුමාට මේ සියල්ල අධීක්ෂණය කරමින් එකින් එක යන්න අවශ්‍යතාවයක් නැහැ. ඒ නිසා එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඒ ආයතන භාර ප්‍රධානීන් ඉන්නවා. ඔවුන් මේ පිළිබඳව සොයන්න බලන්න අවශ්‍යයි. අවශ්‍ය කටයුතු කරලා මේවා නිවැරැදි කරන්න අවශ්‍යයි. මම මගේ දියණිය සමඟ මේ ළඟදී මොල්ලිගොඩ ආයුර්වේද රෝහලට ගිය අවස්ථාවේදී මම මේ පිළිබඳව පරීක්ෂා කරලා බැලුවා. බලලා මගේ හිතේ වේදනාවට ලොග් පොත දෙන්නය කියලා ඉල්ලාගෙන මම ලෝග් සටහනක් ගැහුවා, මේ වෙලා තිබෙන විනාශය පිළිබඳව කරුණාකර ගරු ඇමතිතුමා දැනුවත් කරන්නය කියලා. මම හිතන්නේ එතුමා මේ පිළිබඳව මූලික කටයුතු කළා. මේ සඳහා විසඳුමක් දෙන්නය කියලා ගරු ආණ්ඩුකාරතුමාට යොමු කළා. මිල ගණන් නියම කරලා මේ කාමර හය විවෘත කරන්න ගත වුණු කාලය කොපමණද කිව්වොත් එහෙම අතිශයින්ම කනගාටුදායකයි.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මීගොඩට සහ මොල්ලිගොඩට මම ඒ වකවානුවේ X-ray කිරණ යන්ත්‍ර දෙකක් ලබා දුන්නා. මේකට විශාල මුදලක් වැය කළා. මේ මුදල ආයෝජනය කරලා මේ වැඩේ කරන්න අවශ්‍ය කටයුතු කළා. මේක ආරම්භ කළා. ගරු ඇමතිතුමනි, දැන් මේ කටයුතුත් අකර්මණ්‍යය වෙලා තිබෙනවා. මේ යන්ත්‍ර දෙක සවි කරලා තිබෙනවා. කාලයක් යන කොට මේ යන්ත්‍ර යල් පනිනවා වාගේම මේවා ක්‍රියාකාරීත්වයෙන් ඈත් වෙනවා. විශාල මුදලක් ඒ සඳහාත් ආයෝජනය කරලා තිබෙන නිසා මේ පිළිබඳව සොයා බලලා මේවා ආරම්භ කරන්න පියවර ගන්නය කියලා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන ලෙසට ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

එපමණක් නොවෙයි. මොල්ලිගොඩ පංචකර්ම මධ්‍යස්ථානයට යාබද ගොඩනැගිල්ලේ තිබෙන්නේ සංස්කෘතික මධ්‍යස්ථානයක්. මේ ගොඩනැගිල්ල පිහිටා තිබෙන්නේ පර්චස් 6.5 ක ඉඩමක. මේ ඉඩම් කොටස ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරාගෙන - ප්‍රාදේශීය සභාව සතු මේ ඉඩම වෙනුවට යාබද ඉඩමේ පර්චස් 15 ක් අපි ඒ දවස්වල ලබා ගත්තා. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව මට යම්කිසි සංවේගයක් දැනෙන්නේ. ගරු ඇමතිතුමනි, මේ පංචකර්ම මධ්‍යස්ථානය හදන කොට මේ ගමේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා අපට උදව් වුණේ නැහැ. ඔහු කළේ අපට විරුද්ධව මහජන බලවේග අවදි කරන එකයි. මට සිද්ධ වුණා මගේ පෞද්ගලික මිතුරන්ගෙන් සල්ලි එකතු කරලා පර්චස් විසි ගණනක ඉඩමක් පෞද්ගලික සල්ලිවලින් මිලදී ගන්න. මට මතක හැටියට ඒ ඉඩම පර්චස් විසි එකක්. ඒ ඉඩම මිලදී අරගෙන ඒ ඉඩමේ ක්‍රීඩා පිටියක් හරිගස්සලා, එවකට හිටපු ක්‍රීඩා අමාත්‍ය උපාලි කොඩිකාර මැතිතුමාගෙන් මිලියන දෙකක් ඉල්ලාගෙන, අඩුපාඩු සොයාගෙන ක්‍රීඩා පිටියක් සකස් කරගෙන ඒක ගමේ දරුවන්ට භාර දීලා තමයි මේ පංචකර්ම මධ්‍යස්ථානය හදන්නේ. රජයේ මුදල් නොවෙයි. මේ මළ

අපහරණ පද්ධතිය සැලසුම් කරලා තිබුණේ මේ බිම් කොටසේ කරන්න. අපි මිලියන දෙකක් වියදම් කරලා, මේ යාබද ඉඩමේ සංස්කෘතික මධ්‍යස්ථානය, දරුවන්ට ඒ අවශ්‍ය පුහුණුවීම් කටයුතු කරන්න, ඒ අවශ්‍ය ගොඩනැගිල්ලක් හැදුවා. මේකට තව ලක්ෂ 30 ක් විතර අවශ්‍යයි. මේකේ වැඩ අවසාන කරන්න තව මිලියන 03 ක් විතර අවශ්‍ය වෙනවා. ප්‍රාදේශීය ලේකම්වරයාට තමයි අපි මේ ඉඩම භාර දෙන්නේ. ප්‍රදේශයේ පරිත්‍යාගශීලියෙක් මේ ඉඩම පරිත්‍යාග කළේ. මේකේ වැඩ ඉවර කරලා මළ අපහරණ පද්ධතියේ වැඩ කටයුතු අවසන් කළා නම් විශාල වශයෙන් මේකේ ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන්. මේ පංචකර්ම මධ්‍යස්ථානය පවත්වාගෙන යන්න, ඒ දවස්වල ප්‍රමාණාත්මකව තිබුණු මළඅපහරණ පද්ධතිය ප්‍රමාණවත්. ඒක හොඳටම ප්‍රමාණවත්. මේක විවෘත නොකරන්නේ ඇයි කියන කාරණාව තිබෙනවා. ඔබතුමාට විශාල ගෞරවයක්. මේකේ වැඩ කටයුතු ඉක්මණින් ආරම්භ කරන්න ඕනෑ. මාස හතර ඇතුළත අනිවාර්යයෙන්ම මේ වැඩවලට විශේෂ කමිටුවක් පත් කරලා - ඔබතුමාට මම යෝජනා කරනවා. මේ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්නවා නම් මමත් ඔබතුමාගේ උදව්වට එන්න කැමැතියි. මේ සඳහා ගරු මන්ත්‍රීවරුන්ගෙන් සහ නිලධාරීන්ගෙන් කමිටුවක් හදලා මේකේ ප්‍රමාදය වළක්වාගෙන මේ කටයුතු විධිමත් කඩිනම් ක්‍රියාමාර්ගයකට ප්‍රවේශ වෙන්න කියන කාරණය මම ඉතා ගෞරවයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් අපේ ගරු අමාත්‍යතුමාට යෝජනා කරනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විවිධ යෝජනා රාශියක් - මම දවල් ඔබතුමාත් එක්ක කථා කරන කොට ඔබතුමා කිව්වා, වැඩිහිටියන් සඳහා වන්දනා ගමනක් යන්න සමූපකාරය හරහා බස් රථයක් කුළියට ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන් කියලා. අතිශයම වැදගත්. මොකද අපි එක එක තැන්වලින් ගියාම මිල ගණන් කැඳවලා, විශාල වැඩ කටයුතු රාශියක් කරන්න සිද්ධ වෙනවා. ඒක නිසා මම මේ සභාවේදී ඔබතුමාට යෝජනා කරනවා. බස් රථය පමණක් නොවෙයි. සමූපකාරය මගින් මේ චාරිකා සංවිධානය කරන්න පුළුවන් නම් - උදාහරණයක් ලෙස ගත්තොත් එහෙම අපි පානදුරේ සිට පොලොන්නරුවට යනවා නම් දඹුල්ල, අනුරාධපුරය, පොලොන්නරුව දින දෙක හෝ තුන, නේවාසික ස්ථාන සහ මහ පෙන්වන්නම් මේ සියලු දෙයම Package එකක් හැටියට අප කියන්න පුළුවන් නම්, මෙන්න මෙච්චර මුදලක් වැය වෙනවා. පළාත් සභා මන්ත්‍රීවරයෙකුට තමන්ගේ ප්‍රතිපාදනවලින් සමූපකාර දෙපාර්තමේන්තුවට වෙන් කරලා ඒ වැඩිහිටියන්ට මේ චාරිකාව සංවිධානය කරලා සම්පූර්ණ වගකීම සමූපකාර දෙපාර්තමේන්තුව හරහා භාර අරගෙන ඒ කටයුතු සම්පූර්ණ කරනවා නම්, ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරියෙකුත් මැදිහත් කරලා මේ කටයුත්ත ඉතාමත් ආරක්ෂා සහිතව සංවිධානය කරලා, අපට ඒ අයට ඒ ආධ්‍යාත්මික හා මානසික සුවයක් ලබන්න ඉඩ සලසා දෙන්න පුළුවන් නම්, අපට ඒක විශාල රුකුලක් හැටියට ඉතා පහසුවෙන් කරන්න පුළුවන් කාර්යභාරයක් වෙනවා. ඒ නිසා මම මේ අයවැය විවාදයේදී ඔබතුමාට යෝජනා කරනවා. එවැනි ක්‍රමවත් වැඩ පිළිවෙළක් තුළ එම කටයුතු සංවිධානය කරන්නය කියලා.

සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමිය ඉතාමත් හොඳ යෝජනාවක් ක්‍රියාවලියට නංවලා එතුමිය ඒසම්බන්ධව සභාවේ ප්‍රකාශ කළා. අර ආයුර්වේද සහ බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන එක ස්ථානයක පවත්වාගෙන යන ක්‍රමවේදය. මෙය ඉතාමත්ම ප්‍රායෝගිකව මා දැක්කා. චීනයේ ඉතාමත් හොඳින් මෙය ක්‍රියාත්මක වෙනවා. චීනයේ අපට වැඩිය හුඟක් වෙනස්. මොකද හේතුව ඔවුන් දේශීය වෛද්‍ය ක්‍රමයට තමයි ප්‍රමුඛස්ථානය දීලා තිබෙන්නේ. චීනයේ අනිවාර්යයෙන්ම දේශීය වෛද්‍ය ක්‍රමය හදාරන වෛද්‍ය ශිෂ්‍යයෙක් කලින් බටහිර වෛද්‍යවරයෙක් වෙන්න ඕනෑ. ඔහු MBBS, එහෙම නැත්නම් ඊට අවශ්‍ය කරන මූලික විභාගය සමත් වෙන්න ඕනෑ, දේශීය වෛද්‍ය ක්‍රමය හදාරන්න. දේශීය වෛද්‍ය ක්‍රමය හදාරලා දේශීය වෛද්‍යවරයෙක් හැටියට චීනයේ කටයුතු කරන වෛද්‍යවරයෙකුට වැඩි පඩියකට හිමිකරුවෙක් වෙනවා. ඒක අපට වැඩිය සුවිශේෂී ක්‍රමවේදයක්. ඒත් රෝහල්වල තමන්ට අවශ්‍ය කරන, තමන්ගේ රටේ වෛද්‍ය ක්‍රමය අනුව ප්‍රතිකාර ලබන්නද? එහෙම නැත්නම් බටහිර වෛද්‍ය ක්‍රමය අනුව ප්‍රතිකාර ලබන්නද? ඒ ක්‍රමවේදයන් දෙක තුළම ප්‍රතිකාර ලබා ගැනීමේ පහසුකම් සලසා තිබෙනවා. හැබැයි, අපට වැඩිය වෙනස්ෙ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අය ප්‍රතිකාර ලබන්න තමන්ගේ සෞඛ්‍ය රක්ෂණ සහතිකය ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් මුදල් දෙන්න ඕනෑ. එසේ නොමැති නම් ඒ අයට අවස්ථාව ලැබෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

කාලය ඉක්මණින් යනවා. ඒ නිසා අපේ කටයුතු කිරීමේදී අපි කොහොම කථා කළත් ඊට වැඩිය සහනදායි තත්ත්වයක් තමයි ලංකාවේ රෝගීන්ට තිබෙන්නේ. ඒ වාගේම මම ඔබතුමාට අවසාන වශයෙන් යෝජනා කරනවා. ගරු අමාත්‍යතුමනි, මේ අමාත්‍යාංශයේ වෛද්‍යවරුන්, ඒ වාගේම සමාජ සේවා දෙපාර්තමේන්තුව මේ හැම අමාත්‍යාංශයකම ඉතාමත්ම නිර්මාණශීලී නිලධාරීන් ඉන්නේ. ඉතාමත් නිර්මාණශීලී. දැන් සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමිය කථා කරන කොට කිව්වා, අර පවුල් සෞඛ්‍ය නිලධාරීන් හරහා ක්‍රියාත්මක කරන වැඩ සටහනක් පිළිබඳව. මම හොඳින් එතුමියගේ කථාවට සවන් දුන්නා. මම යෝජනා කරනවා. මෙවැනි නිර්මාණශීලී නිලධාරීන්ගේ ව්‍යාපෘති එක තැනකට ගොනු කරගෙන සමස්ත දිස්ත්‍රික්ක තුන පුරා මේවා බෙදා හරින්න යම්කිසි වැඩ පිළිවෙළක් සකස් වෙනවා නම්, මේ ක්‍රමවේදයන් තුළ ඔබතුමාට වඩාත් යහපත් ප්‍රතිඵල අත්පත් කරගන්න පුළුවන් වෙයි කියලා හිතෙනවා. මොකද ඉතාමත්ම ගුණාත්මක වශයෙන් පෝෂණය වුණු වැඩ සටහන් ඒ ප්‍රදේශවල තැන් තැන්වල ක්‍රියාත්මක වෙනවා. දැන් ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ලේ ක්‍රියාත්මක වන ඒ වැඩ සටහන හරිම කාලෝචිත වැඩ සටහනක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ, මට කාලය නොමැති නිසා. මම මූලාසනයට අවනත වෙමින් මගේ කථාව අවසන් කරනවා. මම ප්‍රාර්ථනා කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඉතාමත් දක්ෂ නිලධාරීන් පිරිසක් ඉන්නවා. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා. ඒ වාගේම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා සෞඛ්‍ය අධ්‍යක්ෂවරු. විශේෂයෙන්ම මගේ දිස්ත්‍රික්කය ගැන කිව්වොත් එහෙම මගේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ඉතාමත්ම කාර්යශූර, ඉතාමත්ම නිර්මාණශීලී, තමන්ගේ සේවයට ඉතාමත්ම කැප වුණු කෙනෙක්. ඒ වාගේම අනිකුත් වෛද්‍යවරුත් එහෙමයි. ඒ නිසා අපි සියලු දෙනාටම සුභ පතනවා. ගරු අමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ට මගේ ගෞරවනීය සුභ පැතුම් පිරිනමමින්, ඔබතුමාට 2019 වර්ෂය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා කියලා ප්‍රාර්ථනය කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 03.21 ]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කළුතර දිස්ත්‍රික්කයේ, මගේ ආසනයේ, මගේ ගමේ සහෘද පළාත් සභා මන්ත්‍රීතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කරන්න ලැබීම අපේ සතුටක්. ඔබතුමා බණ්ඩාරගම ආසනයේ මට පස්සේ සභාපති. මම ඔබතුමාට කලින් පත් වුණු සභාපති. ඒ නිසා දේශපාලනයේ මහජනතාවට සේවය කිරීමේදී තිබෙන වැදගත්කම පිළිබඳව ඔබතුමා මට කියා දෙන්න තරමට අප දෙදෙනාට දෙදෙනාට හොඳින් මේ කාරණායේ අවබෝධයක් තිබෙනවා. මම මේ වැය ශීර්ෂයේ කථා කරන්න හිටපු කෙනෙක් නොවෙයි. හැබැයි මම සන්තෝෂයෙන් ඉල්ලලා ගත්තා, මේ වැය ශීර්ෂයේ වචනයක් කථා කරන්න ඕනෑය කියලා. ඒකට හේතුව අපි දෙන්නා එක ගමේ, එක ආසනයේ වාගේම මේ ඇමතිතුමාත් අපි දෙන්නාගේම දිස්ත්‍රික්කයේ ඇමතිතුමා. අපේ ගරු මහ ඇමතිතුමාට අමතරව මේ බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ හතරක් තිබෙනවා. ඒ අමාත්‍යාංශ හතරෙන් අනික් ඇමතිවරු තුන්දෙනා පිළිබඳව කළුතර දිස්ත්‍රික්කයේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ උදවිය යම් තරමකට නම හරි කියන්න දන්නවා, අනික් ඇමතිවරු තුන්දෙනා පිළිබඳව. මම විශ්වාස කරන, මම දන්න දේ තමයි අඩුම තරමේ මේ අමාත්‍යාංශයේ ඇමතිතුමාගේ නමවත් සමාජගත වෙලා නැහැ. ඒ නිසා අමාත්‍යාංශය කරන දේවල් තියා, අවම වශයෙන් මේ විෂයයට ඇමති කෙනෙක් ඉන්නවාද කියලාවත් එහෙම ලොකු දැනුවත්භාවයක් සමාජයේ නැහැ. ඒකට හේතුව මේ අමාත්‍යාංශය විතරයි ජනාධිපතිතුමා අර විද්‍යාත්මක ක්‍රමයට ලබා දීලා තිබෙන අමාත්‍යාංශය. අනික් අමාත්‍යාංශ කෙසේ වෙතත් මේක ලබා දීලා තිබෙන්නේ, විද්‍යාත්මක ක්‍රමය පිළිබඳව කල්පනා කරලා. ඒ තමයි රටේ සෞඛ්‍යයට පළාතේ සෞඛ්‍යයට වඩා ඇමතිතුමාගේ සෞඛ්‍ය සංවර්ධනය සඳහා තමයි මේ අමාත්‍යාංශය එතුමාට ලබා දීලා තිබෙන්නේ. හැබැයි ඒ හැරුණු කොට මේ ගරු සභාව නියෝජනය කරන ගරු මහ ඇමතිතුමාට, ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාට, අපේ

ලලිත් වනිගරත්න ඇමතිතුමාට, ඒ වාගේම රංජිත් සෝමවංශ ගරු ඇමතිතුමාට යම් අයිතියක් තිබෙනවා කියන්න, එක්සත් ජාතික පක්ෂයට. අනික් විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට මේ වැය ශීර්ෂය සම්මත කර ගැනීම සඳහා ඡන්දයක් පාවිච්චි කරන්නය කියලා. එහෙම ඉල්ලන්න අයිතියක් තිබෙනවා. මම හිතන්නේ නැහැ, ඒ අයිතිය ඔබතුමාට තිබෙනවා කියලා. අපි දෙන නොදෙන එක කෙසේ වෙතත් ඉල්ලන්නවත් ඔබතුමාට අයිතියක් නැහැ. ඔබතුමාට එහෙම බලාපොරොත්තු වෙන්නවත් අයිතියක් නැහැ. මේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු අතරින් එකම මන්ත්‍රීවරයෙකුටවත් තමන් නියෝජනය කරන මන්ත්‍රී ධූරයට සමාජයේ ජීවත්වන කොයි දේශපාලන පක්ෂයේ මිනිහාටත් උදව් කරන්න රුපියලක ප්‍රතිපාදනයක් නොලැබුණු අමාත්‍යාංශය ඔබතුමාගේ අමාත්‍යාංශය. ඒ අමාත්‍යාංශය විතරයි. ඒ නිසයි මම කල්පනා කරලා කිව්වේ, මේ අමාත්‍යාංශය එහෙම අමාත්‍යාංශයක් කියලා. හැබැයි 2016 අයවැය කථාව වෙලාවේදී, ඔබතුමාගේ අවසාන කථාවේදී ඔබතුමා මෙන්න මෙහෙම එකක් කියනවා. 2017 අයවැයට. ඔබතුමා කියනවා,

*"මන්ත්‍රීකම දරනවා. විපක්ෂයේ ඉන්නවා. මේ සෞඛ්‍යය ක්ෂේත්‍රය ගත්තාම මම හිතන්නේ දේශපාලනය මේකට ගාව ගන්න නරකයි. දේශපාලන බේදයෙන් තොරව සෞඛ්‍යය සේවය අපි බස්නාහිර පළාතේ ස්ථාපිත කරන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑය" කියලා.*

එහෙම කිව්වාට ඔබතුමා මේ පසුගිය අවුරුදු හතර තුළ තනිකරම මේ කටයුත්ත කළේ, දේශපාලනික මුහුණුවරක් අරගෙන. මගේ කිසිම අමනාපයක් පෞද්ගලිකව නැහැ. බොහොම හිතවත්, සුහද මිත්‍රයා අපේ දිස්ත්‍රික්කයේ. හැබැයි, ඇමතිකමේ කටයුතු කරද්දී, ඔබතුමා ඒ විධියට කටයුතු කළේ. අනික් කාරණය තමයි දැන් මේ දවස්වල ඔබතුමාගේ ඇමතිකමයි, ඔබතුමාගේ ඇමති ධූරයයි සමානව පේන්නේ ජනාධිපතිතුමාගේ ජනාධිපතිකමත් එක්ක. ජනාධිපතිතුමාගේ ජනාධිපති ධූරය පිළිබඳව මේ කාලයේ සමාජයේ විවිධ කථා බහ තිබෙනවා. මම මේක මේ සභාවේ මීට දවස් දෙකකට ඉස්සෙල්ලා කිව්වා. අද ආයෙත් කියන්න ඕනෑය කියලා හිතුණා. ඒ කියන්න ඕනෑය කියලා හිතුණේ ජනාධිපතිතුමා දවස ගණනේ කරන, දවස ගණනේ කියන දේවල් අනුව බලන කොට - අද උදේ එකක් කිව්වා. ඊයේ තව එකක් කිව්වා. සම්මේලනයේ තව එකක් කිව්වා. ඔක්තෝබර් 26 වැනිදා සිට විවිධ දේවල් කිව්වා. මේ කියපු දේවල්, දැක්ක දේවල් එක්ක මම කලිනුත් කිව්වා, මේ ජනාධිපතිකම ගණිකා වෘත්තියට වඩා පහළට ගෙනාපු රටේ ජනාධිපතිවරයෙක් ඉන්නවා නම්, ඒ මේ වර්තමාන ජනාධිපතිතුමා. ගණිකා වෘත්තියටත් වඩා පල්ලෙහාට ගෙනාවා මේ ජනාධිපති ධූරය. කොහොමද ගෙනාවේ. ගණිකාව කියන කෙනා කවදාවක්වත් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ජනාධිපතිතුමාට එහෙම අපහාස වන විධියට -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ. නැහැ. ජනාධිපතිතුමා ගණිකාවක් කියලා මම කියන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙම කථා කරන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ජනාධිපතිතුමා කිව්වාට එක එක දේවල්. මම කීයටවත් කියන්නේ නැහැ, ජනාධිපතිතුමා ගණිකාවක් කියලා. මම කියන්නේ ගණිකාව හොඳයි. ගණිකාව හොඳයි කියලා කියන්නේ, ගණිකාවත් එක්ක බුදිය ගත්ත මිනිහාව -

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

තමුන්නාන්සේ මගේ පිළිතුරු කථාව කරන කොට කරුණාකර රැඳී ඉන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම ඉන්නවා. මම ඉන්නවා. අම්මෝ මම ඔබතුමාව දාලා යන්නේ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මම ඕවා ඔක්කොටම උත්තර දෙන්නම්. තමුනාන්සේ රැඳිලා ඉන්න මම කථා කරන තෙක්. කථා කරලා යන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අහන් ඉන්න. අහන් ඉන්න. අවුරුද්දක් කරපු දේවල් නේ මේ කියන්නේ. ගණිකාව හොඳයි. ගණිකාවත් එක්ක මිනිහෙක් බුදිය ගත්තාට පස්සේ ආපසු එළියට ඇවිල්ලා, ඒ ගණිකාව කියන්නේ නැහැ. ඌ මගෙත් එක්ක බුදිය ගත්තේ මෙන්න මේ විධියට. ඌගේ හැකියාවන් නොහැකියාවන් මේ විධියයි. ඌ කරන්නේ මේ විධිහයි කියලා ගණිකාව කවදාවක්වත් එළියට ඇවිල්ලා කියන්නේ නැහැ. හැබැයි ජනාධිපති අවුරුදු 3 ½ ක් තිස්සේ කරපු කියපු දේවල් අර ගණිකාවකටත් වඩා පල්ලෙහාට ඇවිල්ලා, එළියට ඇවිල්ලා මේ සමාජයේ මොනවාද කියන්නේ. ඒ කියන්නේ මොනවද? ඒ නිසා ගණිකාව හොඳයි, මේ රටේ ජනාධිපතිට වඩා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

කවුද පත් කළේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද ගණිකාවත් එක්ක බුදිය ගත්තේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඇයි ගණිකාවත් එක්ක බුදිය ගත්තාද? වාඩි වෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බාධා කරන්න එපා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

කවුද පත් කළේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මගේ හිත මිත්‍ර ගරු මන්ත්‍රිතුමනි, ගණිකාවකට වඩා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

කවුද පත් කර ගත්තේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අපි පත් කර ගත්තේ. ගණිකාවකට වඩා නරක ජනාධිපති කෙනෙක් ඉන්නේ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මෙයා ගණිකාව ගැන ඔච්චර දන්නේ කොහොමද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අපි පිළිගන්නවා. වක්කඩේ හකුරු හැංගුවා වාගේ වැඩක් අපට වුණේ. පස්සේ ගන්නය කියලා ආරක්ෂාවට හංගපු හකුරු ටිකට වුණු වැඩේ අපට වුණේ. වක්කඩේ හකුරු හැංගුවා වාගේ වැඩක් වුණේ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

තව වුණේ නැහැ. තව ඉන්නවා. තව හම්බ වෙයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු මහ ඇමතිතුමනි,

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කරන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

උපුල් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාවට කවුරුත් බාධා කළේ නැහැ. ඉන්න කෝ නිකන් පස්ස උඩ වාඩි වෙන්නේ නැතිව. (බාධා කිරීමක්) -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වෙලාව සීමිතයි. බාධා කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහ බැංකු හොරාව මාස තුනක් යන්න කලින් ඇතුළට දානවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහ ඇමතිතුමා -

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මෙයා ගණිකාව ගැන හොඳට දන්නවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

පොඩ්ඩක් ඉන්න කෝ. දැන් බැහැ නේ? දැන් වයසයි නේ? පොඩ්ඩක් ඉන්න කෝ. මොන ගණිකාවෝද දැන්. මොන ගණිකාවෝ හොයනවාද දැන්. ඔය වයසට මොන ගණිකාවෝද? බණක් භාවනාවක් කරගෙන ඉන්න. දැන් කොහේ ගණිකාවෝද? ඒ කාලයේ කරපුවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ වුණාට කියන කොට ආසයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සම්පූර්ණ වැරැදි ප්‍රකාශයක්. අපි දන්නවා උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමා කවදාවක්වත් ඒ වාගේ වැරැදි වැඩක් කරන්නේ නැහැ. එවැනි මනුස්සයෙකුට අපහාස කිරීම වැරැදියි. ඒක ඉල්ලා අස් කරගන්න ඕනෑ. ඒක මම හිතන්නේ අපි දන්න එකක්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම ඒවා කිව්වේ නැහැ. දැන් බැහැයි කියලා මම කියන්නේ. කලින් කරපු එක ගැන මම කිව්වේ නැහැ. ඔබතුමා කිව්වාට.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එතුමා ඒ වාගේ වැඩ කරන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමා එතුමාට අපහාස කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙයයි කුප්පිය අල්ලලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනයට කථා කරන්න. අයවැය ගැන කථා කරන්න. එතකොට බාධාවකින් තොරව ඔබතුමාට කථාව කරගෙන යන්න පුළුවන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඔයාගේ නායකයා ෆොන්සේකාද? මෛත්‍රීද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිතමිත්‍ර ගරු මහ ඇමතිතුමා, එතුමාගේ වැය ශීර්ෂයට ඡන්දය ගන්න කලින් එතුමා මහ වණ්ඩි පාට් කථාවක් කිව්වා. අපි අවුරුදු තුනක් තිස්සේ එතුමාත් එක්ක හිට ගත්ත එක එතුමා එක මොහොතකින් අමතක කළා. එතුමාට අමතක වුණා විසි වැනි සංශෝධනය -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේගොල්ලොත් ඒ වැඩේම කළා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විසි වැනි සංශෝධනයට මේ පළාත් සභාවේ එකගත්වය අහන්න ආපු වෙලාවේ - 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණු විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ සභාවේ එකඟත්වය ගන්න එවපු වෙලාවේ -

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

සමනළයාව අගමැති කරන කොට හොඳයි. දැන් වැරැදියි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විසි වැනි ව්‍යවස්ථා සංශෝධනය මේ පළාත් සභාවට ආපු වෙලාවේ ගරු මහ ඇමතිතුමාව ඔය පොහොට්ටුවේ ඉන්න ඔක්කොම තනි කළා. මහ ඇමතිතුමාව ග්‍රහණයට ගත්තා. විසිවැනි ව්‍යවස්ථා සංශෝධන ආපු වෙලාවේ මහ ඇමතිතුමා සාකච්ඡා කළේ ඔය කට්ටියත් එක්ක නොවෙයි. අපිත් එක්ක සාකච්ඡා කරලා තමයි මහ ඇමතිතුමාගේ සරමයි අමුඩෙයි කළිසමයි බේරගත්තේ. විසි වැනි සංශෝධනය ගැන මේ අපිත් එක්ක සාකච්ඡා කරලා තමයි ගරු මහ ඇමතිතුමාගේ ගැලවෙන්න ගිය, නැති වෙන්න ගිය සරම බේර ගත්තේ. එදා මහ ඇමතිතුමාට සහයෝගය දුන්නේ අපි. ඒ දීලයි මහ ඇමතිකම බේරලා දුන්නේ. හැබැයි පහු වෙනකොට ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාට එක රැයක් නිදාගෙන - මම කියන්නේ ගරු මහ ඇමතිතුමා ගණිකාවක් කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එච්චරයිද තියෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මෙයා ගණිකාවට හපන්නේ. ඔක්කොම කියනවා. ඔබතුමාත් ගණිකාවට හපන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හැබැයි ගරු මහ ඇමතිතුමා අවුරුදු තුනක් අපිත් එක්ක බුදිය ගත්ත එක අමතක කරලා, සරම පිහිදාගෙන එදා ඇවිල්ලා කිව්වා, ඔවුන්ව අපි අඳුරන්නෙත් නැහැයි කියලා. ඔවුන්ව අපි දන්නෙත් නැහැයි කියලා. අන්න මහ ඇමතිතුමා ගණිකාවට වැඩිය නරක් වුණු විධිය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කට්ටියම මෛත්‍රීපාලගේ ගෝලයෝ නේ. ගණන් ගන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම කවදාවක්වත් කොල්ලොත් එක්ක නිදාගෙන නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ වාගේම අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා පසුගිය අයවැයේදී මෙන්න මෙහෙම කථාවක් කියනවා. මොකක්ද කියන්නේ? *"නමුත් මේ කළුතරට දාගෙන තිබෙන්නේ බස්නාහිර පළාත් සභාවේ මුදල් නොවෙයි. මිලියන 450 ක් මධ්‍යම රජයේ රාජිත සේනාරත්න ගරු ඇමතිතුමා, එතුමා කළුතර ජීවත්වන නිසා, කළුතර ආසනයේ දේශපාලනය කරන නිසා එතුමා රුපියල් මිලියන 450 ක් වෙන් කරලා ඒ අවශ්‍ය වැඩ කටයුතු කරගෙන යන මොහොතක් මේක. තවත් මුදල් ඉතිරිවෙලා තිබෙනවා."*

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒවා කරන්න ඕනෑ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විශේෂයෙන් කියනවා

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැව් හොරා. නැව් හොරා

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රාජිත සේනාරත්න කියන්නේ යහපාලනයෙන් ඇති වුණු, කළුතරින් ආපු එක්සත් ජාතික පක්ෂයේ සෞඛ්‍ය ඇමතිතුමාට තමයි මෙතුමා ස්තුති කරලා තිබෙන්නේ. ඒ නිසා මෙතුමා කරපු ඉලව්වක් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා වෙලාව අවසානයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

වෙලාව ඉවරද? ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරනවා. අද තමුන්නාන්සේලාගේ මහ ජනාධිපතිගේ ඉඳලා දෙවැනියා වුණු අගමැතිගේ ඉඳලා මහ ඇමති දක්වා අද ඉඳලා තිබෙන්නේ මොකක්ද? ගෙදර ගියොත් අඹු නසී. මහ සිටියොත් තෝ නසී කියන තැනට. ඒ නිසා තමුන්නාන්සේලා පුළුවන් තරම් තමුන්නාන්සේලාගේ ඔය කෙළෙහි ගුණ නොදන්න -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පිරිමි ගණිකාවක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා -ඔබතුමාට විනාඩි 08 ක කාලයක් තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

[අ.භා. 03.33 ]

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යටතේ සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ප්‍රථමයෙන්ම, පසුගිය ඩෙංගු උවදුරෙන් පළාතේ ජීවිත බේරාගන්න කටයුතු කිරීම පිළිබඳවත්, ඒ වාගේම ඒ වෙනුවෙන් සුළු සේවකයින්ගේ අඩුපාඩුව සපුරා ගනිමින් ඒ අවස්ථාව ජය ගැනීමට සෞඛ්‍ය ක්ෂේත්‍රයත් සමඟ පළාත් සභාවේ ගෞරවයත් ආරක්ෂා කර ගැනීම පිළිබඳව අපි ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වන අතර, ඒ සුළු සේවකයින් ස්ථිර කිරීම පිළිබඳවත් අපි ස්තුති කරනවා. තවත් 31 දෙනෙක් ඒ මෙහෙවරට ගිහිල්ලා, මිනිසුන්ගෙන් බැණුම් අහලා, වහළවල් උඩ නැඟලා, පීලි කඩන් වැටිලා එහෙම වැඩ කරපු 31 දෙනෙක් -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

යනවාද? ඉන්න. ඡන්දයට එන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මට අවස්ථාව දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා නැඟිට්ටා නම් යන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් 31 දෙනෙක් කළු, කැලණි, අත්තනගලු ඔය දිගේ ගහගෙන යන්න ඉඩ නොදී ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කරන්නට ඔවුන් පිළිබඳව තිබෙන වයස් සීමාවන් හෝ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විශේෂ අවස්ථාවක් කොට සලකමින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, ගරු ආණ්ඩුකාරතුමාත් මැදිහත් කරගෙන කටයුතු කරන්නය කියන ඉල්ලීම අපි ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු ඇමතිතුමා අවිස්සාවෙල්ල මූලික රෝහලට මිලියන 7 ½ ක එක්ස්රේ යන්ත්‍රයක් ලබා දීලා, පෞද්ගලිකව මිනිසුන්ගේ විය පැහැදම් අඩු කරලා, රෝගීන්ගේ ආර්ථික රෝගී බව අවසන් කිරීමට කටයුතු කිරීම පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා.

[ගරු සුමිත් විජයමුණි ද සොයිසා ]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සෞඛ්‍ය සේවය පළාත් සභාවේ මුදල් වියදම් කළ යුතු අවිස්සවෙල්ල මූලික රෝහලට දැවැන්ත තදබදයක් තිබෙන, ඇඳන් යට ලෙඩ්ඩු ඉන්න අවිස්සවෙල්ල රෝහලට පෞද්ගලික ධන පරිත්‍යාගයක් කරන්න නිව් අවිස්සාවේල්ල ස්ටෝර්ස් අධිපතිතුමා එච්.ආර්. ද සිල්වා මැතිතුමා මිලියන 10 ක ඇඳන් විස්සක වාට්ටු සංකීර්ණයක් දෙන්න එකඟත්වය පළ කරලා දැන් අවුරුදු 1 ½ කටත් වඩා වැඩියි. ගරු ඇමතිතුමාත් එක්කකරගෙනත් මම රෝහලට ගියා. අක්කර 28 ක් විතර ඉඩ තියෙන අවිස්සවෙල්ල මූලික රෝහලේ ඉඩමේ, ඒ සඳහා තවමත් ඉඩක් වෙන් වෙලා නැහැ. මේ එච්.ආර්. ද සිල්වා මැතිතුමා මිලියන 10 ක් නොවෙයි, මිලියන 15 ක් වුණත් වෙන් කරන්න සූදානම්. එතුමා මගේ මවගේ සහෝදරයා. ඒ එක්කම කඩිනමින් මේ ඉඩකඩ වෙන් කරලා, මේ අවුරුද්ද අවසන් වීමට පෙර ඒ වාට්ටු සංකීර්ණය ඉදි කරන්න අවස්ථාව සලසා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අවිස්සවෙල්ල මැතිවරණ කොට්ඨාශයේ කොළඹ දිස්ත්‍රික්කයේ කෙළවරේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන්, ආයුර්වේද වෛද්‍යවරුන් හතර දෙනෙක් ඉන්නවා. සංවර්ධන සහාකාරවයෙක්, උපාධිධරයෙක් ඉන්නවා. මේ අයට ඉන්න තැනක් නැහැ. මේ ආයුර්වේද වෛද්‍ය සේවාව ශක්තිමත්ව ජනතාව තුළට, ගම් තුළට ගෙනි යන්න ඉඩකඩක් නැහැ. ඒ සඳහා මම ඉල්ලා සිටිනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, ගරු අධ්‍යාපන අමාත්‍යතුමාත්, ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් එකතුවෙලා, ඉතාමත් ඉක්මණට මේ අයට ස්ථාවර ගොඩනැගිල්ලක් - අපේ පාසල් පද්ධතියේ ඉඩ තිබෙන තැන් තිබෙනවා. අපි සීතාවක, හංවැල්ල මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හැදුවෙත් අලුත් අම්බලම ආදර්ශ කණිෂ්ට විද්‍යාලයේ ඉඩම් කොටසක් අරගෙන. කණම්පැල්ල විද්‍යාලයේ ඉඩම් තිබෙනවා. ඔසු උයනකුත් කරන්න ඉඩම් තිබෙනවා. ඒ ස්ථානයේ මේ ප්‍රජා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය ඉතාමත්ම කඩිනමින් හදන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දෙන්නය කියන ඉල්ලීම කරනවා.

ඒ වාගේම අපට පුළුවන්කම ලැබුණා සාලාව පිපිරීමෙන් අළු දූවිලි වෙලා ගිය සාලාව රෝහල පැය 72 ක් තුළ හදන්න. ඒ පැය 72 ක් තුළ සාලාව රෝහල හමුදාවේ සහායත් අරගෙන, නැවත ප්‍රතිෂ්ඨාපනය කරලා අපි දන්නවා. ඇත්තටම අධ්‍යාපනයට වෙලා තිබෙන දේම තමයි මේ සෞඛ්‍යයට වෙලා තිබෙන්නේ. නගරයේ පාසල්වල ළමයින් ඇත. ගොඩනැගිලි නැත. සෞඛ්‍යයට වෙලා තිබෙන්නේ නගරයේ රෝහල්වල ලෙඩුන් ඇත. ඇඳන් නැත. ගමේ රෝහල්වල ඇඳන් ඇත. ලෙඩුන් නැත. මෙන්න මේ විෂමතාවය දුරු කරන්න අගනුවර තිබෙන සෞඛ්‍ය සේවාව හෝමාගමට, අවිස්සාවේල්ලට ගෙනියන්න ඒ වාගේම අවිස්සාවේල්ලේ, හෝමාගම තිබෙන තදබදය අවම කරන්න සාලාව රෝහල ශක්තිමත් කරන්න විශේෂඥ වෛද්‍ය සේවාවන් සතියකට දෙකකට වරක් ඒ රෝහල්වලට ගිහිල්ලා රෝගීන් නගරයට යන එක වළක්වන්න, හෝමාගම තදබදය අවම කරන්න පාදුක්ක රෝහලට විශේෂඥ වෛද්‍ය සේවාව ලබා දෙන උපාය උපක්‍රම සහ සම්පත්වලට පෙළ ගැසුණුනොත්, අපට මේ සෞඛ්‍ය සේවාවේ විෂමතාවය සහ මහජනතාව විඳින පීඩා අවසන් කරන්න පුළුවන් වෙනවා කියන එක අපි මතක් කරනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඔබතුමාගේ වැය ශීර්ෂය යටතේ නිරෝගී දිවි පෙවෙතක් වෙනුවෙන් ජල මුද්‍රිත වැසිකිළි ආධාර ලබා දීමේදී අපි දකිනවා නාගරිකව, අනවසර හිමියන්ට තමයි, මේ ජල මුද්‍රිත වැසිකිළි නැත්තේ. හැබැයි ඔවුන්ට පදිංචිය තිබෙනවා. මේ පදිංචිය සැලකිල්ලට අරගෙන අනවසර පදිංචිකරුවන්ට ජල මුද්‍රිත වැසිකිළි ආධාරය ලබා දිය යුතුව තිබෙනවා. ඒ සඳහා කටයුතු කළ යුතුව තිබෙනවා. මේ පළාත් සභාව මීට ඉහත එවැනි ක්‍රියා මාර්ගවල ක්‍රියාත්මක වුණා කියන එකත් මතක් කරමින් ඔබතුමාගේ විශේෂ අවධානයට එය යොමු කරනවා.

මූලාසානාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රය තරම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය, මිලදී ගැනීමේ ක්‍රියාවලිය උල්ලංඝණය කරන තවත් කිසිම තැනක් නැහැයි කියලා මම මතක් කරනවා. මේ සෞඛ්‍ය සේවාවට අත්‍යවශ්‍ය රෝහල් පද්ධතියට අත්‍යවශ්‍ය -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මට විනාඩියක් දෙන්න. මේ විශේෂ කරුණක් ඉදිරිපත් කරන්න ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඇමැතිතුමාගේ කාලය තමයි අඩු වෙන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නැහැ, එහෙම නම් මම කෙටියෙන් ඉදිරිපත් කරන්නම්. ගම්පහට මිලියන 24 ක් - විදුලි ජනක යන්ත්‍ර නැතුව රෝහල් දුවන්න බැහැ. හෘදය වස්තුව සහ රුධිරය වාගේ. මේ විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීමේදී සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විකෘති කරලා, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවට හැකි මිලියන 5 සීමාව ඉක්මවලා මිලියන 24 කට කැඳවලා, ඊට පස්සේ ලංසු කැඳෙව්වාට පසු ලංසු කැඳවපු ටෙන්ඩර් ටිකට අදාළ අත්සන් අරගෙන, ටෙන්ඩර් ඔවුන් ඉදිරියේ කඩන්නේ නැතුව ඇතුළට යන මට්ටමකට තිබෙන මේ සෞඛ්‍යයේ මේ මිලදී ගැනීමේ ක්‍රියාවලිය, මාෆියාව නවත්වන්න. ඒ වාගේම මේ මහජන මුදල් කෝටි ප්‍රකෝටි ගණනක් වියදම් කරලා, මහජනතාවගේ ජීවිතත් සමග සැත්කම ක්‍රියාත්මක වෙද්දී විදුලිය ගියොත් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

කනත්තෙන් නවතින යුගය අවසන් කරන්න මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින් ගිණුම් කාරක සභාවේ අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වහන්න නොවෙයි. අශ්වයා යන්න ඉස්සෙල්ලා ඉස්තාලය වහන සම්ප්‍රදායකට ගිණුම් කාරක සභාවත් යන්න කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා වෙලාව අවසන්. නැත්නම් ඇමැතිතුමාට

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

අපි ගරු මන්ත්‍රීතුමන්ලාගෙනුත් ඉල්ලා සිටිමින්, ගරු ඇමැතිතුමාට කාර්ය මණ්ඩලයට, ඒ වාගේම ලේකම්තුමාට අපගේ ගෞරවය ස්තුතියි පුද කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අදාළ ලිපි තිබෙනවා නම් සභාගත කරන ලෙස මම මම ඉල්ලා සිටිනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

සභාගත කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේ ගරු සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Lalith Ellawala M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 14 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 03.44 ]

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ගරු සභාපතිතුමනි, අප අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක් අදහස් ප්‍රකාශ කළා. හොඳ හෝ නරක, විවේචන සියලුම දේවල් මම හොඳින් පිළිගත්තා. මේවා ප්‍රකාශ කිරීමෙන් තමයි අපේ ගමන් මඟ තවත් නිවැරැදි කර ගන්න පුළුවන් වෙන්නේ කියලා මම හිතනවා. මම හිතන්නේ මෙම සෞඛ්‍ය අමාත්‍ය ධූරය

[ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා ]

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මට භාර දුන්නේ, සුදු නෙළුම් මල් වට්ටියක් වාගේ. මේ නෙළුම් මල් වට්ටියට අපේ මන්ත්‍රීතුමා, ඇමැතිතුමන්ලා, මහ ඇමැතිතුමා ඇතුළු සියලු දෙනාම අද අත ගහලා තිබෙනවා. ඒ වාගේම නිලධාරීන් මේවාට අත ගහලා තිබෙනවා. මේක හොඳ පිංකමක් කරන්න පුළුවන් අමාත්‍යාංශයක්. සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තාම, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ගත්තාම, සමාජ සේවා අමාත්‍යාංශය ගත්තාම ඒ දෙපාර්තමේන්තු ගත්තාම, පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව ගත්තාම මේ සියලුම තැන්වලින් කෙරෙන්නේ සමාජ සේවාවක්. පිංකමක්. ඒ පිංකමේ ආදීනව අපට ඉහත ආත්මයකදී ලැබෙයි. ඒක නිසා මුලින්ම මම උත්තර දෙන්න ඕනෑ මේ ටෙන්ඩර් ප්‍රශ්නයක් ගැන අපේ සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමා කථා කළා. මට ඒක දැනගන්න ලැබුණා. මම ඊයේම නියෝගයක් දුන්නා වහාම ඒ ටෙන්ඩර් ක්‍රමය අහෝසි කරන්න කියලා. ඒ ටෙන්ඩර් ක්‍රමය අපි අහෝසි කරලා යළිත් වතාවක් විධිමත් ටෙන්ඩර් ක්‍රමයකට යන්න කියලා. ඊයේ මට දැනගන්න ලැබුණු මොහොතේම ඒක අහෝසි කළා. ඒක නිසා මම තව කථාවක් කියන්න ඕනෑ. සරත් ෆොන්සේකා මහත්තයා මේ රටේ දේශපාලනයට ආවා. ඇවිල්ලා ඡන්දය ඉල්ලුවා. ගෝල බාලයෝත් දිස්ත්‍රික්ක මට්ටමින් තෝරා ගත්තා. ඒ ඡන්දයෙන් තමයි මේ පළාත් සභාවට ආවේ. ඇවිල්ලා පක්ෂය මාරු කරලා දැන් වෙනත් පක්ෂයකට ගිහිල්ලා ඉන්නවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නායකයාත් එක්කමයි ගියේ. තනි කරලා ගියේ නැහැ. නායකයත් එක්ක අපි ඔක්කෝම ගියේ.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

තමන් ඒ මඩ වලේ ඉන්න ගමන්, අද තමන් ඒ මඩ වලේ බැහැලා මඩ නාන ගමන් ජනාධිපතිවරයාට මඩ ගහනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපරාදේ ඔයිට වැඩිය කියන්න දේවල් තිබුණා.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මඩ නොවෙයි. අසූචි නාන්නේ.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

මම එතුමාට කියන්න කැමැතියි. ජනාධිපතිතුමා පෙළවහක් කර ගත්තා, දැන් අවුරුදු 3 1/2 කට ඉස්සෙල්ලා. යූ.එන්.පී. එකත් එක්ක. රනිල් වික්‍රමසිංහ මහත්තයාව තමයි කසාද බැන්දේ. කසාද බැඳලා දැන් ළමයි නැහැ. අවුරුදු 3 ½ ක් යන කල් -

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

වඳ.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමන්ලා ගිහිල්ලා ඒවාට උදව් උපකාර කළා, මේ දරුවා ප්‍රසූත කර ගන්න. දැන් ප්‍රසූත කර ගන්න බැහැ. ප්‍රසූත කර ගන්න බැරි වනකොට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්තයා එතැනින් අයින් වුණා. ප්‍රසූත කර ගන්න පුළුවන් නායකයෙක්, අගමැතිවරයෙක් එතුමා අද බිහි කරගෙන තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

හොර ගෑණියෙක් ගන්න ගියා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

King කෙනෙක්ව ගත්තා නේද?

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ඒ වාගේම කියන්න කැමැතියි. අපේ නිශාන්ත වර්ණසිංහ හිටපු ඇමැතිතුමා ප්‍රකාශයක් කළා සම්ප්‍රදායික සෞඛ්‍ය ගැන. රාජිත සේනාරත්න මහත්තයා විශාල සේවාවක් ජනාධිපතිතුමාත් එක්ක එකතු වෙලා යහපාලන රජය හදලා, සෞඛ්‍ය සම්පන්න පිරිසක් රටේ හදන්න වැඩ කටයුතු කළා කියලා. අපි ඒක පිළිගන්නවා. ටික කාලයක් කරගෙන

ගියා. හැම දෙයක්ම කළා. ජනාධිපතිතුමා තමයි මේ රටේ දුම්වැටි භාවිතය අඩු කරන්න අවශ්‍ය කරන නීතිමයට තත්ත්වයට ගෙන ආවේ. ඒක රාජිත සේනාරත්න මහත්තයාට දීලා ඒ වැඩ ටික සාර්ථකව කරගෙන ගියා. හිටපු සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට අනෙකුත් සෞඛ්‍ය පහසුකම් දෙන්න ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව ඒ වැඩ කටයුතු හරියට කරගෙන ගියා. ඒ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් මේ රටට ලැබිය යුතු ඉහළම ස්ථානයත් මේ රජයට ලැබුණා. ඒ වාගේම ඒක ලැබෙන කොටම, ලෝක බැංකුව, මංකොල්ල කාලා ඒ සම්පූර්ණ ගෞරවය විනාශ කළේ එක්සත් ජාතික පක්ෂයේ නායකයයි කියන එක මේ අවස්ථාවේ තමුන්නාන්සේලාට කියන්න කැමැතියි. ඒ නිසා අපි කනගාටු වෙනවා නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

වැරැදි ප්‍රකාශයක් කළේ?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු ඇමැතිතුමා ඒක මහ බැංකුව

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

කෙලින් කථා කරන මන්ත්‍රීවරයෙක් හැටියට -

ගරු එම්.එස්.එම්. ෆයිරෝස්
Hon. M.S.M. Fairoz

ගරු ඇමැතිතුමා ඔබතුමා දන්නේ නැත්නම් වාඩි වෙන්න. ලෝක බැංකුව විනාශ කළේ, අපි නොවෙයි. ලෝක බැංකුව විනාශ කළේ ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම කිව්වේ විද්‍යාත්මක ක්‍රමයට දීපු එකම අමාත්‍යාංශය මේක විතරයි කියලා.

[සභාවේ ඝෝෂා]

ලෝක බැංකුවයි, මහ බැංකුවයි දන්නේ නැතුව කොහොමද දොස්තරලා පාලනය කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ වචනයක් දෙකක් එහාට මෙහාට වුණාම දහලන්න එපා. පොඩ්ඩක් දහලන්නේ නැතුව ඉන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පොලොස් කොට්ටෝරුවා වාඩි වෙන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මගෙන් අහගන්න එපා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු ඇමැතිතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ඒ කාලය අතරතුර තමයි දැන් අපි මේ සෞඛ්‍ය ක්ෂේත්‍රය කරගෙන යන්නේ. මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල අඩුපාඩු ප්‍රමාණයක් සම්පූර්ණ කරමින්, හොඳ වැඩ විශාල ප්‍රමාණයක් කෙරුවා. පසුගිය කාලයේ අපට ලැබුණු අරමුදල්වලින් විශාල ප්‍රමාණයෙන් වැඩ කරන්න මගේ ලේකම්තුමා, අනෙකුත් අධ්‍යක්ෂවරු, නිලධාරීන් එක්ක සැහෙන්න උත්සාහයක් ගත්තා. ඒක නිසා මට අවිස්සාවේල්ල රෝහල පිළිබඳව චෝදනා කිහිපයක් ආවා. ඇත්තටම අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මට නොවෙයි චෝදනා කළේ. ඒ වාගේම අපේ සුමිත් ද සොයිසා මගේ සහෝදර ගරු මන්ත්‍රීතුමා චෝදනා කළේ ඒකේ අඩුපාඩු හදන්න මුදල් වෙන් කරලා ඒ මුදල්වලින් ප්‍රයෝජනයක් ගත්තේ නැහැයි කියලයි. ඒ මුදල්වලින් ප්‍රයෝජනයක් ගන්න නොහැකි වුණු හේතුව මම සොයා බැලුවා. මීට පෙර එළියට ගිහිල්ලා. මට දැනගන්න ලැබුණේ, ඉංජිනේරු මහත්තයාගේ තිබෙන අඩුපාඩුවක් නිසා ඒ වැඩ ටික කර ගන්න බැරි වුණු බවයි. ඒ මුදල් අපි අපතේ නොයවා වෙනත් කටයුතු සඳහා යෙදවූවා කියලා

[ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා ]

මට දැනගන්න ලැබුණා. මම එතුමන්ලා හම්බ වෙලා ඊළඟ උපදේශක කාරක සභාවට කැඳවලා විමසලා ඒ වැඩ ටික කරනවා. ලබන අවුරුද්දේ ඒ වැඩ සියල්ලම කරන්න මුදල් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපේ හෙක්ටර් බෙත්මගේ ගරු සභානායකතුමා අපට යෝජනා කළා ලේ පිරිසිදු කිරීමේ යන්ත්‍ර, ඩයලසීස් කිරීමේ යන්ත්‍ර කිහිපයක් තලංගම ප්‍රදේශයේ සවි කරන්න කියලා. නවගමුව ඒ වාගේ රෝහල්වල. දැන් අපි කරගෙන යනවා. හොරණ රෝහලේ දැනටමත් ඒක ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම වතුපිටිවල රෝහලේ ඒක ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මීගමුව රෝහල. අවිස්සාවේල්ල රෝහල. මේ රෝහල් හැම එකකටම මුදල් යොදවලා අවශ්‍ය උපකරණ සවි කරගෙන යනවා. ඒක ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා ඔබතුමාගේ ඉල්ලීමත් ඊළඟ වර්ෂයේදී ඉෂ්ට කරන්න කටයුතු කරනවා කියලා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ඒ වාගේම තමුන්නාන්සේ ඉල්ලා සිටියා, ආයුර්වේද සම්බාහන සේවාව කරන අපේ සේවකයින් කරන සේවයට දීමනාවක් දෙන්න කියලා. අපි ලේකම්තුමාත් එක්ක මම කථා කළා. ඒක අපට බොහොම ඉක්මණින් කර ගන්න පුළුවන්. ඒ අවශ්‍ය කරන අනුමැතිය, මහ ඇමැතිතුමාගේත් උපදෙස් අරගෙන අපේ කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ගෙනැල්ලා ඒකත් අපි ජනවාරි ඉඳලා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. තමුන්නාන්සේලාගේ ඒ ඉල්ලීම.

ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම බටහිර වෛද්‍ය ක්‍රමය ගැන අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කථා කළා. ඒක හොඳ යෝජනාවක්. මම ඒ වගේ වැඩ පිළිවෙළක් දැක්කා. බැංකොක් ගිය වෙලාවේ. අපේ නිලධාරීන් සමග අපි ගියා බැංකොක් නගරයේ සෞඛ්‍ය වැඩ සටහන් කිහිපයකට සහභාගී වෙන්න. ඒ වෙලාවේදී මම දැක්කා ඒ රෝහල්වල බටහිර වෛද්‍ය ක්‍රමයයි, දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමයයි දෙකම එකට තිබෙනවා. ඒක නිසා මම යෝජනා කරලා, ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. අද කළුතර දිස්ත්‍රික්කය ගත්තාම කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා දන්නවා. රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා දන්නවා. අපි මිලියන 20 ක් වියදම් කරලා බදුරලිය රෝහලේ ආයුර්වේද මධ්‍යස්ථානයක් ආරම්භ කළා. පොඩි කාමර දෙකක් අරගෙන. ඒකේ බොහොම සාර්ථක භාවයක් තිබෙනවා. අද බටහිර වෛද්‍ය ක්‍රමයට වැඩිය ජනතාව එන්නේ මේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙන් ප්‍රතිකාර ගන්න. මම සොයා බැලුවා. ඒ වාගේම අපි දැන් වතුපිටිවල රෝහලේ ඒක ආරම්භ කරන්න කටයුතු කරලා තිබෙනවා. ඉත්තෑපාන රෝහලේ ආරම්භ කරලා තිබෙනවා. අපි හැම රෝහලකම ආයුර්වේද කොටසත්, බටහිර කොටසත් එකතු කරලා ලබන අවුරුද්ද වනකොට මේවායේ වැඩ නිම කර ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම තමුන්නාන්සේලා දන්නවා සමාජ සේවා, සෞඛ්‍ය ගැන මම දිගට කථා කරන්න යන්නේ නැහැ. සෞඛ්‍ය සේවයේ විශාල වැඩ කොටසක් කළා. තමුන්නාන්සේලා දන්නවා පසුගිය කාලයේ ඩෙංගු උවදුර පිළිබඳව තිබුණු තත්ත්වය. ඒ සඳහා අපි සේවකයෝ 225 ක් තාවකාලිකව බඳවා ගත්තා. අපි හිතුවක්කාර වැඩක් කළේ. අපි දන්නවා සේවකයින්ගේ අවශ්‍යතාවය. වහළය උඩ නඟින්න ඕනෑ. ඒ වාගේම අපේ සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගෙවල් දොරවල් ගැන හොයලා බලන්න ඕනෑ. ඉස්පිරිතාලේ කටයුතු සොයන්න ඕනෑ. පිරිසිදුව තියා ගන්න ඕනෑ. ඒ සඳහා සේවකයෝ පිරිසක් අපි හදිසියේ බඳවා ගත්තා. දැන් ඒ බඳවා ගැනීමෙන් අපි 189 ක් ස්ථිර කරලා තිබෙනවා. ඒකේ පොඩි ගැටළුවක් ආවා. අට පාස් 31 දෙනෙක් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි. ගරු ප්‍රධාන ඇමැතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් තීන්දුවක් අරගෙන අපි ආණ්ඩුකාරතුමාට යොමු කරලා තිබෙනවා. ආණ්ඩුකාරතුමා ඒකඟ වෙලා තිබෙනවා. ලබන සතිය වනකොට ඒ ප්‍රශ්නයත් අපි විසඳනවා. ඒ දරුවන්ගේ රැකියා ටික -

**ගරු කාමල් කුරුප්පු**
Hon. Kamal Kuruppu

ගරු ඇමැතිතුමා වයස වැඩි වුණු කට්ටියට මොකද කරන්නේ?

**ගරු සුමිත් ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

වයස වැඩි වුණු කට්ටියටත් ඒ සහනය ලැබෙනවා. ඒ වාගේම ඩෙංගු උවදුර. තමුන්නාන්සේලා දන්නවා අපි පසුගිය කාලයේ -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඇමැතිතුමා ඔබතුමාට තව විනාඩි 03 යි තිබෙන්නේ. අනවශ්‍ය කථාවලට යන්න එපා.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ඩෙංගු රෝගීන් 71,000 ක් වාර්තා වුණා. තමුන්නාන්සේලා දන්නවා මීගමුව රෝහල පිරෙන්න ලෙඩ්ඩු හිටියා. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මීගමුව රෝහලට ගිහිල්ලා නියෝගයක් දුන්නා සති දෙකෙන් ගොඩනැගිල්ලක් හදන්න. සති දෙකෙන් ඒ ගොඩනැගිල්ල හදලා සේවකයින්ට ඒ පහසුකම් ලබා දුන්නා කියන එක අපි කියන්න ඕනෑ. ඒ සඳහා අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාගේ, ගාණේ මෙට්ට 100 ක් අරගෙන දුන්නා. මීගමුව රෝහලට.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සති දෙකෙන් හදන්න වුණේ, අර බිල්ඩින් එක කඩා වැටෙන්න ගියා. හොරාට හදලා.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ඒ වාගේම රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය අපට උදව් කළා. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ඇවිල්ලා දේශපාලන භේදයෙන් තොරව උදව් කළා. අපි දේශපාලනය ගාව ගත්තේ නැහැ. මම ඒක තමයි කිව්වේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පුටු ටික අරගෙන දුන්නේ මම.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

සෞඛ්‍ය ක්ෂේත්‍රයට දේශපාලනය ගාව ගන්න නරකයි. ඒ නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනත් වෙනත් වැඩ කරන තැනක් නොවෙයි. ජනතාව සුවපත් කරන වැඩ සටහන් කරන්නේ. මේකට දේශපාලනයක් නැහැ ගරු මන්ත්‍රීතුමනි. ඩෙංගු රෝගීන් දැනට 17,000 ට බැහැලා තිබෙනවා. ඒක නිසා අපි ඉදිරියේදීත් අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කටයුතු කරනවා. ඇත්ත වශයෙන්ම මම කියන්න කැමැතියි. බැංකොක් නගරයේදී දැකපු දෙයක් තමයි, මේ අත දාලා බලන ප්‍රෙෂර් මීටර් එකක්. ඒකේ නාඩි වැටෙනවා. (බාධා කිරීම්) ඒක අපි ලබන සුමානය වනකොට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ජනාධිපතිතතුමාගේ නාඩි වැටෙනවාලු.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

අත දැම්මා බලාගෙන ගියා. මම දැකපු දෙයක්. ඉතින් එතුමා - (බාධා කිරීම්) අපි සමාජ සේවා අංශයෙන් විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. වැඩිහිටි සුව සේවා මධ්‍යස්ථාන තුනක් දිස්ත්‍රික්ක තුනේම ඉදි කරනවා. එකක් කළුතර. අනෙක් එක කොළඹ, අනෙක් එක ගම්පහ. ඒ වාගේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු ඇමැතිතුමා කථාව අවසන් කරන්න.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ඒ නිසා මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. පරිවාස දෙපාර්තමේන්තුව වැඩ කොටසක කරනවා. ඒ වාගේම මේ වෙලාවේ මම ස්තුතිවන්ත වෙනවා අමාත්‍ය මණ්ඩලයටත්, සියලුම මන්ත්‍රීවරුන්ටත්. ඒ වාගේම මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු මගේ පුද්ගලික කාර්ය මණ්ඩලය, පළාත් අධ්‍යක්ෂතුමා ඇතුළු සියලුම අධ්‍යක්ෂවරු, සියලුම සුළු සේවකයින්. නැත්නම් මෙම රාජකාරිය කරන්න බැහැ. ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් තමුන්නාන්සේලා දීපු සහයෝගයට ලබන අවුරුද්දේත් මේ වාගේ වැඩ සටහන් කරන් ශක්තිය ධෛර්ය ලැබේවා. ජනාධිපතිතුමාගෙන් විශාල වශයෙන් සහයෝගය ලැබුණා. අපි ඒ සඳහා විශේෂ ස්තුතියක් කරමින් කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳව අමාත්‍යාංශ වැය ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 යන ශීර්ෂයන් පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳව අමාත්‍යාංශ වැය ශීර්ෂ අංක 105, 113, 114, 115 හා 116 ඡන්ද විමසීමේදි වැඩි ඡන්ද 12 කින් සභා සම්මත වූ බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

***ශීර්ෂ අංක 105 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 42 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 105 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 42 against and 00 decliners.*

***ශීර්ෂ අංක 113 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 42 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 113 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 42 against and 00 decliners.*

***ශීර්ෂ අංක 114 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 42 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 114 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 42 against and 00 decliners.*

***ශීර්ෂ අංක 115 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 42 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 115 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 42 against and 00 decliners.*

***ශීර්ෂ අංක 116 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 54 යි, විපක්ෂව 42 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 116 should be approved was put and the Committee of the Whole Council was divided as 54 for, 42 against and 00 decliners.*

## 2019 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය

THE APPROPRIATION STATUTE RELATING TO THE FINANCIAL STATEMENT - 2019

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2019 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question proposed again.*

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. මට මේක කියවන්න දෙන්න. වැදගත් යෝජනාවක් යන්නේ. ආණ්ඩු පක්ෂයෙන් තමයි වැඩියෙන් කෑගහන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි කෑගහන්නේ නැතුව මේගොල්ලන්ට කෑගහන්න දෙන්නද?

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය යන යෝජනාව සම්බන්ධ සාකච්ඡාව පොදු වැදගත්කමකින් යුත් පරිපාලන ප්‍රතිපත්ති හා අදාළ කරුණුවලට පමණක් සීමා විය යුතු බව කාර්ය පටිපාටි රීති අංක 50(3) හි සඳහන්ව තිබෙනවා. ඒ අනුව කටයුතු කරන ලෙස මම ඉතාමත් ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. විවාද ආරම්භ කිරීමට විපක්ෂයට අවස්ථාව. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 04.06 ]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳව අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්න කැමැතියි. අද බස්නාහිර පළාත් සභාවේ අවසන් වැය ශීර්ෂය වෙනුවෙන් පැවැත්වෙන මේ විවාදයේදී විශේෂයෙන්ම මේ පැවැත් වූ විවාදවලදී අපි දිගින් දිගටම අවධාරණය කළේ, අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට, මේ රටේ නිදහසට, මේ රටේ ව්‍යවස්ථාවට, මේ රටේ නීතියට, මේ රටේ සම්ප්‍රදායට එල්ල වෙලා තිබෙන තර්ජනය පිළිබඳවත්, හිස ඔසවමින් තිබෙන මුරණ්ඩුභාවය, -

**ගරු කාමල් කුරුප්පු**
Hon. Kamal Kuruppu

උසාවියට බොරු සාක්ෂි දුන්නු මිනිහෙක් ඔය. බොරු සාක්ෂි දීලා වරදකරුවෙක් වෙන්න යන මිනිහෙක් ඔය කථා කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

උසාවියෙන් නඩු අහයි. ඔබතුමා නඩු අහන්නේ නැතුව ඉන්න කෝ?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

නැඟිටලා කථා කරන්න කෝ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔයාලා ඒ කාලේ නඩු ඇහුවා නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, -

**ගරු කාමල් කුරුප්පු**
Hon. Kamal Kuruppu

කියන්න, කියන්න.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කාමල් කුරුප්පු ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. දිගින් දිගටම බාධා කිරීම් කරන්න එපා. බොහොම සුළු කාලයක් තිබෙන්නේ. ඔබතුමාට පසුව උත්තර දෙන්න පුළුවන්.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මෙතුමා විසර්ජනය ගැන නොවෙයි කථා කරන්නේ. ඒකයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මම ඔයගොල්ලෝ කියන එකද කථා කරන්න ඕනැ?

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මෙතුමා බයිලා ගහන්නේ. බයිලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීවරු බීලා ඉන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔය කාඩ දේශපාලනයට විරුද්ධව තමයි අපි මේ කථා කරන්නේ. ශික්ෂණයක් නැහැ. ඔය තක්කඩිකම. ඔය තක්කඩි දේශපාලනය.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අවුරුදු තුනක් කාලා -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

පාඨලීගේ ජාතකය කියන්න බලන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔය රස්තියාදුකාර දේශපාලනය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මිරිස් කුඩු කාරයෝ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අවුරුදු තුනක් රට කාලා, දැන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, මේ කට්ටිය ගෙනිහිල්ලා වෛද්‍ය පරීක්ෂණයකට යොමු කරලා බලන්න, මේ කට්ටිය බීමත්ව ඉන්නවාද කියලා. ඒක නිසා අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අකුලමින් තියෙන්නේ. ඒක තමයි මේ පෙන්වන්නේ. මේ රස්තියාදුකාර දේශපාලනය, මේ ත්‍රාඩ දේශපාලනය -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අවුරුදු තුනක් රට කාලා දැන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

වීරකැටියේ ජුලම්පිටියේ අමරෙලාගේ දේශපාලනය මේ සභාවට ගේන්න හදන්නේ. ඒ දේශපාලනයට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නියම දේශපාලනය.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, මේ රටේ නිදහස වෙනුවෙන් මේ රටේ ව්‍යවස්ථාව වෙනුවෙන්, මේ රටේ ජනතාව ගෙනියන අරගලය තමයි අද දවසේ -

[සභාවේ ඝෝෂා]

පුළුවන්කමක් නැහැ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

පාර්ලිමේන්තුව විසුරුවලා -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

රටේ පාර්ලිමේන්තුව වහලා. 2019 වර්ෂයට Budget එකක් නැහැ.

[සභාවේ ඝෝෂා]

අනෙක් පැත්තෙන් ත්‍රිවිධ හමුදාවේ ප්‍රධානියා අත්අඩංගුවට ගත්තා. මේ මහ දේශප්‍රේමී කියා ගන්නා ආණ්ඩුවෙන්. දේශප්‍රේමී අගමැතිකම යටතේ තමයි රටේ ත්‍රිවිධ හමුදාවේ ප්‍රධානියාව අත්අඩංගුවට ගත්තේ. ඒ විතරක් නොවෙයි. කොටි නැගිට්ටා. මහවිරු සමරු තිබ්බා. ඒ විතරක් නොවෙයි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පළාත් සභාව ගැන කථා කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, යහපාලනය කාලේ -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මහින්ද රාජපක්ෂත් මස්තබාල්දූ වෙලා තිබෙන්නේ. තහනමට ලක් වුණු, කොටියාගේ තහනමට ලක් වුණු අගමැතිවරයෙක් ඉන්නේ. (බාධා කිරීම්) හොර කැබිනට් එකක් ඉන්නේ. ඉතින් මෙතැන මොනවා කථා කරන්නද? අද රටේ

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කථා කරන්න දෙයක් නැත්නම් ඉඳගන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මූල්‍ය බලය නැති කරලා 2019 වර්ෂය සඳහා Budget එකක් ඉදිරිපත් වෙලා නැහැ. අද පාර්ලිමේන්තුව වහලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, විසර්ජනය ගැන කථා කරන්න කියන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මහ බැංකුව හොරා කාලා, ප්‍රජාතන්ත්‍රවාදය -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

රට ජාත්‍යන්තර වශයෙන් අපකීර්තියට පත් කරලා විතරක් නොවෙයි. අද ජනාධිපතිවරයාගේ (බාධා කිරීම්) මුළු රටම අරාජික වෙලා, අස්ථාවර වෙලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි. ඒ නිසා මේ රස්තියාදුකාර දේශපාලයනට -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

බේරුවල මුස්ලිම් මිනිස්සු මරන්න කිව්වේ කවුද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

දෙන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

ත්‍රාඩ දේශපාලනයට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කුඩුකාරයෝ. මිරිස්කුඩු කාරයෝ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

කුඩු රාජිත අහු වුණේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කථානායක පුටුවට වතුර වක් කරපු ඒ දේශපාලන සංස්කෘතිය තමයි මෙතැනටත් ගෙනැල්ලා, අපට දැන් කථා කරන්න දෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, ඡන්දයකදී අප අතර වාද විවාද වෙන්න පුළුවන්. ඡන්දයෙන් අපි පරාජය වෙන්න පුළුවන්. ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. ශීලාචාරකමක් නැහැ. මේ වාගේ මෝඩයෝ ටිකක් එක්ක අද අපට යන්න වෙලා තිබෙන්නේ. ඒක වෙනස් කරන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

ඒ මන්ත්‍රීවරුන්ට ගරු කරනවා. හැබැයි ඔයගොල්ලෝ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇමැතිකම කර ගන්න බැරි වුණු මන්ත්‍රීවරයා.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පළාත් සභා මැතිවරණයක් ආපුවාම අපට දැක ගන්න පුළුවන් වෙයි ඔයගොල්ලෝ ඉතිරි කාලයේ කටයුතු කරන්නේ කොහොමද කියලා. ඒ වාගේම අපි කියන්න කැමැතියි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පෙබරවාරි 10 දැක්කේ නැද්ද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පුළුවන් වෙයි. ඒක නිසා දැන් මේ කට්ටියගේ තාවකාලික සමගියක්. හරි සමගියි. හරි එකමුතුයි. හරි ශක්තිමත්. බලමු අපි ඉදිරියේදී මොකද වෙන්නේ කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ජාතිවාදියා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

බැසිල් රාජපක්ෂගෙන් ජනාධිපති අපේක්ෂකත්වය ලැබෙයිද කියලා බලාගන්න පුළුවන් වෙයි. අන්න එතකොට එයි අඬාගෙන අනේ අපට මොකද වුණේ කියලා. අපි කියන්න කැමැතියි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාගේ අපේක්ෂකත්වය බලාගන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔයගොල්ලෝ වූන් වෙලා ඉන්න. හැබැයි ඒවායෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය යට කරන්න බැහැ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අපොයි ප්‍රජාතන්ත්‍රවාදය අපි දන්නවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ රටේ නිදහස වෙනුවෙන්, මේ රටේ ස්ථාවරභාවය වෙනුවෙන් -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේකට අදාළව කථා කරන්න කෝ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විසර්ජනයට කථා කරන්න කියන්න ගරු සභාපතිතුමනි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අනිවාර්යනේම දිගටම මේ අරගලය කරගෙන යනවා කියන එක කියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමා විසර්ජනයට කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මාතෘකාව විසර්ජන කෙටුම්පත.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමා මේ අයවැයට සම්බන්ධව කථා කරන්න. වෙනත් ඒවාට යන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

විසර්ජනයට තමයි මේ කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

අදාළ දේට කථා කරන්න. වෙනත් දේවල්වලට යන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මත්පැන් ගඳක් එනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මගේ නිදහස නැති වෙලා. ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙලා. මට කථා කරන්න (බාධා කිරීම්) දෙන්නේ නැහැ. ඒකද ප්‍රජාතන්ත්‍රවාදය?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධයෙන් ඔබතුමා කථා කරන්න. වෙන ඒවා කථා කරන්න යන්න එපා. පාර්ලිමේන්තුවේ -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

රටේ ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කරලා, යහපාලනය යටපත් කරලා. අද මූල්‍ය කළමනාකරණයක් නැහැ. මූල්‍ය කටයුතු පිළිබඳව අපට විනිවිදභාවයක් නැහැ. කොහෙන්ද අපට අහන්න තිබෙන්නේ? පාර්ලිමේන්තුව වහලා දාලා තිබෙන්නේ. ඒ නිසා මම කියනවා මේ කරගෙන යන -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා පාර්ලිමේන්තුව ගැන කථා කරන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ නිසා ගරු සභාපතිතුමනි -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔබතුමා ජීප් එකේ ගියේ පායලීත් එක්ක. අර අහිංසක කොල්ලා -

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අගමැති වෙලා මේ ඉදිරිපත් කරපු විසර්ජන පනත් කෙටුම්පත - විපක්ෂය විධියට අපි අපේ යුතුකම, වගකීම ඉෂ්ට කළා. අපි අපේ (බාධා කිරීම්) ඔය තිබෙන -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

සංදීප්ට සනීපද? යුතුකම් වගකීම් ඉෂ්ට කරලා සංදීප්ට සනීපද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ අමාත්‍යාංශවලින් ඔය කියන ආකාරයේ මහ ආශ්චර්යක් වෙලා තිබෙනවා නම් - ගොඩනැගිල්ලක් හදලා තිබෙනවා. හැබැයි මේ ගොඩනැගිල්ලට ඇවිල්ලා ඉන්න මිනිස්සුන්ගේ හැටි බලන්න කෝ? ශීලාචාරකමක් තිබෙනවාද? හැදියාවක් තිබෙනවාද? ඔබතුමාට ඇහුම්කන් දෙනවාද?

[සභාවේ ඝෝෂා]

ඔබතුමාට ගරු කරනවාද? කියන්න බලන්න ඔබතුමාට ගරු කරනවාද කියලා. ඔබතුමා කියන දේවත් අහන්නේ නැහැ. රීතිවලට ගරු කරන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

ඉතින් මෙවැනි සභාවක් හැදුවා කියලා ඇති වැඩේ මොකක්ද? ඒක උඩින් බලනවා නම් - ඉතින් ගරු සභාපතිතුමනි, මම කියන්න කැමැතියි -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීවරු වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ මගේ අවස්ථාව. ඒ නිසා අපි මහ ඇමැතිතුමාගේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විසර්ජනයට කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

එතුමා අවුරුදු 3 1/2 ඇතුළේ කරලා තිබෙන විශේෂ ව්‍යාපෘතිය මොකක්ද කියන්න. මේ බස්නාහිර පළාතේ කැළි කසළ ප්‍රශ්නය විසඳුවාද කියන්න. මාර්ග තදබදය පිළිබඳ ප්‍රශ්නය විසඳුවාද කියන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මෙගා පොලිස් කෝ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මාර්ග තදබදයට විසඳුමක් දුන්නාද? ප්‍රවාහන ප්‍රශ්න විසඳුවාද? - ප්‍රශ්නය විසඳුවාද? නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මෙගා පොලිස් කෝ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කට වහගෙන ඉන්න. මෝඩයෙක් වෙන්නේ නැතුව කට වහගෙන ඉන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කෝ මෙගා පොලිස්? හොරකම් කළා විතරයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මෝඩයෙක් වාගේ හැසිරෙන්න එපා. මෝඩයන්ට පුළුවන් සමච්චල් කරන්නයි, නින්දා කරන්නයි විතරයි. මෝඩයන්ට පුළුවන් සමච්චල් කරන්නයි, නින්දා කරන්නයි, කෑගහන්නයි විතරයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කෝ මෙගා පොලිස්?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කාලය අවසන්.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒක නිසා මම කියන්න කැමැතියි මේ රටේ -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කාලය අවසන්.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කාලය ඉවරයි.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 04.16 ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා විසර්ජන පනත් කෙටුම්පත යටතේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව. දින හතරක් පුරා සාකච්ඡා කරපු විවිධ වැය ශීර්ෂවලට අදාළව -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රුපියල් බිලියන 81 ක් වන වියදම, වියදම් කිරීම සඳහා වූ -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නීත්‍යානුකූල බලය -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලැබෙන විසර්ජන ප්‍රඥප්තියට ඡන්දය ප්‍රකාශ කළේ නැත්නම් ලබන අවුරුද්දේ මුදල් වියදම් කර ගන්න බැරුව යනවා. ඒ නිසා මේ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කිරීම -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ පළාත් සභාවේ ඉතාමත්ම වැදගත්ම කාරණයක් බවට පත් වෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා, 37 (1) යටතේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි 2019 -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙනවාලු.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, දැන් අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කථා කරන අවස්ථාවේ විවිධ කෑගැසීම් ඇහුනා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හදපු බිල්ඩින් එක වතුරට යට වුණා. ඒකයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මෙතැන ඉන්න බැහැ. ඉතාමත් දරුණු මත්පැන් ගඳක් මෙතැනට එනවා. මේක වරප්‍රසාද ප්‍රශ්නයක්. අපට බයයි. අවසාන ඡන්ද විමසීමේදී මේ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව කවුද වග කියන්නේ? බේබද්දෝ මේ සභාවට ඇවිල්ලා යම්කිසි විධියකට මේ මන්ත්‍රීවරුන්ට ඡන්දය පාවිච්චි කරන්න දෙන්නේ නැතුව හිරිහැර කළොත් -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට බේබද්දෝ කියලා මේ මන්ත්‍රීවරුන්ට කියන්න බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කරුණාකරලා මේ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න. මේ සභාවට බීලා ඇවිල්ලා ඉන්නේ කවුද කියලා කියන්න. තමුන්නාන්සේට වගකීමක් තිබෙනවා. තමුන්නාන්සේ සභාපතිවරයාට හැටියට කවුද මේ සභාවට බේබද්දෝ වාගේ බීලා ඇවිල්ලා තර්ජනය කරන්නේ කියලා කරුණාකරලා පරීක්ෂාවක් කරලා බලන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මුලින්ම මෙතුමාව පරීක්ෂා කරන්න.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කථාවට බාධා වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මගේ වෙලාව දෙන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කරුණාකරලා -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

කිසිම මන්ත්‍රීවරයෙක් මත්පැන් පාවිච්චි කරලා නැහැ. කරුණාකරලා සිරිකමල්ව පරීක්ෂා කරන්න. මෙයාව පරීක්ෂා කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

වාඩිවෙන්න. වාඩිවෙන්න. මගේ වෙලාව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරිකමල් මන්ත්‍රීතුමා බීලා. මෙතුමා තමයි බීලා ඉන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, සිරිකමල්ට ලැජ්ජාවට කියන්න දෙයක් -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මම අභියෝග කරනවා. පුළුවන් නම් මත්පැන් බීලා නැහැයි කියලා සහතිකයක් දෙන්න. මම අභියෝග කරනවා. පුළුවන් නම් මත්පැන් බීලා නැහැ කියලා සහතිකයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාට එහෙම කියන්න බැහැ ගරු මන්ත්‍රීතුමා. මන්ත්‍රීවරුන්ට අභූත චෝදනා කරන්න එපා. මන්ත්‍රීවරු බීලා කියලා. අපි කොහොමද ඔප්පු කරන්නේ?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මෙතුමා බීලා. මෙතුමා බීලා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

සාවද්‍ය චෝදනා කරන්න එපා ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සිරිකමල් මන්ත්‍රීතුමා බීලා ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මෙරිල් පෙරේරා මන්ත්‍රීතුමා කියනවා සිරිකමල් මන්ත්‍රීතුමා බීලා කියලා. ඒ නිසා මට මේ ගැන ගැටළුවක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමාව check කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමා බීලා. බීලා ඇවිල්ලා තියෙන්නේ. මෙතුමා බීලා. බීලා ආපු කෙනෙක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම අභියෝග කරනවා මාව check කරන්න. ඒ වාගේම අනෙක් අයවත් check කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ කථා කරන්නේ බීලා ඇවිල්ලා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කාලය අපතේ යනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම බීලා ඉන්නේ. මාව check කරන්න කෝ? ඉවරයි නේ?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

රීතිවලට අනුව මන්ත්‍රීවරු check කරන්න බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මාව check කරන්න.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට කාලය දෙන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ මන්ත්‍රීවරු බේබද්දෝ. බීලා ඇවිල්ලා ඉන්නේ. මේ අයගෙන් අපට ජීවිත හානි වෙන්න පුළුවන්. මේ ඡන්දය පවත්වන වෙලාවට අපට ජීවිත හානි වෙන්න පුළුවන්. තර්ජනය කරනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

එහෙම වෙන්නේ නැහැ මන්ත්‍රීතුමා. අපේ සහෝදර මන්ත්‍රීවරු ඉන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ ඡන්දයෙන් පරදින කොට බොරු චෝදනා දාලා කියනවා. මෙතුමා බීලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

බීපු කෙනා එළියට දාන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතුමා බීලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ මනුස්සයා බීලා ඇවිල්ලා තියෙන්නේ. එළියට දාන්න.

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

එතුමා පිළිගන්නවා බීලා කියලා. පිළිගත්තා නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එළියට දාන්න.

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

එතුමා පිළි අරගෙන ඉවරයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සුසාර දිනාල් බීලා නැහැ. මම ඒක කියනවා. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මෙතුමාව එළියට දාන්න.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. මෙතුමාට අවස්ථාව දෙන්න. කාලය අපතේ යනවා. මට ඒක පිළිගන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඔක්කෝම හිටියේ කැන්ටිමේ. මේ අය සිරිකොතට ගිහිල්ලා එන ගමන් බීලා ආවේ. මේගොල්ලෝ බීලා ආවේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පුළුවන් නම් පරීක්ෂා කරන්න. එන්න ඔයගොල්ලෝ. අපිව පරීක්ෂා කරමු බලන්න.

[සභාවේ ඝෝෂා]

මෙතැන තුන් දෙනෙක් ඉන්නවා. අන්න අතන අනික් තුන් දෙනා. ඕනෑ නම් නම් පහ කියන්නම්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අපි නම් පහ කියන්නද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔව්. එන්න පරීක්ෂා කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

පස් දෙනෙක් ඉන්නවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පරීක්ෂා කරමු. පරීක්ෂා කරලා බලමු. පස් දෙනෙක් ඉන්නවා. අපිත් එන්නම් පරීක්ෂා කරන්න. මහ ඇමැතිතුමා අපිත් පරීක්ෂාවට එන්නම්.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මට කාටවත් පරීක්ෂා කරන්න අවශ්‍ය නැහැ. එහෙම පරීක්ෂා කරන්න රීතියක් නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

එන්න පුළුවන් නම් කට්ටිය, පරීක්ෂා කරන්න.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මගේ වෙලාව මට දෙන්න.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

වෙලාව දෙනවා. ඔබතුමා කථා කරන්න.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

මෙතැනට බීලා ආවොතින් බලන්න මොකක් හරි ක්‍රමවේදයක් තියෙනවාද? පළාත් සභාවට කවුරු හරි බීලා ආවොත් ඒක සොයා ගන්න ක්‍රමවේදයක් තියෙනවාද? ඒ ක්‍රමවේදය අනුගමනය කරන්න. ඒ ක්‍රමවේදය අනුගමනය කරලා බීලා ඉන්නවා නම් එළියට දාන්න. අනෙක් පක්ෂවල කවුරු හරි ඉන්නවා නම් එළියට දාන්න. මේ පළාත් සභාවේ මොකක් හරි ක්‍රමවේදයක් ඇති නේ?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, රුපියල් බිලියන 81 ක් වියදම් කිරීම සඳහා වූ විසර්ජන ප්‍රඥප්තියට තමයි අද අපි ඡන්දය විමසන්න හදන්නේ. මේකේදී අපි දන්නවා පෙර වර්ෂයට වඩා රුපියල් මිලියන 9635 ක් -

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

අපි සියලු දෙනාම සිරිකොතට ගිහිල්ලා ආවේ. එහෙම චෝදනා කරන්න බැහැ සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

නැහැ, නැහැ. හරි.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ඒ චෝදනාව අයින් කර ගන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රුපියල් මිලියන 9633 ක් මේ අවුරුද්දේ ගිය අවුරුද්දට වඩා වැඩියෙන් වියදම් කරලා තිබෙනවා.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ගරු සභාපතිතුමනි, පළාත් සභා මන්ත්‍රීවරු බීලා ආවා නම් බලන්න මොකක් හරි ක්‍රමවේදයක් තියෙන්න එපැයි. ඒ ක්‍රමවේදය අනුගමනය කරන්න.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

එහෙම ක්‍රමවේදයක් නැහැ. වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා. වාඩි වෙන්න. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, 13.4% ක වැඩි වීමක්. ඒකේ පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 8465 ක් සහ ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 1170 ක වැඩිවීමක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේක විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණාව තමයි 2018 වර්ෂයේ පුනරාවර්තන වියදම්වලින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිකාල දීමනා සහ නිවාඩු වැටුප් රුපියල් මිලියන 2575 ක් වෙලා තිබෙනවා. 2019 වර්ෂයේ ඒක රුපියල් 5186 කට වැඩි වෙනවා. ඒ කියන්නේ රුපියල් මිලියන 2611 ක වැඩි වීමක්. 101% ක වැඩිවීමක් තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කරන සේවකයෝ සංඛ්‍යාව 11,853 ක්. ඒ අයට තමයි අතිකාල දීමනාවලින් 98% ක්ම යන්නේ. ඉතුරු සේවක සංඛ්‍යාව 47,351 ක් සඳහා යන්නේ 2% ක අතිකාල දීමනාවක්. ඒ නිසා මේ මුදල් වියදම් කිරීමේදී අසීමිත මුදලක් තිබෙන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සියලු මුදල් ටික වියදම් කරන්න 2019 දෙසැම්බර් 31 වනකොට සෞඛ්‍ය අමාත්‍යාංශය මහන්සි වෙලා වැඩ කරන්න ඕනෑ කියන කාරණාව මතක් කරනවා. ඒ වාගේම අපි මතක් කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි,

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බීලා. බීලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ විසර්ජන ප්‍රඥප්තිය සම්මත කළාට පස්සේ අපට ලැබෙන බලයත් එක්ක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් කට්ටිය ගිහිල්ලා පේර කොල කාලා එයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපට බලපාන ප්‍රධාන කාරණාවක් තිබෙනවා. ඒ තමයි මේකේ ආදායම. මේ ආදායමට රජයෙන් ලැබෙයැයි අපේක්ෂිත ප්‍රතිපාදන තිබෙනවා. ජාතිය ගොඩ නැඟීමේ බදු සහ මුද්දර ගාස්තුත් එක්ක රුපියල් මිලියන 30,624 ක්. ඉන් අපේක්ෂිත මුදල රුපියල් 22,217 ක්වත් ලැබෙයි කියන විශ්වාසය මේ අවුරුද්දේ තිබෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා. අද අපි මේ අයවැය ඉදිරිපත් කළේ පාර්ලිමේන්තු අයවැයක් නැති වෙලාවක. අපි දන්නවා මේකට වග කියන්න ඕනෑ කවුද කියලා. අපට මතකයි 2015 අගෝස්තු මාසේ 17 වැනිදා පාර්ලිමේන්තු මැතිවරණය තියෙන කොට, එදා සිරිකොතේ ලයිට් බිල ගෙවා ගන්න බැරුව ඉන්න කොට එදා පාර්ලිමේන්තු මැතිවරණය තියන්න පාර්ලිමේන්තුවට තරග කරපු එක්සත් ජාතික පක්ෂයේ සියලු දෙනාට මුදල් දුන්නේ, පාර්ලිමේන්තුව කඩලා මංකොල්ල කාපු සල්ලිවලින්. අපි කනගාටු වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා සිරිකොතේ බිල් ගෙවනවාද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා තමන්ගේ වැය ශීර්ෂය ගැන කථා කරන කොට සුවපතිව මතක් කළා. අපි කනගාටු වෙනවා මහ බැංකුවේ අධිපතිව අමතක වීම පිළිබඳව. මහ බැංකුවේ අධිපති තමයි දැවැන්තම මුදල් වංචාව කළේ. ඒ මුදල් වංචාව හරහා තමයි රට ඇතුළේ දැවැන්ත මුදල් හිඟයක් නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ මුදල් හිඟය නිසා තමයි ආර්ථික අවපාතයක් ඇති වුණේ. ගරු සභාපතිතුමනි, අපි තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ, අද පාර්ලිමේන්තුවේ අයවැයක් නැහැ. පාර්ලිමේන්තුවේ අයවැය ඉදිරිපත් කරන්න තිබෙන අවස්ථාව නැති කළේ කථානායකවරයා. කැලෑ නීතිය ක්‍රියාත්මක කරලා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොරු කියන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කැලෑ නීතිය ක්‍රියාත්මක කරලා, අභූත ලේඛන හදලා, පාර්ලිමේන්තු න්‍යාය පත්‍රය -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොරු කියන්න එපා. වැදගත් මනුස්සයෙක්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පාර්ලිමේන්තුව තියන එක අහෝසි කරනු ලැබුවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කථානායක වැදගත් කෙනෙක්. අපහාස කරන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මන්ත්‍රීවරු හතළිස් ගණනක් හිටපු රනිල් වික්‍රමසිංහ මහත්තයාට 2015 අගෝස්තු 17 වැනිදා අගමැතිකම හම්බ වුණා. එදා කවුරුත් බහුතරය බලන්න කියලා කිව්වේ නැහැ. පාර්ලිමේන්තුවේ -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේ budget එකද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ විසර්ජන ප්‍රඥප්තියද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අද බහුතරය බලන්න කියලා පාර්ලිමේන්තුව (බාධා කිරීම්) පළාත් සභාවට ලැබිය යුතු මුදල් මහ ආණ්ඩුවෙන් ලැබිය යුතු මුදල්වලට කථානායකවරයා වග කියන්න ඕනෑ. කැලෑ නීතිය ක්‍රියාත්මක කරපු, පාර්ලිමේන්තුව වල් වද්දපු, පාර්ලිමේන්තු සම්ප්‍රදාය කඩපු, පාර්ලිමේන්තුවේ නීතිරීති විනාශ කරපු කථානායකවරයා තමයි පාර්ලිමේන්තුව අයවැය -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා තමයි අද පාර්ලිමේන්තුවෙන් මුදල් නොලැබෙනවා නම් -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අද රජයෙන් ලැබෙන ප්‍රදාන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ඔබතුමා පාර්ලිමේන්තුවට යන්න එපා. පළාත් සභාව ගැන කථා කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම කියන්නේ පාර්ලිමේන්තුවේ අයවැය ගැන.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, රජයෙන් ලැබෙන ප්‍රදාන පළාත් සභාවට ලැබෙන්නේ නැතුව යනවා. ගරු සභාපතිතුමනි, ජනාධිපතිතුමා විවේචනය කළා. ඔබතුමාට මතකයි ජනාධිපතිතුමාව විවේචනය කළා. හැබැයි ජනාධිපති මරන්න කුමන්ත්‍රණය කරපු එක්සත් ජාතික පක්ෂය තමයි තමන්ගේ නායකයා මරන්න කුමන්ත්‍රණය කරලා, ඒ කුමන්ත්‍රණයට තමන්ගේ ඇමැතිවරු සම්බන්ධ කරලා, පොලිස්පතිවරයා සම්බන්ධ කරලා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ජනාධිපතිට ආරක්ෂාව දෙන්න බැරිද? අයියෝ නඩු දාගන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මාතෘකාවට කථා කරන්න කෝ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම කථා කරන්නේ මාතෘකාවට ගරු සභාපතිතුමනි. පාර්ලිමේන්තුවෙන්, රජයෙන් ලැබිය යුතු ප්‍රදාන මේකේ තිබෙනවා බිලියන 3624 ක්. ඒ මුදල ලැබුණේ නැත්නම් මේ අයවැය හිඟය පියවා ගන්න පුළුවන්කමක් නැහැ. පළාත් සභාවේ අයවැය ක්‍රියාත්මක කර ගන්න පුළුවන්කමක් නැහැ. ඒ මුදල නොලැබෙන්න බලපාලා තිබෙන්නේ කථානායකවරයාගේ කැලෑ නීතිය කියන එකයි මම කියන්නේ. ඒ නිසා තමයි අයවැයක් සම්මත කරන්න බැරි වෙලා තිබෙන්නේ. පාර්ලිමේන්තු සම්ප්‍රදාය කැඩුවා. පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝණය කළා. පාර්ලිමේන්තුවට න්‍යාය පත්‍රයක් නැති කළා. පාර්ලිමේන්තුවක් වාරාවසනා කළාට පස්සේ නැවත වතාවක් පටන් ගනිද්දී ජනාධිපතිතුමාගේ ප්‍රකාශය කියවන්න තිබෙන්නේ. නමුත් එහෙම එකක් පාර්ලිමේන්තුවේ තිබුණේ නැහැ. පාර්ලිමේන්තු සම්ප්‍රදාය විනාශ කරලා දැම්මා. ඒ නිසා තමයි අද අයවැයක් නැති වෙලා තිබෙන්නේ. ඒ නිසා රටේ ආර්ථිකය කඩා වැටෙනවා නම් ඒකට වගකියන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂය. ජාත්‍යන්තරය මේ රටට බලපෑම් කරනවා නම් ඒකට වගකියන්න ඕනෑ එක්සත් ජතික පක්ෂය. අද ජාත්‍යන්තරය ගෙනැල්ලා මේ රට අධිරාජ්‍යවාදීන්ගේ කුණු ගොඩක් බවට පත් කරගන්න තමයි එක්සත් ජාතික පක්ෂයට උවමනා වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා මේ පළාත් සභාව ඇතුළු පළාත් සභා සියල්ලේ ඡන්ද දිගින් දිගට කල් තියලා අයවැයවලින් පළාත් හරහා ජනතාවට ලැබෙන සියලු මුදල් අහෝසි කරලා තිබෙන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් තිබෙනවා. මේ විසර්ජන ප්‍රඥප්තිය සම්මත කරලා අප්‍රේල් මාසේ 22 මේ සභාව ඉවර වුණාට පස්සේ මේ සභාව ඇතුළේ මේක ක්‍රියාත්මක කරන මහජන නියෝජිතයෝ කවුරුන්ද? පළාත් සභා මැතිවරණ පිළිබඳව නිශ්චිතව දින වකවානු කියන්න බැරි වුණු ආණ්ඩුවක් තිබුණේ. පළාත් සභා ක්‍රමය, මැතිවරණ ක්‍රමය මොකක්ද කියලා කියා ගන්න බැරි වුණු ආණ්ඩුවක් තිබුණේ. ඡන්ද සියල්ල කල් දාලා තියෙනවා. පළාත් සභා හයක ඡන්දය කල් දැම්මා. තව පළාත් සභා තුනකත් ඡන්ද කල් දාන්න නියමිතව තිබුණා. ඒ නිසා අපි විශ්වාස කරනවා ඉදිරි කාල පරිච්ඡේදය ඇතුළේ අලුත් ආණ්ඩුව ඇතුළේ පළාත් සභා මැතිවරණ ක්‍රමය හදලා, පළාත් සභාව තියලා අපි මේ විසර්ජන ප්‍රඥප්තියෙන් බලය දෙන මුදල් ජනතාවට ලබා දෙන්න අවශ්‍ය දේශපාලන වටාපිටාවක් ඉදිරි කාලයේ නිර්මාණය වෙයි කියන විශ්වාසය තිබෙනවා. විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුයි කියන කාරණය කියමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.31 ]

**ගරු එස්. කුහවරදන්**
**எஸ். குஹவரதன்**

கௌரவ தவிசாளர் அவர்களே, 2014 ஆம் ஆண்டு ஆரம்பமான பயணம் இன்னும் நான்கு மாதங்களில் நிறைவடைய இருக்கின்றது.இவ் வேளையிலே நிதி சம்மந்தமான கூற்றை சமர்ப்பித்து விட்டு அதற்கான இறுதிக் கட்டத்திலே இன்று நாம் இருக்கின்றோம். கௌரவ தவிசாளர் அவர்களே, யுத்தத்தால் கஷ்டப்பட்ட அல்லது யுத்தத்தால் பாதிக்கப்பட்ட இரண்டு பகுதியினருமேஇந் நாட்டிலே இருக்கின்றனர். அந்த வகையிலே யுத்தம் நிறைவடைந்த பின்னர் இந் நாட்டிலே ஓர் நல்லாட்சியை ஏற்படுத்துவதற்காக இந்நாட்டிலே வாழுகின்ற ஒவ்வொரு குடி மகனும் 2015 ஆம் ஆண்டு 08 ஆந் திகதிதனது வாக்குரிமையை சரியாகப் பயன்படுத்தி நாட்டில் எல்லோரும் ஒற்றுமையாக ஒரு நல்லாட்சியைக் கொண்டு வந்தோம்.

ஆனால் இந் நாட்டிலே கடந்த மாதம் 26 ஆந் திகதி நடைபெற்ற ஜனநாயக விரோதமான, ஜனநாயகத்திற்கு முரணான, ஜனநாயகத்தை மதிக்காத ஒரு செயற்பாடு காரணமாக இன்று நாம் நடுத்தெருவிலே நிற்கின்றோம். கண்ணைக் கட்டி காட்டிலே விட்டவர்களைப் போல் நாம் இன்று திசை தெரியாது நிற்கின்றோம். இந் நாட்டிலே வாழுகின்ற பெரும்பான்மை மக்களாக இருந்தாலும் சரி, சிங்கள மக்களாக இருந்தாலும் சரி,

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විසර්ජන ප්‍රඥප්තියට පිටින් කථා කරන්නේ.

**ගරු එස්. කුහවරදන්**
**எஸ். குஹவரதன்**

தமிழ் மக்களாக இருந்தாலும் சரி, முஸ்லிம் மக்களாக இருந்தாலும் சரி இந் நாட்டிலே நாம் அனைவரும் நடுத்தெருவிலே நிற்கின்ற மக்களாக மாறிவிட்டோம். வாக்களிப்பது என்பது எமது உரிமை அந்த வாக்கு இன்று அளிக்கப்பட்ட விதம், நாங்கள் ஏமாற்றப்பட்டவர்களாக மாறிவிட்டோம். அந்த வகையிலே மத்திய அரசில் இருந்து மாகாண சபையை எவ்வாறு வழி நடாத்த வேண்டும் என்கின்ற இன்றைய நிலையிலே நாம் யாரிடம் செல்வது என்பது - யார் ஜநாதிபதி, யார் பிரதமர், யார் அமைச்சர்கள் என்று தெரியாமல் அப்பாவி மக்கள் சொல்லோனாத் துயரத்தை அனுபவித்துக் கொண்டிருப்பதையும், இவ் வேளையிலே ஜனநாயகம் குழி தோன்டி புதைக்கப்பட்டதையும் உங்களுக்கு முன்னால் கொண்டு வர விரும்புகின்றேன்.அப்பாவி மக்களின் வாக்குகளை மாத்திரம் வாங்கி அந்த மக்களின் வாக்குகளுக்காகவாவது அவர்களை இவ்வாறான ஒரு ஜனநாயகப் பாதையை குழி தோண்டி புதைத்திருக்கின்ற சரியான அரசியல்வாதிகளை எதிர்வரும் காலங்களிலே வருகின்ற தேர்தலிலே மக்கள் சரியாக அடையாளம் காண வேண்டும். மாகாண சபையாக இருந்தாலும் சரி, பாராளுமன்றமாக இருந்தாலும் சரி ஜனாதிபதித் தேர்தலாக இருந்தாலும் சரி, மக்கள் நிச்சயமாக எதிர்வருகின்ற காலங்களிலே எந்தவொரு அரசியல் வாதிகளுக்கும் சரியானதொரு பாடத்தை புகட்டுவார்கள் என்று கூறிக் கொள்ள விரும்புகின்றேன். இன்னும் நான்கு மாதங்களிலே எமது மாகாண சபை நிறைவடைய இருக்கின்றது. அடுத்து வருகின்ற மாகாண சபை தேர்தலிலே தெரியும் யார் உண்மையான மக்கள் சேவகர்கள், யார் உண்மையாக மக்களுடன் மக்களாக இருந்தவர்கள், யார் ஜனநாயகத்திற்கு விரோதமாக செயற்பட்டவர்கள், யார் ஜனநாயகத்தைக் காட்டிக் கொடுத்தவர்கள், யார் ஜனநாயகத்தை குழி தோண்டி புதைத்தவர்கள் என்பது இனி வரும் காலங்களிலே மக்கள் நிச்சயமாக பாடம் படிப்பிப்பார்கள் என்பதைக் கூறிக் கொண்டு, இவ்வாறான மாகாண சபையில் நாங்கள் ஒற்றுமையாக பயணிக்கின்ற காலங்களிலே தூர நோக்குடன் இந் நாட்டின் அபிவிருத்தியை எடுத்துச் செல்லும் காலங்களிலே நல்லாட்சி இன்று எங்கே போனது என்பது தான் எல்லோருக்கும் தெரியவில்லை. எனவே இவர் அவரைக் குற்றம் சாட்டியும், அவர் இவரைக் குற்றம் சாட்டியும் ஒவ்வொருவரை மாறி மாறி குற்றம் சாட்டாமல்,

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමාගේ විනාඩි 05 කාලය ඉවරයි.

**ගරු එස්. කුහවරදන්**
**எஸ். குஹவரதன்**

எனவே,மக்களின்அடிப்படை பிரச்சினைகளை சரியாக இணங்கண்டு நிச்சயமாக இந் நாட்டின் ஜனநாயகத்தை நிலை நிறுத்தி வெற்றிப் பாதையிலே செல்வோம் என்று கூறி எனது உரையை முடித்துக் கொள்கின்றேன் நன்றி வணக்கம்.

[අ.භා. 04.36 ]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ අපට විසඳා ගත යුතු ප්‍රශ්න රාශියක් තිබියදී, ඒ ප්‍රශ්න මහ හැරලා ඒවාට අපි කොතෙක් යෝජනා ගෙන ආවත් ඒවා ක්‍රියාත්මක නොකර ඒවා පසකට දාලා තමයි හැමදාම අයවැය හැදුවේ. අපි අයවැයට කලින් බොහෝ යෝජනා ගෙන ආවා. විශේෂයෙන් සෑහෙන පීඩනයකට පත් වෙලා තිබුණු සමූපකාර ක්ෂේත්‍රය පිළිබඳව. සමූපකාර ක්ෂේත්‍රයේ විශ්‍රාම වැටුප ඉතාමත් අඩුයි. අපේ බස්නාහිර පළාතේ ජනතාවක් වැඩ කරනවා නම් අඩුම විශ්‍රාම වැටුපක් ලැබෙන්නේ මේ සමූපකාර විශ්‍රාමිකයන්ට. රුපියල් 4000 ක් 5000 ක් ලැබෙන මනුස්සයට ඒ විශ්‍රාම වැටුප වැඩි කරන්න අපි මේ අයවැයෙන් විශේෂයෙන්ම මුදලක් වෙන් කරලා දෙන්න කිව්වා, සමූපකාර විශ්‍රාම වැටුප් අරමුදලට. කොපමණ යෝජනා ගෙනාවත් අද වනකල් මේ අයවැයෙන් ශත පහක් වෙන් කරලා නැහැ. ඒ පිළිබඳව කනගාටු වෙනවා. විශේෂයෙන්ම අපේ බස්නාහිර පළාතේ ජීවත් වන අහිංසක මිනිසුන්ගේ සුළු පරිමාණ ව්‍යාපාර වැහීගෙන යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. බස්නාහිර පළාතේ මහ පරිමාණ සුපර් මාර්කට් දාලා ඒවා විශාල ප්‍රමාණයෙන් විවෘත කිරීම තුළ අහිංසක සුළු

පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර වැහිලා යන තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම මේ ප්‍රදේශයේ නිවාස ප්‍රශ්නය බොහොම තදින් තිබෙනවා. මම ඊයේ පෙරේදා ගියා. දුම්රිය නිවාසවල හිටගෙන ඉන්න පුළුවන්කමක් නැහැ. කෝච්චියේ යනකොට පාරට බහින්න පුළුවන්කමක් නැහැ. මරණයක් වුණාම මිනීය කරේ තියාගෙන යන්න බැරි තත්ත්වයට දුම්රිය නිවාස ප්‍රශ්නය සහ නිවාස ප්‍රශ්නය උග්‍ර වෙලා තිබෙනවා. මේවාට අපි විසඳුම් ඉල්ලුවා. මේවාට මුදල් වෙන් කරන්න කිව්වා. ගිය අවුරුද්දේ සහ මේ අවුරුද්දේ බලන කොට පොඩි වෙනසක් කළා. ඉලක්කම් දෙකෙක් තුනක් එහාට මෙහාට වෙනස් කරලා, මේ පොත අච්චු ගහලා තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මහ ඇමැති නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මහ ඇමැති ඇතත් නැතත් කියන්න ඕනෑ දේ මම කියනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අහන්න නැහැ. ඒක තමයි කියන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඇසුවත්, නැතත් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඇමැති මණ්ඩලයම නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඇමැති මණ්ඩලය හිටයත්, නැතත් කමක් නැහැ. ඒක අපි මතක් කරන්න වෙනවා. විශේෂයෙන්ම මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පිළිකා රෝගයෙන් මියයන ප්‍රමාණය දැවැන්ත ලෙස වැඩි වෙලා තිබෙනවා. අපේ ප්‍රදේශයේ විශාල ලෙස තිබෙන ප්‍රශ්න. පිළිකා රෝගයෙන් මිය යන සංඛ්‍යාව පිළිබඳව ගණනය කරන්න බැහැ. අපි විතරක් ඒ ප්‍රදේශයේ ගණනය කළා. අපේ ගමේ 114 ක් මැරුණොත් 93 ක් පිළිකා හැදිලා මැරිලා තියෙන්නේ. මේවා විසඳුම් සොයන්න නොයෙක් අවස්ථාවල උත්සාහ කළා. පසුගිය ආණ්ඩුවෙන් ඒවාට ලක්ෂ ගණන් ප්‍රතිපාදන ලබා දුන්නා. එපමණක් නොවෙයි. අපි මන්ත්‍රීවරු සියලු දෙනා මොන පක්ෂයෙන් පත් කළත්, ආණ්ඩුකාරතුමාගේ අයවැයට අපි අත උස්සලා එය අනුමත කරනවා. ඡන්දයක් නැතිව. මොන මති මතාන්තර තිබුණත්. නමුත් ප්‍රතිපත්තියක් වශයෙන් මෙම කාල සීමාව තුළ මම කවදාවත් විදේශ ගත වුණේ නැහැ. නමුත් විදේශගත වෙන්න අපේ අය අයදුම් කළාම ආණ්ඩුකාරතුමා ඒ අයව Interview කරන්න යනවා. ආණ්ඩුකාරතුමාට එහෙම අයිතියක් තිබෙනවාද මන්ත්‍රීවරුන්ව සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන්න. එහෙම අයිතියක් නැහැ. එතුමාට අපි ගෞරව කරලා එතුමාගේ වැය ශීර්ෂය සම්මත කරලා දෙනවා. එතුමා මන්ත්‍රීවරුන්ව සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන්න කොළ ගහලා, කොළ පුරවලා, ෆෝම් ගෙන්වා ගන්නවා. මේවාට කවුද කථා කරන්නේ? එතුමා නොවෙයි, මහජනතාවයි අපව ඉන්ටර්වීව් කරලා තිබෙන්නේ මහජනතාව. මහජනතාව අපිව පරීක්ෂණයට භාජනය කරලා තමයි සභාවට එවලා තිබෙන්නේ. ඉතින් අපි ඒවා ගැන කනගාටු වෙනවා. මේවා පිළිබඳව කතිකාවක් ඇති වෙන්නේ නැහැ. කවුරුත් ඒවා කථා කරන්නේ නැහැ. ආණ්ඩුකාරතුමාට මන්ත්‍රීවරු Interview කිරීමේ අයිතියක් කවදාවත් ඇති වෙලා නැහැ. ඒ නිසා මම ඊට වඩා ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කථා කරපු නිසා කියන්නේ මේ ප්‍රජාතන්ත්‍රවාදයට පළමුවෙන්ම මරු පහර එල්ල කළේ කථානායකතුමා. තමුන්නාන්සේලාට මතකයි. 54 යි හිටියේ. විපක්ෂයේ 54 ක් හිටියා වාඩි වෙලා. 54 ට වඩා 16 ලොකුයි කියලා දුන්නා 16 ට විපක්ෂ නායකකම. 54 ට වඩා 16 ලොකු වුණා කථානායකතුමාට. හය දෙනෙක් හිටියා ජනතා විමුක්ති පෙරමුණේ. ඒ හය ලොකු වුණා. 54 ට වඩා. ඒ අයට දුන්නා සංවිධායකකම. එතැන තමයි ආරම්භය. ඒ නිසා තමයි 122 ට වඩා 103 ලොකුයි කියලා අරගල කළේ. ඒ ගණන් හිලව් වැරැද්දුවේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ ප්‍රශ්නය වෙන ප්‍රශ්නයක්.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මරු පහර එල්ල කළේ කථා නායකතුමා. තමුන්නාන්සේලා මතක තියා ගන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුවේ ඉන්දැද්දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විපක්ෂ නායකකම දෙන්න බැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඒ නිසා තමුන්නාන්සේලා - සමහර අය ජීවත් වෙන්න බැරි වුණාම කාගේ හරි ගෑණියෙක් උස්සාගෙන ගිහිල්ලා ගෙවල්වල තියාගෙන ඉන්නවා. ගෙවල්වල තියාගෙන ඉඳලා ඒ ගෑණිගේ දේවල් විකුණලා කන්න බොන්න පටන් ගන්නවා. ඒ ගෑණිට ඒක ගැලපෙන්නේ නැති වුණාම මොකද කරන්නේ. එතැන ඉන්න බලන්නේ නැහැ. වෙන වෙන ඩීල් දාන්න පටන් ගන්නවා. බැරි වුණාම, ඒ ගෑණී පිට යනවා වාගේ තේරුණාම මොකද කරන්නේ? ඒ ගෑණිව මරන්න තමයි උත්සාහ කරන්නේ. ඒ මනුස්සයාව මරන්න උත්සාහ කරනවා. මරන්න හැදුවාම ඒ මනුස්සයා මොකද කරන්නේ? මරණයෙන් බේරෙන්න නැවත පරණ එක්කෙනා ළඟට පැනලා යනවා. ඒක තමයි මේ රටේ වුණේ. ඒක තමයි අනුන්ගේ ගෑණු අරගෙන ඇවිල්ලා කර ගත්තේ ඒක තමයි. ඒ නිසා ගැලපෙන්නේ නැති කසාදයක් රනිල් වික්‍රමසිංහ මහත්තයා කර ගෙන දැන් ආපහු පරණ ගෙදරට ඇවිල්ලා ඉන්නවා. ඒ හැරිලා ඇවිල්ලා තමයි ගහන්නේ. ගහන කොට තමුන්නාන්සේලාට කන්න බැරි වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා දුක් විඳිනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දැන් හරිද?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අපි කනගාටු වෙනවා. අනුන්ගේ ගෑණු අරගෙන යන්න එපාය කියලා කියන්නේ ඒකයි. අරගෙන ගිහිල්ලා දැන් විඳවනවා. තමුන්නාන්සේලා දැන් විඳවනවා. ඇත්තට මුහුණ දෙන්න වෙනවා තමුන්නාන්සේලාට.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා, විසර්ජන ප්‍රඥප්තිය ගැන කථා කරන්නකෝ?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අපි යන කොට දන්නවා, මේක ගැලපෙන්නේ නැති සම්බන්ධයක්. අස්ගිරි හාමුදුරුවෝ ගිහිල්ලා අර පල්ලියේ හෞතිස්ම වුණා වාගේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අනික් පැත්තට ගිහිල්ලා එක්සත් ජාතික පක්ෂයට ගිය එක, ගැලපෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා, විසර්ජන ප්‍රඥප්තිය යන්නේ මේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අනික් අයටත් අවස්ථාව දුන්නා නම් අපටත් දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

අනික් අය කළ දේ ඔබතුමා කරන්න එපා. ඔබතුමා ආදර්ශවත් වෙන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වෙලාව දෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේ සියලු දෙනා පොදු සාකච්ඡාවේ කළේ මේවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කමක්නැහැ. ඔබතුමා කරන්න එපා. මම කියන්නේ ඒකයි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඔබතුමා මට විතරක් කියලා හරියන්නේ නැහැ. එහෙම නම් කලින් ඉඳලාම නවත්වන්න ඕනෑ. ඒ නිසා

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය කියන්නේ හොඳ පක්ෂයක්. මේ පක්ෂයේ දැවැන්ත නායකයෝ හිටියා. කවුද? නිදහසේ පියා එක්සත් ජාතික පක්ෂයේ. ඊට පස්සේ ආවා බත් දුන් පියා. කවුද? එක්සත් ජාතික පක්ෂයේ. ඩඩ්ලි සේනානායක මහත්තයා. එයා බත් දුන් පියා. ඊට පස්සේ ආවා ජේ.ආර්. ජයවර්ධන මහත්තයා. ඒ දේශපාලනය අපි අනුමත කරන්නේ නැහැ. නමුත් එතුමාට රට ගැන කැක්කුමක් තිබුණා. එතුමා රට ගැන හිතලා මොකක්ද කළේ? බෙදුම්වාදී ක්‍රමය නවත්වන්න අනුපාත ක්‍රමය මේ රටට හඳුන්වලා දුන්නා. අනුපාත ක්‍රමය නිසා තමයි බෙදුම්වාදී විපක්ෂය නැවතුනේ. එතුමා අනුපාත ක්‍රමය හදලා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළා. එතුමා රටට ආදරය කළා. ඒ එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ. ඊට පස්සේ කවුද ආවේ? රණසිංහ ප්‍රේමදාස මැතිතුමා. එතුමාගේ දේශපාලනය අපට ගැලපෙන්නේ නැහැ. 60,000 ක් මිනී මැරුවා තමයි. නමුත් එතුමා ඊළම දෙන්නේ නැහැයි කිව්වා. වඳුරු හමුදාව එළවනවා කියලා එතුමා ඉන්දියන් හමුදාව රටෙන් පිට කළා. එහෙමයි එතුමා ඒකීය ලංකාවට රටට ආදරය කළේ. ඊට පස්සේ ආවා ඩී.බී. විජේතුංග මහත්තයා. එතුමා මොකද කළේ? එතුමා කිව්වා, ඊළම දෙන්නේ නැහැයි කියලා. එතුමාත් මේ රටට අත තිබ්බේ නැහැ. රට ආරක්ෂා කළා. ඊට පස්සේ තමුන්නාන්සේලාගේ නායකයා - රනිල් වික්‍රමසිංහ ආවේ 2001 දී. ඇවිල්ලා, මොකක්ද කළේ. මේ රට බෙදන න්‍යාය පත්‍රයකට ගිහිල්ලා, අත්සන් කරලා දීලා, පැකේජ් එක දෙනවා කියලා පොරොන්දු වෙලා වෙනම රටක් නිර්මාණය කළා.

අද තමුන්නාන්සේලා අපට මතක නැහැ. එදා උතුරු නැගෙනහිරට යන කොට ගියේ LTTE එකෙන් අවසර අරගෙන. බස්වලින් රුපියල් 3000 ක් ගත්තා. වෑන්වලින් 2000 ක් ගත්තා. ටිකට් කැඩුවා. පොලීසියෙන් ඇල්లුවා. LTTE පොලීසියෙන්. දඩය ගෙව්වේ එහේ තිබෙන උසාවියට. වෙනමම රටක් නිර්මාණය කරලා තිබුණා. මේවා දැන් තමුන්නාන්සේලා කාටවත් මතක නැහැ. දැන් නැවත වතාවක් ඇවිල්ලා ඒ න්‍යාය පත්‍රයට තමයි එතුමා යන්න ගියේ. ඒ න්‍යාය පත්‍රය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ගැලපෙන්නේ නැති නිසා තමයි මට ඒකීය ලංකාව වටිනවා. දේශීය චින්තනය වටිනවා. ඒ නිසා මේ අයත් එක්ක ඉන්න බැහැයි කියලා එතුමා එළියට බැස්සේ. එක්සත් ජාතික පක්ෂයේ හිටපු නායකයෝ රට ආරක්ෂා කරද්දී, ඒ අය ඒකීය ලංකාව ආරක්ෂා කරලා යද්දී රනිල් වික්‍රමසිංහ මහත්තයා දැන් මේ කරන්න හදන්නේ රට බෙදන ව්‍යවස්ථාවක් ගෙනැල්ලා, රට කඩලා, විදේශයන්ට කඩේ ගිහිල්ලා මේ යන ගමන නවත්වන්න තමයි විසුරුවේ. ඒකෙන් ලොකු අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම දරුවන්ට නිල ඇඳුම් ගන්න විධියක් නැහැ. නිල ඇඳුම් ප්‍රශ්නය විසඳගන්න බැහැ. නමුත් වවුචර් ටික තිබෙනවා. අපේ අයත් වැරදියි. දෙන්න ඕනෑ. අකිල විරාජ් කෝටි තුනහා මාරක් ගහපු වවුචර්පත තිබෙනවා තමයි. ඒ වවුචර්පත් හරි බෙදලා මේ ළමයින්ගේ නිල ඇඳුම් ප්‍රශ්නය විසඳන්න ඕනෑ. අපේ බස්නාහිර පළාතේ ජනතාව 6,190,000 ඉන්නවා. මේ ළමයි විසි ලක්ෂයකට වඩා ඉන්නවා. මේ ළමයින්ගේ ප්‍රශ්නය විසඳන්න වගකීමක් තිබෙනවා. ඒ නිල ඇඳුමවත් දෙන්න බැරි වෙලා තිබෙනවා, එක්සත් ජාතික පක්ෂය රනිල් වික්‍රමසිංහ මහත්තයා මේ කළ අපරාධය නිසා.

එක්සත් ජාතික පක්ෂයේ බත් දුන් පියා, ජාතියේ පියා මේ අය එක්සත් ජාතික පක්ෂයේ හිටියා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? එක්සත් ජාතික පක්ෂයේ වර්තමාන නායකයා. තමුන්නාන්සේලාට පුළුවන් නමක් දාන්න. මම හිස් තැනක් විතරක් තියනවා. ජාතියේ මහා හිස් තැනක් පියා කියලා දා ගන්න. රනිල් වික්‍රමසිංහ මහත්තයාට පුළුවන් ඒ නම දා ගන්න එක තමයි තමුන්නාන්සේලාගේ යුතුකම. එතුමා එක්සත් ජාතික පක්ෂයත් සුද්ධ කරලා, මේ රටත් සුද්ධ කරලා - මෛත්‍රීපාල ජනාධිපතිතුමාත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එකතු වෙලා අලුත් රටක් මේ රටේ නිර්මාණය කරනවා. ඒ රටේ තමුන්නාන්සේලාට අවශ්‍ය යහපාලනය අපට තමයි ගේන්න පුළුවන් වන්නේ. රට බේරාගත් නායකයාත්, ඒ වාගේම යහපාලනයට උර දුන් නායකයාත් එකතු වෙලා තිබෙනවා. අපි අකමැතියි තමයි. තවම හිත හදා ගන්න බැහැ. පැනලා ගිහිල්ලා ගෙදරට ආවාට. එතැන ප්‍රසන්නතාවයක් නැහැ තමයි. නමුත් රට වෙනුවෙන් ගත් තීන්දුවට අපි සියලු දෙනා එකතු වෙලා අත් දෙකම උස්සලා මේ මහ ඇමතිතුමාවත්, අපේ ආණ්ඩුවත් ශක්තිමත් කරන්න අපි එනවා. තමුන්නාන්සේලා භය නැත්නම් ඡන්දයට ඇවිල්ලා, ඡන්දයට මුහුණ දීලා ප්‍රජාතන්ත්‍රවාදය රකින්න උදව් කරන්නය කියන ඉල්ලීම කරමින් ලබන්නා වූ නව වසර ඔබ සැමට සුභ පතමින් අපිත් එක්ක ඉඳලා -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපට කාලය මදි වෙනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

බීලා ගිහිල්ලා ළමයෙකුව හප්පලා, ළමයා මහ මග දාලා ගිහිල්ලා, CCTV කැමරා ගලවලා. අද ඒ ළමයා තවම එක තැන. අපි එහෙම හප්පලා ගියේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමාට දිව පැටලෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙයත් බීලා

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඒ නිසා මතක තියා ගන්න. තමුන්නාන්සේලාගේ නායකයාත් බීලා තමයි ළමයෙකුව හප්පලා මහ මග දාලා, CCTV කැමරා ටික ගලවාගෙන ගියේ. ඉතිරි ටිකත් අහගන්න ඕනෑද? ඒ නිසා මගේ කාලය අවසන් නිසා තමුන්නාන්සේලා සියලු දෙනාටම, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව පළාත් සභාවෙන් පාර්ලිමේන්තුවට යන්න ඡන්දය ඉල්ලන අයට අපේ සුභ පැතුම් එක් කරමින් විශේෂයෙන්ම අපෙත් එක්ක ඉඳලා කිහිප දෙනෙක් මිය ගියා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය මදි වෙනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ලබන්නා වූ නව වසර හා නත්තල ප්‍රීතිමත් නත්තලක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.46 ]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී අපි දන්නවා. විසර්ජන පනත් කෙටුම්පත කියලා කියන්නේ, ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධව විවාදයට ලක් කරන අවස්ථාව. අපි හැම වසරකම විසර්ජන පනත් කෙටුම්පතට අපගේ විරෝධය ප්‍රකාශ කළා. ගරු සභාපතිතුමනි, ඒක අපේ ප්‍රතිපත්තියක්. අපි දරන දේශපාලන මතය. පළාත් සභා සම්බන්ධව අපේ තිබෙන ඒ අදහස මේ සියල්ලත් එක්කම අපි විසර්ජන පනත් කෙටුම්පතට හැම අවුරුද්දකම අපේ විරෝධතාවය ප්‍රකාශ කළා.

දැන් උදාහරණයක් හැටියට කිව්වොත් එහෙම ඒ අපි කරපු විරෝධය, ඒකට විරෝධය දැක්වීම, විරුද්ධ වීම ඇත්තටම ඒක සත්‍යයක් බව වැටහෙන්නේ, දැන් මේ පසුගිය විෂයන් යටතේ අපේ ගරු අමාත්‍යවරු පවා, විසර්ජන පනත් කෙටුම්පතේ තිබුණු ඒ මූල්‍ය බෙදීමට තමයි විරුද්ධ වුණේ. දැන් උදාහරණයක් හැටියට කෘෂිකර්ම අමාත්‍යතුමා මෙතැන තමන්ගේ ඒ අදහස් ප්‍රකාශ කිරීමේදී කිව්වා, තමන්ට කෘෂිකර්මය පිළිබඳව, බස්නාහිර පළාතේ සංවර්ධනය සම්බන්ධව අදහසක් තිබෙනවා. හදන්න ඕනෑ. ගොඩ නගන්න ඕනෑ. නමුත් ඒකට අවශ්‍ය මුදල් මට හම්බ වුණේ නැහැ. ඒක දුක් ගැනවිල්ලක්. එතකොට ගරු සභාපතිතුමනි, ඒ නිසා තමයි අපි ගිය අවුරුද්දේ ඒ විසර්ජන පනත් කෙටුම්පතට විරුද්ධ වෙලා තිබෙන්නේ. අපි ඒ සම්බන්ධව විරෝධය දක්වන කොට, ඔබතුමන්ලාට විරෝධයක් හැටියට තමයි ඒක දැනෙන්නේ. නමුත් ඇත්ත. ඒක තමයි ප්‍රතිපත්තිය. ඒක හරි. ඒක තමයි ඇත්ත. ඒ නිසා තමයි අපි ඒකට විරුද්ධත්වය ප්‍රකාශ කරලා තිබෙන්නේ. මේ හැම දෙයක් තුළින්ම බොහෝ වෙලාවට ඒක තමයි සිද්ධ වෙන්නේ. සමහර දේවල්වලට අපි විරුද්ධ වුණාට පස්සේ ඒක විරෝධයක් හැටියට තමයි ගණන් ගන්නේ. හැබැයි, අපි දක්වන විරෝධයම සමහර වෙලාවට තමුන්නාන්සේලාගේ පැත්තෙන් ඒ විරෝධය නිරායාසයෙන් එනවා. හැබැයි, ඒක විරෝධයක් හැටියට සලකන්නේ නැහැ. මම මේ කියන්නේ ඒකයි. ඒ නිසා මේ පසුගිය අවුරුදු ගණනාව ඇතුළතම අපි විසර්ජන පනත් කෙටුම්පතට විරෝධය දැක්වීම හරි. ඒක ඇත්තක්. ඒක කළ යුතු දෙයක් බව තමයි මේ හරහා ඔප්පු වෙන්නේ. මේ අවසාන එකේ නිසා මම ඒක පැහැදිලි කළේ. ඒ නිසා තමයි අපි හැම

අවුරුද්දේම පළාත් සභාවේ විසර්ජන ප්‍රඥප්තියට විරෝධය ප්‍රකාශ කරලා තිබෙන්නේ. එතකොට මේ අයවැය සම්මත වීම සම්බන්ධව ඒ අවුරුදුවල ගරු සභාපතිතුමනි, අවධානමක් තිබුණේ නැහැ. අපි විසර්ජන ප්‍රඥප්තියට විරුද්ධ වුණාට, අපි ඒ හැම අවුරුද්දකම වැය ශීර්ෂන්වලට විරුද්ධ වුණේ නැහැ. අයවැයවලදී අපි වැය ශීර්ෂයන්ට විරුද්ධ නොවීම සම්බන්ධව ගැටළුවක් මතු වුණෙත් නැහැ. මොකද, ඒ මොහොත වන කොට තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් එක්ක බොහොම සහයෝගයෙන්, සමාදානයෙන් නිල නොවන සමාදානයක් තිබුණා. මොකද, අපි විරුද්ධ වෙද්දී එතුමන්ලා බොහෝ වෙලාවට නිහඬව සහයෝගය ප්‍රකාශ කළා. මට මතක හැටියට පක්ෂවත් ඡන්දය දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යහපාලනය.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා ඒකේ බරපතළ විධියට ප්‍රශ්නයක් තිබුණේ නැහැ. හැබැයි, දැන් මේ ගමන අපි පොදු සාකච්ඡාවේදී පැහැදිලිව කිව්වා, වැය ශීර්ෂවලට විරුද්ධ වෙනවාය කියලා. ඒ වැය ශීර්ෂවලට විරුද්ධ වෙනවාය කියලා මම ප්‍රකාශ කළෙත්, මම දන්නවා. ඒ ප්‍රකාශයත් එක්ක මෙතැන ඒ දේශපාලන තත්ත්වයන් මේ සභාව ඇතුළේ වෙනස් වෙනවා. ඒක එහෙම වෙන බව දැනගෙන හිටියා. ඒ නිසා තමයි මම කෙළින්ම කිව්වේ, මේ ගමන අපි වැය ශීර්ෂවලට විරුද්ධ වෙනවා කියලා. මොකද, එතකොට තමුන්නාන්සේලාට අයවැයේදී යම්කිසි සූදානම් වීමක් කරන්න පුළුවන්. ඒක තමයි අපේ සදාචාරය. අපි ඒක හොරෙන් කරපු එකක් නොවෙයි. ඒක ඇති වන නිසාම තමයි, වර්තමාන රටේ තිබෙන දේශපාලන තත්ත්වයත් එක්ක මේක මතු වන නිසා තමයි, මම මගේ පැත්තෙන් පොදු සාකච්ඡාවේදී අවසානයේ මම කිව්වේ, මේ ගමන අපි වැය ශීර්ෂවලට විරුද්ධ වෙනවා. ඒ වාගේම පුළුවන්නම් පරද්දනවා කියලා. ඇයි? පැරදිය යුතුයි. ඒ පැරදිය යුත්තේ, එක පැත්තකින් මීට ඉස්සෙල්ලා අවුරුදුවලදී අපි අපේ අවස්ථාව ඒ වැය ශීර්ෂවලදී තමුන්නාන්සේට දුන්නාය කියලත් කියන්න පුළුවන්. මොකද, පළමුවැනි අවුරුදුවලදී රටේ විශේෂයෙන්ම 2015 දී පටන් ගත්ත ගමන. ඒ ගමන ඇතුළේ තමුන්නාන්සේලාට ඉඩකඩක් තිබෙන්න ඕනෑ, තමුන්නාන්සේලාගේ පැත්තෙන් වැඩ පෙන්වන්න. ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාගේ පැත්තෙන් ඒ සඳහා වැඩ පෙන්වීමේ අවස්ථාවක් තිබෙනවා. අනික් ඇමතිවරුන්ටත් තිබෙන්න ඕනෑ. නමුත් ඇත්තටම ඒ වෙලාවේ අපි ඒ කරපු දේ. ඒ වාගේම මේ සභාව ඇතුළේ අවස්ථාවාදී දේශපාලනයක් තිබුණා. ඒ තමුන්නාන්සේලාගේ පැත්තේ තිබුණේ. ඒ අවස්ථාවාදී දේශපාලනය. අපි ඒක පැහැදිලිවම කියනවා, ඒක අවස්ථාවාදී කියලා. මොකද හේතුව, කිසියම් පක්ෂයකින් ඡන්දය ඉල්ලලා තමුන්නාන්සේලා මේ පළාත් සභාවට ඇවිල්ලා තිබෙන්නේ. එතකොට තමුන්නාන්සේලාගේ මොකක් හරි අභ්‍යන්තර ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒක අභ්‍යන්තර ප්‍රශ්නයක්. ඒක ඇතුළේ ප්‍රශ්නයක්. ඒ ඇතුළේ ප්‍රශ්නය තමුන්නාන්සේලා විසඳා ගන්න ඕනෑ. හැබැයි, අපි දැක්කා, අභ්‍යන්තරව ඒ තිබුණු ප්‍රශ්නය උපයෝගී කර ගනිමින් මෙතැන පුද්ගලයින් මාරු කර ගැනීමේ උවමනාවක් තිබුණා. ඇමතිවරු මාරු කර ගැනීමේ උවමනාවක් තිබුණා. ඒ අවස්ථාවාදී දේශපාලනයට අපි කැමැති නැහැ. අපට අදාළ නැහැ මේකේ ඇමතිකම් දරන්නේ ඉසුර දේවප්‍රියද? උපාලි කොඩිකාරද? එහෙම නැත්නම් මෙරිල් පෙරේරාද? ඒක අපට අදාළ නැහැ. ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි.

හැබැයි, ඒක ඇතුළේ තිබුණා. අපි ඒ වෙලාවේ වැය ශීර්ෂවලට විරුද්ධ වුණා නම් ඒ තත්ත්වය පාවිච්චි කිරීමෙන් අවස්ථාවාදය ජයග්‍රහණය කරනවා තමුන්නාන්සේලාගේ පැත්තෙන්. ඒ නිසා ඒ අවස්ථාවාදයට ඉඩකඩක් අපි ලබා දෙන්න ඕනෑ නැහැ. අන්න ඒ නිසා ඒ ඉඩකඩ ලබා නොදීමට අපි අපේ පැත්තෙන් තීරණය කළා. ඒ නිසා ඒ අවස්ථාවලදී සමහර වෙලාවට වෙන්න තිබුණු තත්ත්වයන් වෙනස් වුණා. මම හිතන්නේ, අද තමුන්නාන්සේලාගේ අමාත්‍ය මණ්ඩලයට ඒක මතක නැහැ. ඒක ප්‍රශ්නයක් නැහැ. අපි හිතන්නේ නැහැ ඒක මතක තියාගෙන ඉන්න ඕනෑ කියලා. අපට එහෙම ඕනෑත් නැහැ. හැබැයි, එහෙම වුණා. ඒ නිසා තමයි අපි වැය ශීර්ෂවලට ඡන්දය ඉල්ලන කොට සමහර වෙලාවට තමුන්නාන්සේලාගේ පැත්තේ ඇමතිවරුන්ගේ කටවල්වලින් පොඩි හින්ට් පාස් වුණා. පොඩි කෑලි ගියා. ඒ කෑලි අතරේ තිබුණා, අපි මේ කාටද උදව් කරන්න හදන්නේ? අපි එක්සත් ජාතික පක්ෂයේ වලිගයක් වෙලාද? අපි මේ එක්සත් ජාතික පක්ෂයට කඩේ යනවාද? ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි කියන්නේ, අපි කිසිම කෙනෙකුට කඩේ යන්නේ නැහැ. අපි

[ ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

ජාතික දේශපාලනයේත් එහෙමයි. මේ පළාත් සභාවේත් එහෙමයි. අපව කඩේ යවන්න පුළුවන් කණ්ඩායමක්ද අපි. අපි මොකටද කාටවත් කඩේ යන්නේ? අපි කඩේ ගිහිල්ලා මොනවාද තමුන්නාන්සේලාගෙන් ගන්නේ? මොනවාද ගන්න තිබෙන්නේ? අපට ගන්න දෙයක් නැහැ. හැබැයි අපි දන්නවා, මෛත්‍රීපාල සිරිසේන මහත්තයා කඩේ ගිහිල්ලා තිබෙනවා. එයා ගිහිල්ලා තිබෙනවා. එයා ගිය නිසා තමයි එයා කියන්නේ, 2015 දී එක්සත් ජාතික පක්ෂයත් එක්ක එකතු වෙන කොට ඒ වෙලාවේ දැනගෙන හිටියේ නැහැයි කියලා මේ තිබෙන්නේ, ඩී.එස්. ගේ, ඩඩ්ලි ගේ යූ.එන්.පී. එක නොවෙයි කියලා. හැබැයි, මුළු රටම දන්නවා ඩී.එස් ගේ, ඩඩ්ලි ගේ යූ.එන්.පී. එක දැන් නැහැයි කියලා. හැබැයි, එතුමා දැනගෙන ඉඳලා නැහැ. ඒක තමයි එතුමා කිව්වේ, මම දැනගෙන හිටියේ නැහැ.

ඊළඟ එක තමයි, ඊයේ පෙරෙයිදා මෛත්‍රීපාල සිරිසේන මහත්තයා කිව්වේ, රනිල් වික්‍රමසිංහ මහත්තයා සම්බන්ධව. රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ප්‍රතිපත්තිය මේ රටේ දේපළ විකුණන එක කියලා මෛත්‍රීපාල සිරිසේන මහත්තයා දැනගෙන ඉඳලා නැහැ. අපෙන් ඇහුවා නම්, අපි කියනවා. එතුමා දන්නේ නැහැ, එතුමාගේ ප්‍රතිපත්ති මොනවාද කියලා. ඒක මේ රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ වැරැද්දක් නොවෙයි. මම මේ කියන්නේ රනිල් වික්‍රමසිංහ මහත්තයාට - එක පැත්තකින් රනිල් වික්‍රමසිංහ මහත්තයා හරි අවංක මිනිහෙක්. මම කියනවා. ඒක සමහර විට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට වලංගු නැති වුණාට මම කියනවා, ප්‍රතිපත්තියක් වශයෙන් රනිල් වික්‍රමසිංහ මහත්තයා හරි. ඇයි? තමන්ට තිබෙනවා දර්ශනයක්. තමන්ට තිබෙනවා, ප්‍රතිපත්තියක්. ඒ නව ලිබරල්වාදී ප්‍රතිපත්තිය. එතුමා කෙළින්ම කියන්නේ. එතුමා ඒ ප්‍රතිපත්තිය වෙනුවෙන් පෙනී සිටිනවා. මේ රටේ ධනේශ්වර පන්තියේ හොඳම නියෝජිතයා තමයි රනිල් වික්‍රමසිංහ මහත්තයා. ඒක අපි දන්නවා. ඒක දැනගෙන තමයි අපි මේ දේශපාලනය කරන්නේ. අපි යනවාද රනිල් වික්‍රමසිංහට කඩේ. මොකද, එතුමා නියෝජනය කරන්නේ ධනේශ්වර දේශපාලනය. නියෝජනය කරනවා විතරක් නොවෙයි. එතුමා ඒක හංගලා ගහන්නේ නැහැ. එතුමා ඒක වෙනුවෙන් කෙළින් පෙනී සිටිනවා. ඇත්තටම එක පැත්තකින් රනිල් වික්‍රමසිංහ මහත්තයාට මොනවා වුණත් ප්‍රතිපත්තියක් තිබෙන මිනිහෙක් කියලා අපි කියන්නේ. ඒවා අනික් පැත්තට අරන් අපව මාට්ටු කරන්නේ, ඔන්න යූ.එන්.පී. ඔන්න රනිල්ගේ පැත්තේ ඉන්නේ කියලා. ඒක තමයි රනිල් වික්‍රමසිංහ. මොකද, මේ රටේ බිහි වුණු හොඳම ධනේශ්වර දේශපාලඥයා තමයි ජේ.ආර්. ජයවර්ධන මහත්තයා. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා නැති වුණාට පස්සේ ඉන්න හොඳම ධනේශ්වර දේශපාලඥයා තමයි රනිල් වික්‍රමසිංහ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මුණුබුරා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මුණුබුරා. ඔව්. රනිල් වික්‍රමසිංහ. ඉතින් එයා ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. ඒ නිසා එයා විකුණන එක අහන්න දෙයක් නැහැ. එයාගේ ප්‍රතිපත්තිය සම්බන්ධව ආපහු අහන්න දෙයක් නැහැ. එයාගේ ප්‍රතිපත්තිය තමයි පෞද්ගලීකරණය. ඒ වෙනුවෙන් එයා කොහොමින් හරි කටයුතු කරනවා. මෙතැනින් අල්ලන්න බැරි නම්, මෙහෙම හරි කොහොම හරි අල්ලලා ගන්නවා. ඒක තමයි එයා කරන්නේ. ඉතින් ඒක මෛත්‍රීපාල සිරිසේන මහත්තයා දැනගෙන හිටියේ නැහැයි කියලා කියන්නේ, අර Facebook වල තිබෙනවා මෛත්‍රීපාල සිරිසේන මහත්තයාව පොඩි එකෙකුට අන්දලා. අන්න ඒ වාගේ එකක් වෙලා. හරි. එහෙම දන්නේ නැහැයි කියලා කියන්නේ. දැන් Facebook වල කුක්කු බබෙක් ඉන්නවා. තමුන්නාන්සේලා බැලුවොත් පේනවා. ඒක දන්නේ නැහැයි කියලා කියන්නේ බොරුවක්. ඇත්තටම ඒ වෙනුවෙන් මෛත්‍රීපාල සිරිසේන මහත්තයා කඩේ ගියා. ඒ වෙලාවේ බැලුවේ තමන්ගේ ජනාධිපතිකම. ඒ වෙලාවේ බැලුවේ තමන්ට ජනාධිපතිකම හම්බ වෙනවා. කමක් නැහැ. කාගෙත් එක්ක හරි ගියාට ප්‍රශ්නයක් නැහැයි කියලා. නමුත් ගිහිල්ලා අසාර්ථකයි. ඒ අසාර්ථක වුණේ, එයා පුද්ගලයෙක් විධියට අසාර්ථකයි. එතැනට ගියා නම් සමහර විට වෙන දේශපාලඥයෙක් අද ඔහොම නොවෙයි. අද ඔය ප්‍රශ්නය එන්නේ නැහැ. හැබැයි, එයා පුද්ගලයෙක් විධියට අසාර්ථකයි. මම කියන්න යන්නේ නැහැ, එයා පුද්ගලයෙක් විධියට අසාර්ථකත්වයට හේතු මොනවාද කියලා මම කියන්න යන්නේ නැහැ. සමහර විට ඉංග්‍රීසි භාෂාව සම්බන්ධව තිබෙන අඩු දැනුම ඒකට හේතු වෙන්න ඇති. මම පොඩි කැල්ලක් කිව්වේ. ඒ නිසා ඒකට

ගැලපෙන්නේ නැතිව ඇති. අර අපි කියන්නේ, ගැන්සියට වැටෙන්නේ නැහැයි කියලා. අන්න ඒ වාගේ හරියට කිව්වොත් තේරෙනවා. පුල්වූර් පන්තියත් එක්ක. ඒ නිසා සමහර වෙලාවට අපි හිතනවා. මොකද, ඔපමණ අවුරුදු තුනහාමාරක් එකට හිටපු මිනිහා 225 ම කැමැති වුණත් -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමා, විසර්ජන ප්‍රඥප්තිය කථා කරන්නේ. ඔබතුමා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

විසර්ජන ප්‍රඥප්තිය. මේකට අදාළයි. ඒකයි වෙලා තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අපි කථා කරන කොට අදාළ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ජේ.වී.පී. එක කථා කරන කොට ඒක අදාළයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක අදාළ කර ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමාගේ ආරම්භය නම් හරිම හොඳයි. ලස්සනට ආවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒකත් අදාළ කර ගන්න හැටි ඉගෙන ගන්න. ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමා කියන කොට විසර්ජන ප්‍රඥප්තිය කියලා මම දන්නවා. මේක මේ ඒකට කොටු වෙන්නේ කියලා. ගරු සභාපතිතුමනි, ඔබතුමා කරලා ඇති දහයේ පන්තියේදී කුලක පාඩම.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔව්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කුලක කියලා පාඩමක් තිබෙන්නේ. ඒ කුලක කියන පාඩමේ තිබෙනවා මහා කුලකයක්. ඒ මහා කුලකය ඇතුළේම තමයි මේ කුලකත් තිබෙන්නේ. මේ පළාත් සභාවත් තිබෙන්නේ. රට කියන මහා කුලකයක් තිබෙනවා නේ? අන්න ඒ රට කියන මහා කුලකය ඇතුළේ තමයි බස්නාහිර පළාත් සභාව තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

හොඳයි. අපට කාලය තිබුණා නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔන්න ඕකයි වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි මේවා අදාළ වෙන්නේ. ඒක නිසා ඕක තමයි ඇත්ත තත්ත්වය. ඒක අද අපේ රටටත් බලපාලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාව හැටියට අපේ පළාත් සභාවටත් බලපාලා තිබෙනවා. අන්න ඒ නිසා අද රටේ අයවැයක් නැතිව අපට සිද්ධ වෙලා තිබෙනවා, බස්නාහිර පළාත් සභාවේ විසර්ජන ප්‍රඥප්තිය ගැන කථා කරන්න. ගරු සභාපතිතුමනි, මේක හරිම විහිළුවක්. අපි දින වකවානු දා ගෙන තිබුණා තමයි. මීට ඉස්සෙල්ලා, මම 1999 බස්නාහිර පළාත් සභාවේ ඉන්න කොට, අපි රෙජිනෝල්ඩ් කුරේ මහත්තයලා ඉන්න කොට, සුසිල් ප්‍රේමජයන්ත මහත්තයා ඉන්න කොට, එතකොටත් අපි රටේ අයවැයට ඉස්සෙල්ලා කථා කරනවා, බස්නාහිර පළාත් සභාවේ අයවැය. කථා කරන්න පුළුවන්. ඇයි? කලින් අපට බස්නාහිරට එවනවා, මෙන්න ඔබලාගේ මුදල්. මෙන්න බස්නාහිරට මුදල් වෙන් වෙන හැටි. ඒ තොරතුරුත් එක්ක තමයි අයවැය හදන්නේ. නමුත් අද එහෙම නැහැ. මේක හරිම විකෘතියක්. මේ කථා කරන්නේ විකෘතියක්. මේ විකෘතිය කියලා කියන්නේ, තේරුම් ගන්න. මේ විකෘතිය කොපමණද කියලා කිව්වොත්, අපි දන්නවා. මේ කමිසයට යටින් අපි අඳිනවා බැනියමක්. සමහරු

[ ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

අදින්නේ නැහැ. මම හිතන්නේ ගොඩාක් කට්ටිය අදිනවා. මේ කමිසයට යටින් බැනියමක් අදිනවා. අපි මේ කමිසය ඇඳලා ඊට පස්සේ බැනියම ඇන්දොත් මොන විකෘතියක් ද තිබෙන්නේ. මේ කමිසය ඇඳලා ඉවර වෙලා ඊට උඩින් අපි බැනියම ඇන්දොත් කොයි තරම් විකෘතියක්ද?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මෝඩ් වාගේ වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අන්න ඒ වාගේ විකෘතියක් තිබෙන්නේ. විහිළුවක් තිබෙන්නේ.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

එතුමාගේ පස්සෙන් ගියා නේද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා මගේ කථාව අවසන් කරන්න ඉස්සෙල්ලා කියන්න ඕනෑ. ගරු මහ ඇමතිතුමා කිව්වා, මේවාට විරුද්ධ වෙන මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන දෙන්නේ නැහැයි කියලා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

එතුමා කේන්ති ගියාම එහෙම කියනවා. ඒවා ගණන් ගන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කරපු අන්තිම නරක, කැත ප්‍රකාශයක් කළේ. මේ දේශපාලනයේ ප්‍රාථමික එකක් මම මේ කියන්නේ ඒ නිසයි. බොරු කියන්න ඕනෑ නැහැ. ප්‍රාථමික කථාවක් එතුමා කළේ. විසර්ජන ප්‍රඥප්තියේදී එතුමා මේකට උත්තරය දුන්නොත් හොඳයි. ඇත්තටම ඉසුර දේවප්‍රිය ගරු මහ ඇමතිතුමා ගෙදරින් ගෙනැල්ලා අපට අනේ සත පහක්වත් දෙන්න එපා. ගෙදරින් ගෙනැල්ලා, අපට දෙන්න එපා. අපි ගන්නේ නැහැ. හැබැයි, මේ රටේ ජනතාවගේ බදු මුදල්. මහජන නියෝජිතයෝ හැටියට ඒ බදු මුදල් අපි කාටත් අයිතියි. අන්න ප්‍රජාතන්ත්‍රවාදය. අන්න ඒක තමයි වෙන්න ඕනෑ. අපි කාටත් අයිතියි. ඒ නිසා බෙදනවා නම්, බෙදෙන්න ඕනෑ හරියට. මම එහෙම කියන්නේ නැහැ තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශවලත් මුදල් බෙදන්න ඕනෑ කියලා. නැහැ. මහජන නියෝජිතයෝ හැටියට බෙදෙන්න ඕනෑ. එහෙම බෙදෙන්නේ නැත්නම් ඒක බෙදා ගැනීම සඳහා බස්නාහිර පළාතේ ජනතාව එකතු කරන්නත් අපි දන්න බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 05.03 ]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධව කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව මම සම්පූර්ණ සතුට පළ කරනවා. 2019 වර්ෂයේ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය රුපියල් 81,280,560,000 ක පමණ මුදලක් දාලා තිබෙනවා. ඒ මුදල විවිධ අමාත්‍යාංශවලට යොදලා ඒ ඒ අමාත්‍යාංශ යටතේ විෂයයන්වලට බෙදලා දීලා තිබෙනවා. දවස් පහක් අපි විවාද කරලා අද මේ විසර්ජන ප්‍රඥප්තිය යටතේ, අපේ ආණ්ඩුකාරවරයා හරහා අපේ ප්‍රධාන ලේකම්තුමා හරහා මහ ඇමතිතුමාට අපි බලය පවරන වෙලාව තමයි මේ. මේ වෙලාවේ මම සතුටු වෙනවා. ජනතා විමුක්ති පෙරමුණත්, අපේ දමිළ සහෝදරයකු වන කුහවර්ධන්

ගරු මන්ත්‍රීතුමාත්, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාත් කථා කරලා ඉවර වෙලා මට මේ අවස්ථාව ලබා දීම ගැන සතුටු වෙනවා. මොකද, මම මේ සභාවේ ආරම්භයේ ඉඳලා ඉන්න කෙනෙක්. මේ විසර්ජන ප්‍රඥප්ති, අයවැය, ඇමතිකම්, විවිධ තනතුරු, උපදේශක කාරක සභා ඔක්කොම තිබුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ වුණාට මහ ඇමති වෙන්න බැරිව ගියා නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ජනතා විමුක්ති පෙරමුණේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ කාලයක් සිටියා. චන්ද්‍රිකා කුමාරතුංග බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ තරඟ කරලා, ජනතා විමුක්ති පෙරමුණ ආසන 39 ක් ජයග්‍රහණය කළා. දෙකක් බෝනස් එකෙන් ඇවිල්ලා, එකක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දුන්නා ජනතා විමුක්ති පෙරමුණ. අද ආසන පහට බැහැලා. පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකකම අරගෙන තියෙනවා. අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනය, 19 වැනි සංශෝධනය ගැන තමයි අද ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ. දැන් මොකක්ද මේ ප්‍රශ්නය? අද මේ ඔක්කොම කියනවා. ආණ්ඩුවක් නැහැ. අයවැයක් නැහැ. පාර්ලිමේන්තුවක් නැහැ. කථානායකවරයෙක් නැහැ. කැබිනට් එකක් නැහැ. අගමැතිවරයෙක් නැහැ. ජනාධිපතිවරයා ඉන්නවා. දැන් ජනාධිපතිවරයාට සූට් එක අන්දලා, උඩින් බැනියම අන්දවන්න කථා කරනවා. ඇන්දුවා නියම සූට් එක තමුන්නාන්සේලා ඔක්කොම එකතු වෙලා. 2015 ජනවාරි 08 වැනිදා. ජනතා විමුක්ති පෙරමුණ, ටී.එන්.ඒ. එක, මුස්ලිම් කොංග්‍රසය, අපේ සෝභිත හාමුදුරුවන්ගේ කට්ටිය ඔක්කොම එක්ක එකතුවෙලා ඇන්දුවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අං දෙක අන්දලා තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අන්දලා ගියා අවුරුදු හතරක්. ඉසුර දේවප්‍රිය අපේ මහ ඇමතුමාත් ඒක ඇඳගත්තා. ඇඳලා ගියා අවුරුදු හතරක්. ගිහිල්ලා මොකක්ද වුණේ? අද මේ තත්ත්වයට ආවේ ඇයි? අද මේ ආණ්ඩුවේ තිබෙන එක්සත් ජාතික පෙරමුණ, ඒ කියන්නේ එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, TNA එක, මුස්ලිම් කොංග්‍රසය, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ, ඒ වාගේම වතුකරයේ දෙමළ පක්ෂ මේ සියල්ලක්ම එකතු වෙලා පාර්ලිමේන්තුවට ගෙනාපු යෝජනා ටික බැලුවාම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හැරිලා බලලා ආපහු අවුරුදු හතරකට පස්සේ මොනවාද ගෙනාවේ. 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ෆෙඩරල් ආණ්ඩුක්‍රම නීතිය උතුරට, මේ රටේ තිබෙන රාජ්‍ය දේපළ විකුණන්න, ගුවන් තොටුපලවල්, වරායවල්, අධිවේගී මාර්ග, සංස්ථා, ඒ වාගේ රජයට අයිති තිබෙන ඔක්කොම. ඊළඟට අධ්‍යාපනය පෞද්ගලිකකරණය කරන්න.

ඒ වාගේ මේ යෝජනා ඔක්කොම එන කොට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බැලුවා ඒ ඔක්කොමත් එක්ක ගෙනාපු මේ ආණ්ඩුවේ සමලිංගික පනත් යෝජනාව. අන්තිමට සමලිංගික පනතත් ගෙනාවා. දැන් නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා, පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා, ජනතා විමුක්ති පෙරමුණේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා තරුණ කාලයේ පාර්ලිමේන්තුවට ගිය මන්ත්‍රීවරු. ඒ ආණ්ඩු කාලයේ හිටියා කථානායකවරු. අපේ නායකයා ස්ටැන්ලි තිලකරත්න මැතිතුමා. පාර්ලිමේන්තුවේ කථානායකවරයා හැටියට හිටියා. කථානායකතුමාට මේ වාගේ ප්‍රශ්න ඒ වෙලාවේ ආවා. ඒ වෙලාවෙත් කැඩුනා ප්‍රේමදාස මැතිතුමාගේ කල්ලිය. ප්‍රේමදාස මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගාමිණී දිසානායක, ලලිත් ඇතුළත්මුදලි, මාවතගම ප්‍රේමචන්ද්‍ර මේ කණ්ඩායම ප්‍රේමදාස මැතිතුමාට විශ්වාසභංගයක් ගෙනාවා. අපේ ස්ටැන්ලි තිලකරත්න මැතිතුමා හොඳ සිහි බුද්ධියෙන් කල්පනා කරලා, තීරණය අරගෙන, එදා පාර්ලිමේන්තුව Settle කරලා, මේ රටේ - කරු ජයසූරියට මොක්කද වුණේ. කරු ජයසූරිය මැතිතුමාට එහෙම එකක් තිබුණේ නැහැ. ජනාධිපතිවරයා 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ 41 න් 2 පනත අනුව විසුරුවා හැරපු පාර්ලිමේන්තුව එයා කැඳවන්න උසාවියේ තුන් කට්ටුවක කථා කරන්න තිබුණු එක පස් කට්ටුවක කථා කරන නඩුවක් බවට පත් කොට අද ඇවිල්ලා පාර්ලිමේන්තුව ගෙනැල්ලා විනාශ කරලා, රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති කළා. කවුද ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දැන් කථා කරන්නේ? ජනතා විමුක්ති පෙරමුණ. කවුද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කළේ. ඡන්දයක් දාන්න බැහැ. ඡන්දයක් ඕනෑද? එපාද?

[ ගරු උපාලි කොඩිකාර ]

නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා එතකොට පාර්ලිමේන්තුවේ ඉන්නේ. කලගෙඩි ලාම්පු සෙල්ලම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගෙනල්ලා, ඡන්දය ඕනෑද එපාද කියලා අහන කොට ඔලුගෙඩි ගලවලා යන්න ගැහුවා. කපලා ගැහුවා. කෝට්ටුවේ ගහලා කිව්වා, ඡන්දය දාපු එවුන්ට මරණය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, -

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මේ බජට් එකද? ජනතා විමුක්ති පෙරමුණේ විවාදය ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මට වෙලාව දෙන එක බොහොම අමාරුයි. ඒ නිසා වෙලාවටම නවත්වන්න. ඔබතුමාට උපරිම තව විනාඩියයි දෙන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කථා කරන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයෙන් බලය බෙදලා පිහිටවපු බස්නාහිර පළාත් සභාවේ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳවයි. එතකොට කාටවත් මේකේ නැහැ බැහැ කියන්න බැහැ. දැන් මම මේ රටේ ඉතිහාසය ගැන කථා කරන්නම්. අද මේ වන කොට පාර්ලිමේන්තුවක් නැහැ. ඇයි පාර්ලිමේන්තුවක් නැති වෙන්න හේතුව? රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට එදා 2015 ජනවාරි 17 වැනිදා 46 ක් පාර්ලිමේන්තුව නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂය තිබෙද්දී ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒ වගන්තිය බලන්නේ නැතිව 29 සැරයක් පරාද වෙලා හිටපු රනිල් වික්‍රමසිංහ මැතිතුමාව රටේ අගමැති කරලා, කැබිනට් මණ්ඩලය පත් කරලා දුන්නා. ඒ වෙලාවේ අපි ඇහුවේ නැහැ නේ? උසාවියට ගියේ නැහැ නේ? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මේක දුන්නේ කොහොමද කියලා. අද මහින්ද රාජපක්ෂ මැතිතුමාට දුන්නාට පස්සේ තමයි උසාවි යන්නේ. නඩු දාන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය කථා කරන්නේ. ජනතා විමුක්ති පෙරමුණ නැවත ප්‍රජාතන්ත්‍රවාදය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක ඡන්දයෙන් ආවේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ තත්ත්වයට වැටිලා තිබෙනවා. ඒ නිසා අපි කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ අද බස්නාහිර පළාත් සභාව ගත්තාම මුස්ලිම් ජනතාව, දෙමළ ජනතාව, සිංහල ජනතාව, කතෝලික ජනතාව, මැලේ ජනතාව මේ වාගේ මිශ්‍ර පළාත් සභාවක් මේක. මේ සියල්ලම ඉන්න ජනතාව. ඒ නිසා මේ vision එකත් එක්ක ගත්තාම මේ විසර්ජන ප්‍රඥප්තියෙන් මෙපමණ මුදලක් වෙන් කරලා, එකට එක ගැලපෙන ආකාරයේ සංවර්ධන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන් වෙනවා. කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකේ ක්‍රමයක් නැහැ. ඒ නිසා තමයි ප්‍රශ්නය. අපි ඉදිරියට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් අපි ගෙනෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, බලය බෙදීම තුළ ඒ ගේන්නා වූ ක්‍රමවේදයත් එක්ක අපි සෑම අමාත්‍යාංශයකම හදනවා, ක්‍රීඩා අමාත්‍යාංශ අධ්‍යාපනයට එකතු කරන, අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක සංස්කෘතිය එකතු කරන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වැඩ සටහනක් අපි හදලා, ප්‍රඥප්තිය පළාත් සභාවේ අලුත් ක්‍රමයට වැඩ කරන්න කියලා මතක් කරමින්, අපේ බුලත් කොළෙන් තරඟ වැදිලා අපෙන් ගිය නවුසර් ෆවුසි ගරු මන්ත්‍රීතුමාට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කීර්ති කාරියවසම් මැතිතුමාට, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මැතිතුමා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 05.13 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි විසර්ජන ප්‍රඥප්තිය ගෙනැල්ලා ජනතාවට ලබා දෙන මුදල් පිළිබඳවත්, මධ්‍යම රජය පළාත් සභාවට වෙන් කරන මුදල පිළිබඳවත් අපි කථා කරන්න උත්සාහ කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නොවැම්බර් මාසය වන කොට මේ රටේ මධ්‍යම රජය අයවැයක් හදලා, ඒ අයවැය අනුමත කරලා, ඒ අමාත්‍යාංශවල විවාදය ඉවර වෙලා, ජනතාවට ජනවාරි 01 වැනිදා ඉඳන් ඒ රටේ ඉදිරි වර්ෂය සඳහා අවශ්‍ය ආදායම් වියදම් ඇතුළත් මුදල් ලේඛනයක්, ගිණුම් ලේඛනයක් හදලා තිබෙන්නේ. එහෙම බැරි වුණා නම්, අඩුම ගණනේ අතුරු සම්මත ගිණුමක් හදලා ඊළඟ මාස තුන සඳහා විධිමත් වැඩ සටහනක් ඕනෑ. එහෙම මොහොතක, මධ්‍යම රජයට අයවැයක් හදන්න බැරි වුණු මොහොතක මධ්‍යම රජයේ ආණ්ඩු පක්ෂය පාර්ලිමේන්තුවට එන්නේ නැති යුගයක, පාර්ලිමේන්තුවේ බහුතරය පෙන්වන්න බැරි මොහොතක, පනතක් සම්මත කර ගන්න බැරි මොහොතක, බස්නාහිර පළාත් සභාව අපි අයවැයක් හදලා ජනතාව ඉදිරියට ගිහින් කියනවා, මෙන්න බස්නාහිර පළාතේ ලබන වසරේ අයවැය කියලා. එහෙම අයවැයක් හදලා, අපට ගමනක් යන්න පුළුවන්ද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුදල් කොමිසමේ මහත්වරු බස්නාහිර පළාත් සභාව නොමග යවලා තිබෙනවා. මුදල් කොමිසම මේ පෙන්වලා තිබෙන ගණන් මේ ඔක්කොම මංගල සමරවීර මැතිතුමා මීට මාස හතරකට පෙර ඒ ඒ පළාත් සභා වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන පිළිබඳව ඒ ගත්ත පළමු තර්කය තමයි අද ගෙනැල්ලා මේ විධියට මුදල් කොමිසම ඉදිරිපත් කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපි තමුන්නාන්සේට කියනවා, අයවැයක් නැති රටක, අගමැති කෙනෙක් නැති රටක, කැබිනට් එකක් නැති රටක බස්නාහිර පළාත් සභාවේ අපි සිහින ලෝකයක තනි වෙලා ඉන්නවා.

අපි අහලා තිබෙනවා. ඉතිහාසයේ අධිකරණයට ඉදිරිපත් කරනවා, ව්‍යාජ ලිපි ලේඛන හදපු අය. අධිකරණයට ඉදිරිපත් කරනවා ව්‍යාජ පාස්පෝට් තියාගෙන හිටපු අය. නමුත් ගිය සතියේ අධිකරණය ව්‍යාජ අගමැතිවරයෙකුට හා ව්‍යාජ කැබිනට් මණ්ඩලයකට විරුද්ධව අතුරු තහනමක් දෙනවා. එහෙම රටක තමයි අද අපි බස්නාහිර පළාත් සභාව විධියට ඇවිල්ලා කථා කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි එදා කිව්වේ, ජනවාරි 08 වැනිදා දේදුනු විප්ලවය කියලා. ඒ දේදුනු විප්ලවය අපි කරන කොට මේ පැත්තේ ඉන්න එක මහත්තයෙක්වත් සිරිසේන මහත්තයාත් එක්ක හිටියේ නැහැ. සිරිසේන මහත්තයාව පෝෂණය කළේ, සිරිසේන මහත්තයාව ඒ තනතුරට අරගෙන ගිහිල්ලා වාඩි කෙරෙව්වේ මේ විපක්ෂයේ අද ඉන්න සියලුම පක්ෂවල නායකවරු සහ එක්සත් ජාතික පක්ෂයේ අසාමාන්‍ය කැප වීමයි. එදා අපි වතුරෙන් ගොඩ දාපු මාළුවෙක් වාගේ සිරිසේන මහත්තයාව ගෙනැල්ලා, මහවැලි කේන්ද්‍රයේ නවත්වලා පළමු වැනි කථාව කරන කොට බේරුවල ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ තරුණයෙක් රතිඤ්ඤා පත්තු කළාය කියලා අදත් ඔහු කොඳු නාරටියෙන් පල්ලෙහා පණ නැතිව උඩුබැලි අතට ඇඳක බුදියාගෙන ඉන්නවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්. අවුරුදු හතරක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඔහුට ගැහුවේ කවුද? ඔහුට ප්‍රහාරය එල්ල කළේ, රතිඤ්ඤා කරලක් පත්තු කරපු වරදට. හැබැයි, අද මේ රටේ විධායකයත් අහන ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නේ නැහැ. විධායකයට එදා අමතක වුණා. විධායකය එදා හිටියේ කුරුණෑගල කැළයක. රනිල් වික්‍රමසිංහ මහත්මයා මහින්ද රාජපක්ෂ මහත්තයාව හම්බ වෙන්න අරලිය ගහ මන්දිරයට යනවා. අද ඔය අගමැතිවරයාත් එක්ක ඉන්න, ව්‍යාජ අග්‍රාමාත්‍යවරයාත් එක්ක ඉන්න කණ්ඩායම එදා මහින්ද රාජපක්ෂ මහත්තයාට කිව්වේ යන්න එපාය කියලා. එහෙම කියන කොට රනිල් වික්‍රමසිංහ මැතිතුමා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාත් එක්ක කථා කර ගෙන, ඒක හරියටම සිරිසේන මහත්තයාට ලබා ගන්න කටයුතු කරලා දුන්නා.

[ ගරු නිරෝෂන් පාදුක්ක]

ජනමතයට ගරු කරලා හිටපු ජනාධිපතිතුමා ඒක පිළිඅරගෙන ගියා. හැබැයි, එතුමා යන කොට මොකක්ද සිරිසේන මහත්තයා ඇහුවේ? කවුද හෙලිකොප්ටර් දුන්නේ මහින්ද රාජපක්ෂට ගෙදර යන්න. එහෙම අහපු සිරිසේන මහත්තයා පසුගිය කාලයේ කියනවා, මමයි දුන්නේ හෙලිකොප්ටර් රාජපක්ෂට හම්බන්තොට යන්න. මේවා මේ රටේ දරුවෝ බලාගෙන හිටියා. මේ රටේ හැම පුද්ගලයෙකුම බලාගෙන හිටියා.

ගරු සභාපතිතුමනි. අපි බොහොම ගෞරවයෙන් මතක් කරනවා. මේ සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරු, අපි සියලු දෙනාම දන්නවා. සිරිසේන මහත්තයා මොකක්ද කළේ කියලා. එතුමාට සංස්කෘතික ප්‍රශ්නයක් තිබුණේ නැහැ. එතුමාට තිබුණේ භාෂාව පිළිබඳව ගැටළුවක්. ඒ ගැටළුව තුළ එතුමා අද පාර්ලිමේන්තුවේ 225 කට වෛර කරලා අද එතුමා කියනවා, පාර්ලිමේන්තුවේ 225 ම කිව්වත් මම රනිල්ට දෙන්නේ නැහැයි කියලා. එහෙම කියන ජනාධිපතිවරයෙක් ඉන්න රටක, එහෙව් ජනාධිපතිතුමා පත් කරපු මහ ඇමති ඉසුර දේවප්‍රිය මහත්තයා අපට කියනවා, අපේ උපමාන ප්‍රතිපාදන දෙන්නේ නැහැයි කියලා. ඒක ප්‍රශ්නයක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තාත්තා කළ දේ පුතා නොකළොත් නොට්ටිගේ පුතා. ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාගේ දේශපාලන තාත්තා මෛත්‍රීපාල සිරිසේන මහත්තයා. එයා කියනවා නම් 225 ම ඡන්දය දුන්නත් මම රනිල් වික්‍රමසිංහට දෙන්නේ නැහැයි කියලා. ඉසුර දේවප්‍රිය මහත්මයා මේ කියන දේ ගැන අපි පුදුම වෙන්න ඕනෑ නැහැ. හැබැයි, ඉසුර දේවප්‍රිය මහත්තයාට තනි කකුලෙන් බයිසිකල් පදින්න වුණේ මේ තනතුරේ වාඩි වෙන කොට. හැබැයි, මේ විපක්ෂයේ ඉන්න අපි ඔක්කොම ඉසුර දේවප්‍රිය ප්‍රධාන අමාත්‍යවරයාට ඔය පුටුවේ වගකීම් සහ රාජපකාරී ඉටු කරන්න හරියටම කෙළින් මේ විපක්ෂයේ ඉඳගෙන උදව් කළාය කියන එක ඉසුර දේවප්‍රියගේ හදවතේ තිබෙන සියුම්ම තැන සාක්කි දරයි. හදවතින් කියයි. හදවතේ කොනටම කැකැරිලා ගිහිල්ලා අපි තමයි නැවතුනේ. අපි තමයි deposit වුණේ. අපි එතැන deposit වෙන කොට මේ කණ්ඩායම කකුලෙන් ඇද්දා. එහෙම කරද්දීත් ඒ ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යවරයාට - හැබැයි, කිසියම් වූ අප එකඟ නොවන සමහර තැන් බොහොමයක් තිබුණත්, එතුමාට පළාත් සභාව පිළිබඳ අවබෝධයක් තිබුණා. ඒ නිසා අපි ඒ කාලේ උදව් කළා. එතුමා හොඳයි කියන දේට අපි ඔක්කොම නැගිට්ටා. හැබැයි, අද ඉසුර දේවප්‍රිය මැතිතුමාට කෙළෙහි ගුණ අමතක වෙලා. මම දන්නේ නැහැ හදවතින් කිව්වාද? එහෙම නැත්නම් කේන්තියෙන් කිව්වාද? එහෙම නැත්නම් මොන විධියට කිව්වාද කියලා. ඒක නොවෙයි. අද රටේ දේශපාලන අර්බුදයක් තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ජනාධිපතිවරණයට එන කොට කිව්වා, විධායකය සතු බලතල අඩු කරනවාය කියලා. ඒ අනුව අපි 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා විධායකයේ තටු කැපුවා. අපි කිව්වා. පියාඹන්න පුළුවන්. ඔබට කූඩු බඳින්න බැහැ. ඔබට පියාඹන්න පුළුවන්. කූඩු බඳින්න බැහැයි කියලා තුනෙන් දෙකේ බලයක් නැතිව කප්පාදු කරන්න පුළුවන් හැම බලයක්ම විධායකය සතු අපි කප්පාදු කළා. අද ඒ හින්දා තමයි විධායකය අඬන්නේ. ඒක හින්දා තමයි අද විධායකය වැලපෙන්නේ.

ඒ නිසා තමයි අද විධායකය පිස්සු නටන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ඒ කථා කරපු දේ අද තේරෙනවා. අපෙන් ඇහුවා, මොනවාද ඔබලා කළේ කියලා. අපි ස්ථාපිත කරපු ප්‍රජාතන්ත්‍රවාදය සමහරුන්ට තේරුනේ නැහැ. ඊත් අද මැතිවරණ කොමිසමේ සභාපතිවරයා නිහඬව ඉන්න කොට කොමිසමේ තවත් නිලධාරියෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් කියනවා, පාර්ලිමේන්තුව විසුරවපු ක්‍රමය වැරදියි කියලා. අද අන්න ඒක තමයි අපි හදපු ප්‍රජාතන්ත්‍රවාදය. රාජපක්ෂවරු පිළිබඳ තීරණ ගන්න හිටපු පොලිස් පරීක්ෂකවරයාව ජනාධිපතිවරයා මාරු කරන කොට පොලිස් කොමිසම කියනවා. බැහැ, ඔබට මාරු කරන්න. ඔහුව නැවතත් ඒ ස්ථානයට පත් කරන්න. අන්න අපි ඇති කරපු ප්‍රජාතන්ත්‍රවාදය. මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ඇඟේ හැපුණු දවසක්. එහෙම නොවුනා නම්, අද මේ රටේ පොලිස් ස්ථානාධිපතිවරු 400 ක් මේ වන කොට මාරු කරලා අවසානයි. ඒ නිසා මේක තමයි අපි හදපු දේ. තොරතුරු දැන ගැනීමේ පනත. ඒ නිසා මේ සියලු කාරණා මේ රටේ සිවිල් සමාජ ගත කළා. ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමා කිව්වත්, මම යහපාලනයේ product එකක් නොවෙයි කියලා. හැබැයි, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කියනවා, නැහැ, ඉසුර දේවප්‍රිය ඔබ යහපාලනයේ product එකක් කියලා. මම දන්නේ නැහැ දෙන්නාගෙන් කවුද හරි කියලා. එයා කියනවා. නැහැ,ඉසුර. ඔබ යහපාලනයේ product එකක් කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව තව දින 120 කටත් වඩා අඩු කාලයක් සඳහා තමයි මේ මන්ත්‍රීවරු මේ පුටුවල වාඩි වෙලා ඉන්නේ. ඒ නිසා

මේ හදන අයවැය අභියෝගාත්මක අයවැයක්. මේ අයවැය ඉලක්ක, අරමුණු කරා යා නොහැකි අයවැයක්. ඒ නිසා බොහොම අමාරුවෙන් ජනවාරි මාසයේදී අලුතෙන් හිතන්න වෙනවා. මම විශ්වාස කරනවා, මේ සභාව නැවතත් ජනවාරි මාසේ ආයිත් කැඳවන්න වෙනවා. කැඳවලා ආදායම් පිළිබඳව නැවතත් අලුතෙන් හිතන්න වෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාම්ප්‍රදායික අයවැයක් අපි දවස් හතරක් පුරා ඉදිරිපත් කළත් මේ යථාර්ථය කඩතුරාවකින් වැහිලා තිබෙනවා. ඒ නිසා මේ රට අස්ථාවර කළේ විධායකය. අද බස්නාහිර පළාත් සභාවේ අයවැය අස්ථාවර කරලා තිබෙන්නේ මේ රටේ විධායකය. ඒ නිසා මේ රටේ දෙකෝටි විසි ලක්ෂයක් ජනතාව තනි පුද්ගලයෙක් හින්දා දුක් විඳිනවා. රටක් අරාජික වෙලා තිබෙනවා. රටේ හෙට දවස විධායකය විනාශ කළාය කියන එක මේ උත්තරීතර සභාවට කියනවා. හැබැයි, අපට නම් ආරංචියිජනාධිපතිතුමා කියනවාය කියලා, රනිල් වික්‍රමසිංහ මහත්තයා එයාව විනාශ කළා කියලා. මම නම් දන්නේ නැහැ, කොහොම වුණාද කියලා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි තමුන්නාන්සේ ඉදිරියේ මේ කථා කරන්නේ. හිටපු ජනාධිපතිතුමා 1970 පාර්ලිමේන්තුවට ආපු ලාබාල මන්ත්‍රීවරයා. එතුමා දන්නේ නැද්ද දේශපාලන හැසිරීම, වට පිටාව. ඇයි? එතුමා හොරෙන් කාමරයක් ඇතුළේ ජනාධිපති ලේකම් කාර්යාලයේ කවුරුවත් දන්නේ නැතිව දිවුරුම් දෙනවා. එස්.බී. දිසානායක කියනවා. මමලු ඔක්කොම ප්ලෑන් කළේ. බම්බුව. ටී ෂර්ට් එකක් ඇඳගෙන හිටියේ දිවුරුම් දෙන දවසේ. දන්නේ නැහැ මොකටද එන්න කිව්වේ කියලා. යකෝ අගමැතිවරයෙක් දිවුරුම් දෙනවා නම් ටී ෂර්ට් ඇඳගෙන යනවාද? මේ මොන බොරුද? කාමරයක් ඇතුළේ තියලා, නිවාස අඩස්සියේ තියලා තමයි මහින්ද රාජපක්ෂ මහත්තයාව අගමැති කළේ. ව්‍යාජ අගමැති කළේ. ඒ නිසා මේ ජනාධිපතිතුමාට දැක්මක්, දර්ශනයක් නැහැ. එහෙම නම් ඇයි මහින්ද රාජපක්ෂ මහත්තයා මේ අගමැති පුටුවේ වාඩි වුණේ. එතුමා ඇයි අගමැති පුටුව භාර ගත්තේ. මේ රටේ යුධ ජයග්‍රහණයක් ලබා දුන් රාජ්‍ය නායකයෙක්. පක්ෂ භේදයකින් තොරව හැමෝම ගරු කරපු නායකයෙක්. ඇයි අද වැටෙන්න පටන් අරගෙන තිබෙන්නේ? තමන්ගේ පවුලේ අයට තිබෙන නඩුවලින් බේරෙන්න. තාජුඩීන් මිනී මැරුමෙන් බේරෙන්න. සිරිලිය ගිණුමෙන් බේරෙන්න. එතකොට සොහොන හදපු එකෙන් බේරෙන්න. හැඳුනුම්පත් ගනුදෙනුව. එතකොට බෙත්තාරාමේ ලයිට් ගලවා ගෙන ගියපු එක. කොටස් වෙළඳපොලේ සල්ලි අරගෙන තාරුණ්‍යයට හෙටක් දාපු එක. ලසන්ත වික්‍රමතුංග ඝාතනය. කප්පරක් තිබෙනවා. ඒ කප්පරෙන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඩේසි ආච්චි ගැන කිව්වේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ ඔක්කොමත් එක්ක ගත්තාම අපි පටන් ගත්තා දිනපතා නඩු අහන අධිකරණයක්. හැබැයි, ගිය මාසේ තමයි ඒකේ වැඩ ටික තිබුණේ. ඒ නිසා තමයි - හිටපු ජනාධිපතිතුමා ඇයි මෙහෙම මේකට පෙළඹුණේ? ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වගකීමෙන් කියන්නේ. මේ රටේ පළාත් පාලන ඡන්දය අවුරුදු දෙකහාමාරක් කල් දැම්මේ කවුරුවත් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා කියන එක කනගාටුවෙන් මේ සභාවට කියනවා. අපි කියන්නේ, පළාත් සභා නොවෙයි. මේ පළාත් සභා මැතිවරණ හැකි ඉක්මණින් තියන්න කියලත් අපි ඉල්ලනවා. ඒක කරන්නත් තමුන්නාන්සේලාගේ කට්ටිය පාර්ලිමේන්තුවට එන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ කැන්ටිමේ ඉඳන් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒ නිසා අපි කියනවා. මේ යථාර්ථය තේරුම් ගන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හරි පාර්ලිමේන්තුවක් දෙන්න. එතකොට එනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

2015 ජනවාරි 08 වැනිදා මහින්ද රාජපක්ෂ මහත්තයා පැරදුනාම අපේ ගම්වල අහිංසක ශ්‍රී ලංකාකාරයෝ ගියේ බස්වල. වන්දනා ගමන් යන්නේ. පොල් මල් ගහගෙන ගියේ. හම්බන්තොටට මහින්ද රාජපක්ෂව බලන්න, පොල් මල් ගහගෙන ගියේ. හැබැයි, ව්‍යාජ අගමැති විධියට දැන්

[ ගරු නිරෝෂන් පාදුක්ක]

මාසයකට ඉස්සෙල්ලා පත් වුණා. පොල් මල් ගහගෙන ගිය එකෙක්වත් ආවාද කොළඹ. නැහැ. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ගෙදර හිටියේ කවුද? ලංකාවේ පළමුවැනි ධනපතියෝ 20 න් 05 දෙනෙකුයි, කොටස් වෙළඳපොල මංකොල්ල කාපු අඩු ගණනට අරන් වැඩි ගණනට EPF එකට විකුණපු පට්ට හොරු ටික විතරයි වර්තමාන ව්‍යාජ අගමැතිවරයාගේ ගෙදර හිටියේ. බස්වල පොල් මල් ගහගෙන ගිය කට්ටිය කවුරුවත් නැහැ. ආවාද? හැබැයි, අපේ පක්ෂයත් වැටිලා හිටියා. හැබැයි, මේක ආශිර්වාදයක් වුණා. එදා මහින්ද රාජපක්ෂව බලන්න පොල් මල් ගහගෙන හම්බන්තොට ගියා වාගේ එක්සත් ජාතික පාක්ෂිකයෝ අරලිය ගහ මන්දිරයට ඇවිල්ලා රනිල් වික්‍රමසිංහව ආරක්ෂා කළාය කියන එක තමුන්නාන්සේට මතක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න. බොහොම ස්තුතියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවසාන වශයෙන් කියන්නේ. ඉසුර දේවප්‍රිය මහ ඇමතිවරයාගේ අවසාන අයවැය. එතුමාගේ අවසාන අයවැය. ඒ අවසාන අයවැයේදී අපි එතුමාට සුභ ප්‍රාර්ථනය කරනවා. කොහොම හරි පුළුවන් නම් ජනාධිපතිතුමාට කියලා - එතුමාගේ හොඳ සුවච කීකරු ගෝලයෙක්, ඉසුර දේවප්‍රිය මහත්මයා. මේ රටේ තිබෙන දේශපාලන අර්බුදයට මැදිහත් වෙන්න. නමුත් අපි දැක්කේ, ඉසුර දේවප්‍රිය මහත්තයා කටවුට් ගහලා තිබෙනවා, මහින්දවයි මෛත්‍රීවයි ජෝඩු කළා කියලා. කපු මහත්තයා පාට් එක දක්වලා. ඒක නොවෙයි අපට ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අපට ඕනෑ ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමනි, මෙන්න මේ අස්ථාවරත්වයෙන් ඉවත් කර ගන්න පුළුවන් නම් කපුකම කර ගන්න මහ ඇමතිතුමනි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 05.26 ]

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2019 වර්ෂයට අදාළ මුදල් ප්‍රකාශයේ විසර්ජන ප්‍රඥප්තියට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපි හිතනවා. අවුරුදු පහකට ජනතාව අපව පත් කරලා පළාත් සභා මන්ත්‍රීවරුන් හැටියට අපට මේ දක්වා මම හිතන විධියට විශාල වශයෙන් සංවර්ධනයක් කරන්නට අපට ඒ හැකියාව ලැබුණා. ගරු මහ ඇමතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් අපට මේ අවුරුදු හතර ඇතුළුව. මම හිතන්නේ, මේ අවසාන අපගේ අයවැය. අවසාන අවුරුද්ද. අප්‍රේල් 21 ට කලින් මම හිතන්නේ, මේ මාස හය තුළ මේ අයවැයෙන් අපි බලාපොරොත්තු වෙනවා, ලබන අවුරුද්දේ පළාත් සභා නියෝජිතයින් හැටියට අපට විශාල සංවර්ධනයකට යන්නට ඒ හැකියාව ලැබේවායි කියා. ඒ වාගේම මෙතෙක් අපි බැලුවාම මැද කොළඹ, උතුරු කොළඹ අපි නියෝජනය කරන අපේ පළාත්වල අපට බස්නාහිර පළාත් සභාව තුළ මහජන නියෝජිතයන් හැටියට අපට සතුටු විය හැකි විශාල සංවර්ධනයක් කර ගෙන යන්නට අපට ඒ හැකියාව ලැබුණා. ඒ වාගේම ජනතාවගේ සිතුම් පැතුම් ඉෂ්ට කරන්නට බස්නාහිර පළාත් සභාව තුළින් අපට ඒ තිබුණු ප්‍රශ්න ටික විසඳාගන්නට ඒ හැකියාව ලැබුණා. ඒ වාගේම මම අයිල ඉලංගෙයි මහජන කොංග්‍රස් පක්ෂයේ ගරු රිෂාඩ් බදුර්දීන් මැතිතුමාගේ නායකත්වය තුළින් අපි එතුමාගේ අමාත්‍යාංශයේ මුදල්වලිනුත් අපට විශාල වශයෙන් සංවර්ධනයක් කරා යන්නට මේ බස්නාහිර පළාත් සභාව තුළ හැකියාව ලැබුණා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා. ඉදිරියේදී මේ මාස හය තුළදී අඩුම වශයෙන් අප්‍රේල් 21 ට කලින් අපේ තිබෙන්නා වූ මේ සංවර්ධන කටයුතු, ඒ වාගේම අඩක් නිමා වූ සමහර ගැටළු තිබෙනවා. ඒ සියල්ලකටම අපට උදව් උපකාර කරලා, ඒ ජනතාවගේ සිතුම් පැතුම් ඉෂ්ට කරන්නට හැකියාව ලැබෙනවාය කියන එක අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපගේ අමාත්‍යාංශ තුළින් දවස් හතරක් අයවැය ශීර්ෂ අනුව අපට කථා කරන්නට අපට අවස්ථාව ලැබුණා. ඒ නිසා අපි ඒ සියලු දෙනාටම අමාත්‍යාංශවල නිලධාරීන් ඇතුළු ඒ වාගේම ඇමතිවරුන්ට, මහ ඇමතිතුමා ඇතුළු සියලු දෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. යම්කිසි කාර්යයක් කරන්නට මේ වකවානුව තුළදී අපට ඒ අවකාශ ලබා දුන්නාය කියන එක. එහෙම නැත්නම් මම හිතන විධියට

අපට මේ ගමන ඉදිරියට යන්නට අපට බැරි වෙනවා. ඒ නිසා අපට තීන්දුවක් ගන්නට අපට සිදු වුණා. අපි ඉන්න විධියට ඉඳලා මේ මාස හතර ගත කරන්නට අපට ඒ හැකියාව ලැබෙනවා කියන එක. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, එළඹෙන 2019 වර්ෂයේ මේ ජනතාවට මේ අයවැය තුළින් විශාල සංවර්ධනයක් කරන්නට අපට හැකි වෙනවාය කියන එක අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපි මහ ඇමතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ අමාත්‍යවරුන්, ඒ වාගේම මන්ත්‍රීවරුන්, ඒ වාගේම පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා. අපට ජනතාවගේ සිතුම් පැතුම් ඉෂ්ට කරන්නට පූර්ණ සහයෝගය ලබා දෙන්නය කියන එකත්.

ඒ වාගේම මේ අවස්ථාවේදී අපේ සහෝදර මන්ත්‍රීවරුන් කථා කරන කොට කථා කළා. මම හිතන විධියට විශාල වශයෙන් අද මේ අයවැය තුළින් අද දේශපාලන කථිකාවත් ඇති වුණු මේ අවස්ථාවේදී, අද පාර්ලිමේන්තුව අස්ථාවර වෙලා තිබෙන මේ වකවානුව තුළදී අපි බලාපොරොත්තු වෙනවා, ස්වාධීන ආයතනයක් වන අධිකරණය විසින් අපට හොඳ තීන්දුවක් 10 වැනිදා වන විට අපට ලැබෙනවාය කියලා. ඒ තීන්දුවත් එක්ක ඉදිරියට යන්නට - මේ ලංකාවේ ආණ්ඩුවක් නැතිව මේ පළාත් සභාව අපි නියෝජනය කරමින් අද අයවැය ඉදිරිපත් වෙලා තිබෙනවා. අපට මහ ආණ්ඩුවෙන් ලැබෙන මුදල් මම හිතන විධියට අපට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා. ඉදිරියේදී ස්වාධීන ආයතනයක් වශයෙන් පාර්ලිමේන්තුවත් රැස් වෙලා අපට අධිකරණයෙන් ස්වාධීන උත්තරයක් ලැබිලා 10 වැනිදා වන කොට සුභ ගමනක් යන්නට අපට හැකි වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මේ අයවැයට අපගේ පූර්ණ සහයෝගය ලබා දෙමින්, මෙම විසර්ජන පනතට අපේ සහයෝගය ලබා දෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මීළඟට මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 05.32 ]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යතුමා මගින් 2019 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන අයවැය විස්තරය සම්බන්ධයෙන් විසර්ජන ප්‍රඥප්තිය අවස්ථාවේදී වචන කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ස්තුතිවන්ත භාවය මම පිරිනමනවා. ඇත්තෙන්ම අසනීප තත්ත්වයෙන් හිටියත් වචන කිහිපයක් ප්‍රකාශ කිරීම පළාත් සභාවේ විපක්ෂ නායකවරයා ලෙස එය මගේ යුතුකමත්, වගකීමක් මෙන්ම, හොඳයි කියලා හිතුනු හින්දා තමයි මේ අදහස් ප්‍රකාශ කරන්නේ. අපි දන්නවා. පෙර වර්ෂවල වාගේම ප්‍රාග්ධන වියදමට වැඩිය පුනරාවර්තන වියදම් වැඩි වෙලා තිබෙනවා. ඒ තුළින් අපි හරියට එදා වේල සරි කර ගන්න ආර්ථිකයක් බවට තමයි පත් වෙලා තිබෙන්නේ. ඒ වාගේම පළාත් සභාවේ ලැබිය යුතු ස්ථිර ප්‍රමාණවත් ආදායම් මාර්ග මධ්‍යම රජය යටතට ගැනීමේ ප්‍රතිවිපාක දරන්න සිදු වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි BTT බදු ආදායමත් අපට අහිමි වීම. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා මෙම රජයේ තිබෙන තත්ත්වයන් පිළිබඳව, අස්ථාවරභාවය ඇති කිරීමට, ආර්ථිකයේ කේන්ද්‍රස්ථාන වසා දැමීමට කටයුතු කිරීම ලෙසින් ද එහි බලපෑම පළාතට දරන්න සිදු වෙලා තිබෙනවා කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ වාගේම එහි පාලනය තුළින්, යහපාලනය තුළින් ප්‍රධාන අමාත්‍යතුමා බිහි වීම ඉදිරියේදී එවන් යහපාලන තත්ත්වයක් තුළ බලය මාරු වීම් නොවැලැක්විය හැකි බවත් මම මතක් කරන්න කැමැතියි. මේ සියල්ල මත අපි ඉතාම කෙටියෙන් මතක් කරන්නේ. එදා ගරු ප්‍රධාන අමාත්‍යතුමා පත් වුණු දවසේ ඉඳලා එතුමාගේ හැම කටයුත්තකටම අපි සහයෝගය දුන්නා. අපේ මන්ත්‍රීවරුන් විවිධ සහයෝගයන් ලබා ගත්තා. උදව් උපකාර. එතුමා නිර්ලෝභීව - එතුමා ඇතුළු ඇමති මණ්ඩලයත් විපක්ෂය කියලා බලන්නේ නැතුව උදව් උපකාර කළා. ඒක සත්‍යයක් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. නමුත් මේ අයවැය තුළ පක්ෂයක් විධියට අපි ගන්න ඕනෑ තීන්දු අපට ගැනීමේ වගකීම පක්ෂය මගින් වෙලාවකට

මෙහෙයවනවා. අපි පසුගිය කාලයේ පක්ෂයත් එක්ක තීන්දු අරගෙන අපි කටයුතු කළා. ඒ වෙලාවේදී අපට මතකයි. පක්ෂය කෙළින්ම පුද්ගලයෝ හැටියට සමහර ඇමතිවරු නමින්ම හඳුන්වලා දීලා ඔහුට උදව් කරන්න, උපකාර කරන්නය කියලා කිව්වා. නමුත් මේ අලුත් තීන්දුවේදී අපි කවදාවත් හිතපු නැති විධියට ප්‍රධාන අමාත්‍යතුමා අපට චෝදනාවක් කළා. එන්න එපා වැඩ කර ගන්න. වැඩ කර ගන්න ආවොත් එහෙම සත පහක් දෙන්නේ නැහැ. අපි මෙන්න මේ ආකාරයට තමයි වැඩ කරන්නේ කියලා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඕක ගිය පාරත් වුණා නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගිය පාර අපි ඡන්දය දුන්නා නේ? ඒක වෙනම දෙයක්. ඕනෑ දෙයක්.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

බාධා කිරීම් කරන්න එපා. එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

පොඩ්ඩක් ඉන්න කෝ? කථාව අහගෙන ඉන්න කෝ?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒවා ඕනෑ දෙයක්. නොලැබුණත් ප්‍රශ්නයක් නැහැ. මතක තියා ගන්න. මම මගේ කථාවේදී වෙලාසනිනුත් කිව්වේ අසනීපයි කියලා, මම තර්ක කරන්න කැමැති නැති හින්දා. ඕගොල්ලන්ගේ තිබෙන ඒ 25 ත් අධොමුඛයේ හරි ගහගන්න. එපමණයි කියන්න තිබෙන්නේ. අපි මේ ප්‍රධාන අමාත්‍යතුමා එක්ක තිබෙන සහ සම්බන්ධතාවය නිසා තමයි ඒ බව එතුමාට මතක් කළේ. ඒ නිසා මම මේ මතක් කරන්නේ. අපි කවුරුත් මේ පළාත් සභාවට පැමිණියේ එක එක පක්ෂ නියෝජනය කරමින්. ඒ පක්ෂවල විවිධ අනන්‍යතාවයන් තිබෙනවා. ඒ අනන්‍යතාවයන් උඩ අපි වැඩ කටයුතු කරන ගමන්ම තමයි අපට අවශ්‍ය දෙයක් ගිහිල්ලා කථා කරලා සමහර වෙලාවකදී අපි මේ අමාත්‍යාංශය මගින්, අනෙකුත් අමාත්‍යාංශ මගින් උදව් උපකාර ඉල්ලා ගන්නවා. ඒක යුතුකමක්. ඒක මනුස්සකමක්. පුළුවන් දේ කරන එක, බැරි දේ නොකරන එක අදාළ ඇමතිවරයාගේ වගකීමක්. මම මේ කාරණා ඉතාම කෙටියෙන් මතක් කළේ වෙන මොකුත් නිසා නොවෙයි. අපි දන්නවා. අපි මේ වැඩේදී කොයි තරම් සද්භාවයෙන් යුක්තව ප්‍රධාන ඇමතිතුමා වෙනුවෙන් අපි වගකීම් සහිතව කටයුතු කරලා තිබෙනවාද කියලා. අපට තිබුණා සමහර කාලවලදී ප්‍රධාන ඇමතිතුමාට විරුද්ධව යටි උගුල් අදින්න, ඒ සඳහා යෝජනා තිබුණා. හැබැයි අපි ඒ එහේකටවත් ඉඩ දුන්නේ නැහැ. අපි ඒ සියල්ලේදීම මහ ඇමැතිතුමාව නිසි විධියට රැක්කා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ නිසා මම කිව්වේ, වෙන මොකවත් නොවෙයි. කරන්න තිබෙන වෙලාවේදී අපි අපේ යුතුකම් ඉතාම හොඳ මනුස්සකම්වලින් අපි ආරක්ෂා කළා.

ඒ නිසා මම ඊළඟට ඉදිරියේ පැවැත්වෙන මැතිවරණ තත්ත්වයක් තුළ පක්ෂය මාරු වෙයිද නැද්ද කියලා කියන්නත් අපට බැහැ. ඒක ඒ අදාළ ජනතාවගේ තීන්දුවක්. මධ්‍යම රජයේ අයවැයක් නැතුව පළාත් අයවැයක් ඉදිරිපත් කිරීමත් හරියට අඳුරේ අත ගානවා වාගේ. ඒත් කමක් නැහැ. අද මේ තත්ත්වය මත අපි ඉතාමත් සතුටට පත් වෙනවා. අපි තීන්දුවක් අරගෙන තිබෙනවා. මේක අපේම තීන්දුවක් නොවෙයි. පක්ෂයත් එක්ක. අද දේශපාලන අර්බුදතාවයක් තිබෙනවා. ඒ අර්බුදතාවයට පක්ෂයේ පල්ලෙහා ඉඳලා උඩටම යනකල් සමහර තැන්වල විවිධ ගැටළු තිබෙන්නේ. ඒ නිසා සමහර තැන්වල අපට අයවැයට විරුද්ධ වෙනවා කියන එක හිතට එක්කර ගන්න අමාරුයි. ඒත් කරන්න දෙයක් නැහැ. පක්ෂයේ තීන්දුවලට අනුව අපි ඒ තීන්දුව ගත්තා. හැබැයි අපට දැනුනා නම්, ඇතුළතින් ඔහේ බලය මාරු කරන්න හදනවා කියලා. ඒ වෙලාවේදී අපි බය නැතුව තීන්දුත් ගන්න බලාගෙන හිටියේ කියන එක මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔවා දුකට කියන කථා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මොකක්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දූකට කියන ඒවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දූකට කියන ඒවා නොවෙයි. අපි ඇත්තටත් කියනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ලෙඩෙක් නිසා මුකුත් කියන්නේ නැහැ. ඕන එකක් කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දූකට. දූකට.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ලෙඩෙක් නිසා මුකුත් කියන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඡන්දය අඩු වෙනකොට ඔහොම කියනවා තමයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි මුකුත් කිව්වේ නැහැ ඔබතුමාට බාධා කරන්න හොඳ නැති නිසා. ඔච්චර බොරු කියන්න එපා. බොරු කියන්න ගියොත් අපට කථා කරන්න වෙනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

බාධා කිරීම් කරන්න එපා. එතුමාට අවස්ථාව දෙන්න. අවසාන විනාඩිය තියෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මම මේ මතක් කරන්නේ, මම මීට වැඩිය දීර්ඝව කථා කරන්නේ නැහැ. කථා කරන කොට මගේ පපුවේ අසනීප තත්ත්වය ටිකක් වැඩි වෙනවා. ඒ නිසා මේ අයවැය සම්බන්ධයෙන් මට කියන්න තිබුණු ටික - විශේෂයෙන්ම මම දන්නවා මේකේ ගැළපිල්ලක් නැහැ. මම මගේ තිබෙන ස්වභාවික ශක්තිය මත තමයි මේ කිව්වේ. අපි අයවැය ජයග්‍රහණය කරන්නට හෝ පරදින්නට, ඒක වෙනම දෙයක්. ඕනෑම දෙයකට අපේ සුභ පැතුම් පිරිනමමින් මේ අයවැය තුළින් ප්‍රදේශයේ ජනතාවට යහපතක් කරන්න හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් සමාප්ත කරනවා.

[අ.භා. 05.41 ]

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම ඉතාමත්ම සතුටට පත් වෙනවා, බස්නාහිර පළාතේ 31 වන අයවැය ඉදිරිපත් කරන වෙලාවේ විසර්ජන ප්‍රඥප්ති අවස්ථාවට කථා කරන්නට ලැබීම පිළිබඳව. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ මට පෙර කථා කරමින් නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා රජයේ අයවැය ඉදිරිපත් නොකළ අවස්ථාවක අපට අයවැයක් ඉදිරිපත් කළ නොහැකි කියලා. ඒක සම්පූර්ණයෙන් වැරැදියි ගරු සභාපතිතුමනි. රජයේ අයවැයක් නොමැති වුවද, NDT වශයෙන් ලැබෙන මුදල් අපට ලැබෙන්නේ පනතක් මගින්. ඒ නිසා රජයේ අයවැය නැති වුණාට ඒ මුදල් අපට ලැබෙනවා. ඒ නිසා NDT වශයෙන් අපි ඇස්තමේන්තු කර ඇති මුදල රුපියල් මිලියන 30,624 ක්. අනිවාර්යනේම අපට ලැබෙනවා. විශේෂයෙන්ම පළාත් ආදායම් වශයෙන් අපි ඇස්තමේන්තු කරලා තිබෙන මුදල මිලියන 26,206 ක්. ඒකත් අපට අනිවාර්යෙන්ම ලැබෙන මුදලක්. වර්ෂයක් අවසන් වීමට පෙර විශේෂයෙන්ම පළාත් සභාවක් විසින් අයවැයක් ඉදිරිපත් කරලා ඒක සම්මත කර ගන්න ඕනෑ. අපි හිතනවා අද පාර්ලිමේන්තුවේ අයවැය සම්මත නොවුණත්, මේ වර්ෂය අවසන් වෙන්න ඉස්සෙල්ලා රජය විසින් අතුරු සම්මත අයවැයක් හෝ ඉදිරිපත් කරලා 2019 වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගනියි කියලා. මම හිතන්නේ ඒ පිළිබඳව අපට ගැටළුවක් නැහැ. නමුත් පළාත් සභාව කියන්නේ සක්‍රීය ආයතනයක්. අපි අක්‍රීය වෙලා නැහැ. හැබැයි සමහර අය, විපක්ෂ නායකතුමා හෝ මෙතැන විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු අපේ වැය ශීර්ෂයන්වලට විරෝධය ප්‍රකාශ කළේ හදවතින් නොවෙයි. අපි දන්නවා. බොහොම වේදනාවෙන්. මෙතැන ඉන්න මන්ත්‍රීවරු 104 දෙනා මගේ සතුරොත් නොවෙයි. වෛරක්කාරයොත් නොවෙයි. නමුත් මේ අයට පක්ෂයේ

[ ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා ]

තීන්දුවකුත් නැතුව දෙතුන් දෙනෙකුගේ උවමනාවට අයවැයට විරුද්ධ වෙන්න සිද්ධ වුණා. පසුව ඒකට පක්ෂයේ නායකයෝ සම්බන්ධ වුණා. පාර්ලිමේන්තුව මට්ටමට මේ පළාත් සභාව ගේන්න උත්සාහ කළා. අද ලොකු අර්බුදයක් හදන්න විශාල ව්‍යායාමයක් දැරුවා. අන්තිමට දෙක තුන වනකොට මේ බටහිර බලවේගත්, ඒකසත් ජාතික පක්ෂය විතරක් නොවෙයි. අපෙත් ඇතැම් නායක නායිකාවෝ කියන අයත් බටහිර බලවේග පවා මේකට මැදිහත් වෙන්න උත්සාහ කළා. ඉතින් මේක තමයි තත්ත්වය. අපි මේ පළාත් සභාව තව දින 100 කින් පමණ, මාස කිහිපයකින් පමණ විසුරුවනවා. අපි එකට හිටියා නම්, මේ ඉදිරි මාස කිහිපයත් අපට එකට ඉන්න තිබුණා. එහෙම නම් අද මෙවැනි තත්ත්වයක් නිර්මාණය වෙන්නේ නැහැ. අද එක්සත් ජාතික පක්ෂය ඇතුළු කණ්ඩායම උත්සාහ කළේ මොකක්ද? ඒ අය මුලින්ම උත්සාහයක් ගත්තා මගේ වැය ශීර්ෂය පරාජයට පත් කරන්න. ඒ නිසා තමයි මේ අර්බුදය පැන නැඟුණේ. දැන් ඒක බැරි වුණාමවත් අපි අනෙක් වැය ශීර්ෂයන් පරාජය කිරීමෙන් වැළකී සිටින්න තිබුණා. නමුත් එවැනි තත්ත්වයක් නිර්මාණය වුණේ නැහැ. මොකද, අපේ පුද්ගලික වැරැද්දක් නැහැ ගරු සභාපතිතුමනි. මම පාලක පක්ෂයට වාගේම මේ 31 ක් අවුරුද්දක් සම්පූර්ණ වන 2019 මේ පළාත් සභාව පාලනය කරපු අමාරුම යුගයේ පාලනය කරපු මට අමතරව මහ ඇමැතිවරු දෙන්නෙක් ඉන්නවා. එක්කෙනෙක් තමයි රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමැතිතුමා. අනෙක් කෙනා සුසිල් ප්‍රේම්ජයන්ත මහ ඇමැතිතුමා. මට මතකයි එදා 1999 එතුමාත් එක්ක එකතු වුණේ. ඊට පස්සේ ඉතාම අසීරුම කාලය ගත කළේ මම.

හැබැයි ඒ අසීරුම කාලය ගත කළත් මේ 104 දෙනා සමග සුහදශීලීව, විශ්වාසනීයව කටයුතු කරන්න මට පුළුවන්කමක් ලැබුණා. අද ජනතා විමුක්ති පෙරමුණ ඕනෑම අයවැයකට ඇවිල්ලා, ලක්ෂමන් නිපුණ ආරච්චි මැතිතුමා මේ උඩින් වැටුණු මිනිහෙක් වාගේ මටත්, මගේ ගරු ඇමැතිවරුන්ටත් මේ ඉන්න සියලු දෙනාට - මේ අවුරුදු හතරේම එතුමා කළේ ඒක. ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ, මේ රටේ මිනිස්සු විශ්වාස කරන ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකකට මැදිව තිබෙන දේශපාලන පක්ෂයක්. අද මේ පළාත් සභාවේ මගේ අත්දැකීම මම සමහර අවස්ථාවලදී ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරලා තිබෙනවා. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණෙන් මම අපේක්ෂා කරන්නේ නැහැ, මම හෝ මගේ අමාත්‍ය මණ්ඩලය වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කර ගන්න. හැබැයි, මේ පළාතේ ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරන්න තිබුණා. අද එතුමා පළමුවැනි කථාව පටන් ගන්න කොටම කිව්වා, අමාත්‍යාංශවලට බෙදලා තිබෙන මුදල් ප්‍රමාණවත් නැහැයි කියලා. ගරු සභාපතිතුමනි, මට නම් පුද්ගලික වත්කම් නැහැ. මේ පළාතේ ජනතාවගෙන්, රජයෙන්, අපේ පළාතෙන් ලැබෙන ආදායම ඇරෙන්න වෙන රුපියලක්වත් වියදම් කරන්න බලයක් අපට නැහැ. අපට ලැබෙන ආදායම්වලින් උපරිම මුදලක් මම මේ අමාත්‍යාංශවලට බෙදලා දීලා තිබෙනවා. ඒ නිසා තමයි පාර්ලිමේන්තුවේ අයවැයක් සම්මත නොවුණු අවස්ථාවක අපට අද ශක්තිමත් අයවැයක් ඉදිරිපත් කරන්න පුළුවන් වුණේ. ඒ අපට තිබෙන ශක්තිය නිසා කියන එක මම මේ අවස්ථාවේ තමුන්නාන්සේට මතක් කරනවා.

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන වශයෙන් තිබෙන කුහකකම අපට නැති කරන්න පුළුවන්කමක් නැහැ. අද මේ පළාත් සභාවේ ජනතා විමුක්ති පෙරමුණේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න මම කොයිම අවස්ථාවකවත් පසුබට වුණේ නැහැ. විශේෂයෙන්ම සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු කැලණි ගඟ ව්‍යාපෘතිය, තෙත් බිම් කලාප පිළිබඳ කාරණාවේදී අපි ඒවා කරන්න ඕනෑ කියලා ජනතාවගේ පැත්තෙන් හිටියා. ජනතා විමුක්ති පෙරමුණ ඒවාට අපට ස්තුති කරනවාද? ඒවාට ප්‍රසංශා කරනවාද? මෙතැන ඇවිල්ලා මේ අපට අපහාස කරලා, ඇමැතිවරුන්ට අපහාස කරලා ලබන වින්දනය මොකක්ද? ජනතා විමුක්ති පෙරමුණේ මේ වින්දනයෙන් පළාතේ ජනතාවට සාධාරණයක් ඉෂ්ට වෙනවාද? එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා අද එවැනි තත්ත්වයක ඉන්න නිසා අද ජනතා විමුක්ති පෙරමුණට සිද්ධ වුණා, අලියාගේ බෙල්ලේ එල්ලිලා බටහිර බලවේගවල නකුටක් බවට පත් වෙන්න. ඒ වැරැදි පූර්වාදර්ශය නිසයි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මුළු රටේම ඒක කළා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හිතේ ඇති එහෙම කරන්න. අපිව වල්ග කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ වාගේම -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

බාධා කිරීම් කරන්න එපා එතුමාට. එතුමා කාටවත් බාධා කිරීම් කළේ නැහැ නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වල්ගේ නොවෙයි. නැට්ටේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

වල්ගේ නොවෙයි. බෙට්ටක් වෙලා තියෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එදා අපි (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පරිපූරක ඇස්තමේන්තු 01 සහ 02 යටතේ අපි වෙන් කරපු මුදල බිලියන 4 කට ආසන්න ප්‍රතිපාදනයක්. මේ දෙසැම්බර් 31 වනකොට අපි සියයට සියයක් ප්‍රගතිය අත්පත් කරගෙන තිබෙනවා. මම මේකේ මහ ඇමැති වනකොට අවුරුදු 15, 20, 30 හදපු නැති ගොඩනැගිලි තිබුණා. මෙතැන ඉන්න මුස්ලිම් මන්ත්‍රීවරු දන්නවා. ෆයිරූස්ට අමතක වුණාට මෙතැන ඉන්න මුස්ලිම් මන්ත්‍රීවරු දන්නවා. මුස්ලිම් පාසල් කීයක් කන්ටේනර්වල තිබුණාද? පන්තියක් පවත්වා ගන්න බැරුව කොළඹ නගරයේ කොපමණ අපහසුවක් තිබුණාද කියන එක මේ අපේ ඉන්න ඉස්ලාම් මන්ත්‍රීවරු දන්නවා. අපේ පළාතේ ඇතැම් පාසල්වල ළමයින් ටෙන්ට්වල ඉගෙන ගත්තේ. පාටිෂන් කරපු පන්ති කාමරවල ඉගෙන ගත්තේ. අද ඒගොල්ලෝ තුන්මහල්, දෙමහල්, තනිමහල් පන්ති කාමරවල නිදහසේ, ඉතාමත් නවීන පන්ති කාමරවල තම අධ්‍යාපන කටයුතු කරන්න පරිසරයක් අපි නිර්මාණය කරලා දුන්නා කියන එක මම තමුන්නාන්සේට කියනවා.

ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමා, රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමැතිතුමා, ඔබතුමන්ලාගේ සුසිල් මුණසිංහ මහ ඇමැතිතුමන්ලා ඒ අවදිය අනුව, ඒ අයගේ වගකීම් ඉෂ්ට කළා. මම ලොක්කයි, මම මුදුනයි කියන එක නොවෙයි මම කියන්නේ. නමුත් මම සාධාරණයක් ඉෂ්ට කරලා දීලා තිබෙනවා. අනෙක් එක හැම ප්‍රතිපාදනයක්ම - රජයෙන් ලැබුණේ ලක්ෂ 24 යි. යහපාලන රජය පිහිටෙව්වාට පස්සේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලැබුණේ ලක්ෂ 24 ක ප්‍රතිපාදනයක් විතරයි. මම ඒකට තවත් ලක්ෂයක් එකතු කරලා, තව ලක්ෂ 25 ක් දීලා, පසුව ලක්ෂ 50 ක් දීලා පළාත් මන්ත්‍රීවරයෙකුගේ ගෞරවය රැක්ක එකම මහ ඇමැති මමයි කියන එක මම තමුන්නාන්සේට කියනවා. අද මට කරන්න දෙයක් නැහැ. හැබැයි එදා ඔය කියන - දැන් මේගොල්ලන්ට ඇවිල්ලා උපදෙස් දීපු, මේගොල්ලන්ව සිරිකොතට කැඳවපු ඇමැතිවරු එදා මේ පළාත් සභාවේ අපට දෙන්න ඕනෑ සල්ලි ටික දුන්නේ නැහැ. මම හැමදාම තනියෙන් හඬ නැඟුවා. නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා ඇමැතිවරුත් එක්ක ගහගන්න ගියා කියලා. හැමදාම මේ පළාත් සභාවට පත් වන අයට ඇමැතිවරුත් එක්ක ගහගන්න වෙනවා තමයි. මේ පළාත් සභාවේ ඉඳලා ගිය අයවත් පළාත් සභාවට සලකනවාද? ඒ නිසා අපට සිද්ධ වුණා සටන් කරන්න. මෙතැන එක්සත් ජාතික පක්ෂයේ කිසිම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් අපට උදව් කළේ නැහැ පළාත් සභාව පවත්වාගෙන යන්න. මොකද, මේ පළාත් සභා නවයෙන් හතක් තිබුණේ අපේ නිසා. මේක තමයි ඇත්ත කථාව.

ගරු සභාපතිතුමනි, අපට සල්ලි තිබෙන නිසා, බස්නාහිර පළාතට මූල්‍ය හැකියාවක් තිබෙන නිසා අපි වැඩ කළා. හැබැයි ඒ වැඩ කරපු එකේ ආත්ම ගෞරවයත් රැක්කේ නැහැ. වැඩි පිරිසක් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු මම ඇතුළු ඇමැතිවරු කරපු කාරණා අගය කිරීම පිළිබඳව මම ඒ අයට ගෞරවය පුද කරන්න පසුබට වෙන්නේ නැහැයි කියන එකත් මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. මේ පළාත් සභා අයවැය පටන් ගත්තු හැටියේම ගිය 04 වැනිදා මේක පාර්ලිමේන්තුවක් කරන්න උත්සාහ කළා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් අද විපක්ෂයේ කණ්ඩායම් එකතු වෙලා පාර්ලිමේන්තුවට කරන්න ගිය දේ මේ පළාත් සභාවට කරන්න බැරි වුණා. ඒ සම්බන්ධව මම ගෞරව කරනවා. මොන පක්ෂ පාට භේද තිබුණත් එදා

[ ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා ]

මේ පළාත් සභාව පිහිටුවනකොට අපට දුන්නු වගකීම ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරමින් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ බටහිර බලවේග මේ අයවැය පරාජය කරන්න උත්සාහ කරන වෙලාවේ මේක ජයග්‍රහණය කරා ගෙන යන්න අපේ කණ්ඩායම මාත් එක්ක එකතු වුණා කියන එක මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ලංකාවේ බලවේග.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, හුඟක් විපක්ෂයේ මන්ත්‍රීවරු තමන්ගේ අයවැය විවාදයට එක් වෙමින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට පහර පිට පහර දුන්නා. හැබැයි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ගිය 26 වැනිදායින් පස්සේ තමයි මෛත්‍රීපාල ජනාධිපතිතුමා නරක් වුණේ. අපට හරිම ප්‍රශ්නයක් වෙලා තිබුණා, අපේ පක්ෂයේ සභාපතිතුමාත් එක්ක කටයුතු කරන්න. උත්සවයකට ගියත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු තමයි අපේ ඇමතිවරුන්ට වඩා ඉස්සරහින් ගියේ. හැබැයි අතිගරු ජනාධිපතිතුමා ඉවසලා, ඉවසලා හැටදෙලක්ෂයක් වූ ජනතාව වෙනුවෙන් ඉවසලා, ඉවසලා, ඉවසලා රට වෙනුවෙන් ගත්තු තීන්දුවක් බව අපි මේ අවස්ථාවේදී මතක් කරනවා. ඒ නිසා කාට හිත රිදුණත් අපට කරන්න දෙයක් නැහැ. ගරු සභාපතිතුමනි, මට දීර්ඝ වශයෙන් කථා කරන්න කාලයක් නැහැ. මේ අයවැයේදී මේ පළාතේ ජනතාව වෙනුවෙන් මා කළ මෙහෙය වෙනුවෙන් මාව අගය කරපු සහ මාව විවේචනය කරපු සියලු ගරු මන්ත්‍රීවරුන්ට ඉතාමත් ගෞරවයෙන් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මා විසින් අත්‍යාවශ්‍යයෙන්ම කළ යුතු කාර්යයක් තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, විපක්ෂය විසින් අපට එල්ල කළ දැඩි ප්‍රහාරවලට අපට ශක්තිමත්ව, කුළුණක්ව මුහුණ දෙන්න පුළුවන්කම ලැබුණා. පසුගිය දින කිහිපය තුළ අර පාර්ලිමේන්තුව වාගේ නොයෙකුත් ප්‍රචාර යවමින්, බොරු කියමින් සමහර අයව නිහඬ කරන්න දැරූ උත්සාහයන් අපි දැක්කා. සමහර වෙලාවට මේ අයවැයට පාර්ලිමේන්තුවේ ඇමතිකම් දරන කොට පළාත් සභාව පිළිබඳ අවබෝධයක් නැති මැති ඇමතිවරුන් පවා අද අපව පරාජයට පත් කරන්න ලොකු උත්සාහයක් ගත්තා. හැබැයි අපේ එකමුතුකමේ බලයෙන් අපි ඒ සියලු බලවේග පරාජයට පත් කළා. ඒ වෙනුවෙන් විශේෂයෙන්ම අපට ශක්තියක් වුණු අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ඒ වාගේම දුමින්ද දිසානායක ඇමැතිතුමාටත්, ඒ වාගේම ප්‍රසන්න රණතුංග අපේ හිටපු මහ ඇමැතිතුමාටත්, රවුෆ් හකීම් හිටපු ඇමැතිතුමාටත්, රිෂාද් බදියුදීන් හිටපු ඇමැතිතුමා ඇතුළු අපට මේ අයවැයේදී සහයෝගය දුන්නු පළාත් සභාවෙන් පිට සියලුම දේශපාලන නායකයන්ට මගේත් පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය, මන්ත්‍රීවරු ඇතුළු සියලු දෙනාගේ ගෞරවය සහ ස්තුතිය මම මේ අවස්ථාවේදී පුද කරන්න කැමැතියි. (බාධා කිරීමක්) සියලුම නායකයන් ගැන කිව්වා නේ? දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමාගේ, මන්ත්‍රීවරු දෙන්නෙක් ඉන්නවා. ඒ නිසා දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි මතක් කරලා දුන්නාට. කියන්න දෙයක් නැහැ. මගේ දේශපාලන පෙකණිවැල කපලා තිබෙන්නේ මහජන එක්සත් පෙරමුණෙන්. ඒක නිසා මම ඒක කරන්න ඕනෑ තැන්වලදී කරනවා. ඒ නිසා අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, අපි දැන් පැමිණ සිටින්නේ බස්නාහිර -

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

බාධා කිරීම් කරන්න එපා. සිරිකමල් ගරු මන්ත්‍රීතුමා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා මගේ වැය ශීර්ෂයේදී අත් දෙකම උස්සපු එක ගැන. ගරු සභාපතිතුමනි, අපි දැන් පැමිණ සිටින්නේ, බස්නාහිර පළාත් සභාවේ 31 වන මුදල් ප්‍රකාශයේ අවසන් දිනයේ අවසන් අවස්ථාවටයි. 2019 වර්ෂයට අදාළව මා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයේ වෙන් කර ඇති ප්‍රතිපාදන සඳහා නීතිමය බලය පැවරෙන විසර්ජන ප්‍රඥප්තිය අප විසින් සම්මත කර ගත යුතු වෙනවා. ලබන වර්ෂය තුළ ගෙවිය යුතු පුනරාවර්තන වියදම්, ප්‍රාග්ධන වියදම් සහ ණය අත්තිකාරම් ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීම මෙම විසර්ජන ප්‍රඥප්තියේ අරමුණයි. එක් එක් වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 81,280.56 ක මුදල් වැය කිරීමට බලය මා විසින් මෙම සභාවෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ඔබතුමාටත් බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, හැමදාම මේ පළාත් සභාවේ අයවැය ඇතුළු සභාවේ කටයුතු කරගෙන යන්න අපට සහයෝගය ලබා දෙන සභා ලේකම්තුමා, ප්‍රධාන ලේකම්තුමා, සියලුම ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ඒ වාගේම ආරක්ෂක අංශ, මේ නව ගොඩනැගිල්ලට අපි පැමිණෙන්න තීරණය කරපු දවසේ සිට දිගින් දිගටම අපට හොඳින් සංග්‍රහ කරපු සියලුම මාධ්‍යවේදීන්ට මම ගෞරවය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම මේ සභාවේ හිදිමින්, වරප්‍රසාද වරදාන ලබමින් 2019 අවුරුද්දේදීවත් මේ පළාත් සභාව විවෙචනය කිරීමෙන් වළකින ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

බොහොම ස්තුතියි ඔබතුමාටත්. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2019 වර්ෂයට අදාළ මුදල් ප්‍රකාශයේ විසර්ජන ප්‍රඥප්තිය සභා සම්මත කිරීමේ අවස්ථාව. කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ ආසනවලට ගිහිල්ලා වාඩි වෙන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2019 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය සභා සම්මත කිරීමේදී ගරු සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින්, පූර්ණ කාරක සභාව පක්ෂව 53 යි, විපක්ෂව 44 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question put and the Committee of the Whole Council was divided a 53 for, 44 against and 00 decliners.*

## පූර්ණ කාරක සභාවේ කාලය දීර්ඝ කිරීම
EXTENDING THE DURATION OF COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, *"මෙම සභාවේ වැඩ කටයුතු අවසන් වනතුරු සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

දැන් පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් කරන්න.

***ඊට අනුකූලව ප.ව. 06.03 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***

*Accordingly at 06.03 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

මේ අවස්ථාවේ පූර්ණ කාරක සභාව සභා අවස්ථාවට පත් වෙනවා. අද දවසේ ප්‍රගතිය. මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් පිළිවෙළින් 107, 121, 122, 123, 124, 125 හා 103 යන ශීර්ෂයන් යටතේ විවාදය 2018.12.06 වන දින පස්වරු 03.30 ට ආරම්භ කොට පස්වරු 06.00 දක්වා පැවැත් වුණු අතර එකී වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය එදින අවසන් නොවූ අතර එදින තාවකාලික අත්සිටවූ විවාදය 2018.12.07 වන දින එනම් අද දිනයේ පෙරවරු 09.00 ට නැවත ආරම්භ කොට පෙරවරු 10.45 දක්වා පැවැත්විණ. ඒ අනුව එකී අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් යටතේ විවාදයට අමාත්‍යතුමා සමග ගරු මන්ත්‍රීවරුන් 19 දෙනෙකු සම්බන්ධ

[ ගරු සභාපතිතුමා ]

විය. විවාදය අවසානයේ බෙදීමක් ඉල්ලූ බැවින් ශීර්ෂ අංක 107, 121, 122, 123, 124, 125 හා 103 යන වැය ශීර්ෂයන් වැඩි ඡන්ද 20 කින් සභා සම්මත වූ බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

ඉන් අනතුරුව ආරම්භ කරන ලද්දේ ශීර්ෂ අංක 105, 113, 114, 115, 116 වැය ශීර්ෂයන්ට අදාළ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රධානයන් පිළිබඳව සලකා බැලීමේ විවාදයයි. එකී විවාදය අද දින පෙරවරු 10.45 සිට පස්වරු 04.00 දක්වා පැවැති අතර, එකී අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් යටතේ විවාදයට ගරු මන්ත්‍රීවරුන් 17 දෙනෙකු සම්බන්ධ විය. ඒ පිළිබඳව බෙදීමක් ඇති වූ නිසා, ඡන්ද විමසීමේදී එම වැය ශීර්ෂයන් වැඩි ඡන්ද 12 කින් සභා සම්මත වූ බව ප්‍රකාශ කරනවා.

අද දින පස්වරු 04.00 ට ආරම්භ වූ 2019 සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ සාකච්ඡාව පස්වරු 06.00 ට අවසන් වුණා. 2019 මූල්‍ය ප්‍රකාශයේ විසර්ජන ප්‍රඥප්තිය අවසානයේදී බෙදීමක් ඉල්ලූ බැවින් ඡන්ද විමසීමකට ලක් වුණා. එම විසර්ජන ප්‍රඥප්තියට පක්ෂව ගරු මන්ත්‍රීවරු 53 ක්, විපක්ෂව ගරු මන්ත්‍රීවරු 44 දෙනෙක් සහ පක්ෂව ගරු මන්ත්‍රීවරු 00 ක් ඡන්දය පාවිච්චි කිරීමෙන් අනතුරුව වැඩි ඡන්ද 09 කින් එම විසර්ජන ප්‍රඥප්තිය සභා සම්මත වූ බව මම මේ අවස්ථාවේ නැවත වරක් සභාවට ප්‍රකාශ කර සිටිනවා.

අපේ සම්ප්‍රදායක් තිබෙනවා, අපගේ අයවැය විවාදය අවසන් වූවායින් පස්සේ මගේ ස්තුතියක් කිරීම. එය සම්ප්‍රදායක් වශයෙන් හැමදාම කරනවා. ඒ නිසා මෙම අවස්ථාවේදී මගේ ස්තුතිය ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. මම විශ්වාස කරනවා ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා මට සහාය ලබා දෙයි කියලා. 2019 අයවැය විවාදය පැවැත් වුණු අවස්ථාවේදී විශේෂයෙන් අපි ගරු ආණ්ඩුකාරතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එත් එක්කම ගරු ප්‍රධාන ඇමතිතුමා. එතුමාට අපි බෙහෙවින් ස්තුතිවවන්ත වෙන්නට ඕනෑ. මොකද, අද අපේ මහ ගෙදර, අපට ඉතාමත් ගාම්භිර සභාවක් ලබා දෙමින් අද එතුමාගේ හතරවැනි අයවැය. එහෙම නැත්නම් පළාත් සභා ඉතිහාසයේ 31 වන අයවැය විවාදය අපේම ගෙදර පැවැත්වීමට ගරු ප්‍රධාන ඇමැතිතුමා ගත්තා වූ උත්සාහයට, එතුමා දීපු සහයෝගයට අපි එතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ඒත් එක්කම මේ කාර්යයේදී ප්‍රසන්න රණතුංග හිටපු ප්‍රධාන ඇමතිතුමා තමයි මුල්ගල තිබ්බේ. එතුමාවත් සිහිපත් කරනවා. අපි එතුමාටත් ස්තුතිවන්ත වෙනවා. එතුමා ලබා දුන්න සහයෝගයට. ඒත් එක්කම බස්නාහිර පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්ට. අපේ ඇමැතිවරු හැම කෙනෙක්ම මම විශ්වාස කරනවා, පක්ෂ භේදයෙන් තොරව හැමෝටම සාධාරණව උදව් කළා. නමුත් අවසාන මොහොතේ පුංචි ප්‍රශ්නයක් වූ නිසා පොඩි බෙදීමක් වුණා. මම හිතනවා ලබන වර්ෂයේදී ඒවා නිරාකරණය කර ගනියි කියලා.

ඒ වාගේම මගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා. එතුමා මට විශාල ශක්තියක් ලබා දුන්නා. ගරු සභානායකතුමා, මූලාසනය දැරූ සභාපති නිල මඩුල්ලේ ගරු මන්ත්‍රීවරුන් වන ලලිත් එල්ලාවල මැතිතුමා, සිරිකමල් පිලීෂියන් ද සිල්වා මැතිතුමා යන දෙදෙනාම ඇත්ත වශයෙන්ම විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ දෙදෙනාටත් මම මගේ ස්තුතිය සහ ප්‍රණාමය පුද කර සිටිනවා. මූලාසනය දැරූ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට, විශේෂයෙන්ම අපේ ගරු විපක්ෂ නායකතුමා අසනීපයෙන් සිටියත් අවසාන මොහොතේ හරි එතුමා ඉතාමත් වැදගත් කථාවක් කළා. මම ඒ ගැනත් අගය කරනවා. මහ ඇමැතිතුමා කිව්වා වාගේ එතුමා හදවතින්මයි කථා කළේ. එතුමාට යම්කිසි වේදනාවක් තිබුණා ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අයවැය තුනකට ඡන්දය දීලා පක්ෂයේ ගත්තු තීරණයක් නිසා අවසන් අයවැයේදී විපක්ෂය ඇතුළු - එතුමන්ලා අපට හැමදාම සහාය දැක් වූවා. පක්ෂයේ ගත්තු තීරණයක් නිසා. ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමාත් ඒක මුලින් ප්‍රකාශ කළා. ඒ නිසා එතුමන්ලාට විරුද්ධ වෙන්න සිද්ධ වුණා. ඒ සියලුම මන්ත්‍රීතුමන්ලාටත් මගේ ස්තුතිය පුද කර සිටිනවා. (බාධා කිරීමක්)

මේ සභාවේ සියලුම පක්ෂ නායකතුමන්ලා අපට සහාය දැක්වූවා. එක පක්ෂ නායකතුමෙක් විපක්ෂයේ අසුන් ගත්තා. එතුමාගේ තීන්දුව ගැන අපි සතුටු වෙනවා. ඒ වාගේම මේ විවාදවලට ඉතාමත් හරවත් දේශන පත්වමින් මම හිතන්නේ හැම කථිකයෙක්ම ඉතාමත් හරවත් දේශන ඉදිරිපත් කළා. සුළු සුළු අතපසුවීම් වුණා. මම හිතන්නේ කථික ලැයිස්තු ඉදිරිපත් කිරීමේදී මගෙනුත්, විපක්ෂයේ සංවිධායකතුමාගෙනුත්, ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාගෙනුත් පුංචි පුංචි අතපසුවීම් සිදු වුණා. එහෙම අතපසුවීම් සිදු වෙලා යම්කිසි අයෙකුට කථික

ලැයිස්තුවේ නම අහිමි වුණා නම්, මම ඒ ගැනත් ඒ අයට කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.

ඒ වාගේම නිලධාරීන් අතරින් ප්‍රධාන ලේකම්තුමා හැමදාම මේ සභා ගර්භය තුළ සිටිමින් එතුමා නන් අයුරින් සහයෝගය දැක් වූවා. එතුමා ඇතුළු එතුමාගේ කාර්ය මණ්ඩලයේ සෑම කෙනෙකුටම මම මගේ ස්තුතිය පුද කර සිටිනවා. ඒ වාගේම ආණ්ඩුකාර ලේකම්තුමා ඇතුළු එතුමාගේ කාර්ය මණ්ඩලය, සභා ලේකම් හේමන්ත සමරකෝන් මැතිතුමා ඇතුළු එතුමාගේ කාර්ය මණ්ඩලය, සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු එම අමාත්‍යාංශ කාර්ය මණ්ඩලවලට, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල වෙත, විශේෂයෙන්ම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය), නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු), රණසිංහ මහතාටත්, භාණ්ඩාගර ලේකම්තුමියටත් අපි විශේෂ ස්තුතියත් පුද කර සිටිනවා.

ආරක්ෂක කටයුතු සංවිධානය කර දුන් ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරී මහත්ම මහත්මීන්ට, අමාත්‍යාංශ ආරක්ෂක අංශයේ MSD නිලධාරීන්ට, පොලිස් සෝදිසි අංශයේ Search Unit අංශයට, තලංගම පොලීසියේ පොලිස් ස්ථානාධිපතිතුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලයට, බස්නාහිර පළාතේ Wespro ආරක්ෂක අංශයට, සහායක සේවා සැපයීමේදී ගොඩනැගිලි පවිත්‍රතා කටයුතු සිදු කළ Wespro ආයතනයට, අනෙකුත් සේවා සැපයීමෙන් බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයට, සභා ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු වෙනුවෙන් පළාත් ඉංජිනේරු කාර්යාංශයේ කාර්ය මණ්ඩලය වෙත හා PRD, පළාත් මාර්ග අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත සභා ශාලවේ ශ්‍රව්‍ය දෘෂ්‍ය සේවා සැපයීම සඳහා තාක්ෂණ සේවය සැපයීම වෙනුවෙන් අදාළ පෞද්ගලික ආයතනයන්ට හා එම තාක්ෂණික කාර්ය මණ්ඩලවලට, ආහාර පාන සහ සංග්‍රහ කටයුතු ඉටු කළ අදාළ ආයතනයන්ට හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට හා ඒ කාර්ය මණ්ඩලවලටත් මගේ සුභාශිංසන ස්තුතිය පිරිනමනවා.

ඒ වාගේම අද දවසේ සෞඛ්‍ය සායන සේවාවක් පවත්වමින් අපේ මන්ත්‍රීවරුන්ගේ හිසට, මනසට ලොකු ප්‍රතිකර්මයක් දුන්නා. මම හිතන්නේ දැන් නම් ඒ අය හොඳ ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් ඉන්නවා. ඒ පිළිබඳව අපේ ඇමැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට, වෛද්‍යවරුන්ට සහ තාක්ෂණ සියලු නිලධාරීන්ට මගේ ගෞරවය සහ ස්තුතිය පුද කර සිටිනවා.

ඒ වාගේ වාර්තාකරණය සහ මාධ්‍ය කටයුතු වෙනුවෙන් මාධ්‍ය කටයුතු ආවරණය කළ සියලුම රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් හා මුද්‍රිත ජන මාධ්‍යවේදීන්ටත්, ඒම ආයතනවලටත් පළාත් ප්‍රධාන අමාත්‍ය මාධ්‍ය ඒකකටයත් ස්තුතිවන්ත වෙනවා. මට තව පුංචි කාරණාවක් කියන්න තිබෙනවා. මම කවදාවත් මූලාසනයෙන් මාධ්‍යයට තහංචි දැම්මේ නැහැ ගරු ප්‍රධාන ඇමැතිතුමනි. අපි අවසර දුන්නේ ඒ අයට. මුල් දවසේ පුංචි ප්‍රශ්නයක් ඇති වුණා. පසුවද අපි කිව්වේ, වටේ නොගිහිල්ලා මාධ්‍ය ආවරණය කරන්න කියලයි. නමුත් ඊට පසුදා ඒ කථාව මුල් පිටුවේ සහ තවත් ඉංග්‍රීසි පත්තරයක ලොකුවට ගියා, අපි මාධ්‍යයට එන්න දුන්නේ නැහැයි කියලා. එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ. අපි හැමදාම මාධ්‍යයට ආදරය කළා. මාධ්‍යයට උපරිම සැලකුවා. මාධ්‍යයට අවශ්‍ය පහසුකම් උදේ ඉඳලා හැම දෙයක්ම, ඒ ප්‍රවාහන පහසුකම් පවා අපි ලබා දුන්නා. ඒ නිසා මෙය නිවැරැදි කර වාර්තා කරන ලෙස මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මාධ්‍ය මෙතැන සිටිනවා නම්, ඒවා නිවැරැදි කරන්න. අපි කොහෙත්ම මාධ්‍යයට තහංචියක් දැම්මේ නැහැ. අවුරුදු ගණනක් අපිත් එක්ක මාධ්‍ය කටයුතු කළා. ඒ නිසා සියලු මාධ්‍ය ආයතනවලට, ඒ වාගේම නිල වාර්තාකරණයෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ කථනයන් නිල හැන්සාඩ් වාර්තාකරණයේ යෙදුණු හැන්සාඩ් වාර්තාකාරිණියන්ට, ගරු මන්ත්‍රීවරුන්ගේ කථනයන් ක්ෂණිකව පරිවර්තනය කිරීමෙන් සහාය දැක් වූ ක්ෂණික භාෂණ පරිවර්තන මහත්ම මහත්මීන්ට, Interpreter, මානව සම්පත් සම්බන්ධීකරණය වෙනුවෙන් කැලණිය විශ්ව විද්‍යාලයේ සියලු දෙනාටත් මගේ ගෞරවය සහ ස්තුතිය පුද කර සිටිනවා. ඒ වාගේම අවසාන වශයෙන් සංවිධාන කටයුතුවල යෙදුණු සභා ලේකම් කාර්යාලයේ සභා ලේකම්තුමාගේ පටන් කාර්යාල සේවක මහතා තෙක් දැක්වූ සහායට සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන්ටත්, මගේ ප්‍රණාමය සහ ස්තුතිය පුද කර සිටිනවා. එමෙන්ම නන් අයුරින් සහාය දැක් වූ ඉහත ප්‍රකාශ නොවූ යම් පාර්ශවයක් වේ නම්, තැනැත්තෙක් වේ නම් ඒම සියලුම පාර්ශවයන්ටත්, මම ඉහළම නිලධාරියාගේ සිට සුළු සේවක මහතා දක්වා සියලුම අයටත් මගේ ප්‍රණාමය ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

[ ගරු සභාපතිතුමා ]

ඒ වාගේම අපි සතුටු වෙනවා ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ අවසාන අයවැය අද අවසන් වෙන්නේ. පුංචි පුංචි දේවල් ගණන ගන්න එපා. විහිළුවට එතුමා යම් යම් ප්‍රකාශ කරනවා. ඒවා අපි අමතක කරලා 2019 වර්ෂයේ අපි ඔක්කෝම එකට එකතු වෙලා අපි කලින් ගියා වාගේම - අපි ඔක්කෝම එක මන්ත්‍රීවරු. සිරිකමල් මන්ත්‍රීතුමා පොඩි පාට් එකක් දැම්මේ එතුමාව එක්කරගෙන ගිහිල්ලා නැහැ. ඒකයි. ගියා නම් ප්‍රශ්නයක් නැහැ. ඔයගොල්ලන්ට සිරිකමල් මන්ත්‍රීතුමාත් එක්කරගෙන යන්න තිබුණා නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ වෙලාවට තමයි සකළසූරිය මහත්තයලාගේ, එඩ්වට් සිල්වලාගේ වටිනාකම තේරෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

ගරු ප්‍රධාන අමැතිතුමාගේ වාර්ෂික සුහද හමුවක් තියෙනවා. ඔබතුමා එතැනට එන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. එතුමාගේ සුහද හමුවාට ආරාධනා කරලා තිබෙනවා සවස 06.30 ට.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එතකොට සිරිකමල්ට දවල් ගහපුවාට අමතරව තව ටිකක් ගහන්න පුළුවන් නේ?

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

එහෙමයි අපි ඉන්න ඕනෑ. නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමයි, අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමයි මේක ඇතුළේ මරා ගත්තා. බේර ගන්න බැරුව ගියා. අන්න කැන්ටිමේ දෙන්නා එක මේසේ තේ බොනවා. විහිළු කර කර. මට පුදුම හිතුනා, කොහොමද මේ දෙන්නා එකට ඉන්නේ කියලා. ඒක තමයි දේශපාලනය කියන්නේ. සදාකල් මිතුරෝද, සදාකල් හතුරෝද නැත. ඒකයි කියමන. එහෙම නම් අපි අද සතුටු වෙනවා. 2018 වර්ෂයේ මේ සභා ගර්භයේ තිබෙන අපේ අවසන් රැස්වීම. අපි සියලු දෙනා මෙතැනින් යන්නේ සියලුම ප්‍රශ්න අමතක කරලා. අපේ හිත්වල, පපුවේ, ඔළුවේ තිබෙන ඒ සියලුම කුහකකම්, නොසතුට හැම දෙයක්ම අත්හැරලා අපි නැවත වරක් ජනවාරි මාසේ මුණ ගැසෙන්න ඕනෑ. විශේෂයෙන්ම සභාපතිවරයා වශයෙන් මම හැමදාම මධ්‍යස්ථව හිටියා. මටත් පොඩි පොඩි ප්‍රශ්න ආවා. ඒවා මම ගණන් ගන්නේ නැහැ. සාමාන්‍යයෙන් ඒක මගේ ස්වභාවය. ඒ නිසා අවසාන වශයෙන් ලබන්නා වූ අසිරිමත් නත්තල අපේ සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. හැමදාම නත්තල සමරනවා. එතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට අසිරිමත් සුභ නත්තලක් වේවා. ඒ වගේම ලබන්නා වූ 2019 වසර ඔබ සැමට සාමය සතුට පිරි සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඔබ සැමට තෙරුවන් සරණයි. සුභ නව වසරක්. සුභ අනාගතයක්.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Hon. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 06.16 ට, 2019 ජනවාරි මස 08 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 06.16 p.m till 09.30 a.m, on 08.01.2019*